62 වන කාණ්ඩය
5 වන කලාපය

සඳුදා
1965 සැප්තැම්බර් 6

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1238]

විසර්ජන කෙටුම්පත් පනත, 1965-66 [දෙළොස්වන වෙන් කළ දිනය] : [තී. 1256]

ශීර්ෂ 55—64; 70—76; 80—82 සහ 85 කාරක සභාව විසින් සලකා බලන ලදී.

PUBLIC LIBRARY
JAFFNA.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 62
இல. 5

திங்கட்கிழமை
6 செப்ரெம்பர், 1965

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்


வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1238]

ஒதுக்கீட்டு மசோதா, 1965-66 [ஒதுக்கப்பட்ட பன்னிரண்டாம் நாள்] [ப. 1256] :
தலைப்புக்கள் 55-64; 70-76; 80-82; 85—குழுவில் ஆராயப்பெற்றன


---

Volume 62
No. 5

Monday,
6th September 1965

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS [Col. 1238]

APPROPRIATION BILL, 1965-66 [*Twelfth Allotted Day*] [Col. 1256] :
Considered in Committee—Heads 55-64 ; 70-76 ; 80-82 ; 85.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

**1965 සැප්තැම්බර් 6 වන සඳුද**

1965 செப்ரெம்பர் 6, திங்கட்கிழமை

*Monday, 6th September 1965*

---

පූ. භා. 10ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්, කේ. බී. ඊ.] මූලාසනාරූඪ විය.

சபை, மு. ப. 10 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ ஸ்ரீமான் அல்பட் எப். பீரிஸ், கே.பி.ஈ.] தலைமை தாங்கினார்கள்.

*The House met at* 10 A.M., MR. SPEAKER [THE HON. SIR ALBERT F. PERIES, K.B.E.] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

### PAPERS PRESENTED

(1) Report of the Ceylon Hardboard Corporation for the period 1st April 1961, to 31st March 1962 ;

(2) Report of the Ceylon Leather Products Corporation from April 1961, to March 1962 ;

(3) Report of the Ceylon Leather Products Corporation from April 1962, to March 1963 ;

(4) Report of the D. I. Leather Products Corporation from April 1960, to March 1961 ;

(5) Report of the Board of Directors of the Ceylon Mineral Sands Corporation for the year ended March 31, 1962 ;

(6) Annual Report of the Ceylon Steel Corporation for 1961-62 ;

(7) Annual Report of the Ceylon Steel Corporation for 1962-63 ; and

(8) Report of the Ceylon Ceramics Corporation for the period 1st April 1962 to 31st March, 1963.

[කර්මාන්ත හා ධීවර ඇමති වෙනුවට ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

சபையின் செயலதிகார பீடத்தில் இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Ordered to lie upon the table.*





(454 වෙනි අධිකාරය වන) රජයේ ඉඩම් ආඥා පනතේ 95 සහ 96 යන වගන්තිය යටතේ පනවන ලද නියෝගයක් මම ඉදිරිපත් කරමි. [ගරු සී. පී.ද සිල්වා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

சபையின் செயலதிகார பீடத்தில் இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Ordered to lie upon the table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

### வினாக்களுக்கு வாய்மூல விடைகள்

### ORAL ANSWERS TO QUESTIONS

**යතුරු ලේඛක සේවා විභාගය, 1964**

தட்டெழுத்தாளர் சேவைப்பரீட்சை, 1964

TYPISTS' SERVICE EXAMINATION, 1964

1. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ)

*(திரு. எம். பீ. டி. சொய்ஸா சிறிவர்தன—மினுவாங்கொட)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1964 මැයි මාසයේ පවත්වන ලද යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ විභාගයෙන් සමත් සියලුම අපේක්ෂක අපේක්ෂිකාවන්ට පත්වීම් දීමට එතුමා ක්‍රියා කරනවාද? (ආ) එසේ නම්, ඒ කවදාද? නොඑසේ නම්, ඒ මන්ද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) தட்டெழுத்தாளர் சேவைக்கு ஆட்களை நியமிப்பதற்கென 1964, மே மாதத்தில் நடாத்தப்பெற்ற பரீட்சையில் சித்தியெய்திய பரீட்சார்த்திகள் அனைவருக்கும் நியமனங்கள் வழங்குவதற்கு அவர் நடவடிக்கைகள் எடுப்பாரா? (ஆ) ஆமெனில் எப்பொழுது? இல்லையெனில் ஏன்?*

asked the Minister of Finance: (*a*) Will he take action to give appointments to all the successful candidates at the examination for recruitment to the Typists' Service held in May 1964? (*b*) If so, when, and if not, why?

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**

*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*

(The Hon. U. B. Wanninayake—Minister of Finance)

(*a*) By "successful" candidates, the hon. Member is probably referring to the 141 candidates who

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු වන්නිනායක]

obtained the minimum number of marks at the written examination to be summoned for the *viva-voce* test. It may not be possible to give all these candidates appointments in the Typists' Service. (*b*) Appointments are being given to candidates strictly in order of merit, depending on the total number of marks obtained, as and when vacancies occur. In fact, 35 such appointments have been made so far. Further appointments will be made as vacancies occur.

## ඔඩිටර් ජනරාල් දෙපාර්තමේන්තුව : ගණන් පරීක්ෂක අධිකාරීන්

*கணக்குப் பரிசோதனை அத்தியட்சர்கள் : கணக்குப் பரிசோதனை அதிபதி திணைக்களம்*

SUPERINTENDENTS OF AUDIT : AUDITOR-GENERAL'S DEPARTMENT

3. ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)

*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*

(Dr. N. M. Perera—Yatiyantota)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ගණන් පරීක්ෂක අධිකාරීන් (ගණන් පරීක්ෂණ සේවයේ III වැනි පන්තිය) බඳවා ගැනීම සඳහා 1964 ඔක්තෝබර් මාසයේදී විභාගයක් පැවැත්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රසිද්ධ කළ බව එතුමා දන්නවාද? (ආ) 1964.12.4 වැනි දින ගැසට් නිවේදනයෙන් මෙම විභාගය 1965 ජනවාරි මාසය දක්වා කල් දැමූ බව එතුමා දන්නවාද? (ඉ) දැන් මෙම විභාගය තව දුරටත් කල්දමා තිබේද? (ඊ) ඔඩිටර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අධික නිලධාරි හිඟයක් පවතින නිසාත්, ඔඩිටර් ජනරාල් වරුන් මේ ගැන නැවත නැවතත් අවධානය යොමු කර තිබියදීත් මෙම විභාගය මේ අයුරින් කල් දමා ඇත්තේ මන්ද? (උ) තවදුරටත් ප්‍රමාද නොකර මෙම විභාගය පැවැත්වීමට එතුමා කටයුතු කරනවාද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) கணக்குப்பரிசோதனைச் சேவையின் 3 ஆம் வகுப்பு கணக்குப் பரிசோதனை அத்தியட்சர்களை நியமிப்பதற்கென, 1964 ஒக்ரோபர் மாதம் பரீட்சை ஒன்று நடாத்துவதற்கென அரசாங்க சேவை ஆணைக்குழுவினால் விளம்பரம் செய்யப்பட்டதென்பதை அவர் அறிவாரா? (ஆ) 4/12/1964 ஆம் தேதிய வர்த்தமானி அறிவித்தல் மூலம் இப்பரீட்சை 1965 ஜனவரிக்கு பின்போடப்பட்டது என்பதையும் அவர் அறிவாரா? (இ) தற்போது, இப் பரீட்சை மேலும் பின்போடப்பட்டுள்ளதா? (ஈ) கணக்குப்பரிசோதனை அதிபதியின் திணைக்களத்தில் ஊழியர் பற்றாக்குறை மிக அதிக அளவில் உள்ளமையாலும், இதுபற்றி கணக்குப் பரிசோதனை அதிபதி பலமுறை குறிப்பிட்டுமிருக்கையில் இப்பரீட்சை இவ் விதம் பின்போடப்பட்டுள்ளது ஏன்? (உ) இப்பரீட்சையை மேலும் காலதாமதமின்றி நடாத்துவதற்கு அவர் நடவடிக்கைகள் எடுப்பாரா?*

asked the Minister of Finance : (*a*) Is he aware that an examination for the recruitment of Superintendents of Audit (Class III of the Audit Service) was advertised by the P. S. C. to be held in October, 1964? (*b*) Is he also aware that this examination was postponed to January, 1965, by Gazette Notification of 4.12.64? (*c*) Has this examination been now further postponed? (*d*) In view of the fact that the Auditor-General's Department is badly under-staffed and Auditors-General have repeatedly drawn attention to this, why has this examination been postponed in this way? (*e*) Will he take steps to hold this examination without further delay?

ගරු වන්නිනායක

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

(*a*) Yes. (*b*) Yes. (*c*) Yes. (*d*) The examination was postponed to January 1965 by the former Government in view of representations which had been made regarding the Official Language proficiency requirements stipulated in the original notice of June 1964. A further postponement beyond January 1965 was necessitated on account of the impending General Election and the disorganization caused by the cyclone of December 1964. The examination could not be held up to now as a policy decision on the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

conditions of eligibility of candidates already in the Public Service had to be reached by the new Government. Such a decision has recently been made. (e) Yes. The Public Service Commission has been so advised.

## අහුන්ගල්ල දුම්රිය ස්ථානයට නුදුරින් තිබෙන දුම්රිය හරස් පාර

அகுன்கல்ல புகையிரத நிலையத்திற்கருகிலுள்ள புகையிரதக் கடவை

## RAILWAY CROSSING NEAR AHUNGALLA STATION

4. එල්. සී. ද සිල්වා මයා. (බලපිටිය)
(திரு. எல். சீ. டி சில்வா—பலப்பிட்டிய)
(Mr. L. C. de Silva—Balapitiya)

ප්‍රවාහන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මුහුදුබඩ මාර්ගයේ අහුන්ගල්ල දුම්රිය ස්ථානයට නුදුරුව ආරක්ෂා විරහිත දුම්රිය හරස් පාරක් තිබෙනබව එතුමා දන්නවාද? (ආ) මෙම දුම්රිය හරස් පාර පිහිටි ස්ථානයේ හදිසි අනතුරු ගණනාවක් සිදුවූ බව එතුමා දන්නවාද? (ඉ) මේ දුම්රිය හරස් පාර ඇති ස්ථානයේ රේල් ගේට්ටුවක් සවි කරන මෙන් පළාත් වාසීන් එතුමාට හා දුම්රිය සාමාන්‍යාධිකාරිට ඉල්ලීම් කිහිපයක් කළ බව එතුමා දන්නවාද? (ඊ) එසේ හෙයින්, මෙම දුම්රිය හරස්පාර පිහිටි ස්ථානයේ රේල් ගේට්ටුවක් සෑදීමට එතුමා කටයුතු කරනවාද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) கரையோரப் புகையிரதப் பாதையில் அகுன்கல்ல புகையிரத நிலையத்திற்கு அண்மையில் பாதுகாப்பற்ற புகையிரதக் கடவையொன்று இருக்கிறதென்பதை அவர் அறிவாரா? (ஆ) இப்புகையிரதக் கடவையில் பலமுறை விபத்துக்கள் ஏற்பட்டுள்ளன என்பதை அவர் அறிவாரா? (இ) இக்கடவையில் ஒரு புகையிரதப் படலை அமைக்குமாறு அவரையும், புகையிரதத் திணைக்களத் தலைமை அதிபதியையும் அப்பகுதி மக்கள் பலமுறை வேண்டியுள்ளார்கள் என்பதையும் அவர் அறிவாரா? (ஈ) எனவே இக்கடவையில் ஒரு புகையிரதப்படலை அமைப்பதற்கு அவர் நடவடிக்கைகள் எடுப்பாரா?

asked the Minister of Communications: (a) Is he aware that there is an unprotected railway crossing on the coastline close to the Ahungalla Railway Station? (b) Is he aware that a number of accidents have occurred at this railway crossing? (c) Is he aware that the people of the area have made a number of requests to him and to the General Manager of Railways to construct a railway gate at this crossing? (d) Will he, therefore, take steps to construct a railway gate at this crossing?

ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහන ඇමති)
(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)
(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

(a) Yes. (b) There were two accidents during the past five years. (c) Yes. (d) This level crossing is on a P. W. D. road. The onus of providing and maintaining gates, if required, is on the Public Works Department. The applicants have been advised accordingly.

## බෙන්තොට වලල්ලාවිට කෝරළේ මහ පැලැන පොල්වත්ත

மகாபெலன்ன பொல்வத்த, பெந்தோட்டை வலலாவிற்ற கோறளை

## MAHAPELENA POLWATTE, BENTOTA WALALLAWITA KORALE

5. එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බෙන්තොට වලල්ලාවිට කෝරළේ (බටහිර) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 15 දූවේමෝදර ග්‍රාම සේවක කොට්ඨාශයේ පිහිටි මහ පැලැන පොල්වත්ත නමැති ඉඩම ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ රජයට පවරාගෙන මෙම ඉඩම බෙදා දීම සඳහා 1963 ජනවාරි මස 19 වැනි දින පවත්වන ලද ඉඩම් කච්චේරියේදී සුදුසු අයදුම්කරුවන් තෝරා ගන්නා ලද බව එතුමා දන්නවාද? (ආ) සුදුසු අයදුම්කරුවන් තෝරාගෙන අවුරුදු 2 මාස 6ක් ගත වී ඇතත් මෙතෙක් ඔවුන් ඉඩම් කට්ටිවල පදිංචිකරවා නැති බව එතුමා දන්නවාද? (ඉ) එතුමා ඔවුන් පදිංචි කරවීමට අදහස් කරන්නේද? (ඊ) එසේ නම් ඒ කවදාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. සී. ද සිල්වා මයා.]

(උ) මෙතෙක් ඒ ඒ ඉඩම් කට්ටි ඒ ඒ කට්ටිකරුවන්ට භාර නොදීමට හේතු මොනවාද ?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா : (அ) பெந்தோட்டை வலலாவிற்ற கோறளை (மேற்கு) பெரும்பாக இறைவரி உத்தியோகத்தர் பிரிவைச் சேர்ந்த 15 ஆம் இலக்க தூவேமோதர கிராம சேவகர் பிரிவிலுள்ள மகாப்பெலன்ன பொல்வத்த என வழைக்கப்படும் காணி அரசாங்கத்திஞல் கிராம விஸ்தரிப்புத் திட்டத்தின் கீழ் கொள்ளப்பட்டது என்பதையும், 1963, ஜனவரி 19 ஆம் தேதியன்று நடாத்திய காணிக் கச்சேரியில் இக்காணியைப் பராதீனப்படுத்துதற்கு தகுதியுடைய விண்ணப்பதாரர்கள் தெரிவு செய்யப்பட்டனர் என்பதையும் அவர் அறிவாரா ? (ஆ) தகுதியுடைய விண்ணப்பதாரர்கள் தெரிவு செய்யப்பட்டு இரு ஆண்டுகளும் ஆறு மாதங்களும் கடந்திருந்துங்கூட அவர்களுடைய காணித் துண்டுகளில் அவர்கள் இதுவரை குடியேறவில்லை என்பதை அவர் அறிவாரா ? (இ) அவர்களைக் குடியேற்ற அவர் உத்தேசிக்கின்ருரா ? (ஈ) ஆமெனில் எப்பொழுது ? (உ) காணியைப் பெறுபவர்களுக்கு அவரவர்கள் காணித்துண்டுகள் இதுவரை கையளிக்கப்படாமல் இருப்பதற்குக் காரணங்கள் என்ன ?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that the land called Mahapelena Polwatte in No. 15 Doowemodera Grama Sevaka Division in the Bentota Walallawita Korale (West) D. R. O.'s Division was acquired by the Government under the Village Expansion Scheme and the eligible applicants for the alienation of this land were selected at the land kachcheri held on 19th January, 1963 ? (*b*) Is he aware that although 2 years and 6 months have lapsed since the selection of the eligible applicants they have not been settled down so far in the allotments ? (*c*) Does he propose to settle them ? (*d*) If so, when ? (*e*) What are the reasons for not handing over the allotments to the respective allottees so far ?

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(*a*) I am aware that the land kachcheri was held, but that acquisition proceedings were not finalised. (*b*) Yes. (*c*) Yes. (*d*) As soon as possession is taken over after the acquisition proceedings are completed. (*e*) The selected allottees could not have been put in possession as the acquisition proceedings are not yet completed. The owners objected to the acquisition of the portion of the land originally proposed to be acquired. After due inquiry another portion of the same land is being acquired. Instructions have been given to the Government Agent to complete the acquisition proceedings as quickly as possible and to place in possession the selected allottees. I must state that since then I have told all Government Agents not to hold land kachcheries until all proceedings are completed.

**එල්. සී. ද සිල්වා මයා.**

*(திரு. எல். சீ. டி சில்வா)*

(Mr. L. C. de Silva)

Will the Hon. Minister direct the Government Agent to settle the allottees on that portion of the land already acquired ?

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

It is being acquired.

**එල්. සී. ද සිල්වා මයා.**

*(திரு. எல். சீ. டி சில்வா)*

(Mr. L. C. de Silva)

The land kachcheri was held $2\frac{1}{2}$ years ago but an order under Section 38 (*a*) has still not been published. I understand that this is an omission on the part of the Government Agent.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

The people will be settled on the land that is acquired and not on some other portion of the land.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Question No 6.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

I want time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க ஆணையிடப்பட்டது.

*Question ordered to stand down.*

### ශාඛා බෙහෙත් ශාලා බලාගන්නවුන්

### கிளை மருத்தகக் கண்காணிப்பாளர்

### BRANCH DISPENSARY CARETAKERS

7. ලක්ෂ්මන් ජයකොඩි මයා. (දිවුලපිටිය)
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)
(Mr. Lakshman Jayakody—Divulapitiya)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ශාඛා බෙහෙත්ශාලා මධ්‍යම බෙහෙත්ශාලා වශයෙන් උසස් කරන විට අවුරුදු 20 කට වැඩි කාලයක් සේවය කර ඇති ශාඛා බෙහෙත්ශාලා බලාගන්නවුන් අස්කර ඒ වෙනුවට අලුත් සේවකයින් බඳවා ගන්නා බව එතුමා දන්නවාද? (ආ) ශාඛා බෙහෙත් ශාලා මධ්‍යම බෙහෙත්ශාලා වශයෙන් උසස් කරනු ලබන විට, ශාඛා බෙහෙත් ශාලා බලාගන්නවුන් මුරකරුවන් වශයෙන් හෝ කම්කරුවන් වශයෙන් හෝ ඔවුන් සඳහා විභාගයක් පවත්වා, එයට පසු ඖෂධ සංයෝජකවරුන් වශයෙන් හෝ පත් කිරීමට එතුමා කටයුතු කරනවාද? (ඉ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) கிளை மருந்தகங்களை மத்திய மருந்தகங்களாகத் தரம் உயர்த்தப்படுகையில் 20 வருடங்களுக்கு மேல் கடமையாற்றிய கிளை மருந்தகங்களின் கண்காணிப்பாளர்களை விலக்கிவிட்டு அவர்களுக்குப் பதிலாக புதிய ஊழியர்கள் நியமிக்கப்படுகின்றனர் என்பதை அவர் அறிவாரா? (ஆ) கிளை மருந்தகங்களை மத்திய மருந்தகங்களாகத் தரம் உயர்த்தும் பொழுது கிளை மருந்தகங்களின் கண்காணிப்பாளர்களுக்கெனப் பரீட்சை ஒன்று நடாத்தி அவர்களைக் காவலாளர்களாக அல்லது வேலையாட்களாக அல்லது மருந்தாளர்களாக நியமனஞ் செய்வதற்கு அவர் நடவடிக்கைகள் எடுப்பாரா? (இ) இல்லையெனில், ஏன்?

asked the Minister of Health: (*a*) Is he aware that when branch dispensaries are up-graded to central dispensaries the caretakers of branch dispensaries who have worked for more than 20 years are dismissed and new employees are recruited instead? (*b*) Will he take steps to appoint the caretakers of branch dispensaries as watchers or as workers or as dispensers after holding an examination for them when the branch dispensaries are up-graded to central dispensaries? (*c*) If not, why?

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (සෞඛ්‍ය ඇමති)
(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—சுகாதார அமைச்சர்)
(The Hon. M. D. H. Jayawardena—Minister of Health)

(*a*) Not aware. (*b*) Already such caretakers are permitted the opportunity to be absorbed into the labour grades. (*c*) Does not arise.

### ශාඛා බෙහෙත් ශාලා බලාගන්නවුන්ගේ සේවා තත්ත්වය

### கிளைமருந்தகக் கண்காணிப்பாளர்: சேவை நிபந்தனை முதலியன

### BRANCH DISPENSARY CARETAKERS: SERVICE CONDITIONS

8. ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ශාඛා බෙහෙත්ශාලා බලාගන්නවුන්ගේ වැටුප් පරිමාණය හා රාජකාරි එතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

සඳහන් කරනවාද? (ආ) ඔවුන්ට වාර්ෂික වැටුප් වැඩිවීම් දීමට එතුමා කටයුතු කරනවාද? (ඉ) ඔවුන්ගේ සේවය ස්ථිර කිරීමටත් විශ්‍රාම වැටුප් සහිත කිරීමටත් එතුමා කටයුතු කරනවාද? (ඊ) එසේ නම්, ඒ කවදාද? නොඑසේ නම්, ඒ මන්ද? (උ) මේ අය බෙහෙත් ශාලා බලාගන්නවුන් මුරකරුවන් හා කම්කරුවන් වශයෙන් ද වැඩ වර්ජන පැවති කාලවලදී බෙහෙත් ශාලාවල හා ආරෝග්‍යශාලාවල ඖෂධ සංයෝජකයින් වශයෙන්ද සේවය කර ඇති බැවින් ඔවුන් රජයේ සේවයට ඇතුලත් කිරීමට එතුමා සළකා බලනවාද? (ඌ) නොඑසේ නම්, ඒ මන්ද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) கிளை மருந்தகங்களின் கண்காணிப்பாளர்களுடைய சம்பள அளவுத்திட்டத்தையும், கடமைகளையும் அவர் கூறுவாரா? (ஆ) அவர்களுக்கு வருடாந்த சம்பள உயர்ச்சி வழங்குவதற்கு அவர் நடவடிக்கைகள் எடுப்பாரா? (இ) அவர்களை நிரந்தரமான, இளைப்பாற்றுச் சம்பளத்தையுடைய பதவியினராக்க அவர் நடவடிக்கைகள் எடுப்பாரா? (ஈ) ஆமெனில் எப்பொழுது? இல்லையெனில், ஏன்? (உ) வேலைநிறுத்தங்களின் போது அவர்கள் கண்காணிப்பாளர்களாகவும், காவலாளர்களாகவும், வேலையாட்களாகவும், மருந்தாளர்களாகவும், மருந்தகங்களிலும், வைத்தியசாலைகளிலும் வேலைசெய்துள்ளமையினால் அவர்களை அரசாங்க சேவையில் சேர்த்துக்கொள்வது சம்பந்தமாய் அவர் சிந்திப்பாரா? (ஊ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Health: (*a*) Will he state the salary scale and the duties of the caretakers of branch dispensaries? (*b*) Will he take steps to grant them annual increments? (*c*) Will he take steps to make them permanent and pensionable? (*d*) If so, when, and if not, why? (*e*) In view of the fact that they have worked as caretakers, watchers, workers and as dispensers in Dispensaries and Hospitals during strikes, will he consider absorbing them into Government Service? (*f*) If not, why?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*

(The Hon. M. D. H. Jayawardena)

(*a*) Caretakers are paid only allowances depending on the number of visits per month by the visiting apothecary. The present rates are as follows:—

Rs. 240 per annum for 12 days and over in a month;

Rs. 210 per annum for 8 days and over in a month;

Rs. 180 per annum for 4 days and over in a month;

Rs. 150 per annum for less than 4 days.

Whenever possible honorary caretakers are appointed through the Rural Development Department.

The duties of a caretaker are:—

1. He should be in charge of all Government articles at the branch dispensary;
2. He should sweep and maintain the dispensary premises and clean the dispensary furniture;
3. He should bring water for use at the dispensary;
4. He should assist in maintaining order among patients;
5. He should assist the medical officer or apothecary in the dispensary and in the issue of medicine to patients.

(*b*) As they are paid only allowances, the question of payment of annual increments does not arise. (*c*) Their services are of a temporary nature. Hence it is not possible to make them permanent and pensionable. (*d*) Does not arise in view of (*c*). (*e*) Whenever their services become unnecessary such as by the up-grading of a branch dispensary to a central dispensary they are offered alternative employment as labourers irrespective of age and educational qualifications. (*f*) Does not arise in view of (*e*).

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## බලපිටිය, කොස්ගොඩ මාතෘ වාට්ටුවක්

பலப்பிட்டியிலுள்ள கொஸ்கொடவுக்கு பிரசவ சிகிச்சையறை

MATERNITY WARD FOR KOSGODA, BALAPITIYA

9. එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කලින් තිබූ රජය විසින් බලපිටිය ඡන්ද දායක කොට්ඨාශයේ කොස්ගොඩ මාතෘ වාට්ටුවක් ඉදි කිරීම සඳහා කරන ලද යෝජනාව ගැන එතුමා දන්නවාද? (ආ) මේ කාර්ය සඳහා කොස්ගොඩ මධ්‍යම බෙහෙත් ශාලාවට යාබදව පිහිටි ඉඩම පවරා ගැනීම සඳහා ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි විසින් 1964.1.29 වැනි දින සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ බව එතුමා දන්නවාද? (ඉ) එතුමා මේ ඉඩම පවරා ගැනීමට කටයුතු කර එම ඉඩමෙහි මාතෘ වාට්ටුවක් ඉදි කරනවාද? (ඊ) එසේ නම්, ඒ කවදාද? (උ) නොඑසේ නම්, ඒ මන්ද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) பலப்பிட்டித் தேர்தல் தொகுதியிலுள்ள கொஸ் கொடவில் பிரசவ சிகிச்சைக்களமொன்று நிறுவுவதாக முன்னைய அரசாங்கத்தினால் முடிவுசெய்யப்பட்டிருந்தது என்பதை அவர் அறிவாரா? (ஆ) இத்தேவைக்கென கொஸ் கொட மத்திய மருந்தகத்திற்கு அருகிலுள்ள இடத்தைக் கொள்வதற்கு காலியிலுள்ள சுகாதார சேவைகள் அத்தியட்சரினால் 29.1.64 ஆம் தேதியன்று சுகாதார சேவைகள் அதிபதிக்கு விண்ணப்பமொன்று அனுப்பப்பட்டது என்பதை அவர் அறிவாரா? (இ) இக் காணியைக் கொள்முதல் செய்து பிரசவ சிகிச்சைக்களத்தை அதில் நிறுவுவதற்கு அவர் நடவடிக்கை யெடுப்பாரா? (ஈ) ஆமெனில், எப்பொழுது? (உ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Health: (*a*) Is he aware of the proposal made by the previous Government to construct a Maternity Ward at Kosgoda in the Balapitiya Electorate? (*b*) Is he aware that an application for the acquisition of the premises adjacent to the Central Dispensary, Kosgoda, was forwarded by the Superintendent of Health Services, Galle, to the Director of Health Services on 29th January, 1964, for this purpose? (*c*) Will he proceed to acquire this land and construct the maternity ward on this land? (*d*) If so, when? (*e*) If not, why?

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන
(*கௌரவ எம். டீ. எச். ஜயவர்தன*)
(The Hon. M. D. H. Jayawardena)

(*a*) Yes. (*b*) Yes. (*c*) No. (*d*) Does not arise in view of (*c*) above. (*e*) As funds are not available for the construction of the buildings.

ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)
(*திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை*)
(Mr. Leslie Goonewardene—Panadura)

Is that the reason or is it due to the promise given by the Hon. Minister of Finance to the I. M. F. not to expand our social services?

## බ/සොරණාතොට පාසලේ උපගුරු පී. එච්. උක්කු බණ්ඩා මහතා

திரு. பி. எச். உக்கு பண்டா, உதவி ஆசிரியர், BD/சொறணதோட்ட பாடசாலை

MR. P. H. UKKU BANDA, ASSISTANT TEACHER BD/SORANATOTA SCHOOL

10. කේ. වයි. එම්. විජයරත්න බණ්ඩා මයා. (සොරණාතොට)
(*திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத்தோட்டை*)
(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බ/සොරණාතොට පාසලේ උපගුරු පී. එච්. උක්කු බණ්ඩා මහතා සේවයට බැඳී කොපමණ කල්ද? (ආ) ඔහුගේ පත්වීමේ දිනයේ සිට මේ දක්වා පාසල් කීයක ඔහු සේවය කර තිබේද? (ඉ) ඔහුගේ අධ්‍යාපනික සුදුසුකම් මොනවාද? (ඊ) ඔහු දැනට සිටින පාසලේ කොපමණ කලක් සේවය කර තිබේද? (උ) ඔහුගේ සේවය මෙම පාසලට පමණක් සීමාකර තිබේද?

*கல்வி, கலாச்சார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) BD/சொறணதோட்ட பாடசாலையைச் சேர்ந்த உதவி ஆசிரியரான திரு. பி. எச். உக்குபண்டா சேவையிற்*

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[විජයරත්න බණ්ඩා මයා.]

சேர்ந்து எவ்வளவு காலமாயிற்று? (ஆ) அவர் நியமனம் செய்யப்பட்டதிலிருந்து இதுவரை எத்தனை பாடசாலைகளில் கடமையாற்றியுள்ளார்? (இ) அவருடைய கல்வித் தகைமைகள் யாவை? (ஈ) தற்போதைய பாடசாலையில் அவர் எவ்வளவு காலம் கடமையாற்றியுள்ளார்? (உ) அவருடைய சேவைகள் இப்பாடசாலைக்கு மாத்திரந்தான் மட்டுப்படுத்தப்பட்டுள்ளனவா?

asked the Minister of Education and Cultural Affairs: (*a*) How long is it since Mr. P. H. Ukku Banda, Assistant Teacher of Bd/Soranatota School joined service? (*b*) In how many schools has he served since his appointment? (*c*) What are his educational qualifications? (*d*) How long has he served in the present school? (*e*) Has his services been restricted to this school only?

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**

(*கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல— கல்வி, கலாச்சார விவகார அமைச்சர்*)

(The Hon. I. M. R. A. Iriyagolla— Minister of Education and Cultural Affairs)

(අ) අවුරුදු 17 යි මාස 11 යි. (ආ) මුල් පත්වීමේ දින සිට මෙම සොරණාතොට පාසලේම පමණි. (ඉ) නුපුහුණු 1 වැනි පෙළ (සිංහල) (ඊ) අවුරුදු 17 යි මාස 11 යි. (උ) නැත.

## බ/කන්දේගෙදර කිරිඔරුව පාසලේ මුල් ගුරු කේ. බී. තෙන්නකෝන් මහතා

திரு. கே. பீ. தென்னகோன், தலைமையாசிரியர் BD/கண்டேகெதற-கிறியொறுவ பாடசாலை

MR. K. B. TENNAKOON, HEADMASTER, BD/KANDEGEDERA-KIRIORUWA SCHOOL

11. **විජයරත්න බණ්ඩා මයා.**
(*திரு. விஜேரத்ன பண்டா*)
(Mr. Wijeratne Banda)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බ/කන්දේගෙදර කිරිඔරුව පාසලේ මුල්ගුරු කේ. බී. තෙන්නකෝන් මහතාගේ අධ්‍යාපනික සුදුසුකම් මොනවාද? (ආ) ඔහුගේ සේවා කාලය කොපමණද? (ඉ) මෙම කාලය තුළ ඔහු පාසල් කීයක සේවය කර තිබේද? ඒ පාසල් වල නම් මොනවාද? (ඊ) ඔහුගේ උපන් ගමින් බැහැර සේවය සඳහා ඔහු මාරු නොකිරීමට හේතු මොනවාද?

கல்வி, கலாச்சார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) BD/கண்டேகெதற-கிறியொறுவ பாடசாலையின் தலைமை ஆசிரியரான திரு. கே. பீ. தென்னக்கோனின் கல்வித் தகைமைகள் யாவை? (ஆ) அவருடைய சேவைக் காலம் என்ன? (இ) இக்காலத்தில் அவர் எத்தனை பாடசாலைகளில் சேவையாற்றியுள்ளார்? அப்பாடசாலைகளின் பெயர்கள் என்ன? (ஈ) அவரை அவருடைய சொந்த இடத்திற்கு வெளியே சேவையாற்றுவதற்கு மாற்றஞ் செய்யாமலிருப்பதற்குரிய காரணங்கள் யாவை?

asked the Minister of Education and Cultural Affairs: (*a*) What are the educational qualifications of Mr. K. B. Tennakoon, Headmaster of Bd/Kandegedera-Kirioruwa School? (*b*) What is the period of his service? (*c*) In how many schools has he served during this period and what are the names of schools? (*d*) What are the reasons for not transferring him for service out of his native place?

**ගරු ඊරියගොල්ල**
(*கௌரவ ஈரியகொல்ல*)
(The Hon. Iriyagolle)

(අ) නුපුහුණු 1 වැනි පෙළ (සිංහල) (ආ) අවුරුදු 29 යි මාස 11 කි. (ඉ) පාසැල් 3 කි. 1. බ/කොහොවිලකදුර විද්‍යාලය; 2. බ/කුට්ටියගොල්ල විද්‍යාලය; 3. බ/කන්දෙගෙදර කිරිඔරුව විද්‍යාලය. (ඊ) ගමින් බැහැර පාසැල් තුනක සේවාව කර ඇත.

## බ/කන්දේගෙදර මහා විද්‍යාලය

BD/கண்டேகெதற மகா வித்தியாலயம்

BD/KANDEGEDERA MAHA VIDYALAYA

12. **විජේරත්න බණ්ඩා මයා.**
(*திரு. விஜேரத்ன பண்டா*)
(Mr. Wijeratne Banda)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බ/කන්දේගෙදර මහා විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජල පහසුකම් නොමැති බව එතුමා දන්න වදා? (ආ) මෙම පාසලට ජල පහසුකම් සැලැස්වීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුව කටයුතු කර තිබේද? (ඉ) එසේ නම්, මෙම පාසලට ජලය සපයන්නේ කවදාද? නොඑසේ නම්, ඒ මන්ද?

*கல்வி, கலாச்சார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) BD/கண்டேகெதற மகா வித்தியாலயப் பிள்ளைகளுக்கு தண்ணீர் வசதி களில்லை என்பதை அவர் அறிவாரா? (ஆ) இப்பாடசாலைக்குத் தண்ணீர் வசதியளிப் பதற்கு கல்வித் திணைக்களம் நடவடிக்கை எடுத்துள்ளதா? (இ) ஆமெனில் இப்பாட சாலைக்கு எப்பொழுது தண்ணீர் விநியோ கிக்கப்படும்? இல்லையெனில் ஏன்?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that the children of Bd/Kandegedera Maha Vidyalaya do not have water facilities? (*b*) Has the Education Department taken action to provide water facilities to this school? (*c*) If so, when will water be supplied to this school and if not why?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

(අ) එසේය. (ආ) එසේය. (ඇ) ජලය සැපයීමේ වැඩ සම්පූර්ණ වූ විගස ජලය ලැබෙනු ඇත.

**විජේරත්න බණ්ඩා මයා.**
*(திரு. விஜேரத்ன பண்டா)*
(Mr. Wijeratne Banda)

ජල සම්පාදනය පිළිබඳව කිසිම වැඩ පිළිවෙළක් අරගෙන නැති බව ගරු ඇමතිතුමා දන්නවාද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගම්කාර්ය සභාව ජලය සැපයීමට වැඩ පිළිවෙළක් ඇති කර ගෙන යනවා.

**විජේරත්න බණ්ඩා මයා.**
*(திரு. விஜேரத்ன பண்டா)*
(Mr. Wijeratne Banda)

තවම කිසිම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වී නැති බව ගම්කාර්ය සභාපති වශයෙන් මා දන්නවා. ඒ නිසා මේ පාසලට ජලය ලබා දීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් කටයුතු කරනවාද කියා මා අහනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අසා බලන විට මේ ජලය සැපයීමේ ක්‍රමය ඉක්මණින් කෙරේවිය කියා ඒ අය කියනවා. ඒ ක්‍රමය බොහොම ලෙහෙසියි. එහෙම නැත්නම් අපි ජලය ලබා දෙනවා.

## නැසියිය එම්. බී. සුබනේරිස් මහතා
### காலஞ்சென்ற திரு. எம். பி. சுபனேரிஸ
### MR. M. B. SUBANERIS, DECEASED

2. ආචාර්ය එන්. එම්. පෙරේරා. (ඩී. පී. ආර්. වීරසේකර මයා.—දෙහිඕවිට—වෙනුවට)
*(கலாநிதி என். எம். பெரேரா—திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெஹியோவிற்ற—சார்பில்)*
(Dr. N. M. Perera—on behalf of Mr. D. P. R. Weerasekera—Dehiowita)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දඹුල්ලේ, මිරිස්ගෝනියාවේ පිහිටි කැලෑ දෙපාර්තමේන්තුවේ දුව පර්යේෂණ මධ්‍යස්ථානයේ ස්ථිර මුරකරුවෙකු වශයෙන් සේවය කළ එම්. බී. සුබනේරිස් නමැත්තා 1963 ජූනි මස 23 වැනි දින හදිසි අනතුරකින් මිය ගිය බව එතුමා දන්නවාද? (ආ) ඔහුගේ අඹු දරුවන් දැන් අනාථයින් වී සිටින බව එතුමා දන්නවාද? (ඉ) කැලෑ දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ට කුමන වන්දියක් ගෙවා තිබේද? (ඊ) කිසිම වන්දියක් ගෙවා නැත්නම් ඒ මන්ද? (උ) ඔවුන්ට වන්දි ගෙවීමට කටයුතු කර තිබේද? නොඑසේ නම්, ඒ මන්ද? (ඌ) ඔවුන්ට වන්දි ගෙවනවාද? එසේ නම්, ඒ කවදාද? (එ) මෙම කාරණය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) தம்புள்ள, மிரிஸ்கொனி யாவவிலுள்ள வனத் திணைக்கள மர ஆராய்ச்சி நிலையத்தில் நிரந்தர காவலாளியாகக் கடமை யாற்றிய எம். பீ. சுபனேரிஸ் என்பவர் 1963, ஜூன் 23 ஆம் தேதி விபத்தொன்றின்மூலம் இறந்தாரென்பதை அவர் அறிவாரா? (ஆ) அவரது மனைவியும் பிள்ளைகளும் தற்பொழுது*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]
ஆதரவற்றவர்களாகிவிட்டனர் என்பதை அவர் அறிவாரா? (இ) திணைக்களத்தினால் அவர்களுக்கு வழங்கப்பட்டுள்ள நட்டஈடு என்ன? (ஈ) நட்டஈடு எதுவும் வழங்கப்படவில்லையாயின், ஏன் வழங்கப்படவில்லை? (உ) அவர்களுக்கு நட்டஈடு வழங்குவதற்கு நடவடிக்கையேதாவது மேற்கொள்ளப்பட்டுள்ளதா? அன்றேல், ஏன்? (ஊ) அவர்களுக்கு நட்டஈடு வழங்கப்படுமா? அவ்வாறாயின் எப்பொழுது? (எ) இவ்விடயம் சம்பந்தமாக அவர் மேற்கொள்ளவிருக்கும் நடவடிக்கை யாது?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that one M. B. Subaneris, a permanent watcher attached to the Timber Research Station, Mirisgoniyawa, Dambulla, of the Forest Department, died by an accident on the 23rd June, 1963? (*b*) Is he aware that his wife and children have now become destitute? (*c*) What compensation has been paid to them by the Forest Department? (*d*) If no compensation has been paid, why? (*e*) Has action been taken to pay them compensation, and if not, why? (*f*) Will compensation be paid to them and, if so, when? (*g*) What action will be taken in this matter?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

(අ) ඔව්. (ආ) නැත. (ඉ) සුබනේරිස් මහතාගෙන් යැපෙන්නන්ට ගෙවනු පිණිස රු. 3,500 ක මුදලක් භාණ්ඩාගාරය විසින් කම්කරු වන්දි කොමසාරිස් වෙත ගෙවා ඇත. (ඊ) (උ) (ඌ) සහ (එ): (ඉ) පිළිතුර අනුව පැන නොනඟී.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Why do you say it does not arise? You have not yet paid the compensation.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

A sum of Rs. 3,500 has been passed. The reply is, (අ) ඔව්. (ආ) නැත. (ඉ) සුබනේරිස් මහතාගෙන් යැපෙන්නන්ට ගෙවනු පිණිස රු. 3,500 ක මුදලක් භාණ්ඩාගාරය විසින් කම්කරු වන්දි කොමසාරිස් වෙත යවා ඇත. (ඊ) (උ) (ඌ) සහ (එ): (ඉ) අනුව පැන නොනඟී.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

The money may have been sent in, but the people have not been paid the compensation.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I do not know. I cannot say anything now. I will look into this matter

## විසර්ජන කෙටුම්පත් පනත, 1965-66

*ஒதுக்கீட்டு மசோதா, 1965-66*

### Appropriation Bill, 1965-66

කාරක සභාවේ දී සලකා බලන ලදී.—[ප්‍රගතිය, සැප්තැම්බර් 3.]

[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப் பெற்றது. [தேர்ச்சி, செப்ரெம்பர் 3]

[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

*Considered in Committee—[Progress, 3rd September].*

[Mr. Speaker *in the Chair.*]

**55 වන ශීර්ෂය.—ඉඩම්, වාරිමාර්ග සහ විදුලි කටයුතු පිළිබඳ අමාත්‍යවරයා**

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 5,30,137

1 වන උප ශීර්ෂය.—සේවක සංඛ්‍යා සහ වැටුප් රු. 3,38,922

*தலைப்பு 55.—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சர்*

வாக்குப்பண இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூ. 5,30,137

உப தலைப்பு 1.—ஊழியர் கோப்பும் சம்பளமும், ரூ. 3,38,922

Head 55—Minister of Land, Irrigation and Power

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 530,137*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*Sub-head 1.—Cadre and salaries, Rs. 338,922*

ඉදිරිපත් කරන ලද සංශෝධනය.—[සැප්තැම්බර් 2.]

சமர்ப்பிக்கப்பட்ட திருத்தம்—[செப்ரெம்பர் 2] :

*Amendment moved*—[2nd September]:
"That the Vote be reduced by Rs. 10 in respect of sub-head 1, item 'Minister'."
—[බර්නාඩ් සොයිසා මයා.]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed.*

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Sir, can I ask one question? I am reluctant to take the time of the House. I only want to ask one question from the Hon. Minister of Land.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

If I allow one hon. Member I think I will have to allow others too. We are working to a schedule.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I agree with you. As the Head comes up I will ask the question.

ජයකොඩි මයා.
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

සභාපතිතුමනි, ප්‍රශ්න ඇසීමේ කාල යෙන් තව පැය කාලක් ඉතිරි වී තිබෙනවා. ඒ පැය කාල මට දෙන මෙන් මම නමුත් නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

පූ. භා. 10.15

සභාපතිතුමා
*(அக்கிராசனர்)*
(The Chairman)

We have about 15 minutes extra. Therefore, the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) may ask his question.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

You can also take about half an hour from the time allotted for the discussion of the votes of the Ministry of Home Affairs. I do not think we are going to spend much time on those Votes.

The question I want to raise is this. The Hon. Minister will remember, this House came to a decision about the risk allowance to engineers. This House unmistakably decided that we were not going to pay any risk allowance to engineers but only to workers. I am informed on fairly good authority that he has now decided to grant 15 per cent. risk allowance even to the engineers subject to a maximum of Rs. 111.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I have no authority to do so.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

That is what I want to know. If it is not true I hope the Hon. Minister will check up and see that it is not done.

The second point is this. Workers are given a 15 per cent. risk allowance. Your department has now asked them to choose between the risk allowance and the compensation. I have got with me the circular issued by the department. The result of this is if a man dies due to an accident while working on the electric mains his children will get nothing if no compensation is going to be paid. It was decided by the House to pay them the compensation as well as the risk allowance.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I am not aware of any circular. I shall certainly look into the matter.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

සභාපතිතුමනි, කාලය මදි නිසා මම දීර්ඝ ලෙස කථා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. කෙටියෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරනවා. ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ වැඩ පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව පටන්ගත් දස අවුරුදු සැලැස්ම අනුව කරගෙන ගියායයි ගිය සිකුරාදා තර්කයක් ඉදිරිපත් කළා. පසු ගිය අවුරුදු 9 යේ ඇස්තමේන්තු දිහා බැලුවොත් පෙනේවි, අවුරුදුපතා රජය වැය කරන ලද මුදලින් පහෙන් එකක් පමණ මේ ඇමතිතුමාගේ අමාත්‍යාංශයට වෙන් කර තිබෙන බව. එය නරකයයි මම කියන්නේ නැහැ. මෙවර අයවැය ඇස්තමේන්තු බැලුවොත් තමුන්නාන්සේට පෙනේවි, රජය වැය කිරීමට බලාපොරොත්තු වන මුදලෙන් හතෙන් එකක් මේ අමාත්‍යාංශයට වෙන් කර තිබෙන බව. එයින් පෙනෙනවා ඇමතිතුමාට වුවමනා තරම් මුදල් ලැබෙන බව. ඇමතිතුමාගේ වැඩ සඳහා වුවමනා තරම් මුදල් ලැබෙනවා නම්, ඒ ලැබෙන මුදල් නියම විදියට යොදවනවාද, ඒ මුදල්වලින් නියම ප්‍රයෝජන ලැබෙනවාද කියා අප බැලිය යුතුයි. ඒ යොදවන මුදලෙන් රටට නියම ප්‍රයෝජන ලැබෙනවාද ? රටට අවශ්‍ය සංවර්ධනය එයින් සිදු වෙනවාද ?

කැලෑ දෙපාර්තමේන්තුව ගැන විශාල ලෙස කථා කරනවා. ඒ දෙපාර්තමේන්තුව සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනවාය කියනවා. තේක්ක වැවීම, මැහෝගනි වැවීම සහ ඇත්දෙමට වැවීම යනාදිය සම්බන්ධයෙන් ඉලක්කය අනුවම ක්‍රියා කර ගෙන යන බව කීව. නමුත් අද එහි තත්ත්වය ගැන අපි දන්නව. කැලෑ දෙපාර්තමේන්තුව මගින් වවාගෙන යන කැලෑ, සම්පූර්ණයෙන්ම වාගෙ විනාශ වෙලයි තියෙන්නෙ. ඩී. එස්. සේනානායක අගමැතිතුමාගෙ කාලෙ වවන්න පටන් ගත් කැලෑ වගයක් අපේ කොට්ඨාශයේ තිබෙනව. අවුරුදු 17, 18, 20 තරමෙ කොස් ගස් එම කැලෑවෙ තිබෙනව. නමුත් පළල ඇඟිල්ලකට වැඩිය තිබෙනවාය කියන්න අමාරු තරමයි. සෑම දෙයක් සඳහාම විශාල මුදලක් වියදම් කර ඇති නමුත් කැලෑවලින් නම් කිසි ප්‍රයෝජනයක් ලැබී තිබෙනවාය කියන්න අමාරුයි. මෙම දෙපාර්තමේන්තුව මගින් අපේ පළාතෙ—නෙත් කලාපයෙ—කොස්, තේක්ක, යනාදිය වවනව. නෙත් කලාපයට අයත් ප්‍රදේශවල තේක්ක යනාදිය වැවීමෙන් සාර්ථක ප්‍රතිඵල ලැබෙන්නෙ නැහැ. ඒ පළාත්වල වැවෙන ලීයෙන් ප්‍රයෝජන ගන්නත් බැහැ. තේක්ක වවනවනම් වවන්න ඕනැ, පොළොන්නරුව වැනි ප්‍රදේශවලයි. ඇමතිතුමා වවන්න පටන් ගත්ත ප්‍රදේශවලයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දැන් මොකද කරන්නෙ ? ඒ ගස් උදුර ගෙන ගිහින් වෙන කොහෙවත් හිටවන්නද ?

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

එවැනි ප්‍රදේශවල මේ විධියෙ ගස් වැවීම මෝඩ වැඩක් බවයි, මා කියන්නෙ. තමුන්නාන්සෙගෙ ක්‍රමයත් ඩී. එස්. සේනානායක අගමැතිතුමාගෙ ක්‍රමයම නම්, ඇත්ත වශයෙන්ම එය සාර්ථක වී නැති බව කියන්න ඕනැ.

විදුලිය පිළිබඳ තත්ත්වය මොකක්ද ? මුදල් දහස් ගණන් යට කර නොයෙකුත් විධියෙ සංවර්ධන වැඩ අරඹන්න පුළුවනි. නමුත් ඒවායින් නියම ප්‍රයෝජනය ලැබෙනවද කියන එක ගැන ටිකක් කල්පනා කර බලන්න ඕනැ. ඒ වගෙම, ඉඩම් බෙදා දීම ගැනත් කල්පනා කරන්න ඕනැ. මේ ගරු ඇමතිතුමා, මෙම අංශය භාරව අවුරුදු 10 ක් පමණ කාලයක් සේවය කර තිබෙනව. එතුම, මේ රටේ මහා පරාක්‍රමබාහු එහෙම නැතිනම් මහසෙන් යන විරුදාවලිය ලබා ගන්න බොහොම මහන්සි ගන්නව. කවද හරි "මහසෙන්" යන නම "මහ සිල්වා" වෙන්න පුළුවනි. මේ, මහසෙන්ගෙන් නියම ප්‍රයෝජනයක් සැලසෙනවද කියන එකයි, බලන්න තියෙන්නෙ.

විශේෂයෙන්ම ඉඩම් දීම ගැන විශේෂ කොමිටියක් පත් කරන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනව. ඩී. එස්. සේනානායක අගමැතිතුමා මුලින්ම මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රටේ ඉඩම් පණතක් සකස් කරන විට—1933 දී පමණ—ගෙනිච්ච පළමුවන වැඩ පිළිවෙළ තමයි, දක්ෂ අයගෙන් සමන්විත කොමිෂන් එකක් පත් කර කොයි විධියටද ඉඩම් බෙදන්න ඕනෑ කියන ප්‍රශ්නය නිරාකරණය කර ගන්ට උත්සාහ කිරීම. ඒ අනුව අවසාන තීරණයක් අරගෙන තමයි, එතුම වැඩ කළේ.

තවත් එක කාරණයක් එතුමට මතක් කරන්න තියෙනවා. අපේ ප්‍රදේශවල ජනය, සෞඛ්‍ය පහසුකම් සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වන මධ්‍යසථානවලට යන්න ඕනෑ. අධ්‍යාපන පහසුකම් සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවත්වනු ලබන පාසල්වලට යන්න ඕනෑ. අනිකුත් පහසුකම් සඳහත් ඒ විධියයි. නමුත් එතුමගෙ කොළණිවලට විශෙෂ වරප්‍රසාද තියෙනවා. එතුමගෙ අමාත්‍යාංශයට මුදලින් ඒවයෙ විශාල පාඨශාලා හදනව; විශාල ඩිස්පෙන්සරි හදනව. එසේ කිරීම සාධාරණද ? එතුම සමහරවිට කියාවි, මේක "කොළනයිසේෂන්" වැඩ පිළිවෙළක් නිසා, වැව් යටතෙ කෙරෙන වැඩ කටයුතු නිසා, මේ විධියට කටයුතු කරන්න වුවමනාය කියා. අපෙත් ගම් පුළුල් කිරීමෙ ව්‍යාපාර තිබෙනව. ඇයි, එම පහසුකම් ඒවට නොදෙන්නෙ ? ඒව අසාධාරණ වැඩ බව පෙනී යන්න ඕනෑ.

අපි ඒ පළාත් දියුණු කිරීම ගැන සන්තෝෂ වෙනව. පොළොන්නරුව ප්‍රදේශය විශාල වශයෙන් දියුණු කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. අපි ඒ ගැන සන්තෝෂ වෙනව. ලක්ෂ 10 ක් පමණ වියදම් කර පොළොන්නරුවේ මහා විද්‍යාලය දියුණු කරනව. ඒ ගැන අපේ විරුද්ධත්වයක් ඇත්තෙ නැහැ. එවැනි වරප්‍රසාද අපටත් තියෙන්න ඕනෑ. මොකක් හරි වැඩ පිළිවෙළක් අනුව මේව කෙරෙන්න ඕනෑ. මෙවැනි තැනක පාඨශාලා ගොඩනැගිලක් සාදනව නම්, එය අධ්‍යාපන ඇමතිතුමාගෙන් අවසරය පිට එතුමගෙ මුදලටත් සම්බන්ධ කර ගනිමින් කටයුතු කරන්න ඕනෑ. ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ.

ඒ වගෙම ගම් පුළුල් කිරීමෙ ව්‍යාපාරය යටතෙත්, ගොවි ජනපද ව්‍යාපාරය යටතෙත්, ගෙවල් තැනීම සඳහා මුදල් දීමේ ප්‍රශ්නය ගැන විශෙෂයෙන්ම සොයා බලන ලෙස මා එතුමගෙන් ඉල්ලනව. මා නොයෙකුත් අවස්ථාවන්හිදී මේ ගැන එතුමට කියා තිබෙනව. අවුරුදු 2 ක් තුළ ගෙයක් හදන්න වෙලා තියෙනව. යමෙක් අත්තිවාරමක් දැම්මොත් ඊට පසු රුපියල් 150 ක් ලැබෙනව. බිත්ති මට්ටමට ගෙය බැන්දම නව මුදලක් ලැබෙනව. අවසානයෙදි තව රුපියල් දහක් ලැබෙනව. අවුරුදු 2 ක් තුළ මේ වැඩ කර අවසන් කළේ නැති නම් නියමාකාරයෙන් මුදල ලැබෙන්නෙ නැහැ. ඒක විශාල අසාධාරණයක්. වත්තේගම ගරු මන්ත්‍රීතුමාත් (පී. බී. ඒ. වීරකෝන් මයා.) මේ ගැන සඳහන් කළා. ගම් පළල් කිරීමේ ක්‍රමය යටතේ ඉඩම් ලබාගන්නා විට, ගෙවල් තැනීමේ ප්‍රශ්නය ගැනත් කල්පනා කර බලන්න ඕනෑ. එම නිසා විශේෂයෙන් මේ කාරණය ගැනත් තමුන්නාන්සේගේ සැලකිල්ල යොමු කරනවා ඇතැයි කියා මම විශ්වාස කරනව.

ඊ ළඟට, ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේගේ මාර්ගයෙන් මම අහන්න කැමතියි, මුසාජී කියන පුද්ගලයාට දුන්නු ඉඩම පිළිබඳව. එක්තරා තීරණයක් අරගෙන තිබෙනව තමුන්නාන්සෙලා මේ ධනේස්වර පැලැන්තියට ඉස්සෙල්ලා ඉඩම් දීලා, ඊට පසුව ගොවීන්ට ඉඩම් දීමේ—දෙවනුව වරප්‍රසාද දීමේ—ඩී. එස්. සේනානායක ප්‍රතිපත්තිය, නැවත වරක් ක්‍රියාත්මක කිරීමට. ඒ ප්‍රතිපත්තිය නැවතත් පටන් ගෙන තිබෙනව. නමුත් මුසාජීට මයියංගන ඡන්ද කොට්ඨාශයට අයත් ඉඩම් දුන්නෙ තමුන්නාන්සෙගෙ අවසර ඇතුවද කියා මේ අවස්ථාවේදි ප්‍රශ්නයක් අහන්න කැමතියි. දැනටමත් අක්කර 60 ක් පමණ එළිකර තිබෙනව, කාගෙන්වත් අවසරයක් නැතුව. ඒ වරප්‍රසාද අපටත් දෙනවාද ? සාමාන්‍ය ගොවියාටත් දෙනවද ? සාමාන්‍ය ගොවියාට කැලෑවක් අවසර ගන්නෙ නැතුව කොටවල හෝ කොටල වී, තල, මෙනේරි ආදිය වපුරා ගන්න, වගා කරන්න ඉඩ දෙනවද කියල තමුන්නාන්සෙගෙන් අහන්න කැමතියි. නමුත් එවැනි අවසරයක් දෙන්නෙ නැහැ. එහෙම නම් අවසරයක් නැතුව කැලෑවක් කොටා ගොවිතැන් කළාම සාමාන්‍ය ගොවියකු උසාවිය ඉදිරියට පමුණුවන්නා වාගේම මුසාජීත්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

උසාවියට ඉදිරිපත් කර දඬුවම් කරන්න ඕනෑ. එහෙම කළොත් අපේ විරුද්ධත්වයක් නැහැ.

ඒ සමගම කජු වැවීම සඳහාත් ඉඩම් දී තිබෙනව. සාමාන්‍ය ක්‍රමය අනුව, ඉඩම් කච්චේරි පවත්වා එසේ ඉඩම් බෙදා දෙන වාට මගේ විරුද්ධත්වයක් නැහැ. නමුත් දැනට ගෙන යන වැඩ පිළිවෙළ නිසා, මෙ රට ඉඩකඩම් විදේශිකයන් වාගේම ද්‍රවිඩ ජනතාව ක්‍රමානුකූලව අල්ලාගෙන යනව. තමුන්නාන්සේගේ අනුදැනුමක් නැතුව, ඇස් දෙකට පෙනෙන්නේ නැතුව, දැන් දැන් අපේ සිංහල ප්‍රදේශවලටත් ක්‍රමානුකූල ඇතුල් වීමේ වැඩ පිළිවෙළක් යොදා ගෙන යනව. මම අහනව, මන්නාරම ප්‍රදේශයේ අක්කර තුන් දහසක් බෙදා දී ඇත්තේ කොයි ආකාරයෙන්ද කියා තමුන්නාන්සෙ දන්නවද? ඉඩම් කච්චේරියක් පවත්වා අක්කර තුන් දහසක් බෙදා දුන්න. ඒ ගැන තමුන්නාන්සේගේ දැනගැනීම පිණිස ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න කැමතියි. 6 වන මාසයෙ 22 වනදා, මන්නාරම් කච්චේරියෙන් අක්කර තුන් දහසක් බෙදා දීම සඳහා ඉඩම් කච්චේරියක් පැවැත්වුව. නමුත් මෙම අක්කර තුන් දහසෙන් සිංහල ජනතාවට ලැබුණෙ අක්කර 250 ක් පමණයි.

තමුන්නාන්සෙ මේව ගැන දැනගන්න ඕනෑ. ඉදිරිපත් කරන කාරණා පිළිගන්න ඕනෑ. කාටද මේවා දීල තිබෙන්නෙ? මම ඒ අයගෙන්, සමහරකුගෙ නම් ඉදිරිපත් කරන්නම් තමුන්නාන්සෙගෙ දැනගැනීමට: අක්කර 600 ක් දීලා තිබෙනව අම්බලවාන කියන කෙනෙකුට. අක්කර 100 ක් දීලා තිබෙනව, "හේමාස් ඉන්ඩස්ට්‍රීස්" කියන ආයතනයකට. අක්කර 400 ක් දීලා තිබෙනව බී. එල්. ආන්දප්ප කාසිචෙට්ටි කියන අයට. අක්කර 25 බැගින් දීලා තිබෙනව තිල්ලරත්නම් සහ නඩරාජා කියන පුද්ගලයන්ට. අක්කර 75 බැගින් කදිරවේලු සහ නිකොලයි පිල්ලෙ කියන පුද්ගලයන්ට දී තිබෙනව. අක්කර 25 ක් රාජසිංහම් කියන පුද්ගලයාට දී තිබෙනව. මේ අතර සෙල්ලමුත්තු, තම්බයියා, සුබ්‍රමනියම්, සෝමසුන්දරම්, "යාල් කැජු ග්‍රෝවර්ස් ඇසෝසියේෂන්," වෙල්වනායම්, ගනේසරත්නම්, කන්දසාමි, මජිලි, "ඩොලර් කෝපරේෂන්," "ඇච්ලෙස් කෙමිකල්ස්," ජයරත්නම් ආදී වශයෙන්—පුද්ගලයන්ට සහ ආයතනයන්ට—ඉඩම් බෙදා දී තිබෙනව. මම සඳහන් කරන මේ පුද්ගලයන් කව්ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

"ඩොලර් කෝපරේෂන්" කියන්නෙ ඇමෙරිකානු සමාගමක්ද?

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

"ඩොලර් කෝපරේෂන්" කිව්වට ඇමෙරිකානු සමාගමක්ය කියල මම හිතන්නෙ නැහැ. ඒක ඉන්දියානුකාරයන්ට අයිති සමාගමක් වෙන්න පුළුවනි.

මම අහන්නෙ මේ විධියට ඉඩම් දෙන්නෙ ඇයි? ඒ සමගම තමුන්නාන්සෙගෙන් අහන්න කැමතියි, ත්‍රිකුණාමලයෙ ඉඩම් කච්චේරිය පවත්වා ඉඩම් දුන් ආකාරය ගැන. කන්තලේ සිටින සමහර සිංහල අයට ඉඩම් ලැබුණා, මෙම ඉඩම් කච්චේරියෙන්. නමුත් ඉන් පසු මොකද කළේ? ෆෙඩරල් පක්ෂය ඒ ගැන විරුඬත්වය ප්‍රකාශ කළායින් පස්සෙ, මෙම ඉඩම් කච්චේරිය අවලංගු කළා. එපමණක් නොවෙයි, මින් මත්තට ඉඩම් බෙදා දීමේදී ඒ ප්‍රදේශයේ සිටින ද්‍රවිඩ ජනතාවට පමණක් ඉඩම් දෙන්න ඕනෑය කියා තීරණය කළා. මම විරුද්ධත්වයක් නැහැ, ලංකාවෙ සිටින ද්‍රවිඩ ජනතාවට ඉඩම් බෙදා දීම ගැන. නමුත් සාධාරණයක් තිබෙන්න ඕනෑ. එක්කො ජනගහනය අනුව දෙන්න ඕනෑ. එහෙම නැත්නම් මොකක් හෝ සැලැස්මක් යටතෙ බෙදා දීමට තමුන්නාන්සෙ කටයුතු යොදන්න ඕනෑ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி. சில்வா)*
(The Hon. C. P. de Silva)

මන්නාරමෙ ඉඩම් කච්චේරියෙන් ඉඩම් දුන්නෙ ඉඩම් ඉල්ලපු අයටයි. යම් කෙනෙකු ඒ ගැන අප්‍රසාදයක් තිබෙනවා නම්, නීත්‍යානුකූලව කටයුතු කරන්නට කොමසාරිස්වරයාට බලය තිබෙනවා. යම් කිසි ඉඩම් කච්චේරියක් පැවැත්වුණොත්, ඒක නුසුදුසුයි කියල කොමසාරිස්වරයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැටහෙනවා නම්, ඒක අයින් කරන්න ඉඩම් කොමසාරිස්වරයාට නීතිය අනුව බලය තිබෙනවා. ත්‍රිකුණාමලයෙ ඉඩම් කච්චේරිය සම්බන්ධයෙන් කොමසාරිස් වරයා අනුගමනය කර තිබෙන්නෙ ඒ නීතියයි. යම්කිසි ඡන්ද කොට්ඨාශයක ඉඩම් බෙදා දෙනවා නම් පළමුවෙන් ඒ ඡන්ද කොට්ඨාශයේ අයට ඉඩම් දුන් නාට පස්සෙ පිට අයට ඉඩම් ලබාගන්න පුළුවනි. හැබැයි "මේජර් කොලනයිසේෂන් ස්කීම්" ඇර. එපමණයි ඒ ගැන කියන්න තිබෙන්නෙ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ඒ විධියෙ ප්‍රතිපත්තියක්, වැඩ පිළිවෙළක් තමුන්නාන්සෙ සෑම ඡන්ද කොට්ඨාශයකම අනුගමනය කරනවා නම් හොඳයි. නමුත් එහෙම දෙයක් මෙහි සිදු වී නැහැ. මන්නාරම් ප්‍රදේශයේ අක්කර සිය ගණන් පිටස්තර අයවලුන්ට—කොළඹ ඉන්න අයට පවා—දී තිබෙන බව තමුන්නාන්සෙ දන්නවද? ඒ ප්‍රදේශයේ අය ගැන ඉස්සෙල්ල සලකා බලා තිබෙනවද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඉස්සෙල්ල ඉල්ලපු අයට බෙදා දීලයි අනික් අයට දෙන්නෙ? මේ කාරණයෙදි දිසාපතිවරයා ඒ විධියට කටයුතු කරන්න ඇති.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

නමුත් එහෙම දීමෙන්, ඒ ප්‍රදේශයේ ඉඩකඩම් කාට කාට යනවාද කියා අප කාටවත් දැනගන්න ලැබෙන්නෙත් නැහැ. ඔය පිළිවෙළටම තමයි මේ රටේ ඉස්සර සුද්දොත් උඩරට වතුකරයෙ වැඩ කටයුතු කරගෙන ගියෙ. අවුරුදු සිය යක් පමණ ඔය පිළිවෙළටම වැඩ කර ගෙන යාම නිසා දැන් උඩරට වතුකරයේ මතු වී තිබෙන ප්‍රශ්න මොනවද කියා අමුතුවෙන් විස්තර කරන්න වුවමනා වක් නැහැ. ඉඩකඩම් බෙදා දීම සම්බන්ධයෙන් මන්නාරම ආදි ප්‍රදේශවල ගරු ඇමතිතුමා දැන් කරගෙන යන වැඩ පිළිවෙළ ඔය ආකාරයට තවත් අවුරුදු කීපයක් කර ගෙන ගියොත් සුද්දන්ගෙ කාලෙ කෙරුණු වැඩ නිසා උඩරට වතුකරයට වූ හානිකර තත්ත්වයට සමාන තත්ත්වයක් පහත රට ප්‍රදේශයෙත් ඇති වන බවට සැකයක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මන්නාරමේ විතරයි නේ, එහෙම ඉඩම් දීලා තියෙන්නෙ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

මන්නාරමේ පමණක් නොවෙයි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙත්, වෙනත් නොයෙක් ප්‍රදේශවලත් ඒ ආකාරයට ඉඩම් දීම කෙරෙනවා. ආරුගම්බොක්ක වැනි ප්‍රදේශවලත් ඉඩම් බෙදා දී තිබෙන බව අපට දැන ගන්න ලැබුණා. නොයෙක් ස්ථානවල මේ වැඩ පිළිවෙළ දැන් පටන් ගෙන තිබෙනවා. දැන් මහියංගනයෙත් පටන් අරන් තියෙනවා. මුසාජී කොම්පැනිය කොහොමද දැන් ඒ ඉඩම්වල ලී එහෙමත් කපාගෙන තිබෙන්නෙ?

ශ්‍රමදාන ව්‍යාපාරයෙන් කෙරෙන වැඩ ගැන ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ඒ වැඩ පිළිවෙළ තමුන්නාන්සෙගෙ අමාත්‍යාංශයටයි භාර වී තිබුණේ. දැන් එය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට භාර දී තිබෙනවද? මා බොහොම සන්තෝෂයෙන් මතක් කරන්න කැමතියි, ශ්‍රමදාන අංශයෙන් ලක්ෂ්මන් ද සිල්වා දොස්තර මහත්මයා වැනි අයගෙන් විශිෂ්ඨ සේවයක් සිදු වී තිබෙන බව. තමුන්නාන්සෙත් එය දන්නවා. පසුගිය අවුරුදු හතර හමාර ඇතුළත මා නියෝජනය කරන දිවුලපිටිය කොට්ඨාශය තුළ පමණක් රුපියල් ලක්ෂ නවයක පමණ වැඩ කරන්න ශ්‍රමදාන ව්‍යාපාරයෙන් හැකි වුණා. ඒකත් දැන් කඩාකප්පල් කරන්න යනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

නැහැ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ඒ අංශය තමුන්නාන්සෙ යටතෙම තබා ගන්නවද ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඔව්, තියා ගන්නව.

පූ. භා. 10.30

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

එය අසන්න ලැබීම ගැන මා සන්තෝෂ වෙනව. ඉඩම් ප්‍රශ්නය පිළිබඳ බර අනාගතයෙදි තමුන්නාන්සෙ කරට ගන්න ඕනෑ. ඉඩම් ප්‍රශ්නය කොයි විධියට විසඳන්න ඕනැද යන්න පිළිබඳ ප්‍රතිපත්තිය මේ රටේ ජනතාවට භාර දීමට කොමිසමක් තබන්න. වරින්වර ඉඩම් ප්‍රතිපත්තිය වෙනස් වෙන්න ඉඩ තිබෙනව. අපෙ පක්ෂය ආණ්ඩුව කරගෙන ගිය කාලෙ අපේ ඇමතිවරයා හැටියට ගෙන ගිය ඉඩම් ප්‍රතිපත්තියට වඩා වෙනස් ප්‍රතිපත්තියක් එක්සත් ජාතික පක්ෂයට යාමෙන් පසු එතුමා දැන් අනුගමනය කරනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

නැහැ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

තමුන්නාන්සෙ නැතෙයි කිව්වට මොකද, තමුන්නාන්සෙගෙ ක්‍රමය යටතේ එක් තරා පිරිසකට ඉඩම් දෙන්න ඕනෑය කියන ප්‍රතිපත්තියක් පසුගිය අවුරුද්දේ හෝ ඊට පෙර තමුන්නාන්සේ ඉදිරිපත් කළාද ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මන්නාරමේ කජු වැවීමට ඉඩම් දීම සඳහා ඉඩම් කච්චේරියක් පැවැත්වීමට දැන්වීම් ප්‍රසිද්ධ කළේ ආණ්ඩුව වෙනස් වීමට පෙරයි.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

ගරු මන්ත්‍රීතුමා දැන් සෑහෙන වෙලාවක් කථා කළා.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු සභාපතිතුමනි, මීට වඩා කථා කරන්න යන්නෙ නැහැ. ඉඩම් ප්‍රශ්නය සම්බන්ධයෙන් යම්කිසි ස්ථිර වැඩ පිළිවෙළක් යොදන ලෙස ඉල්ලනව.

**රාජා වෙලේගම මයා.** (මොනරාගල)
*(திரு. ராஜா வெலேகம—மொனறாகலை)*
(Mr. Raja Welegama—Monaragala)

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூ. 6,25,000

*Vote No. 2.—Administration charges—Recurrent expenditure, Rs. 625,000*

“56 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 6,25,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

56 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

“56 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 6,25,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

56 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, “That the sum of Rs. 625,000 for Head 56, Vote No. 2, be inserted in the Schedule”, put, and agreed to.*

*Head 56, Vote 2, ordered to stand part of the Schedule.*

6 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම, රු. 51,388

வாக்குப்பணம் இல. 6.—பொருளாதார அபிவிருத்தி மீண்டுவருஞ் செலவு, ரூபா 51,388

*Vote No. 6.—Economic Development—Recurrent Expenditure, Rs. 51,388*

“56 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය සඳහා රු. 51,388 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය”, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

56 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

“56 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் ரூபா 51,388 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

56 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, “That the sum of Rs. 51,388 for Head 56, Vote No. 6, be inserted in the Schedule”, put, and agreed to.*

*Head 56, Vote 6, ordered to stand part of the Schedule.*

7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 1,65,00,000

வாக்குப்பணம் இல. 7.—பொருளாதார அபிவிருத்தி ஆக்கப்பொருட் செலவு, ரூபா 1,65,00,000

*Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 16,500,000*

“56 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 1,65,00,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

56 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

“56 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் ரூபா 1,65,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

56 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, “That the sum of Rs. 16,500,000 for Head 56, Vote No. 7, be inserted in the Schedule”, put, and agreed to.*

*Head 56, Vote 7, ordered to stand part of the Schedule.*

## 57 වන ශීර්ෂය.—ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩි නඩි සහ අනිකුත් දීමනා, රු. 3,98,158

தலைப்பு 57.—காணி நிர்ணயத் திணைக்களம்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 3,98,158

HEAD 57.—LAND SETTLEMENT DEPARTMENT

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 398,158*

“57 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 3,98,158 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

57 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

“57 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 3,98,158 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

57 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, “That the sum of Rs. 398,158 for Head 57, Vote No. 1, be inserted in the Schedule”, put, and agreed to.*

*Head 57, Vote 1, ordered to stand part of the Schedule.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන කෙටුම්පත් පනත, 1965-66

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්, රු. 50,700

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டு வரும் செலவு, ரூ. 50,700

*Vote No. 2.—Administration charges—Recurrent expenditure, Rs. 50,700*

"57 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 50,700 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

57 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"57 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 50,700 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

57 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 50,700 for Head 57, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 57, Vote 2, ordered to stand part of the Schedule.*

58 වන ශීර්ෂය.—මිනින්දෝරු දෙපාර්තමේන්තුව

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩි නඩි සහ අනිකුත් දීමනා, රු. 86,04,505

*தலைப்பு 58.—நில அளவைத் திணைக்களம்*

வாக்குப்பணம் இல. 1—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 86,04,505

HEAD 58.—SURVEY DEPARTMENT

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 8,604,505*

"58 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 86,04,505ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

—කාරක සභාව

58 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"58 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா. 86,04,505 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

58 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 8,604,505 for Head 58, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 58, Vote 1, ordered to stand part of the Schedule.*

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්, රු. 1,36,21,716

வாக்குப்பணம் இல. 2—பரிபாலனச் செலவுகள்—மீண்டு வரும் செலவு, ரூ. 1,36,21,716

*Vote No. 2.—Administration charges—Recurrent expenditure, Rs. 13,621,716*

"58 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 1,36,21,716ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

58 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"58 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா. 1,36,21,716 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

58 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 13,621,716 for Head 58, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 58, Vote 2, ordered to stand part of the Schedule.*

3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු 30,000

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 30,000

*Vote No. 3.—Administration Charges—Capital Expenditure, Rs. 30,000*

"58 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 30,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

58 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"58 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 30,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

58 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப் பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 30,000 for Head 58, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.*

*Head 58, Vote 3, ordered to stand part of the Schedule.*

6 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම, රු. 1,00,000

வாக்குப்பணம் இல. 6.—பொருளாதார அபிவிருத்தி—மீண்டுவருஞ் செலவு, ரூபா 1,00,000

*Vote No. 6.—Economic Development—Recurrent Expenditure, Rs. 100,000*

"58 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය සඳහා රු. 1,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

58 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"58 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் ரூபா 1,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

58 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 100,000 for Head 58, Vote No. 6, be inserted in the Schedule", put, and agreed to.*

*Head 58, Vote 6, ordered to stand part of the Schedule.*

## 59 වන ශීර්ෂය.—කැලෑ දෙපාර්තමේන්තුව

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 22,16,814

தலைப்பு 59.—காட்டுத் திணைக்களம்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் படிகளும்—ரூபா 22,16,814

HEAD 59.—FOREST DEPARTMENT

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 2,216,814*

"59 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 22,16,814ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

59 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"59 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 22,16,814 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

59 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 2,216, 814 for Head 59, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 59, Vote 1, ordered to stand part of the Schedule.*

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්, රු. 4,30,561

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டு வரும் செலவு, ரூ. 4,30,561

*Vote No. 2.—Administration charges—Recurrent expenditure, Rs. 430,561*

"59 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 4,30,561ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

59 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"59 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 4,30,561 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

59 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 430,561 for Head 59, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 59, Vote 2, ordered to stand part of the Schedule.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

6 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම, රු. 1,02,000

வாக்குப்பணம் இல. 6.—பொருளாதார அபிவிருத்தி மீண்டுவருஞ் செலவு, ரூபா 1,02,000

*Vote No. 6.—Economic Development—Recurrent Expenditure, Rs. 102,000*

"59 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය සඳහා රු. 1,02,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

59 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"59 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் ரூபா 1,02,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

59 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 102,000 for Head 59, Vote No. 6, be inserted in the Schedule", put, and agreed to.*

*Head 59, Vote 6, ordered to stand part of the Schedule.*

7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 32,00,000

வாக்குப்பணம் இல. 7.—பொருளாதார அபிவிருத்தி—ஆக்கப்பொருட் செலவு, ரூபா 32,00,000

*Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 3,200,000*

"59 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 32,00,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

59 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උප ලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"59 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் ரூபா 32,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

59 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 3,200,000 for Head 59, Vote No. 7, be inserted in the Schedule", put, and agreed to.*

*Head 59, Vote 7, ordered to stand part of the Schedule.*

## 60 වන ශීර්ෂය.—වාරි මාර්ග දෙපාර්තමේන්තුව

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 23,61,290

*தலைப்பு 60.—நீர்ப்பாசனத் திணைக்களம்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 23,61,290

## HEAD 60.—IRRIGATION DEPARTMENT

*Vote No. 1.—Personal emoluments and other allowances of staff Rs. 2,361,290*

"60 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 23,61,290 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

60 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"60 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 23,61,290 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

60 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 2,361,290 for Head 60, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 60. Vote 1, ordered to stand part of the Schedule.*

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 6,55,710

வாக்குப்பணம் இல. 1.—பரிபாலனச் செலவுகள்—மீண்டு வரும் செலவு, ரூ. 6,55,710

*Vote No. 2.—Administration charges—Recurrent expenditure, Rs. 655,710*

"60 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 6,55,710 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

60 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"60 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 6,55,710 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

60 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 655,710 for Head 60, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 60, Vote 2, ordered to stand part of the Schedule.*

3——ආර් 8499 (65/9)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

6 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම, රු. 1,33,41,819

வாக்குப்பணம் இல. 6.—பொருளாதார அபிவிருத்தி—மீண்டுவருஞ் செலவு, ரூபா 1,33,41,819

*Vote No. 6.—Economic Development—Recurrent Expenditure Rs. 13,341,819*

"60 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය සඳහා රු. 1,33,41,819 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

60 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"60 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் ரூபா, 1,33,41,819 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

60 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 13,341,819 for Head 60, Vote No. 6, be inserted in the Schedule", put, and agreed to.*

*Head 60, Vote 6, ordered to stand part of the Schedule.*

7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 3,00,00,000

வாக்குப்பணம் இல. 7.—பொருளாதார அபிவிருத்தி—ஆக்கப்பொருட் செலவு, ரூபா 3,00,00,000

*Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 30,000,000*

"60 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 3,00,00,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

60 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"60 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் ரூபா. 3,00,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

60 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 30,000,000 for Head 60, Vote 7, be inserted in the Schedule", put, and agreed to.*

*Head 60, Vote 7, ordered to stand part of the Schedule.*

## 61 වන ශීර්ෂය.—තක්සේරු දෙපාර්තමේන්තුව

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 10,72,755

தலைப்பு 61.—விலைமதிப்புத் திணைக்களம்

வாக்குப்பணம் இல. 1—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும் ரூபா 10,72,755

## HEAD 61.—VALUATION DEPARTMENT

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 1,072,755*

"61 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 10,72,755 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

61 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"61 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 10,72,755 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

61 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 1,072,755 for Head 61, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 61, Vote 1, ordered to stand part of the Schedule.*

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්, රු. 2,33,180

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூ. 2,33,180

*Vote No. 2.—Administration charges—Recurrent expenditure, Rs. 233,180*

"61 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 2,33,180 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

61 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

" 61 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 2,33,180 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

61 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, " That the sum of Rs. 233,180 for Head 61, Vote 2, be inserted in the Schedule ", put, and agreed to.

Head 61, Vote 2, ordered to stand part of the Schedule.

## 62 වන ශීර්ෂය.—ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩි නඩි සහ අනිකුත් දීමනා, රු. 9,67,208**

*தலைப்பு 62.—காணி அபிவிருத்தித் திணைக்களம்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 9,67,208

## HEAD 62.—LAND DEVELOPMENT DEPARTMENT

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 967,208*

" 62 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 9,67,208 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

62 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" 62 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 9,67,208 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

62 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, " That the sum of Rs. 967,208 for Head 62, Vote No. 1, be inserted in the Schedule ", put, and agreed to.

Head 62, Vote 1, ordered to stand part of the Schedule.

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්, රු. 73,693**

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டு வரும் செலவு, ரூ. 73,693

*Vote No. 2.—Administration charges—Recurrent expenditure, Rs. 73,693*

" 62 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 73,693 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

62 ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

" 62 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 73,693 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

62 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, " That the sum of Rs. 73,693 for Head 62, Vote No. 2, be inserted in the Schedule ", put, and agreed to.

Head 62, Vote 2, ordered to stand part of the Schedule.

**3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 38,282**

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 38,282

*Vote No. 3.—Administration Charges—Capital Expenditure, Rs. 38,282*

" 62 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 38,282 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

62 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උප ලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" 62 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 38,282 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

62 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப் பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, " That the sum of Rs. 38,282 for Head 62, Vote No. 3, be inserted in the Schedule ", put, and agreed to.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*Head 62, Vote 3, ordered to stand part of the Schedule.*

**6 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම, රු. 43,04,949**

வாக்குப்பணம் இல. 6.—பொருளாதார அபிவிருத்தி, மீண்டுவருஞ் செலவு, ரூபா 43,04,949

*Vote No. 6.—Economic Development—Recurrent Expenditure, Rs. 4,304,949*

"62 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය සඳහා රු. 43,04,949 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

62 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"62 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் ரூபா 43,04,949 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

62 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 4,304,949 for Head 62, Vote No. 6, be inserted in the Schedule", put, and agreed to.*

*Head 62, Vote 6, ordered to stand part of the Schedule.*

**7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 1,88,79,755**

வாக்குப்பணம் இல. 7.—பொருளாதார அபிவிருத்தி ஆக்கப்பொருட் செலவு, ரூபா 1,88,79,755

*Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 18,879,755*

"62 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 1,88,79,755 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

62 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"62 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் ரூபா 1,88,79,755 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

62 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 18,879,755 for Head 62, Vote No. 7, be inserted in the Schedule", put, and agreed to.*

*Head 62, Vote 7, ordered to stand part of the Schedule.*

## 63 වන ශීර්ෂය.—විදුලි දෙපාර්තමේන්තුව (වාණිජ ව්‍යාපාරික කටයුතු)

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 57,81,362**

*தலைப்பு 63.—மின்சக்தி திணைக்களம் (வர்த்தக மயமாக்கப்பட்ட முயற்சி)*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 5,781,362

## HEAD 63.—ELECTRICAL DEPARTMENT (COMMERCIALIZED ACTIVITIES)

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 5,781,362*

"63 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 57,81,362 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

63 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"63 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 57,81,362 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

63 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 5,781,362 for Head 63, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 63, Vote 1, ordered to stand part of the Schedule.*

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 4,80,97,725**

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டு வரும் செலவு, ரூ. 4,80,97,725

*Vote No. 2.—Administration charges—Recurrent Expenditure, Rs. 48,097,725*

"63 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 4,80,97,725 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

63 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"63 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 4,80,97,725 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

63 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 48,097,725 for Head 63, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 63, Vote 2, ordered to stand part of the Schedule.*

**3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 5,50,000**

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 5,50,000

*Vote No. 3.—Administration charges—Capital Expenditure, Rs. 550,000*

"63 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 5,50,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

63 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"63 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 5,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

63 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 550,000 for Head 63, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.*

*Head 63, Vote 3, ordered to stand part of the Schedule.*

**7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 4,50,00,000**

வாக்குப்பணம் இல. 7.—பொருளாதார அபிவிருத்தி ஆக்கப்பொருட் செலவு, ரூபா 4,50,00,000

*Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 45,000,000*

"63 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 4,50,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

63 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"63 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் ரூபா. 4,50,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

63 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 45,000,000 for Head 63, Vote No. 7, be inserted in the Schedule", put, and agreed to.*

*Head 63, Vote 7, ordered to stand part of the Schedule.*

## 64 වන ශීර්ෂය.—විදුලි දෙපාර්තමේන්තුව (වාණිජ ව්‍යාපාරික නොවන කටයුතු)

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 79,800**

*தலைப்பு 64.—மின்சக்தித் திணைக்களம் (வர்த்தகமயமாக்கப்படாத முயற்சி)*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 79,800

HEAD 64.—ELECTRICAL DEPARTMENT (NON-COMMERCIALIZED ACTIVITIES)

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 79,800*

"64 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 79,800 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

64 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"64 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 79,800 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

64 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 79,800 for Head 64, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 64, Vote 1, ordered to stand part of the Schedule.*

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්, රු. 47,81,150**

வாக்குப்பணம் இல. 2.—பரிபாலச் செலவுகள்—மீண்டு வரும் செலவு, ரூபா 47,81,150

*Vote No. 2.—Administration charges—Recurrent Expenditure, Rs. 4,781,150*

"64 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 47,81,150 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

64 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"64 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 47,81,150 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

64 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 4,781,150 for Head 64, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 64, Vote 2, ordered to stand part of the Schedule.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 17,00,000

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 17,00,000

*Vote No. 3.—Administration charges—Capital Expenditure, Rs. 1,700,000*

"64 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 17,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

64 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"64 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 17,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

64 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 1,700,000 for Head 64, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.*

*Head 64, Vote 3, ordered to stand part of the Schedule.*

70 වන ශීර්ෂය.—ස්වදේශ කටයුතු අමාත්‍යවරයා

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 4,11,638

1 වන උප ශීර්ෂය.—සේවක සංඛ්‍යා සහ වැටුප්, රු. 2,49,821

*தலைப்பு 70.—உள்நாட்டு அலுவல்கள் அமைச்சர்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 4,11,638

உப தலைப்பு 1.—ஊழியர் கோப்பும் சம்பளங்களும், ரூபா 2,49,821

HEAD 70.—MINISTER OF HOME AFFAIRS

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 411,638*

*Sub-head 1.—Cadre and salaries, 249,821*

එල්. සී. ද සිල්වා මයා.
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

I move,

"That the Vote be reduced by Rs. 10 in respect of Sub-head 1, item 'Minister'".

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කරුණු කීපයක් පෙන්වා දීමට මම අදහස් කරනවා. ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ඇති කර තිබෙන ගෘහ කර්මාන්ත ගැන කරුණු කීපයක් පළමුවෙන්ම පෙන්වා දෙන්න ඕනෑ. පසු ගිය ආණ්ඩුවේ මෙහෙයවීමෙන් බලපිටිය, දොඩන්දූව සහ මාතර යන ස්ථාන තුනේ කොහු කර්මාන්ත ශාලා තුනක් ආරම්භ කරන්න යෙදුණා. ඒවා ආරම්භ කර දැනට අවුරුදු 6 ක් ගතවී ඇතත්, කොහු කර්මාන්තයේ යෙදී සිටින දහස් ගණන් ජනතාවට ඉන් කිසිම සහනයක් සිදු වී නැත යනු මගේ හැඟීමයි. බලපිටියේ කර්මාන්තශාලාව ආරම්භ කළ අවදියේදී ඒ කර්මාන්තශාලාවේ 20 දෙනෙක් පමණ සේවය කළා. ඒ සංඛ්‍යාව 1962 වන විට 35 දෙනෙක් දක්වා වැඩි වුණා. නමුත් ඒ කර්මාන්තශාලාවේ පාලක මහතාගේ අදක්ෂතාවය නිසා එහි වැඩ කරන සේවකයන්ගේ ගණන අද 4 කට බැස තිබෙනව. මේ 4 දෙනාට මාසෙකට රුපියල් 40 ක වේතනයක්වත් ලබා ගන්නට පුළුවන් කමක් නැහැ. ඒ වාගේම ඒ කර්මාන්තශාලාවේ නිපදවන ද්‍රව්‍ය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ඒ අවට ප්‍රදේශයෙන්ම ලබා ගැනීමට වැඩ පිළිවෙළක් ආරම්භ කර නැහැ. දැනට මෙම කර්මාන්තශාලාවේ සාදන්නේ corridor mattresses කියන පාපිසි වර්ගය පමණයි. ඒ පාපිසිවලට අවශ්‍ය ලණු මාතරින් සහ දොඩන්දූවෙන් ගෙන ඒමට පුරුද්දක් ඇති කර ගෙන තිබෙනව. නමුත් බලපිටිය ප්‍රදේශයේ කොහු කර්මාන්තයේ යෙදී සිටින දහස් ගණනක් උදවිය තමන්ගේ ලණු අලෙවි කර ගැනීමට විධියක් නැතිව ළතැවෙනව. බලපිටියේ තිබෙන කර්මාන්තශාලාවට දොඩන්දූවෙන් සහ මාතරින් ලණු ගෙන්වන්නට කිසිම වුවමනාවක් නැහැ. මම හිතනවා ඒ බව ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇත කියා.

පූ. භා. 11.30

ලණු සායම් කිරීමටත් ඇඹරීමටත් අවශ්‍ය උපකරණ මෙම කර්මාන්තශාලාවේ තිබෙනව. නමුත් ඒවා පාවිච්චියට නොගැනීම නිසා දැන් ඒ යන්ත්‍ර දිරාපත් වී ගෙන යනව. මෙම කර්මාන්ත ශාලාව නඩත්තු කිරීම සඳහා දෙපාර්තමේන්තුවෙන් වියදම් කරන මුදලවත් ලබා ගැනීමට පුළුවන් කමක් නැති තත්ත්වයකිනුයි අද එහි කට යුතු පවතින්නෙ. මේ කාරණය ගැන වරින් වර බලපිටිය කොට්ඨාශය නියෝජනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළ ගරු මන්ත්‍රීවරු එවකට ස්වදේශ කටයුතු භාරව සිටි ඇමතිවරුන් වෙත කරුණු සැලකර ඇතත්, කොහු කර්මාන්තයේ යෙදී සිටින ඒ දහස් ගණන් ජනතාවට කිසිම යහපතක් සලස්වා දීමට මෙතෙක් කිසිම පියවරක් ගෙන නැති බව කණගාටුවෙන් ප්‍රකාශ කළ යුතුව තිබෙනව. එම නිසා මම ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මෙම තත්ත්වය මගහරවා බලපිටියේ කර්මාන්ත ශාලාව දියුණු තත්ත්වයකට ගෙන ඒමට වැඩ පිළිවෙළක් යොදන්නය කියා. මට දැනගන්න ලැබී තිබෙන හැටියට ඒ කර්මාන්ත ශාලාවෙ සිය දෙනෙකුට පමණ රක්ෂා සපයන්න පුළුවන්. ඒ වාගේම ඒ අවට ප්‍රදේශයේ ගෘහ කර්මාන්ත වශයෙන් නිපදවන ලනු සියල්ලම ඒ කර්මාන්ත ශාලාව මගින් අරගෙන බඩු නිපදවන්න පුළුවන්. ඒ නිසා ඒ ගැන විශෙෂ සැලකිල්ලක් දක්වා මේ ප්‍රශ්නය නිරාකරණය කර දෙන්නය කියා ගරු ඇමතිතුමාගෙන් ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනව.

අනිත් කාරණය රෙදි වියන කර්මාන්ත ශාලා ගැනයි. ශ්‍රී ලංකා පේශ කාර්මිකයින්ගේ සමුපකාර සමිතියෙන් මෙහෙයවනු පේශ කර්මාන්ත ශාලාවක් බලපිටියේ තිබෙනව. දෙපාර්තමේන්තුවෙ නියෝජ්‍ය අධ්‍යක්ෂ මහත්මයෙක් එහි සභාපති වශයෙන් පත් වී සිටිනව. මෙම කර්මාන්ත ශාලාව ආරම්භ කිරීමේදී තවත් ශාඛා දෙකක් බලපිටිය කොට්ඨාශයේම—ඌරගස් මන් හන්දියේත්, වතු ගෙදරත්—ඇති කිරීමට වැඩ පිළිවෙළක් තිබුණ. ඌරගස් මං හන්දියේ පිහිටුවන්නට බලාපොරොත්තු වුණු ශාඛාව් තාවකාලිකව නවත්වා තිබෙන බවත් වතුගෙදර ශාඛාව නම් ළඟදී ආරම්භ කරන බවත් ඒ කර්මාන්ත ශාලාවේ පාලකයන්ගෙන් මට දැන ගන්ට ලැබුණා. ඌරගස් මං හන්දියේ ඒ යෝජිත ශාඛාවත් එසේම ආරම්භ කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය ජූලි 24 වැනිදා "දවස" පත්‍රයේ වාර්තාවක් තියෙනව. ඒ වාර්තාව කොයි තරම් දුරට ඇත්තද කියා මම දන්නෙ නැහැ. බලපිටියේ හිටපු මන්ත්‍රීතුමත්, තවත් පිරිසකුත් ගරු ඇමතිතුමා මුණ ගැසීමට ගොස් ඌරගස් මං හන්දියේ රෙදි මුද්‍රිත වැඩ පොළක්—වඩු කර්මාන්ත ශාලාවක්—ඇති කරන ලෙස ඉල්ලා සිටි බවත්, ගරු ඇමතිතුමා ඒ වැඩපොළ ඇති කිරීමට පොරොන්දු වූ බවත් ඒ පත්‍රයේ වාර්තා කර තිබුන. කව්රුන් ඉල්ලා හෝ ඒ වැඩ පොළ ඇති කිරීමට ගරු ඇමතිතුමා එකඟ වුනා නම් ඒ ගැන මම සන්තෝෂ වෙනව. නමුත් ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයා හැටියට මා ගරු ඇමතිතුමාට මතක් කරන්නට සතුටුයි, එවැනි පොරොන්දු වන විට අපේ දැන ගැනීමටත් ඒ කරුණු ඉදිරිපත් කරනවා නම් එය ඉතාමත් සුදුසු බව.

ගරු සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන සමිති ගැනත් වචනයක් නොකියාම බැහැ. ග්‍රාම සංවර්ධන සමිතිවලින් මෙතෙක් සැහෙන සේවයක්—මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු තරමේ සේවයක්—ඉටු වී නැති බව කව්රුත් පිළිගන්න කරුණක්. මීට ප්‍රධාන හේතුව වී තිබෙන්නේ ග්‍රාම සංවර්ධන සමිති පාලනය කරන ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ උදාසීනත්වය බව මට කියන්නට පුළුවනි. ග්‍රාම සංවර්ධන නිලධාරීන් ඔවුන්ගේ පෞද්ගලික අදහස් උඩ නොයෙක් කටයුතුවලට මේ සමිති යොමු කරවා ගැනීමට උත්සාහ කරනව මිස මේ සමිති ග්‍රාමීය දියුණුව සඳහා යෙදවීමට සුදුසු වැඩ පිළිවෙළක් ආරම්භ කර නැහැ. ගමක දියුණුව සඳහා වැඩක් කිරීමට බලාපොරොත්තු වන සමිතියක් ඇති වුණු අවස්ථාවකදී ඒ සමිතිය ලියා පදිංචි නොකර ඒ සමිතියට නොයෙක් හිරිහැර ඇති කිරීම මේ දෙපාර්තමේන්තුවේ සිරිත බව මට කියන්නට පුළුවන්. විවිධ දේශපාලන මත ධාරීන් එකම ග්‍රාමසංවර්ධන සමිතියක ඉන්නට පුළුවන්. ඒ නිසා ග්‍රාම සවංර්ධන සමිති දේශපාලනයෙන් තොර සමිති හැටියට සලකන්නට ඕනෑ. එසේ සලකා ග්‍රාමසංවර්ධන සමිති හැකි පමණ ඉක්මනින් ලියාපදිංචි කරන ලෙස ග්‍රාම සංවර්ධන නිලධාරීන්ට නියෝගයක් නිකුත් කර ඒ සමිති ලියාපදිංචි කරන්නට සලස්වා ඒ සමිතිවලින් ලබා ගන්නට පුළුවන් සේවය ලබා ගන්නා ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

නොතාරිස් ලිපිකරුවන් පිළිබඳ ප්‍රශ්නයකුත් ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කරවන්නට කැමතියි. අද පවතින

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. සී. ද සිල්වා මයා.]

ක්‍රමය අනුව, නොතාරිස් ලිපිකරුවන් ගෙන් අවුරුදු 5ක හෝ ඊට වැඩි කාලයක සේවයක් තිබෙන අයට ඒ විභාගයට පෙනී සිටීමට ඉඩ දීමටත්, තිබෙන ඇබෑර්තු ප්‍රමාණයෙන් එක්තරා ගණනක් ඔවුන් සඳහා වෙන් කිරීමටත් වැඩ පිළි වෙළක් තියෙනව. සාමාන්‍යයෙන් දැන් බොහොම උගත් තරුණයන් නොතාරිස් ලිපිකරුවන් හැටියට බැඳෙන නිසා අවුරුදු 15 කට අධික කාලයක් නොතාරිස් ලිපි කරුවන් හැටියට සිටි උදවියට ඒ අය සමග තරඟ කර මේ විභාගයෙන් ස්ථානයක් ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා අවුරුදු 15 කට වැඩි සේවයක් ඇති නොතාරිස් ලිපිකරුවන් නොතාරිස් ප්‍රාරම්භ විභාගයෙන් නිදහස් කර විභාග යට ඉදිරිපත් කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මම ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනව.

එක්සයිස් දෙපාර්තමේන්තුවේ ප්‍රති පත්තිය කුමක්ද යන්නත් ගරු ඇමති තුමාගෙන් දැන ගන්න කැමතියි. මේ රජය බලයට පත් වූ අළුතම අපට පත්‍ර මාර්ගයෙන් දැන ගන්නට ලැබුනා, දුම්රිය භෝජනාගාරයේ පැවැත්වෙන මත්පැන් වෙළඳාම පවා නැවැත්වීමට වැඩ පිළිවෙ ළක් සකස් කරනවය කියා. එහෙත් අපට පෙනී යනව, නොයෙක් පළාත්වල සමාජ ශාලාවලට—ක්ලබ්වලට—මත්පැන් තබා ගැනීමට දැන් අවසර දීගෙන යන බව. අම්බලන්ගොඩ නගරය මෑත ඉතිහාසයේ එවැනි කිසිවක් නොතිබුණු නගරයක්. දැන් ඒ නගරයේත් ප්‍රසිද්ධ වෙළඳ පොළ ඉදිරිපිට සමාජශාලාවකට අවසර පත්‍රයක් දී තිබෙනව, මත්පැන් තබා ගැනීමට. මා ගරු ඇමතිතුමාට කියන්නෙ, සමාජශාලා වලට මත්පැන් තබා ගැනීමට ඉඩ දෙන්ට එපා කියා නොවෙයි. මත්පැන් තබා ගැනී මට අවසර දෙන්ට කලින්, ඒවා මොන විධියේ සමාජ ශාලා දැයි පරීක්ෂා කර බලා අවසර පත්‍ර නිකුත් කරන ලෙසයි මා ඉල්ලා සිටින්නෙ. මත්පැන් තබා ගැනී මට අවසරදී තිබෙන අම්බලන්ගොඩ නගර යේ තිබෙන මෙම සමාජ ශාලාව ආරම්භ වුණේ, මත්පැන්වලට අවසර දුන්නාට පසුවයි. ඕනෑම කෙනෙකුට එහි ගිහින් සාමාජික ගාස්තුව වශයෙන් සත 25 ක් 50 ක් ගෙවා මත්පැන් ලබා ගන්ට පුළුවන්. කිසිම තහමනක් නැහැ. ඒ නිසා මේ ගැන ටිකක් කල්පනාකාරී වන ලෙස ගරු ඇමතිතුමාට මතක් කරන්ට සතුටුයි. සාමාන්‍යයෙන් තැබෑරුමෙන් අරක්කු ලබා ගෙන බීමට පුරුදුව සිටි අයට අද සුදු අරක්කු බෝතලයක් අරගෙන බොන්ට නැහැ. මන්ද? මාසයෙ මුලදීම සුදු අරක්කු ටික සමාජ ශාලාවලට ගෙන ගිහින්. මේ විධි යට අවසර පත්‍ර නිකුත් කළාම, මාසය මුල දීම සුදු අරක්කු ටික සමාජ ශාලාවලට ගෙන ගියායින් පසු තැබෑරුම්වල වෙළඳා මට සුදු අරක්කු නැතිව යනව. ඒ ප්‍රදේ ශයේ එකම තැබෑරුමකවත් මාසයේ 2 වැනිදාට පසු සුදු අරක්කු බෝතලයක් ගන්න නැහැ. මා පෙන්වා දුන්නෙ මේ විධියට අවසර පත්‍ර දීම නිසා ඒ ප්‍රදේශයේ ඇති වී තිබෙන තත්ත්වයයි. මේ ගැන යම්කිසි වැඩ පිළිවෙළක් යොදන මෙන් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව.

ගරු සභාපතිතුමනි, ග්‍රාම සේවය ගැනත් වචනයක් කියයුතුව තිබෙනව. පසුගිය මැතිවරණ සමයේදී විරුද්ධ පක් ෂවල අපේක්ෂකයින ට වැඩ කළාය කිය න චෝදනාව උඩ සමහර ග්‍රාම සේවක මහතුන්ට නොයෙක් හිරිහැර විඳින්ට සිදු වී තිබෙනව. මා දන්නව, මඩකුඹුර ග්‍රාම සේවක මහත්මයාට දවස් 10 ක් ඇතුළත මාරුවීම් 12 ක් දී තිබෙන බව. අපි නම් ග්‍රාම සේවක මහතුන්ට විරුද් ධව චෝදනා කළේ නැහැ. එහෙත් මගේ ආසනයේ සිටින ග්‍රාම සේවකයින් හැම දෙනාම වගේ ශ්‍රී ලංකා නිදහස් සමාජ වාදී පක්ෂයටයි—ඉඩම් ඇමතිතුමාගෙ පක්ෂයටයි—බොහොම ඕනෑකමින් වැඩ කෙළේ. මෙවැනි චෝදනා උඩ ග්‍රාම සේව ක මහත්වරුන් එහාට මෙහාට මාරු කරන්ට සිද්ධ වෙනව නම්, දැනට සිටින අය ඕනෑ තැනකට යවා ඒ උදවිය බල පිටිය ආසනයට එවන්ට කියා ගරු ඇමති තුමාගෙන් ඉල්ලා සිටින්ට කැමතියි. මැතිවරණයෙන් පසු බලපිටිය ප්‍රදේශයේ ග්‍රාම සේවකයින්, මැතිවරණයෙදී අපට සහයෝගය දුන් හැම කෙනෙකුගෙන් ම වගේ පලිගැනීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනව. මහජන ආධාර යක් සඳහා කරන ලද ඉල්ලීමක් වාර්තා කිරීමට ආ අවස්ථාවක, ජනපදයක වාසය කරන ජනපද වැසියෙකුට යම්කිසි ප්‍රශ් නයක් ඇති වූ අවස්ථාවක, මේ ආදී හැම අවස්ථාවකදීම ඔවුන්ගෙන් පලිගැනීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැනට මාස කීපයකට පෙර මගේ පළාතේ දුප්පත් කම්මල්කරුවකුගේ කම්මලක් ජල ගැල්මකින් හානියට පත් වුණා. ඔහුට ආධාරයක් ලබා දෙන ලෙස ගාලු දිසාපතිතුමාට මා දැනුම් දුන්නා. ඊට මාස ගණනකට පසු මට අම්බලන්ගොඩ ආදායම් පාලක නිලධාරිතුමාගෙන් පිළිතුරක් ආව, දැනට පවතින නීති අනුව ඔහුට යම්කිසි මුදලක් ගෙවනට පුළුවන්කමක් නැත කියා. දැනට පවතින නීති මොනවාදැයි මා ප්‍රශ්න කළ විට මට දැනුම් දුන්න, විපතට පත් තැනැත්තාගේ මාසික ආදායම රුපියල් 100 කට වැඩි නිසා ආධාර මුදලක් ගෙවන්ට බැරිය කියා. ඒ දුප්පත් මනුෂ්‍යයාට මාසෙකට රුපියල් 50 කවත් ආදායමක් තිබෙනවාදැයි ඔප්පු කර පෙන්වන ලෙස මා ප්‍රාදේශීය ආදායම් නිලධාරියාට අභියෝග කළා. ඔහු ඉතාමත් වයසක මනුෂ්‍යයෙක්. ඔහුට මාසෙකට අලවංගු දෙකක්වත් තළන්නට බැහැ. දැන් අලවංගු තීරු බද්ද අඩු කර තිබෙන නිසා ඔහුට ලැබෙන ආදායම තවත් අඩු වෙනවා. සාමාන්‍යයෙන් ඔහුට මාසෙකට රුපියල් 10ක් 15ක් ආදායම තිබෙනවා. නමුත් ග්‍රාම සේවක මහතාගේ පලිගැනීමේ වැඩ පිළිවෙළ නිසා මේ වනතුරු ඔහුට අර ආධාරය ලබා ගන්නට බැරි වුණා. ග්‍රාම සේවක මහතුන් තම ගම් ප්‍රදේශවල රැකියාවෙහි නියුක්ත කර වීම සුදුසු නැහැ. ගම් ප්‍රදේශවල සිටීමෙන් නොයෙකුත් කරදර ඇති වෙනවා. දිස්ත්‍රික්කය තුළ මාරු කරන්නට පුළුවන් නිසා ඔවුන් තම ගම්වලින් ඈත් කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මා විසින් දක්වන ලද මේ කාරණා ගැන ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු වේවායි මා බලාපොරොත්තු වෙනවා.

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන** (අම්බලංගොඩ)
*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன—அம்பலாங்கொடை)*
(Dr. M. H. Saddasena—Ambalangoda)

සභාපතිතුමනි, මඩකුඹුරේ ග්‍රාම සේවක මහතා ගැන බලපිටියේ ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන්නට යෙදුණා. මඩකුඹුර අයත් වන්නේ මා නියෝජනය කරන කොට්ඨාශයටයි. මඩකුඹුරේ සිටි ඒ ග්‍රාම සේවක මහතා එහි සිටි අපරාධකාරයකු බව මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சி. டி சில்வா)*
(Mr. L. C. de Silva)

එහෙම නම් අස් කරන්න ඕනෑ නොවැ.

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddhasena)

ඇත්ත වශයෙන්ම ඔහු අස් කළ යුතු තැනැත්තෙක්. ඒ ගැන කරුණු ඔප්පු වෙලා තියෙනවා. ඔහුට විරුද්ධව පෙත්සම් කීපයක් ඉදිරිපත් වී තිබෙනවා. විභාග පවත්වා තිබෙනවා. ඔහු තුවක්කු පෙන්නා මිනිසුන් භය ගන්වා ඔවුන්ට හිරිහැර කර තිබෙනවා. ඌරගහ හිටපු උප පොලිස් පරීක්ෂකත් සමග එකතු වී අපට ආධාර කළ උදවියට නොයෙකුත් තර්ජන කළා. එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දුන් නිසා ඒ මිනිසුන්ට ගෙවල්වලින් බැහැරව ජීවත් වන්නට සිදු වුණා. මේ තත්ත්වය අගමැතිතුමාටත්, රාජ්‍ය ඇමතිතුමාටත් කියා බොහොම අමාරුවෙන් ඔවුන් වෙනත් ස්ථානවලට මාරු කළා. ඔවුන් නිසා මට මා නියෝජනය කරන කොට්ඨාශයත් එපා වන තරමට කරුණු සිදු වුණා. දැන් ඒ දෙන්නා ඒ ප්‍රදේශයෙන් බැහැර කර සිටීම සැනසීමට කාරණයක්. බලපිටියේ මන්ත්‍රීතුමා ඒ අය පිළිගන්න ලෑස්තිලු. ඔව්, ඒ අය බලපිටියේ ගරු මන්ත්‍රීතුමාගේ සගයන් බව මා දන්නවා. ඒ අය බලපිටියේ කොට්ඨාශයේදී බලපිටියේ ගරු මන්ත්‍රීතුමාගේ ජයග්‍රහණය සඳහා බොහොම උපකාරී වුණා. ඒ නිසා තමන්ගේ හිතවතුන් භාර ගැනීමට අකමැති වන්නේ කවුද?

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ කොට්ඨාශයේ ගුරුවරුන් පමණක් නොව සියලුම ග්‍රාම සේවකයන්ද සභාග පක්ෂයේ අපේක්ෂකයා වූ කුලරත්න මහත්මයාට පක්ෂව වැඩ කළා. ඒ ගැන මගෙන් පමණක් නොව මහජනතාවගෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය සද්ධාසේන]

නොයෙකුත් පැමිණිලි ලැබී ඇති. මහාමැතිවරණයකින් පසුව විශේෂයෙන්ම ග්‍රාම සේවකයන් මාරු කිරීමේ ක්‍රමයක් ඇති කළොත් නම් හොඳයි. ගම්වැසියන් දෙපැත්තට බෙදී වැඩකරනවා. එක කොටසක් ග්‍රාම සේවකයාත් සමඟ එක පැත්තකට වැඩ කරනවා. අනික් අය ඊට විරුද්ධ පැත්තට වැඩ කරනවා. මේ නිසා එක කොටසක් සමඟ ග්‍රාම සේවකයා අමනාප වෙනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ට සහතිකයක්වත් ලබා ගන්නට බැරි වෙනවා.

පූ. භා. 11.45

මට ආධාර කළ එක්තරා මහත්මයකුගේ වත්තක පොල් මලක නටුව පමණක් යන්තමින් කපා එහි රා මුට්ටියක් එල්ලා ඒ මහත්මයා හිර අඩස්සියට ගන්න ඔය අහනකී ග්‍රාම සේවකයා ක්‍රියා කළා. මේවා බාරු නොවෙයි. මේවා ගැන වාර්තා වී තිබෙනවා. පැමිණිලි කර තිබෙනවා. ඒ වගේම ක්‍රියා කර තිබෙනවා. විභාග පවත්වා තිබෙනවා. ඒ ග්‍රාම සේවකයාට විරුද්ධව හාල් පොත් මංකොල්ලයක් ගැනද පරීක්ෂණයක් තිබෙන බව ලජ්ජාවෙන් වුවත් කිව යුතුයි. මෙවැනි තත්ත්වයේ පුද්ගලයන් සභාග පක්ෂයේ උදවියට හොඳ බව අප දන්නවා. ජාතික රජයේ සිරිත නම් කවුරුන් හෝ වේවා අවංක උදවිය නිලතලවලට පත් කිරීමයි. ඒ ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් පැත්තක් ගෙන ක්‍රියා කළ, අපරාධ කළ ග්‍රාම සේවකයන් මාරු කිරීමෙන් පමණක් නොසෑහී ඔවුන් අස් කළ යුතු බව මාත් කියනවා. ඒ කාරණය ගැන එපමණයි.

ගරු සභාපතිතුමනි, දකුණු පළාතේ වැල්ලබඩ පත්තුව නම් වූ අති විශාල ප්‍රදේශය සඳහා ඉන්නේ එක ආදායම් පාලක නිලධාරියකු පමණයි. බලපිටිය ඡන්ද කොට්ඨාශයෙන් කොටසකුත්, අම්බලන්ගොඩ ඡන්ද කොට්ඨාශයත්, රත්ගම ඡන්ද කොට්ඨාශයත් වැල්ලබඩ පත්තුවට අයත් වෙනවා. වැඩ ඉතාම අධිකයි; බහුලයි. මේ ප්‍රදේශය සාමාන්‍යයෙන් උගත් අය බහුල ප්‍රදේශයක් නිසා ඒ අය හැම දේටම ලියුම් ලියනව; පෙත්සම් යවනව. එම නිසා ඒවා විභාග කිරීමටත්, විශේෂයෙන්ම ජීවන වියදම අඩු කිරීමට විධිවිධාන යෙදීමටත් කටයුතු කිරීමට සිදු වී තිබෙන නිසා විශේෂයෙන්ම ආදායම් පාලක නිලධාරිතැනට වැඩ බහුල වෙනව. ඒ නිසා වැල්ලබඩ පත්තුව ආදායම් පාලක කොට්ඨාශය දෙකට බෙදා වැල්ලබඩ උතුර හා වැල්ලබඩ දකුණ කියා කොට්ඨාශ දෙකක් කරන්නය කියන කාරණය මා ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජනය කරනව. ඒ අන්දමට අම්බලන්ගොඩ මධ්‍යස්ථානය කර එහි එක් කොට්ඨාශයකුත් රත්ගම මන්ත්‍රීතුමාගේ (ඩී. ඊ. තිලකරත්න මයා.) මනාපය පරිදි හික්කඩුව හෝ දොඩන්දූව ප්‍රදේශයට තවත් ඩී. ආර්. ඕ. කොට්ඨාශයකුත් ඇති කරන හැටියට මා ඉල්ලා සිටිනව.

එසේ කිරීමට ඉතා පහසු ක්‍රමයක් තිබෙනව. පසුගිය කාලයකදී ජාතික ආණ්ඩුවෙන් මුදල් ණයට ගෙන ඉතාම හොඳ ගෙයක් තනා තිබෙනව. එයට දුන් ණය මුදල පොලියත් සමඟ ලබා ගැනීමට ජාතික නිවාස දෙපාර්තමේන්තුව මහන්සි ගන්නව. ඒ ගෙය ඒ තරම් වටින්නේ නැහැ. ඒ ගෙයි වටිනාකම තක්සේරු කළොත් රුපියල් 40,000 කට වඩා වටින්නෙ නැහැ. නමුත් ජාතික නිවාස දෙපාර්තමේන්තුව මහන්සි ගන්නේ ඒ අය දුන් සම්පූර්ණ ණය මුදලත් එයට පොලියත් ලබා ගන්නයි. එපමණක් නොවෙයි. අවුරුදු ගණනාවක් තිස්සේ මුරකරුවෙක් තබාගෙනත් සිටිනව. ඒ පාළු ගෙයක් මුර කරන්න තබා ගෙන සිටින මුරකාරයාටත් පඩි ගෙවනව. ඔහුට ඒ ගෙවූ පඩියත් අර මුදලට එකතු කර තිබෙනව. ජාතික නිවාස දෙපාර්තමේන්තුව ක්‍රියා කරන්නේ ගොඩනැගිල්ල පරණ වෙන්න වෙන්න ඊට වියදම් කළ සම්පූර්ණ මුදලම ලබා ගන්නයි. එකවර මුදල් ගෙවා හෝ අවුරුදුපතා ගෙවීමේ ක්‍රමයට හෝ මේ ගෙය ලබා ගත්තොත් එය ආදායම් පාලක නිලධාරි කාර්යාලයට සින්නකර ගන්න පුළුවන්. මා කලින් කී විධියට වැල්ලබඩ පත්තුව උතුර හා දකුණ කියා එය දෙකට බෙදා, අම්බලන්ගොඩ මධ්‍යස්ථානය කර, කොට්ඨාශ දෙකක් ඇති කරන්නය කියන ප්‍රශ්නය මා ගරු ඇමති තුමාගේ සැලකිල්ලට භාජනය කරනව. ආදායම් පාලක කොට්ඨාශ ගැන එපමණයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ රැකී රක්‍ෂා ප්‍රශ්නය ඉතාම උග්‍ර අන්දමින් පවතිනවා. එය විසඳීමට අඩු වශයෙන් ඒ ප්‍රදේශයේ පේෂකර්ම මධ්‍යස්ථාන කීපයක්වත් පිහිටුවන ලෙස මා ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමාට ස්තුති පූර්වකව මා මතක් කරන්න කැමතියි, තමුන්නාන්සේ පේෂකර්ම මධ්‍යස්ථාන දෙකක් දෙන්නට පොරොන්දු වූ නමුත් අද වන තුරු ඒ පිළිබඳව කිසිවක් කෙරී නැති බව. ඒ හැර හික්කඩුවට නුදුරුව ඉතාම දුප්පත් ජනතාව වාසය කරන තොරණගල ජනපදය කියන එකේ ආණ්ඩුවට අයිති විශාල බංගලාවක් තිබෙනවා. එය දුන් අබලන් වෙමින් යනවා. ඒ බංගලාව ප්‍රයෝජනයට ගෙන පේෂකර්ම මධ්‍යස්ථානයක් පිහිටුවීම වැඩි වියදමක් නැතිව කරන්න පුළුවනි. දෙපාර්තමේන්තුවෙන් වියදම් කරන්නට බලාපොරොත්තු වන රුපියල් 6,000ට අඩු වියදමකින් ඒ බංගලාව අලුත්වැඩියා කර ඒ දුප්පත් ජනපදයට පේෂකර්ම මධ්‍යස්ථානයක් දෙන්නට පුළුවන්. රැකී රක්ෂා නැති දුප්පත් ජනතාව ඒ පළාතේ අති විශාල සංඛ්‍යාවක් සිටිනවා.

එපමණක් නොවෙයි ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ පාසැල්වලට වුවමනා කරන ලී බඩු ආදිය ලබා ගැනීමට විශාල දුෂ්කරතාවයක් තිබෙනවා. ගල්ලෙන් ලී බඩු ඉල්ලූ විට බඩු සපයන්නය කියා කොග්ගල ලී බඩු කර්මාන්ත මධ්‍යස්ථානයට නියෝග කරනවා. එතනින් බඩු සපයා දීම අවුරුදු ගණනාවක් යන තුරු කෙරෙන්නෙ නැහැ. ළඟදී බූස්සෙත් මධ්‍යස්ථානයක් ඇති කර තිබෙනවාය කියා ආරංචියි. මා නියෝජනය කරන අම්බලන්ගොඩ ප්‍රදේශයේ වඩු කාර්මිකයින් අති විශාල සංඛ්‍යාවක් සිටිනවා. උඩරට ප්‍රදේශවල ස්ටෝරු හා බංගලා ආදිය තැනීම වැඩි වශයෙන්ම කෙරුණේ අම්බලන්ගොඩ ජනතාවගෙනුයි. එහෙත් අද ඒ තත්ත්වය නැති වන අවස්ථාවක් උදා වී තිබෙනවා. අම්බලන්ගොඩ ප්‍රදේශයේත් ඒ කර්මාන්තය දියුණු කර රජයට අවශ්‍ය ලී බඩු ආදිය සපයා ගැනීමට අම්බලන්ගොඩ ප්‍රදේශයේ වඩු කම්හලක් ඇති කරන ලෙස මා ඉල්ලනවා. මේ ක්‍රියා මාර්ගය අනුව වඩු කම්හලක් පිහිටු වුවහොත් ඒ මගින් රජයට වුවමනා ලී බඩු නිපදවා ගැනීමට පළුවන් වෙනවා පමණක් නොවෙයි, එක්තරා ප්‍රමාණයකට රැකීරක්ෂා ප්‍රශ්නයත් විසඳා ප්‍රදේශයේ විශාල ජනකායකට රක්ෂා සපයා දීමටත් පුළුවන් වෙනවා. ඒ වාගේම කර්මාන්ත දියුණුවක් ද ඇති වෙනවා. මම මීට වඩා කාලය ගැනීමට අදහස් කරන්නේ නැහැ. බලපිටියේ මන්ත්‍රීතුමා කී ග්‍රාම සේවකයා ගැන කිසිම අනුකම්පාවක් නොදක්වා නියම විදියට කටයුතු කර මේ රජය දියුණුවෙන් දියුණුව කරා යාමට සලස්වනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

මේ අමාත්‍යාංශයට වෙන් කර තිබෙන්නේ පැය 4 යි. ඒ නිසා මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, තම කථා මිනිත්තු 10 කට සීමා කරන ලෙස. මම සතුටුයි ගරු මන්ත්‍රීවරුන්ට ඕනෑ තරම් කථා කිරීමට ඉඩ දෙන්න නමුත් අපි තීරණයකට එළඹ සිටින නිසා ඒ තරම් කාලය දීමට නොහැකිවීම ගැන මම කනගාටු වෙනවා. [බාධා කිරීමක්] If some hon. Members would like to speak for five minutes, I would be very grateful because they would be helping other hon. Members who wish to speak.

**ඇස්. බී. යාලේගම මයා. (රත්තොට)**
**(திரு. எஸ். பி. யாலேகம—றத்தோட்டை)**
(Mr. S. B. Yalegama—Rattota)

සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අවුරුදු ගණනක්ම සේවය කළ නිලධාරියකු හැටියට සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වචන සවල්පයක් කථා කිරීමට මට යුතුකමක් තිබෙනවා. බලපිටියේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ උදාසීනත්වය නිසා ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය අවුල් තත්ත්වයකට වැටී තිබෙනවාය කියා. ඒ ප්‍රකාශය ගැන මම කනගාටු වෙනවා. ඒ ප්‍රකාශය ගැන මට එකඟවන්න කිසිම පුළුවන්කමක් නැහැ. මටත්, මොනරාගල ගරු මන්ත්‍රීතුමාටත් (රාජා වෙලේගම මයා.), රක්වානේ ගරු මන්ත්‍රීතුමාටත් (එච්. කුරුප්පු මයා.) අද මේ පාර්ලිමේන්තුවට පැමිණෙන්ට ලැබුනේ ග්‍රාම සංවර්ධන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලෙගම මයා.]

නිලධාරීන් වශයෙන් අවුරුදු ගණනක් තිස්සේ ගම්බද ජනතාවට යම් කිසි සේවයක් කළ නිසා යයි මම විශ්වාස කරනවා.

අවුරුදු 14 ක් තිස්සේ ග්‍රාම සංවර්ධන නිලධාරියකු වශයෙන් මා ලත් අවබෝධයත් පළපුරුද්දත් අනුව ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ඉදිරියට කොයි අන්දමට ගෙන යායුතුද, කුමන පියවර ගත යුතුද, යන්න ගැන වචන කිහිපයක් කීමට මම බලාපොරොත්තු වෙනවා. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයෙහි මූලික පරමාර්ථ තුනක් තිබෙනවා. මිනිසාගේ යහපත් පැවැත්මට අදාළ වන ඉතාමත් වැදගත් කාරණා තුනක් වන ආර්ථික, සෞඛ්‍ය හා සදාචාර යන අංශ තුන පදනම් කරගෙන ආරම්භ කරන ලද මේ ව්‍යාපාරයෙන් පසු ගිය අවුරුදු 17 තුළ—1948 දී යි, මේ ව්‍යාපාරය ආරම්භ කළේ—මේ රටේ ගැමි ජනතාවට සෑහෙන සේවයක්, ආපසු බලා සන්තෝෂ වීමට පුළුවන් තරම් සේවයක්, සිදු වී ඇති බව මට කියන්න පුළුවනි. බඩගින්නේ නොසිට කරදරයක් නැතිව ජීවත්වීම ආර්ථික අංශයෙනුත්, නිරෝගීව ජීවත්වීම සෞඛ්‍ය අංශයෙනුත්, වැදගත් ශිෂ්ඨ සම්පන්න මිනිසකු ලෙස ජීවත් වීම සදාචාර අංශයෙනුත් බලාපොරොත්තු වන අතර මේ මූලික කරුණු තුන පදනම් කර ආරම්භ කරන ලද මේ ව්‍යාපාරයෙන් අපේ ගැමි ජනතාවට විශාල සේවයක් කිරීමට පුළුවන් බව අපේ පිළිගැනීමයි. මේ ව්‍යාපාරය මඟින් මිනිසාට ස්වෝත්සාහයෙහි ඇඩි විශ්වාසයක් තබා කටයුතු කිරීමටද ධෛර්ය දෙනවා. අනුන් ලවා වැඩ කරවා ගැනීමට බලා නොසිට සවකීය උත්සාහයෙන්ම අවශ්‍ය දේ සපුරා ගැනීමට මිනිසා සංවිධානය කිරීමත් මේ ව්‍යාපාරයේ තවත් පරමාර්ථයක්. ඊළඟ පරමාර්ථය සම්බන්ධතාවක් ඇතුව කටයුතු කිරීමයි. රජයේ දෙපාර්තමේන්තුත් මහජනයත් අතර සම්බන්ධතාව ඇති කිරීමයි, මෙයින් අදහස් කරන්නෙ. නිදර්ශනයක් වශයෙන්, ගොවිකම් දෙපාර්තමේන්තුව ගනිමු. එම දෙපාර්තමේන්තුවත් සාමාන්‍ය ගැමියත් අතර අද සම්බන්ධයක් නැහැ. ඒවගෙම සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ගැන බලමු. එම දෙපාර්තමේන්තුවත් සාමාන්‍ය ගැමියා අතරත් අද කිසි සම්බන්ධයක් නැහැ. සෑම දෙපාර්තමේන්තුවකම නිලධාරීනුත් සාමාන්‍ය ගැමියාත් සම්බන්ධ කරන පුරුකක් හැටියට ග්‍රාම සංවර්ධන සමිතියක් සලකන්න පුළුවනි. රජයේ දෙපාර්තමේන්තුත් මහජනයත් අතර සහයෝගයක් නොමැති නම්, රටක සංවර්ධනයක් කරන්න බැහැ. යම් රජයකට මහජනතාවගෙ සහයෝගය, හරියාකාර නොලැබෙනව නම්, කොයිම රටකවත් කටයුතු සාර්ථක වන්නේ නැහැ. ගම්බද ජනතාවගෙ සහයෝගය ලබා ගන්න වුවමනා නම්, හැකි තරම් දුරට ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය කෙරෙහි විශ්වාසයක් ඇතිව කටයුතු කරන්ට ඕනෑ. එසේ කළ විටයි, රජයත් මහජනයත් අතර සම්බන්ධතාවක් ඇති කර ගන්න පුළුවන්කම ලැබෙන්නෙ.

ගරු සභාපතිතුමනි, මා ඉදිරිපත් කළ කරුණු තුනෙන් මූලික කරුණ එනම්, ස්වොත්සාහය උඩ සංවර්ධනය කිරීමේ පරමාර්ථය අද බොහෝ දුරට සම්පූර්ණ වී තිබෙනවය කියන්න පුළුවනි. අද ගම්වල නොයෙකුත් විධියෙ සංවිධාන තිබෙනව. 1948 දී ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය, රජයෙ දෙපාර්තමේන්තුවක් යටතෙ ආරම්භ කළ අවස්ථාවේදී ගම්බදව අද තරම් සංවිධාන තිබුණෙ නැහැ. ප්‍රජාමණ්ඩල, විවිධ සේවා සමිති, තරුණ සංගම්, තරුණ ගොවි සමාජ, යනාදිය අද ගම්බදව් බෙහෙවින් තිබෙනව. මෙම සෑම සංවිධානයකම අදහස ගම් දියුණු කිරීම නම්, ග්‍රාම සංවර්ධන සමිති මුල් කරගෙන එහි සහයෝගය ඇතිව කටයුතු කිරීම ඉතා අවශ්‍ය යයි. ඒ කියන්නෙ, වටේ තිබෙන අනිකුත් සංවිධාන සියල්ල එකතු කර එක් සංවිධානයක් යටතේ කටයුතු කිරීම අද ඉතාමත් අවශ්‍ය යයි. මෙතෙක් කල් අපි ග්‍රාම සංවර්ධන සමිතිවලින් බලාපොරොත්තු වුණේ ගම් දියුණු කිරීම පමණයි. අද ලෝකයේ වෙනත් රටවල් මේ මාර්ගයෙන් ලබා ඇති දියුණුව දෙස බලන විට, ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය ගම්වලට පමණක් සීමා නොකර මුළු ප්‍රජාව කෙරෙහිම යොමු කළ යුතුව තිබෙනවාය කියා මා කල්පනා කරනව. ප්‍රජා සංවර්ධන ව්‍යාපාරයක් වශයෙන් මීට වඩා අඩියක් ඉස්සරහට එය ගෙන යන්න ඕනෑ. එතකොට ඒ මඟින් ගම්වලට පමණක් නොව නගර වලටත් සෙතක් සැලසෙනවා ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දවල් 12.0

ඉන්දියාවෙ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ප්‍රජා සංවර්ධන ව්‍යාපාරයක් හැටියට පවත්වගෙන යනව. ඔවුන් තවත් අඩියක් ඒ මගින් ඉස්සරහට ගොස් තිබෙන බව එයින් පේනව. අප පරිපාලන සේවයෙ නිලධාරීන් මෙම ව්‍යාපාරයේ උසස් තැන්වලට පත් කර තිබෙන බව්, ඒ රට දෙස බලන විට අපට පෙනී යනව. ඒවගෙ අපේ රටෙත් ග්‍රාම සංවර්ධන නිලධාරීන්ට අවස්ථාවක් ලබා දෙන්න ඕනෑ, එවැනි කටයුතු සඳහා ඔවුන්ට අවශ්‍ය පුහුණුව් ලබා ගැනීමට. එසේ කොට, ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයෙන් නියම ප්‍රතිඵල ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන හැටියට මා ඉල්ලා සිටිනව. අවුරුදු 14 ක් ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරයෙහි නිරත වූ කෙනෙක් හැටියට මට කියන්න පුළුවනි, නොයෙකුත් අවස්ථාවන්හිදී නිලධාරීන්ගේ හිරිහැර කරදරවලට මැදි වී අපට සේවය කරන්න සිදු වූ බව. ග්‍රාම සංවර්ධන නිලධාරීන් උදාසීන වන්නට එක් හේතුවක් තමයි, නිලධාරීන්ගෙන් බලපෑම් ඇති වීම හා ඔවුන්ගෙන් කරදර හිරිහැර විඳින්නට සිදු වීම. මා ඉල්ලනව්, මෙම තත්ත්වය වෙනස් කර, ග්‍රාම සංවර්ධන නිලධාරීන්ට මීට වඩා පුළුල් පුහුණුවක් ලබා දෙන ලෙස. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයෙ, සම්පූර්ණ ප්‍රතිසංවිධානයක් ඇති කර එම නිලධාරීන්ට මීට වඩා වගකීමක් දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන්නය කියා මා ඉල්ලා සිටිනව. සාමාන්‍යයෙන් පසුගිය අවුරුදු 17 ක පමණ කාලයක් තිස්සෙ, කාර්මික ගොඩනැගිලි, ජල යෝජනා ක්‍රම ආදිය, රුපියල් 4 කෝටි 80 ලක්ෂයක් පමණ වටිනා වැඩ, මෙම දෙපාර්තමේන්තුවේ උත්සාහය නිසා, රුපියල් 1 කෝටි 80 ලක්ෂයක පමණ වියදමින් කර දී තිබෙනව. එයින් පෙනී යනවා නොවෙද, කොයි තරම් මහජන මුදලක් රජයට ඉතිරි කර දී තිබෙනවාද කියා.

එපමණක් නොවෙයි, පසුගිය කාලයෙ, රජයේ ප්‍රතිපත්තියක් අනුව, අපේ ගම්බද ප්‍රදේශවල පේස කර්මාන්ත මධ්‍යස්ථාන දහසක් පමණ පිහිටුවනු ලැබුව. මේ පේස කර්මාන්ත මධ්‍යස්ථාන දහස ඇති කිරීම පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් මගින් කළා නම් රුපියල් 80 ලක්ෂයක් පමණ වියදම් වෙන්න තිබුණ නමුත්, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ උත්සාහය නිසා රුපියල් 25 ලක්ෂයකින් පමණ— ඉතා අඩු වියදමකින්— ඒ පේස කර්මාන්ත මධ්‍යස්ථාන දහය ඇති කරන්නට පුළුවන් වුණා. මේ අන්දමට, ඉතාමත් පුළුල් අන්දමින් මේ වැඩ කටයුතු පසුගිය කාල පරිච්ඡේදය තුළ කරගෙන ගිය බව සඳහන් කරන්න කැමතියි. එම නිසා මේ අවස්ථාවේදී මා නමුන්නාන්සෙට දන්වා සිටින්නෙ, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ප්‍රතිසංවිධානයක් ඇති කිරීම ඉතාමත් අවශ්‍ය බවයි. අද එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් උදාසීන තත්ත්වයකට පත් ව සිටිනව. ඒ මන් ද? නිලධාරීන් කෙරෙහි දැක්විය යුතු උනන්දුව, සැලකිල්ල, පසුගිය කාලය තුළ නොදැක්වීම නිසයි. අවුරුදු 17 ක් තිස්සෙ, තමන්ගෙ දුක්ගැනවිලි සන්දේශ මාර්ගයෙන් ඉදිරිපත් කළ ග්‍රාම සංවර්ධන නිලධාරීන් ගැන මම දන්නව. නමුත් ඒ ඉදිරිපත් කළ දුක්ගැනවිලි ගැන මේ වනතෙක් සැලකිල්ලක් දක්වා ඇති බවක් පෙනෙන්ට නැහැ. ග්‍රාම සංවර්ධන නිලධාරීන් වශයෙන් සේවයට බැඳුනු අයට අන්තිමේදී මැරෙන්නෙ සිද්ධ වෙන්නෙත් ග්‍රාම සංවර්ධන නිලධාරීන් හැටියටයි. ඔවුන්ට උසස් වීමේ අවස්ථාවක් ඇත්තෙ නැහැ. ඔවුන්ගේ පඩි සතුටුදායක ලෙස වැඩි වන්නේ නැහැ. ඔවුන්ගේ ජීවිතය හරියාකාර ගත කිරීමට, සකස් කිරීමට, අවස්ථාවක් ලැබෙන්නෙත් නැහැ. මෙවැනි හේතුන් නිසයි ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව අද තිබෙන තත්ත්වයට පත් වී ඇත්තෙ. එම නිසා ඉක්මනින් එහි ප්‍රතිසංවිධානයක් ඇති කිරීමට කටයුතු යොදනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනව.

ඊ ළඟට නමුන්නාන්සේගේ සැලකිල්ලට යොමු කිරීමට කැමති වැදගත් කාරණයක් ඉදිරිපත් කරනව. ඒ කිතුල් මැදීම ගැනයි. මා දන්නවා, උඩරට ප්‍රදේශයේ, විශේෂයෙන්ම මාතලේ දිස්ත්‍රික්කයේ කිතුල් ගස් මැදීමෙන් පන් දහසකට ආසන්න සංඛ්‍යාවක් ජීවත්වන බව. මේ අනුව අනිකුත් දිස්ත්‍රික්කවලත් කොයි තරම් සංඛ්‍යාවක් සිටිනවා ඇද්ද කියා නමුන්නාන්සේට සිතා ගත හැකියි. නමුත් අද ගම්වල මේ කර්මාන්තයෙහි යෙදී සිටින අයගේ තත්ත්වය පැහැදිලිකර දෙන්න කැමතියි. මීර මදින උදවිය, කිතුල් ගස යටදීම බෝතල

[යාලෙගම මයා.]

ශත 20 කට හෝ 25 කට විකුණනවා. මෙසේ විකුණන මීරාවලට මොකද වෙන්නෙ? ඒවා මිලදී අරගෙන තවත් යම් යම් දේවල් එයට කලවම්කර බෝතලය ශත 50 කට හෝ 60 කට විකුණනවා. පැණි හකුරු සෑදීමට මෙසේ ලබාගන්නා මීරා යොදවන්න පුළුවන් වුණත් පැණි බෝතලය කට ලැබෙන්නෙ රුපියල් 1.25 ක සුළු මුදලක් වන අතරම මේ සඳහා මීරා බෝතල් අටක්ද වුවමනා කරනවා. එම නිසා ගහ යටදීම බෝතලය ශත 20 හෝ 25 ගණනෙ විකුණන්න පුළුවන් නම්, ඒක ඒ අයට ලාභයි. එම නිසා පැණි හකුරු සෑදීම ජාතික කර්මාන්තයක් වශයෙන් සකස් කර ගත්තොත්, පැණි හකුරු වලින් නොයෙකුත් රස කැවිලි හැදීම, වෙනත් නොයෙකුත් අන්දමේ නිෂ්පාදනයන් කිරීම, ආදිය නිසා උඩරට ප්‍රදේශවල ජනතාවට විශාල සෙතක් සැලසෙනවා. ඒ වාගේම අපි දන්නවා, රුපියල් කෝටි ගණනක මුදලක් මේ රටින් සීනි සඳහා වෙනත් රටවලට ඇදෙන බව. එහෙමනම් ජාතික කර්මාන්තයක් වශයෙන් මෙය දියුණු කර ගත හෙත්, ආරක්ෂා කර ගතහොත් සීනි සඳහා පිටරට ඇදී යන විශාල මුදල මේ රටේම ඉතුරු කර ගන්නට ලැබෙනවාට කිසිම අනුමානයක් නැහැ. එපමණක් නොවෙයි, මේ කිතුල් මීරා වලින් ඉතාමත්ම අනර්ඝ විනාකිරි නිෂ්පාදනය කරන්නත් පුළුවනි. ගෘහ කර්මාන්තයක් හැටියට දිස්ත්‍රික්කයක් පාසාම මෙය දියුණු කිරීමට ආධාර අනුබල දෙනවා නම්, එහෙම නැත්නම් නිපදවන මීරා එකම ස්ථානයකට රැස් කර එයින් නිෂ්පාදන ඇති කිරීමට යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරනවා නම්, ඇත්ත වශයෙන්ම මෙයින් විශාල ආදායමක් ලබාගන්න පුළුවන්. ඒ වාගේම කිතුල් ගසෙන් ලබාගන්නා මීරා වලින් සාර්ථක ප්‍රතිඵල ලබාගත්තාය කියා සන්තෝෂ වෙන්නටත් පුළුවනි. එපමණක් නොවෙයි, මෙවැනි ක්‍රියා මාර්ගයක් ඇති කිරීමෙන්, ගම්බද ප්‍රදේශවල ඇතිවන හොර සුරාපොලවල් නැති කර දැමීමටත් මෙය ඉතාමත්ම පහසු වන බව මතක් කර දෙන්න කැමතියි.

තල් ගස් මැදීමෙන් උතුරේ ජනයා විශාල ආදායමක් ලබා ගන්න බවත්, පොල් ගස් මැදීමෙන් දකුණුකරයේ ජනයා ආදායමක් ලබා ගන්න බවත් ගරු ඇමතිතුමා දන්න නිසා අනෙකුත් ප්‍රදේශවල වාසය කරන ජනතාවටද කිතුල් ගස් මැදීමෙන් ඒ විධියට ආදායමක් ලබා ගැනීමට අවකාශ සැලසීම යුතුකමක්ය කියා මා සලකනවා. කිතුල් ගසින් වටිනා විනාකිරිත්, පැණි සහ හකුරුත් සාදා ගැනීමට පුළුවන් නිසා එකී කර්මාන්ත දියුණු කිරීම සඳහා යම්කිසි උචිත වැඩ පිළිවෙළක් යොදන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

**එච්. කුලරත්න මයා. (රක්වාන)**
*(திரு. எச். குலரத்ன—றக்குவான)*
(Mr. H. Kularatne—Rakwana)

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මගේ අදහස් ඉදිරිපත් කිරීමට පෙර ගරු ඇමතිතුමාගෙන් අහන්න සිදු වී තිබෙන්නෙ සබරගමු පළාත තවමත් උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතේ ආධාර ලැබිය හැකි ප්‍රදේශයක් ලෙස නොසැලකෙන්නෙ මක්නිසාද යන්නයි. කොපමණ වැඩ රාශියක් තිබුණත්, සබරගමුවටත් මේ යෝජනා ක්‍රමය යටතේ ආධාර ලබා දෙන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එතුමා ඒ ගැන උත්සාහවන්ත වනු ඇතැයි මා අපේක්ෂා කරනවා.

ලංකාවට දේශපාලනමය ස්වාධීනත්වය ලැබී දැන් සෑහෙන කාලයක් ගත වී තිබෙන නමුත් තවමත් එයින් නියම ප්‍රයෝජනයක් ලබා ගැනීමට ගැමි ජනතාවට හැකියාවක් නොලැබීම කනගාටුදායකයි. මා අදහස් කරන්නෙ රාජකාරි කටයුත්තක් කරවා ගැනීමට යන ගම්බද ජනතාවට මුහුණ පාන්න සිදු වන යම් යම් කරදර හිරිහැර ගැනයි. යම් රාජකාර්යයක් කරවා ගැනීමට ආදායම් නිලධාරි කාර්යාලයට හෝ දිසාපති කාර්යාලයට හෝ යන ගම්බද ජනයාට තවමත් ඉංග්‍රීසීන් මේ රට පාලනය කළ යුගයේ පැවති කරදරකාරි හිරිහැරදායක වැඩ පිළිවෙළමයි දකින්න ලැබෙන්නෙ. තවමත් එය වෙනස් වී නැහැ. ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයෙත්, දිසාපති කාර්යාලයෙත් සිටින නිලධාරීන් තමන් දූප්පත් ගැමියන්ගෙ සේවකයින් බව තවමත් වටහාගෙන නැති බව පෙනෙනවා. කවදත් දක්ෂ ලෙස අදහස් ඉදිරිපත්කර වැඩි දෙනාගේ පොදු යහපත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනුවෙන් ක්‍රියා කිරීමට දක්ෂකමක් තිබෙන ගරු ඇමතිතුමාට මේ අංශය සම්බන්ධයෙනුත් ක්‍රමවත් වැඩ පිළිවෙළක් මගින් ඒ පැරණි යුගයේ පෙනුම වෙනස් කර ස්වාධීන රටකට ඔබින අන්දමේ ස්වරූපයක් ලබා දී, ගැමි ජනතාවට දැනට විඳින්න සිදුවන කරදර මග හරවා වැඩි වැඩියෙන් පහසුකම් ඇති කිරීම අමාරු දෙයක් නොවේය යනු මගේ විශ්වාසයයි. ඒ සඳහා ඉතා ඉක්මනින් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරාවිය කියා අප බලාපොරොත්තු වෙනව.

හාල් සලාක පොත් නැති ලක්ෂ ගණන් ගැමියන් ඉන්නව. අවුරුද්දක් වැයම් කළත් ඒ අයට හාල් පොත් ගන්න බැහැ, දැනට ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ යටතේ. නිලධාරීන්ගෙ නොසැලකිල්ල නිසා ප්‍රාදේශීය ආදායම් කාර්යාලයට තුන් හතර වතාවක් ගියත් වැඩ කටයුතු නොසිදු වන නිසා බොහෝ දෙනා හාල් පොත් ලබා ගැනීමේ අදහස අත් හැර දමා නිකම් ඉන්නව. මේ සම්බන්ධයෙන් දැනට වඩා ක්‍රමවත් වැඩ පිළිවෙළක් ගැන ගරු ඇමතිතුමා කල්පනා කරනු ඇතැයි අපේක්ෂා කරනව.

ගොවිතැන් ආරක්ෂා කර ගැනීමට ගැමියන්ට තුවක්කු වුවමනා කරනව. ඒ සඳහා අවශ්‍ය බලපත්‍රය ලබා ගැනීම අමාරු දෙයක් වී තිබෙනව. හාර පස් මාසයක් හය මාසයක් තිස්සේ නිලධාරීන්ට ලියුම් ලියන්නත්, නිලධාරීන් ගණනාවක් මුණ ගැසීමට යන්නත් සිදු වෙනව බල පත්‍රයක් ලබා ගැනීමට. පසුගිය ආණ්ඩුව කොලොන්නෙත්, අටකලන්කෝරළෙත් මිනිසුන්ගෙ තුවක්කු ගණනාවක් ආපසු ගත්තා. ඒවා තවමත් ලැබුණෙ නැහැ, අයිතිකාරයින්ට. ඒවා නැවතත් අයිතිකාරයින්ට ලබා දීමට ගරු අමාත්‍යතුමා උත්සාහ වන්ත වනු ඇතැයි මා බලාපොරොත්තු වෙනව.

උප්පැන්න, මරණ හා විවාහ ලියා පදිංචි කරන රෙජිස්ත්‍රාර්වරුන්ගෙ ප්‍රමාද දෝෂ නිසා ලියකියවිලිවල වැරදි තැන් ඇති වුණාම ඒවා හරිගස්සා ගැනීමට බොහෝ කාලයක් ගත වෙනව. සමහරවිට අවුරුදු ගණනාවක් ගත වෙනව. පාසල් සිසුන්ගෙ උප්පැන්න සහතික සම්බන්ධයෙන් බොහොම කරදර විඳින්න සිදු වෙනව. නමක් වෙනස් කර ගැනීමට අවුරුද්දක් පමණ කල් ගත වෙනව. දිස්ත්‍රික් රෙජිස්ත්‍රාර්වරුන්ගෙන්, ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගෙන්—ඩී. ආර්. ඕ.—කාර්යාලවලට සුමානයකට වරක්වත් පැමිණ දුප්පත් ජනතාවගෙ පහසුව තකා මේ උදවියගෙ සේවය ලබා දීමට කාල සටහනක් අනුව වැඩ කිරීමට ක්‍රියා කරනු ඇත කියා අප විශ්වාස කරනව. රත්නපුර දිස්ත්‍රික්කයේ ලියන්ගස්වෙල නම් ස්ථානයේ සිට කච්චේරියට හැතැප්ම 45ක් පමණ දුරක් යන්න තිබෙන නිසා එතනින් වැඩක් කර ගන්න ඕනෑ කෙනකු දවස් දෙකක් පමණ ගත කර ආවත්, මාසයක් ඇතුළත දහ වතාවක් ආවත්, මා මුලින් සඳහන් කළ කාරණය නිසා—ඉංග්‍රීසින්ගේ පාලනය පැවති කාලයේ තිබුණු ස්වරූපය වෙනස් වී නැති නිසා—තමන් ආ කාර්යය ඉෂ්ට කර ගන්න නොලැබෙන තත්ත්වයක් තිබෙනව. මේවා තවමත් විදේශීය පාලනයක් ඇති කාර්යාල හැටියට තිබෙන බව සාමාන්‍ය ගොවියෙකුට පෙනෙනව. ඒ නිසා එය වෙනස් කිරීමට කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනව.

ඊළඟට දිසාපතිවරුන් ගැනත් මතක් කරන්නට ඕනෑ. ඒ ඒ දිස්ත්‍රික්කවල දැනට සාමාන්‍යයෙන් අළුත් වැඩ පිළිවෙළවල් රාශියක් දිසාපතිවරුන් විසින් ආරම්භ කරගෙන යනවා. ගැමි ජනතාවගේ අදහස් උදහස්, සිතුම් පැතුම් ගැන අවබෝධයක් තිබෙන දිසාපතිවරුන් සිටින නිසයි එසේ වැඩ කරගෙන යන්නෙ. නමුත් ඒ අතරම ගැමි ජනතාවගේ සිතුම් පැතුම් ගැන නොදන්නා දිසාපතිවරුන් බොහෝ දෙනෙකු ඉන්නව. ඒ නිසා සාමාන්‍යයෙන් දිසාපතිවරුන්ගේ සේවය කච්චේරියේ කඩදාසිවලට අත්සන් කිරීමට පමණක් සීමා නොවිය යුතුයි. දිසාපතිවරුන්ගෙන් ඉටුවිය යුතු සේවය නියම අන්දමින් ඉටුවීමට ඔවුන් දැනට වඩා වැඩියෙන් තම කාලය රාජකාරි කටයුතු සඳහා වැය කළ යුතුයි.

දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභා ගැනත් මතක් කරන්නට සතුටුයි. සාමාන්‍යයෙන් දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභා පවත්වන්නේ මාස තුනකට වරක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කුලරත්න මයා.]

නමුත් දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභා වේදී මට දැනගන්නට ලැබුණු කාරණයක් කණගාටුවෙන් මතක් කරන්නට තිබෙනවා. මීට වර්ෂ දෙකකට තුනකට පෙර දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරක සභාවට ඉදිරිපත් කර තිබෙන එකම යෝජනාවක් වත් එකම අමාත්‍යාංශයකින්වත් ක්‍රියාත්මක කර නැහැ. සාමාන්‍ය රාජකාරියක් වශයෙන් මේ කාරක සභා රැස්වීම් පවත්වනවා හැර, ඉදිරිපත් කර තිබෙන ඉතාමත් වැදගත් යෝජනා සම්බන්ධව එකම අමාත්‍යාංශයක්වත් ක්‍රියාත්මක වී නැහැ. විශෙෂයෙන්ම දිසාපතිවරයාගේ සම්බන්ධතාව ඇතිව ක්‍රියාත්මක වන යෝජනා වලින් ගැමියාට කෙලින්ම යහපතක් සැලසෙනවා. ඒ නිසා දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාව ගැමියාට යහපත සලසන මධ්‍යස්ථානයක්. නමුත් පසුගිය වර්ෂවලදී මේ කාරක සභාවට ඉදිරිපත් කර තිබෙන වැදගත් යෝජනා එකක්වත් ගැන අමාත්‍යාංශවලින් කිසිම සැලකිල්ලක් දක්වා නැහැ. ඒ නිසා අඩු වශයෙන් දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරක සභාවලට ඉදිරිපත් වන වැදගත් යෝජනා මාස තුනක් ඇතුළත ක්‍රියාත්මක වීමට වැඩ පිළිවෙළවල් සකස් කිරීමට වැයම් කරන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. සාමාන්‍යයෙන් දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරක සභා රැස්වීම් පැවැත්වෙන්නේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශවලයි. සමහර අවස්ථාවලදී මේ සභා රැස්වීම්වලට පැමිණෙන්නෙ නිලධාරීන් දෙතුන් දෙනෙකු බවත් මා මේ අවස්ථාවේදී කණගාටුවෙන් මතක් කළයුතුව තිබෙනවා. විශේෂයෙන් සමහර අවස්ථාවලදී ආදායම් පාලක නිලධාරීන් මේවාට සහභාගි වෙන්නෙ නැහැ. ඒ නිසා දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවලට පැමිණිය යුතු හැම නිලධාරියකුම ලවා ඒවාට පැමිණීමට සලස්වා අඩු වශයෙන් මාස දෙකකට වරක් වත් මේ කාරක සභා රැස්වීම් පැවැත්වීමට වීර්ය කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

අ. භා. 12.15

ඊළඟට ග්‍රාම සංවර්ධන කටයුතු සම්බන්ධව කියයුතු කාරණයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම ග්‍රාම සංවර්ධන සමිති වලින් ඉතාමත් වැදගත් වැඩ රාශියක් ඉටුවිය යුතුව තිබෙනවා. විශේෂයෙන්ම ජාතික රජයේ අදහස් ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට නම් ග්‍රාම සංවර්ධනය පිළිබඳව ප්‍රතිසංවිධානයක් කළයුතුයි. අද වැදගත් අයවැය ලේඛන කථාවක් ඉදිරිපත් කර තිබුණත් ඒ අනුව පිටිසර ගැමියාට යහපතක් සලසන්න නම් යම්කිසි මාර්ගයක් තිබෙන්න ඕනෑ. සාමාන්‍යයෙන් ගම්වල සමිති සමාගම් රාශියක් තිබෙනවා. ඒවා සියල්ලම එක්සත් කරන, ඒකාබද්ධ කරන, එක් මණ්ඩලයක් ගමේ තිබිය යුතුයි. සාමාන්‍යයෙන් අද ගම්වල තිබෙන සමිති නිකම් පැන්නක තිබෙන ආභරණ වගෙයි. ගරු ඇමතිතුමා මේවා ගැන උනන්දුවක් දක්වන බව මා දන්නවා. නමුත් විශේෂ උනන්දුවක් දක්වා ක්‍රියා කළ හොත් ග්‍රාම සංවර්ධන සමිති මගින් මීට වඩා පුළුල් සේවාවක් කළහැකියි. ග්‍රාමීය මණ්ඩලවල මූලස්ථානය ග්‍රාම සංවර්ධන මණ්ඩලයට ලබා දිය යුතුයි. ගමේ තිබෙන අනික් සමිති සමාගම්වල සාමාජිකයන් ග්‍රාම සංවර්ධන සමිතියේ කාරක සභිකයන් විය යුතුයි. ඒ අයුරින් මේවා ප්‍රතිසංවිධානය කළහොත් ගම්වලට මීට වඩා සේවාවක් ඉෂ්ට කරන්න පුළුවනි. අද සාමාන්‍යයෙන් පාඨශාලාවල ගුරු-දෙගුරු සමිති තිබෙනවා. ඒ වාගේම ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේ සිටිනවා; ඒ වාගෙම ග්‍රාම සේවක මහත්මයා සිටිනවා; ගොවිකම් ඕවර්සියර් මහත්මයා සිටිනව; සමුපකාර සමිතියේ ලේකම් මහත්මයා, ගොවි කාරක සභාවේ ලේකම් මහත්මයා ආදීන් සිටිනව; ඒ වාගේම ගම්කාර්ය සභාවේ සාමාජික මහතුන් හා ප්‍රජා මණ්ඩලයේ ලේකම් මහත්මයා ඉන්නව. ගම්වල තිබෙන සියළුම සමිති සමාගම්වල නියෝජිතවරුන් ග්‍රාම සංවර්ධන සමිතියේ කාරක සභාවට පත් කළ යුතුයි. ඊට පසුව අඩු වශයෙන් මාස් පතාවත් ග්‍රාම සංවර්ධන සමිතිය රැස්කරවා සභා රැස්වීම් පැවැත්විය යුතුයි. ග්‍රාම සංවර්ධන සමිති මෙසේ ප්‍රතිසංවිධානය කළ හොත් මා කලින් සඳහන් කළ පරිදි, හාල් පොතක් ලබාගැනීමේදී හෝ තුවක්කු බල පත්‍රයක් ලබා ගැනීමේදී හෝ ඉඩමක් ලබා ගැනීමේදී හෝ ගැමියාට කිසිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හිරි හැරයකට මුහුණ පාන්නට වෙන්නෙ නැහැ. එවැනි අවස්ථාවලදී ග්‍රාම සංවර්ධන සමිතියට පුළුවන් ගැමියාට ආධාර උපකාර වන්න. මේ අනුව කටයුතු කළහොත් මීට වඩා සහයෝගතාවක් හා සම්බන්ධතාවක් ගම්වල ඇතිවෙනවා.

ග්‍රාම සංවර්ධන සමිති මගින් දැනට කෙරෙන්නේ පාරවල් කැපීම වැනි සුළු වැඩ පමණයි. නමුත් එම සමිතිවල කටයුතු දැනට වඩා පුළුල් විධියට—සමහර විදේශ රටවල පවා කෙරෙන විධියට—කිරීමේ වැඩ පිළිවෙලක් යෙදීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්නට කැමතියි. කුඩා වැව් හා කුඩා වාරිමාර්ග කටයුතු මේ ග්‍රාම සංවර්ධන සමිති මඟින් දියුණු කිරීමට වැඩ පිළිවෙල වල් යොදන්නට පුලුවන්කම තිබෙනවා. මෙවැනි කටයුතු සඳහා දෙපාර්තමේන්තු වෙන් මොන තරම් ආධාර ලැබුණත් ඊට ගැමි ජනතාවගේ ආධාරයත් නැතිවම බැහැ. කුලීකරුවන් රාශියක් ඒ කටයුතු සඳහා වුවමනා කරනවා. එම නිසා කුඩා වැව් හා වාරිමාර්ග සංවර්ධනය කිරීමේ වැඩ වලට ග්‍රාම සංවර්ධන සමිති සමාගම්වල ආධාර ලබා ගැනීමට වැඩ පිළිවෙලක් යෙදී මෙන් දැනට තිබෙනවට වඩා පුළුල් විධියට ඒ කටයුතු කරන්නට පුලුවනි. රටේ අමාරු තත්ත්වයක් පැතින **මෙවැනි** අවස්ථාවකදී එවැනි වැඩ පිළිවෙලකින් විශෙෂ සෙතක් සැළසෙනවාට කිසිම අඩ මානයක් නෑ. ග්‍රාම සංවර්ධන සමිති පමණක් නොව වෙනත් සමිති සමාගම් සියල්ලම රැස් කරගෙන සෑම අංශයකම ආධාරය මේ සඳහා ලබාගන්නට පුළුවනි.

ග්‍රාම සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් මීට කලින්ද ගරු මන්ත්‍රීවරයකු විසින් සඳහන් කළ බව මට මතකයි. 1946 සිටම මේ නිලධාරීන් ජීවිත ගත කරන්නෙ අහක දැමූ පිරිසක් හැටියටයි. ඒ තත්ත්වය වෙනස් කළ යුතුව තිබෙනවා. රජයේ වෙනත් නිලධාරීන්ට දෙන වරප්‍රසාද මේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ටත් ලබා දී තමන්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා කර ගෙන රාජකාරි කරන්නට ඔවුන්ටත් අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා**

*(அக்கிராசனர்)*

(The Chairman)

ගරු මන්ත්‍රීතුමා මිනිත්තු 10 කටත් වඩා දැන් කථා කර තිබෙනවා.

**කුලරත්න මයා.**

*(திரு. குலரத்ன)*

(Mr. Kularatne)

ගරු සභාපතිතුමනි, මීළඟට ග්‍රාම සේවක කොට්ඨාශ සම්බන්ධයෙන් එක් කරුණක් පමණක් කියන්නට තිබෙනවා, විශෙෂයෙන් කඳුකර උඩරට ප්‍රදේශය ගැන. ග්‍රාම සේවක මහතුන්ගේ පාලන කට යුතු පහසු කිරීම සඳහා ග්‍රාම සේවක කොට්ඨාශ දැනට වඩා කුඩා කළ යුතුව තිබෙනවා. ඒ කොට්ඨාශ තවමත් තිබෙන්නේ ගම් මුලාදෑනීන් රාජකාරි කරන කාලයේ තිබුණු ප්‍රමාණයටමයි. පාලනයේ පහසුව සඳහා මේවා දැනට වඩා කුඩා කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මා තව දුර කථා කරන්නට අදහස් කරන්නේ නෑ. ගරු ඇමතිතුමාගේ අවධානයට තව එක කරුණක් පමණක් යොමු කළ යුතුව තිබෙනවා. සමහර අවස්ථාවලදී අපේ ප්‍රදේශවල ගැමියකුට ලියුමක් ලැබෙන්ට මාස තුන හතර ගත වන අවසථා තිබෙනවා. මේ සම්බන්ධයෙන් දවස් තුනේ නීතියක් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති. එය ඉක්මණින් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලන අතර ගරු ඇමතිතුමා මෙම ඉල්ලීම් ඉෂ්ට කර දෙනවා ඇතැයි විශ්වාස කරමින් මගේ කථාව අවසාන කරනවා.

**පී. එච්. ඩබ්ලිව්. ද සිල්වා මයා.** (දෙවිනුවර)

*(திரு. பீ. எச். டபிள்யூ. டி. சில்வா—தெவிநுவர)*

(Mr. P. H. W. de Silva—Devinuwara)

ගරු සභාපතිතුමනි, ගෘහ කර්මාන්ත මාර්ගයෙන් රට සංවර්ධනය කිරීමේ කාර්යය භාරව සිටින ඇමතිවරයා වන ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගේ මේ වැය ශීර්ෂය සම්බන්ධව මට ලැබී තිබෙන කාල සීමාව ඇතුළත කෙටියෙන් කියයුතන්නේ මෙයයි. ගෘහ කර්මාන්ත සංවර්ධනය කිරීමට උපකාරී වන ඉතාමත්ම වැදගත් අංශය ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරයයි. අද බොහෝ පළාත්වල ග්‍රාම සංවර්ධන සමිති අඩපණ වී තිබෙන බව සියලුදෙනාම පිළිගන්නවා. එම නිසා ප්‍රථමයෙන්ම මේ සමිති සංශෝධනය කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එච්. ඩබ්ලිව්. ද සිල්වා මයා.]

යුතුයි. මේ පිළිබඳව ප්‍රචාරක වැඩ පිළිවෙලක් සෑම තැනම ක්‍රියාත්මක කොට ඒ මාර්ගයෙන් ග්‍රාම සංවර්ධන සමිතිවලට නව ජීවනයක් දෙන්නට ඕනෑ. නමුත් ගරු සභාපතිතුමනි, මෙම වැය ශීර්ෂයෙහි 38 වැනි පිටුවෙහි මෙකී ප්‍රචාරක කටයුතු සඳහා මුළු අවුරුද්දටම වෙන් කර තිබෙන්නේ රුපියල් දෙදාහක් පමණයි:

"Allocations to Government Agents for the organization of rural development rallies and other propaganda activities." ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳ ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් සාර්ථක අන්දමේ කිසිම දෙයක් කරන්නට මේ වෙන් කර තිබෙන මුදල සෑහෙන්නේ නැති බව ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇති.

ග්‍රාම සංවර්ධන සමිති මගින් ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වන ගෘහ කර්මාන්තවලින් ඉතා වැදගත් දෙකක් තමයි පේශ කර්මාන්තය සහ කොහු කර්මාන්තය. මෙම වැය ශීර්ෂයේ දක්වා ඇති පරිදි පේශ කර්මාන්ත මධ්‍යස්ථාන සඳහා වියදම් කරන්නට බලාපොරොත්තු වන මුදල රුපියල් 47,315යි. Capital expenditure for the establishment of handloom centres: Rs.47,315. මම හිතන්නෙ නැහැ සභාපතිතුමනි, අපේ කොට්ඨාශවලින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් අනුව මුළු ලංකාවටම අවශ්‍ය පේශ කර්මාන්ත මධ්‍යස්ථාන පිහිටුවීම මේ මුදල් ප්‍රමාණයෙන් කරන්න පුළුවන් වේය කියා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඇමතිතුමාගේ සිත යොමු කර ඒ සඳහා මීට වඩා වැඩි මුදලක් ලබා ගන්නා ලෙස මතක් කරන්න කැමතියි.

ඊ ළඟට, විදුලි බල මධ්‍යස්ථාන සම්බන්ධව දැන් වැඩ පිළිවෙළක් කරගෙන යනවා. එය ක්‍රියාත්මක කරන්නට මුදලුත් වෙන් කර තිබෙනවා. නමුත් ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ඒවා බලාපොරොත්තු වූ රටවලින් තවමත් ලැබුණේ නැත කියා මට දැනගන්න ලැබී තිබෙනවා. ඒ නිසා ඒ යන්ත්‍ර ආදිය කාවදා ලැබේවිද කියන එක ගැන විස්තරයක් ගරු ඇමතිතුමාගෙන් අපි බලාපොරොත්තු වෙනවා. ඒ මොකද? ඒ විදුලි බල මධ්‍යස්ථාන නියම කර ඇති අපේ කොට්ඨාශවල ජනතාව ඉතාමත් ඕනෑකමින් බලාපොරොත්තුව සිටිනවා ඒවා කවදා විවෘත කර ගැනීමට ලැබේදෝ කියා. එම නිසා ඒ සම්බන්ධයෙන් ඇමතිතුමාගේ හිත යොමු කර එය වහාම ක්‍රියාත්මක කිරීමට විධිවිධාන යොදන ලෙස මම ඇමතිතුමාට මතක් කරනවා.

මී ළඟට මම විශේෂයෙන් මතක් කරන්න කැමතියි, දෙවිනුවර කොට්ඨාශයේ බොහෝ දෙනෙක් යැපෙන්නාවූ කර්මාන්තයක් වන කොහු කර්මාන්තය ගැන. ධීවර කාර්මිකයන් වාසය කරන මුහුදුබඩ ප්‍රදේශවල අතිරේක ආදායමක් ලබා ගැනීමට පුළුවන් එක අතිරේක රක්ෂාවක් තමයි ගෘහ කර්මාන්තයක් වශයෙන් කරගෙන යන කොහු කර්මාන්තය. ඒ කොහු කර්මාන්තය දියුණු කිරීමටත් ඒ සඳහා මධ්‍යස්ථාන ඇති කිරීමටත් වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය මදි බව මගේ හැඟීමයි. කොහු කර්මාන්තයේ යෙදී සිටින අයට උපකාර වශයෙන් කළ යුතු දේවල් රාශියක් තිබෙනවා. එයින් ප්‍රධාන කාර්‍යය නම් කොහු කර්මාන්තය සඳහා අවශ්‍යව ඇති පොල් ලෙලි පල් කර ගැනීමේ වළවල් පහසුව සලසා දීමයි. ඒ වළවල් තිබෙන තැන්වලට යන්නට සිදු වී ඇත්තේ මඩ වගුරුවලින්; එසේ නැත් නම් අනුන්ගේ ඉඩම් උඩින්. දෙවිනුවර කොට්ඨාශයේ තලල්ල, කෝට්ටගොඩ ආදී ප්‍රදේශවල පොල්ලෙලි පල් කර ගැනීම සඳහා ඉඩ නැති නිසාත්, වළවල් තිබෙන තැන්වලට යාමට පාරවල් නැති නිසාත් ඒ ප්‍රදේශවල ජනතාවට බොහෝ අමාරුකම්වලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. ඒ නිසා මේ රටේ විශේෂ ස්ථානයක් ගන්නා වූ ගෘහ කර්මාන්ත දියුණු කිරීමටත්, ඒ කර්මාන්තවල යෙදී සිටින මහජනතාවට ආධාර උපකාර ලබා දීමටත් ක්‍රියා කරන ලෙස මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම ඒ සඳහා මධ්‍යස්ථාන ඇති කර ඒවා දියුණු කරන අතරම, ඒ මගින් සපයන දේවල් අලෙවි කර ගැනීමටත් මීට වඩා පුළුල් ව්‍යාප්ත වැඩ පිළිවෙළක් ගෙන යා යුතු බව ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා කලින් සඳහන් කළ පරිදි, ගෘහ කර්මාන්ත වශයෙන් ඇති පේශ කර්මාන්තය වේවා, කොහු කර්මාන්තය වේවා, මැටි කර්මාන්තය වේවා, මොනම සුළු කර්මාන්තයක් හෝ වේවා, එවැනි දේවලට උපකාර කිරීමෙන් ඒවායේ නිරතව සිටින අයට විශාල වශයෙන් ප්‍රයෝජන ලබා ගන්නට පුළුවනි. මැටි කර්මාන්තයේ යෙදී සිටින සමහර අයට අවශ්‍ය මැටි ලබා ගැනීමට සුදුසු ඉඩම් නැහැ. සමහර විට ඒ සඳහා සුදුසු ඉඩම් තිබුනත් ඒ ඉඩම් ඔවුන්ට අයිති නැහැ. ඒ නිසා මැටි කර්මාන්තයේ යෙදී සිටින අයට නොයෙකුත් අවස්ථාවලදී බොහොම අමාරුකම්වලට මුහුණපාන්නට සිදු වී තිබෙනව. අපේ ගම්වල ඉන්න දුප්පත් මහජනයාගෙන් සමහරු තමන්ගේ සම්පූර්ණ ආදායම් බලාපොරොත්තු වන්නේ මෙවැනි සුළු කර්මාන්තවලින්. තවත් සමහර අය අතිරේක ආදායමක් ලබා ගැනීම සඳහා මේ විධියේ සුළු කර්මාන්තවල යෙදෙනව. ඒ නිසා මේ විධියේ කර්මාන්තවලට ආධාර දීම ඉතාම වැදගත්. නමුත් මට පෙනෙන පිළිවෙළට මේ සඳහා වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය බොහොම අඩුයි. මා මේ කී සුළු කර්මාන්තවලට ආධාර දීම සඳහා—කොහු කර්මාන්ත මධ්‍යස්ථාන, පේෂකර්මාන්ත මධ්‍යස්ථාන ආදියට—වෙන් කර තිබෙන මුදල ප්‍රමාණවත් නැහැ. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කර කටයුතු කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනව.

ගරු සභාපතිතුමනි, තවත් කාරණයක් ගැන මතක් කරන්නට තියෙනව. අඩපණ වී තිබෙන ග්‍රාම සංවර්ධන සමිති සංශෝධනය කොට ඒවාට නව ජීවිතයක් දී ඒ ඒ ප්‍රදේශවල පාරවල් කැපීම, පාසල්වලට තාප්ප බැඳීම, ළිං කැපීම වැනි කටයුතු සඳහා ඒ සමිතිවල සම්පූර්ණ සහයෝගය ලබා ගැනීමට ක්‍රියා කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. අවසාන වශයෙන් රෙජිස්ට්‍රාර් මහත්වරුන් සම්බන්ධයෙන් වචනයක් කියන්නට කැමතියි. අපේ රටේ සෑම ගම්වලම පාහේ රෙජිස්ට්‍රාර් මහත්මයා සැහෙන විශේෂ තනතුරක් දරණ කෙනකු හැටියට ගමේ කව්රුත් සලකනව. නමුත් රෙජිස්ට්‍රාර් මහත්මයාට වැටුපක් නැහැ. විවාහයක් ලියාපදිංචි කළ විට ලැබෙන මුදලින් තමයි, ඒ අයට යම්කිසි ආදායමක් ලැබෙන්නෙ. විවාහයක් ලියාපදිංචි කිරීමේදී අය කරන ඒ ගාස්තුව වැඩි කරන්නය කියා මම කියන්නෙ නැහැ. නමුත් දැනට තිබෙන තත්ත්වය අනුව ගමේ විවාහ මංගල්‍ය වැඩි වුණු තරමට පමණක් රෙජිස්ට්‍රාර් මහත්මයකුට සැහෙන ආදායමක් ලැබෙන බව අප කාටත් පෙනෙනව. රෙජිස්ට්‍රාර් මහත්මයත් වෙද මහත්මය වගේ ගමේ සැහෙන කෙනකු වශයෙන් කව්රුත් සලකන නිසා ඔහුටත් සැහෙන ආදායමක් ලැබෙන්නට සැලැස්වීම ආණ්ඩුවේ යුතුකමක්. ඒ නිසා රෙජිස්ට්‍රාර් මහත්වරුන්ටත් වැටුපක් වශයෙන් නොව මාසික දීමනාවක් වශයෙන් යම්කිසි ආධාර මුදලක් ආණ්ඩුවෙන් ගෙවීමට සලස්වන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 12.30

**ඩී. බී. විජේතුංග මයා. (උඩුනුවර)**
*(திரு. டீ. பி. விஜேதுங்க—உடுநுவர)*
(Mr. D. B. Wijetunga—Udunuwara)

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට පෙර මා පළමුවෙන්ම කියන්නට කැමතියි, ජාතික රජයේ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා ඉතා දක්ෂ ජනතාවගේ සිත් දිනා ගැනීමට පුළුවන් ඇමතිවරයකු පමණක් නොව ගරු මන්ත්‍රීවරුන්ගෙත් සිත් දිනා ගැනීමට පුළුවන් ඇමැතිවරයකු බව.

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම දිසාපති සේවය ගැන වචනයක් කිව යුතුව තිබෙනව. අද දිසාපති සේවය ඉතාමත් අවුල් තත්ත්වයක තිබෙන බව අපි දන්නව. ඊට හේතුව පසුගිය අවුරුදු 9 තුළ පසුගිය රජය තමන්ගේ යම් යම් අදහස් ඉටු කර ගැනීමට මිස කිසිම ක්‍රමයක් ඇතිව දිසාපතිවරුන් පත් නොකිරීමයි. පසුගිය කාලයේ තිබුණු ඒ තත්ත්වය වෙනස් කළ යුතුව තිබෙන නිසා එයින් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාට කරදරයක් ඇති වී තිබෙනව. දිසාපතිවරුන් කොයි විධියට පත් කළ යුතුද යන්න එතුමාට අද ප්‍රශ්නයක් වී තිබෙනව. දිසාපතිවරුන් පත් කිරීම සම්බන්ධයෙන් එක්තරා කාරණයක් ගැන මම

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. විජේතුංග මයා.]

ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර වීමට බලාපොරොත්තු වෙනව. දිසාපති වරුන් වශයෙන් කටයුතු කිරීමට සුදුසු ඉතාම හොඳ පරිපාලන සේවකයන් නම් හොඳට වැඩ කළ ආදායම් පාලක නිලධාරි වරුන් බව මා විසින් මතක් කළ යුතුව තිබෙනව. පරණ ආදායම් පාලක නිලධාරි මහත්වරුන් අතර දිසා සේවය ගැන හොඳ පළපුරුද්දක් තිබෙන, ග්‍රාමීය පරිසරයෙහි ජීවත් වුණු හොඳ නිලධාරීන් ඉන්නව. ඒ අය පරිපාලන සේවයේ මොන ශ්‍රේණියේ සිටියත්, දෙවැනි ශ්‍රේණියේ හෝ වේවා, තුන් වැනි ශ්‍රේණියේ හෝ වේවා හතර වැනි ශ්‍රේණියේ හෝ වේවා—මා කියන්නෙ නැහැ, 5 වන ශ්‍රේණියෙන්ම ගන්නය කියා —ඒ අයගෙන් සේවයෙහි දක්ෂ, මනා නිපුනත්වයක් ඇති හොඳ නිලධාරීන් දිසාපතිවරුන් වශයෙන් පත් කිරීමට තෝරා ගැනීම ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනව.

ඊළඟට ආදායම් පාලක නිලධාරි සේවය ගැන මතක් කළයුතුව තිබෙනව. පරිපාලන සේවය පටන් ගත් විහාම ආදායම් පාලක නිලධාරි සේවය අහෝසි වූ බව තමුන්නාන්සේ දන්නව. ඒ සේවය අහෝසි වීමෙන් පසු ඊට පත් කරන්ට යන්නෙ අළුතෙන් පරිපාලන සේවයට වද්ද ගන්න තරුණ මහත්වරුයි. මා කියන්නෙ නැහැ, ආදායම් පාලක නිලධාරීතුමන්ලා රාජකාරි පටන් ගත්තෙ තරුණ වියේ කියල. නගර බද ජීවත් වන්නට පුරුදු වුණු විශ්ව විද්‍යාලවලින් උපාධි ලබාගෙන පිටවූ තරුණයන් ග්‍රාමීය පරිසරයක් නැතිව මෙම සේවයට වද්ද ගන්නට අපි අදහස් කළොත් වෙන්නෙ, දන් දිසා සේවයට දිසාපතිවරුන් තෝරා ගැනීමට අමාරු තත්ත්වයක් තිබෙන්නා වාගේම මේ සේවයත් ඒ තත්ත්වයට පරිවර්තනය වීමයි. හොඳට ඉගෙන ගෙන විශ්ව විද්‍යාලයීය අධ්‍යාපන යක් ලබාගෙන පරිපාලන සේවයේ ලොකු විභාගයකිනුත් සමත්වෙලා ගමකට ගිහින් ආදායම් පාලක නිලධාරි තනතුරක් කරන්ට යයි කිව්වාම, නගරයක සිට ඇවිත් සේවය කරන්ටයි, ඔවුන් බලාපොරොත්තු වෙන්නෙ. ගමට සම්පූර්ණ කාලය යොදවා වැඩ කරන්ට හැකියාවක්, පළපුරුද්දක් ඔවුන්ට නැති නිසා ඒ සේවය නිසියාකාර ඉෂ්ට වන එකක් නැහැ. ආදායම් පාලක නිලධාරි සේවා විභාගය වැනි විභාගයක් පවත්වා, නැවත ඒ සේවය අරඹා එහි යෙදෙන ගමන්ම පරිපාලන සේවයට ඔවුන් අන්තර්ගත කරන්ට හැකි වන අන්දමට එම සේවය සකස් කරන ලෙස මා යෝජනා කරන්ට කැමතියි. මා එසේ කියන්නෙ මේ සේවය අබලන් වීගෙන යන සේවයක් නිසයි.

ඊළඟට ග්‍රාම සංවර්ධන නිලධාරීන් ගැනත් වචනයක් කියන්ට ඕනෑ. මන්ත්‍රීවරයෙකු කියනව මට ඇහුන, ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය අබලන්වී තිබෙන්නෙ ග්‍රාම සංවර්ධන නිරධාරීන්ගේ උදාසීනත්වය නිසාය කියා. මා එය පිළිගන්නව. ග්‍රාම සංවර්ධන නිලධාරීන් උදාසීන වන්නට කාරණා කීපයක් තිබෙනව. ඉන් එකක් තමයි, ඒ සේවයේ දොර වසා තිබීම. එහි කෙළවරක් තිබෙනව. ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරෙන් පටන් ගෙන එතැනින්ම ඉවර වෙනව. පඩි වැඩි වීමක් නම් තිබෙනව. ග්‍රාම සංවර්ධන නිලධාරි සේවය දැනට සකස් වෙලා තිබෙන්නාක් මෙන්ම පඩි වැඩිවීමේ සේවයක් වශයෙන් තිබෙන අතර ඒ සේවයේ උසස්වීම් දෙකතුනක් ඇති කරන්ට ඕනෑ කියා මා යෝජනා කරනව. කෙනෙකුට දියුණුවන්ට අභිලාෂයක් තිබෙනව නම්, බලාපොරොත්තු විය හැකි යම්කිසි අරමුණක්, තත්ත්වයක්, තිබෙන්ට ඕනෑ. පඩියෙන් පමණක් නොව තමන් දරණ තත්ත්වයෙනුත් උසස්වන්ට ඉඩ තිබෙන්ට ඕනෑ. එවැනි දේ බලාපොරොත්තුවීම මනුෂ්‍ය ගතියක්. එම නිසා ඉතා ජ්‍යෙෂ්ඨ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ට පුළුවන්කම තිබෙන්ට ඕනෑ, ලංකා පරිපාලන සේවයට ඇතුළත්වීමේ වරප්‍රසාදය. ඒක අද ඔවුන්ට නැහැ. මේ කරුණු ගැන සොයා නොබලා ග්‍රාම සංවර්ධන නිලධාරීන් උදාසීන යයි කියමින් මේ සේවය අබලන් වෙන්ට ඉඩ හැරීම වැරදියි. ඒකට කරන්ට තිබෙන්නෙ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ සේවය සතුටුදායක අන්දමට සකස් කරන එකයි. ඒ මහතුන්ගෙන් අපට බලහත්කාරයෙන් සේවය ලබා ගන්ට පුළුවන්කමක් නැහැ. ඒ කාරණයට ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්ට කැමතියි. ග්‍රාම සංවර්ධන සේවය ඉතා වැදගත් සේවයක්. ඒ නිලධාරීන් ලංකාවේ තිබෙන ගම් පන් දහස් ගණනේ අස්සක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුල්ලක් නැර ගිහින් ගම්වල උදවියට ස්වාධීනත්වය, සදාචාරය, ස්වෝත්සාහය අන්‍යොන්‍ය වැටහීම, අන්‍යොන්‍ය සේවය ආදිය ගැන දේශනා පවත්වන්ට ඕනෑ. ගම් වැඩි දියුණු කරන්ට ඉවහල් වූ සේවයක් ග්‍රාම සංවර්ධන සේවය නමින් හඳුන් වන්නෙ. එම නිසා මෙම සේවය ගැන පසුගිය රජය මෙන් නොව මේ රජය විශේෂ සැලකිල්ල යොමු කර, සේවයේ තිබෙන අඩුපාඩු සකස් කර—සමහරවිට ඊට මුදල් අවශ්‍ය වෙන්නෙ නැහැ—ග්‍රාම සංවර්ධන නිලධාරීන්ට පාලන තත්ත්වයක්, උසස්වීම් ක්‍රමයක් සකස් කරන්ට ඕනෑ. ඔවුන් තුළ යම්කිසි අභිලාෂයක් ඇතිවන අන්දමට ඔවුන්ට පරිපාලන සේවයට ඇතුළත්වීමේ අවස්ථාවත් සලසා දෙන්ට වටිනව.

ඊළඟට මා බලාපොරොත්තු වෙන්නෙ උඩරට ගැමි කොමිෂන් සභාව ගැන වචනයක් දෙකක් කියන්ටයි. මගේ කොට්ඨාශය ගම් 46 කින් පරිපූර්ණ කොට්ඨාශයක්. එහෙත් එකම නගරයක්වත් නැහැ, ගරු සභාපතිතුමනි, ලංකාවේ තිබෙන ගම් පත් දහස් ගණන තමයි, ලංකාවේ ජීවනාලිය. මේ ගම් අපි දියුණු කරන්ට ඕනෑ. ගරු සභාපතිතුමනි, මේ වතාවෙත් උඩරට ගැමි කොමිෂන් සභාවේ කටයුතු සඳහා වෙන් කර තිබෙන්නෙ, පසුගිය වතාවෙ වෙන් කළ මුදලමයි, එනම් රුපියල් ලක්ෂ 41 යි. මේ රුපියල් ලක්ෂ 41 කොහෙත්ම ප්‍රමාණවත් නැහැ. ගම්බද පළාත්වල විශේෂ අඩුපාඩුකම් තිබෙනව. මගේ කොට්ඨාශයේ තවම තිබෙනව, ලෙඩුන් පල්ලැක්කියෙන් ආරෝග්‍යශාලාවට ඔසවාගෙන යන්ට සිදුවී තිබෙන ගම්. මහනුවර නගරයට ඇත්තේ හැතැප්ම හතරක් වුවත් පාරක් තොටක් නැතිකමින් එහි මිනිසුන් බොහෝ කරදර විඳිනවා. මේ වර උඩරට ගැමි පුනරුත්ථාපන කටයුතු සඳහා වෙන් කර තිබෙන රුපියල් ලක්ෂ 41 ක පාරවල් සඳහා වියදම් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ආරෝග්‍යශාලා සෑදීමට වෙනම දෙපාර්තමේන්තුවක් තිබෙනවා. පාඨශාලා සෑදීමට වෙනම දෙපාතීමේන්තුවක් තිබෙනවා. පාරවල් සෑදීමට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව තිබුණත් ඊට මුදල් වෙන් කර දී නැහැ. ගම්කාර්ය සභාවලට සුළු "ග්‍රාන්ට්" එකක් දුන්නත් ගම්බද ප්‍රදේශවල පාරවල් දියුණු කිරීමට එය කිසිසේත් ප්‍රමාණවත් වන්නේ නැහැ.

එම නිසා උඩරට ගැමි පුනරුත්ථාපන කටයුතු සඳහා වෙන් කර ඇති සම්පූර්ණ මුදල පාරවල් සෑදීම සඳහා යොදවන්න. පාරක හැතැප්මක් සෑදීම සඳහා රුපියල් 75,000 ක් තක්සේරු කර තිබෙනවා. ඒ මුදල විශාල වැඩියි. අනික් දෙපාර්තමේන්තුත් සමග සාකච්ඡා කර රුපියල් 25,000 කට පමණ පාර හැතැප්මක වැඩ ඉවර කර ගන්නට හැකි ක්‍රමයක් ඇති කළ යුතුයි. ඒ අතර උඩරට ගැමි පුනරුත්ථාපන කටයුතු සඳහා මීට වඩා වැඩි මුදලක් වෙන් කර ඊට මේ ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු ඇමතිතුමා ක්‍රියා කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට සුරාබදු දෙපාර්තමේන්තුව ගැනත් මතක් කරන්නට කැමතියි. කසිප්පු සංහාරය ගැන නිතර නිතර කථා කරනවා අපට ඇසෙනවා. නමුත් මේ රටේ කසිප්පු බොන අය තමන් බොන්නේ මොනවාදැයි නොදැන ඒවා බොන බව අප දන්නවා. ආගම ඇදහීමෙන් හෝ ආශ්‍රයෙන් හෝ ගුණ ධර්මයෙන් හෝ ඒ අය නියම තත්ත්වයකට ගෙන එන්නට පුළුවන් වන තුරු ආණ්ඩුවේ බල පත්‍ර උඩ බීම බෙදා දීමේ ක්‍රමයක් ඇති කරන්න ඕනෑ.

රෙජිස්ට්‍රාර් ජෙනරල් දෙපාතීමේන්තුව ගැන ඊළඟට මතක් කරන්නට කැමතියි. මේ දෙපාතීමේන්තුව මගින් විවාහ ලේකම්වරුන් පත් කර තිබෙනවා. එක කෝරළේට එක ලේකම්වරයා බැගින් පත් කර තිබෙනවා. දැන් ජනගහණය සියයට 20 ගණනකින් වැඩි වී තිබෙන නිසා මීට වඩා ලේකම්වරුන් සංඛ්‍යාවක් පත් කර ගත යුතුයි. ලේකම්වරුන්ගේ ප්‍රධාන කටයුත්ත වන්නේ විවාහ ලියාපදිංචි කිරීමයි. මාසයකට විවාහ කටයුතු සඳහා සුදුසු දවස් තිබෙන්නේ කීපයයි. ඒ නිසා ඒ ශුභ දවස් කීපයේදී විවාහයක් රෙජිස්ටර් කිරීම සඳහා පෝලිමේ පැය ගණනක් සිටින්නට ගම්බද ප්‍රදේශවාසීන්ට සිදු වෙනවා. එම නිසා දැනට පත් කොට සිටින ගණනට අතිරේකව කසාද ලේකම්වරුන් හැකි තරම් පත් කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ කළහොත් එයින් මහජනතාවට ලොකු පහසුවක් සැලසෙනවා. එක එක මන්ත්‍රී කොට්ඨාශයකට අතිරේක වශයෙන් ලේකම්වරුන් හතර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. විජේතුංග මයා.]

පස් දෙනකු පත් කිරීමට කටයුතු කරන්න. එතකොට මනමාල ජෝඩුවලට පෝලිම් ගැසී ඉන්නට ඕනෑ වන්නේ නැහැ. මා නියෝජනය කරන කොට්ඨාශයේ සිටින ලේකම්වරයාගේ කාර්යාලයට හැතැප්මක පමණ දුරක් තිබෙනවා. වැසි දවස්වලට ජෝඩුවලට ඒ දුරවත් යන්න අමාරුයි. සාමාන්‍යයෙන් නැකැත් තිබෙන දිනවලට වැසි වැසීමත් සිදු වෙනව. එසේ වැසි වැස්සොත් මනමාල ජෝඩුවට ලේකම්වරයාගේ කාර්යාලයට යන්න හුඟක් අපහසුයි. මා නියෝජනය කරන කොට්ඨාශයට පමණක් නොව අනික් ගරු මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවලට ද අතිරේක වශයෙන් ලේකම්වරුන් පත් කොට මහජනයාගේ වැඩ පහසු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**රාජා වෙලේගම මයා.**

*(திரு. ராஜா வெலேகம)*

(Mr. Raja Welegama)

ගරු සභාපතිතුමනි, අවුරුදු 8 ක් පමණ කාලයක් තිස්සේ ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය යටතේ සිටි නිලධාරියකු වශයෙන් එසේ නැත්නම් ග්‍රාම සංවර්ධන නිලධාරියකු වශයෙන් සේවය කර ඇති මට ඒ අමාත්‍යාංශය යටතේ මෙම සාකච්ඡාවට සහභාගිවීමට ලැබීම සතුටට කාරණයක්. මුලින්ම ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ගැන වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට කැමතියි. මට ප්‍රථම කථා කළ ගරු මන්ත්‍රීවරුන් ඒ ගැන සෑහෙන විස්තරයක් කළ බව ඇත්තයි. නමුත් අපේ රටට නිදහස ලැබුණාට පසුව මේ රට තුළ ඇති වූ ප්‍රගතිශීලී ව්‍යාපාර අතර මේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ප්‍රමුඛස්ථානය ගන්නා බව සඳහන් කරන්නට ඕනෑ. මේ රටේ මහ ජනයා සංවිධානාත්මක ප්‍රතිපත්ති අනුව සිතීමටත් ක්‍රියා කිරීමටත් අභ්‍යාසයක් නැත්නම් පුරුද්දක් ලැබුවේ මේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයෙන්ය කියන එක අපට අමතක කරන්නට බැහැ. එපමණක් නොවෙයි, අපේ රටට නිදහස ලැබුණාට පසු නිදහස් ජාතියක් වශයෙන් මේ රටේ ජනතාව මේ රටේ අභිවෘද්ධිය සඳහා සහභාගී කර ගැනීමට පුළුවන් වූ ව්‍යාපාරයත් මේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයය කියන එක මතක් කර දෙන්න කැමතියි. එහෙත් මේ ව්‍යාපාරය 1946 දී අත්හදා බැලීමේ ව්‍යාපාරයක් වශයෙන් ආරම්භ කර, ඊට පසු 1948 දී ලංකාවට නිදහස ලැබුණාට පසු දිවයින ව්‍යාප්ත ව්‍යාපාරයක් වශයෙන්, දෙපාර්තමේන්තුවක් වශයෙන්, ආරම්භ කර අවුරුදු 17 ක් 18 ක් කටයුතු කර ගෙන ගොස් තිබෙනව. මේ කාලය ඇතුළත මේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමේදී එයින් රටට වූ සේවයත් එහි ප්‍රමාද දෝෂාදිය පිළිබඳව හොඳ අත්දැකීමකුත් මේ රටේ මහජනතාවට ලැබී තිබෙන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි. එමෙන්ම ආණ්ඩු පක්ෂයෙනුත් විරුද්ධ පක්ෂයෙනුත් කථා කළ ගරු මන්ත්‍රීතුමන්ලා කවුරුත් කිවේ මේ ව්‍යාපාරය මේ රටට අවශ්‍යයි, එමෙන්ම මේ ව්‍යාපාරය දැනට තිබෙන තත්ත්වයට වඩා හොඳින් ප්‍රතිසංවිධානය කර හොඳ දියුණුවක් ඇති කරන්න ඕනෑය කියන එකයි. මාත් ඒ අදහස අනුමත කරන අතරම, මෙය තවදුරටත් කල් දමන්නේ නැතිව හැකි පමණ ඉක්මණින් ආරම්භ කරන්නය කියා මේ අවස්ථාවේදී ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

පසුගිය කාලයේදී නොයෙක් විධියේ ක්‍රමවලට මේ ව්‍යාපාරය සමාලෝචනය වූ බව අපි දන්නව. පසුගිය රජය තිබුණු කාලයේ එක්සත් ජාතීන්ගෙන් නියෝජිත පිරිසක් පැමිණ මේ ව්‍යාපාරය මේ රටේ ක්‍රියාත්මක වන අන්දම ගැන විග්‍රහයන් කර පරීක්ෂණ පවත්වා රජයට වාර්තාවක් ඉදිරිපත් කළ බව අපි දන්නව. පසුගිය වර්ෂය පිළිබඳව ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාගේ පාලන වාර්තාවත් මා දැක්කා. එයිනුත් ඉතා පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනව, මේ රටේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය අලුත් මුහුණුවරකින් ආරම්භ කිරීමට ප්‍රතිසංවිධානය කළ යුතුය කියා. ඒ නිසා මෙය තවදුරටත් කල් නොදමා පළමු වැනි වර්ෂයේදීම මේ ගැන කටයුතු කරන්නය කියා මා විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මතක් කරනව. මේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය පිළිබඳව අත්දැකීමක් ලැබූ මන්ත්‍රීවරුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වශයෙන් අපි සෑම අවස්ථාවකදීම සූදානම්, එතුමාට ඒ කටයුත්ත කිරීමට අපගේ සහයෝගය ලබා දීමට.

අ. භා. 12.45

එමෙන්ම මේ ග්‍රාම සංවර්ධන වැඩ ගම්වල ව්‍යාප්ත කරන, ග්‍රාම සංවර්ධන නිලධාරීන් වශයෙන් හැඳින්වෙන නිල ධාරීන්ගේ අභිවෘද්ධිය පිළිබඳව මේ ව්‍යාපාරය ප්‍රතිසංවිධානය කරන අවස් ථාවේදී සලකා බැලිය යුතුයි. 1940 සිට 1948 දක්වා මේ නිලධාරීන් "කොමර්ස්" දෙපාර්තමේන්තුව නැත්නම් වාණිජ දෙපාර්තමේන්තුව යටතේ සේවය කළා. ඒ කාලයේදී එක්තරා වැටුප් ක්‍රමයක් නිර් දේශ කළා. අද දක්වාමත් සුළු සුළු වෙනස් කම් සහිතව පවත්වා ගෙන යන්නේ ඒ වැටුප් ක්‍රමයමයි. ඊට පසු 1946 දී රජයේ සේවකයින්ගේ පඩි පිළිබඳව පරීක්‍ෂා කරන අවස්ථාවේදී මේ නිලධාරීන්ගේ පඩි වැඩි කිරීම සම්බන්ධව කිසිවක් කළේ නැහැ. එසේ කළේ ඒ අවස්ථාවේ ඒ සේවය අත්හදාබැලීමේ අවස්ථාවක් වශ යෙන් තිබුණු නිසයි. ඊට පසු 1953 දී සෝලියර් කොමිෂන් සභාව වැටුප් ක්‍රමයෙ තිබෙන දුබලතාවයන් නැත්නම් "ඇනෝ මලීස්" ගැන කල්පනා කළා. ඒ අවස්ථාවේ දීත් මේ නිලධාරීන්ගේ පඩි පිළිබඳව දියුණු වක් ඇති වූයේ නැහැ. පොදුවේ කොයි රජයේ සේවකයාටත් වැඩි කළ රුපියල් 10 යේ ආධාරය පමණයි මොවුන්ටත් ලැබුණේ.

බලපිටියේ ගරු මන්ත්‍රීතුමාත්, රක් වානේ ගරු මන්ත්‍රීතුමාත්, උඩුනුවර ගරු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළා, මේ නිලධා රීන්ගේ උදාසීනත්වයක් තිබෙනවාය කියා. මා හිතන හැටියටත් එහි ඇත්තක් තිබෙනවා. එයට හේතුව මේකයි. ඒ නිල ධාරීන් ධෛර්යමත් කිරීමට සේවයෙන් ලබන පහසුකම් ප්‍රමාණවත් නැහැ. ග්‍රාම සංවර්ධන නිලධාරීන් ඉතාම උනන්දු වෙන් වැඩ කරනවාය කියා අපේ රත් තොට ගරු මන්ත්‍රීතුමා කීවා. ඒ ප්‍රකාශ යත් ඇත්තයි. තරුණ කාලයේදී තරුණ යින් වශයෙන් දෙපාර්තමේන්තුවට බැඳන විට බොහෝම උනන්දුවෙන් වැඩ කරනවා. සමහරවිට පාර්ලිමේන්තු ආසන යක් තරඟ කර දිනා ගන්නත් පුළුවන් වෙනවා. එහෙත්, හැමටම ඒ අවස්ථාව ලැබෙන්නෙ නැහැ. එමෙන්ම තමන්ගේ පවුල් බර වැඩිවන විට නොයෙකුත් ප්‍රශ්න මතු වෙනවා. එවිට ඔවුන්ට ග්‍රාම සංවර්ධනය ගැන නොවෙයි ඔවුන්ගෙ ප්‍රශ්න ගැන සිතා පසුතැවිල්ලෙන් සිටින්නටයි සිදු වෙන්නෙ. ඒ නිසා තමයි, ඒ ව්‍යාපාරය වැඩි දියුණු කිරීම සඳහා අවස්ථාවක් ඒ නිලධාරීන්ට නොලැබෙන්නේ.

ඒ වාගේම තවත් ප්‍රශ්නයක් තිබෙ නවා. අද සමාජ තත්ත්වය අනුව, අද අපේ රට මුහුණපා තිබෙන තත්ත්වය අනුව, මේ ව්‍යාපාරය මීට වඩා ප්‍රාණවත් ලෙස ගෙන යා යුතුයි. මේ ව්‍යාපාරය සඳහා ඉතාම දක්ෂ පුද්ගලයින් බඳවා ගත යුතු යි. මේ නිලධාරීන්ට ලැබෙන වැටුප් හා සේවා තත්ත්වය අනුව බලන විට ඉතා දක්ෂ දැන උගත්කම් ඇති අය මේ ව්‍යාපා රයට බැඳෙන්නට මැලි බව පෙනී යනවා ඇති. ඒ නිසා මේ නිලධාරීන්ගේ වැටුප් වැඩි කළහොත් මීට වඩා උසස් අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ඇති අය බඳවා ගන් නට පුළුවන් වෙනවා ඇති. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ගැන මම කථා කිරීමට බලාපොරොත්තු වන්නේ එපමණයි. මම බලාපොරොත්තු වෙනවා, ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයේත්, එම ව්‍යාපාරයේ යෙදී සිටින නිලධාරීන්ගේත් දියුණුව පිණිස වර්තමාන ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා සුදුසු වැඩ පිළිවෙලක් ඇති කරාවිය කියා.

ඊළඟට ගැමි පුනරුත්ථාපනය පිළිබඳව වචන ස්වල්පයක් කීමට මම අදහස් කර නවා. මේ පිළිබඳව කලින්ට වඩා ඇඩි පරි ශ්‍රමයකින් කටයුතු කෙරීම ගැන මම සත් තෝෂ වෙනවා. පසු ගිය දිනවල ස්වදේශ කටයුතු භාර උප ඇමතිණිය අපේ ප්‍රදේශ යට ගොස් සාකච්ඡා පවත්වා තීරණ රාශි යකට එළඹුණා. මේ අවස්ථාවේදී මම තවත් කරුණු කිහිපයක් පෙන්නා දීමට කැමතියි. 1960 න් පසු මේ දක්වා කොම සාරිස්වරුන් තුන් දෙනෙක් පත් කර තිබෙනවා. කලින් කොමසාරිස්වරුන් දෙදෙනෙක් සිටියා. මේ ආණ්ඩුවෙනුත් අළුත් කෙනෙක් පත් කර තිබෙනවා. මේ කොමසාරිස්වරුන් ඒ වැඩ කටයුතු කිරීම සඳහා බොහොම උත්සාහ ගත්තා. දැන් පත්ව සිටින කොමසාරිස්තුමා කෙරෙහිත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

අපේ ලොකු විශ්වාසයක් තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ කොමසාරිස්වරුන් මාරු කිරීමෙහි නොවෙයි. එම කටයුතුවලට අදාළ නිර්දේශයන් හියි. ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව මේ නිර්දේශයන් කර ඇත්තේ දැනට අවුරුදු 15 කට 20 කට පමණ පෙර තිබුණු තත්ත්වය අනුවයි. ඒ කාලයට වඩා විශාල වෙනසක් අද රටේ ඇති වී තිබෙනවා. ඒ නිසා මේ ගැමි පුනරුත්ථාපන කටයුතු සාර්ථක අන්දමින් කරගෙන යාමට වුවමනා නම් මේ නිර්දේශයන් අද රටේ තත්ත්වයට හා අවශ්‍යතාවයන්ට අනුව වෙනස් කළ යුතුයි. පසු ගිය ආණ්ඩුව මඟින් පස් අවුරුදු සැලැස්මක් ඇති කළා. එහි නිර්දේශයන්ට ඇතුළත් වූයේ මුල් නිර්දේශයන්මයි. එය ඇති කළේ ඒ වැඩ ක්‍රමානුකූලව කිරීමේ බලාපොරොත්තුවෙනුයි. මම ගරු ඇමතිතුමාගෙන ඉල්ලා සිටිනවා, අද සමාජය ලබා ඇති දියුණුවට අනුව, විද්‍යාව විදුලි බලය ආදියේ දියුණුවට අනුව, අපේ ගම්බද ප්‍රදේශ දියුණු කිරීමට පුළුවන් වන අලුත් නව නිර්දේශ පද්ධතියක් ඇති කරන්න වය කියා.

**සභාපතිතුමා**
(அக்கிராசனர்)
(The Chairman)

ගරු මන්ත්‍රීවරයාගේ වේලාව අවසානයි.

**රාජා වෙලේගම මයා.**
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)

තව මිනිත්තු දෙකක් දෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා**
(அக்கிராசனர்)
(The Chairman)

දෙවිනුවර මන්ත්‍රීතුමා වාගේ හරියට ම වේලාවටම නවත්වනවා නම් මම ගරු මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. මිනිත්තු 10 කදී හුඟක් දේ කියන්න පුළුවනි.

**රාජා වෙලේගම මයා.**
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)

මගේ කොට්ඨාශයේ ඇති තානායම් පිළිබඳව වචනයක් කියා අවසන් කරන්නම්.

මගේ කොට්ඨාශයේ තානායම් තුනක් තිබෙනවා; තනමල්විල, වැල්ලවාය හා මොනරාගල. මේ තානායම් තුනම පාලනය වන්නේ ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය මඟිනුයි. ඒ තානායම්වල තත්ත්වය ඉතා කනගාටුදායකයි. කතරගම, මහියංගණය, අම්පාරේ ආදී ප්‍රදේශ කරා නොයෙක් පළාත්වලින් එන මහජනයා මේ තානායම්වල සැප පහසු බලාපොරොත්තු වෙනවා. ඒ නිසා ඒවායේ ගොඩනැගිලි මීට වඩා විශාල කර, ඒවායේ තත්ත්වයද උසස් කළහොත් ඉන් කාටත් ප්‍රයෝජනයක් වෙනවා. මට මෙතෙක් වේලා කථා කිරීමට අවසර දීම ගැන තමුන්නාන්සේට බොහොම ස්තුතියි.

**පී. බී. ඒ. වීරකෝන් මයා.** (වත්තේගම)
(திரு. பீ. பி. ஏ. வீரக்கோன்—வத்தேகம)
(Mr. P. B. A. Weerakoon—Wattegama)

සභාපතිතුමනි, උඩරට ගැමි කොමිෂන් සභාවේ වාර්තාව ක්‍රියාත්මක කිරීම පිළිබඳව වචන ස්වල්පයක් කීමට මම අදහස් කරනවා. සුද්දන් විසින් උඩරට ඉඩම් කොල්ල කෑම නිසා දුක්ඛිත තත්ත්වයකට වැටුනු උඩරට ගැමි ජනතාව නඟා සිටුවීමේ අදහසිනු, උඩරට ගැමි කොමිෂන් සභාව තම වාර්තාව සකස් කළේ. ඒ කාර්යය සඳහා අවශ්‍ය මුදල් මේ පාර්ලිමේන්තුවෙන් වෙන් කළ යුතුයි. මුදල් වෙන් කර තිබෙන්නෙ, ලක්ෂ 42 යි. දෙලක්ෂයක් ජනතාව නැඟිටුවන්න පුළුවන්ද, රුපියල් ලක්ෂ 42කින් ? අවුරුදු සිය ගණනක් තිස්සෙ ලංකාවෙ නිදහසට සටන් කළ ඒ අය අද ඉතා දුක්ඛිත තත්ත්වයකයි සිටින්නෙ. මෙන්න මේවායි ඒ අයට මුහුණ පාන්නට තිබෙන ප්‍රශ්න : ඒ අයට හරියාකාර කන්න නැහැ, අඳින්න නැහැ, රක්ෂා නැහැ, අධ්‍යාපනයක් නැහැ, කරදරයක් නැතිව යන්න එන්න පාරවල් නැහැ, සෞඛ්‍ය ප්‍රශ්න විසඳගන්න විධියක් නැහැ. ඒ නිසා විශෙෂයෙන්ම ඒ ජනතාව වෙනුවෙන් ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව, නැවත වරක් කැබිනට් මණ්ඩලය ඉදිරියට ගොස් මේ ජනතාව වෙනුවෙන් අප එදා ඉල්ලා සිටි ලක්ෂ 100 ලබා දෙන්ට සටන් කරන ලෙසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බදියුද්දීන් මැතිතුමා සිටි කාලෙ දුප්පත් ජනතාවට තවත් පහරක් ගැහැව්වා. සැත පුම් 2 කින් ඈතට අධ්‍යාපනය ලබා ගැනීම සඳහා දුප්පත් ගම්බද ළමයකුට යන්න බැරි වන විධියට එතුම නීතියක් දැම්මේ. සැතැප්ම 2 කින් එහා ගම්බද ළමයින්ට අධ්‍යාපනය සඳහා යන්න බැරිවූ. මෙයින් දුප්පත් ගම්බද ළමයාට සිදු වන්නෙ, ගම් බදටම සීමා වී ඉන්නටයි. ඒ ළමයින්ට වාලූන් වෙන්ටයි, සිදු වන්නෙ. මේ අන් දමට ඒ ළමයින්ට නියම අධ්‍යාපනයක් ලබා ගන්න බැරි වුණාම ඔවුන්ට සිදු වන්නෙ කොළඹ ගෙවල පොල් ගාන්න, වළං හෝදන්න එන්නයි; වීදි අතුගාන්න යන්නයි; නොයෙක් විධියෙ කුලී වැඩ කරන්නයි. කන්න අදින්න නැතිකම නිසා, වුවමනාවෙන්ම එවැනි දේට එන්න සිදු වී තිබෙනව. කන්න අදින්න නැති කම නිසා, මේ අන්දමේ නොයෙකුත් කර දරවලට මුහුණ පාන්න ඒ අයට සිදු වෙන ව. මේ ගැන කෑ ගහන්න කෙනෙක් නැහැ. අපට කතා කිරීමත් සීමා වෙලා. එම නිසා මා තමුන්නාන්සෙ ඉදිරියෙ කෙටියෙන් කියා සිටිනව මෙම නීතිය වෙනස් කළ යුතු බව. ගැමි කොමිෂන් සභා වාර්තාව අනුව ඒ අයට නගරවලට පැමිණ අධ්‍යාපනය ලබා ගන්න පහසුකම් සලස්වන්න ඕනෑ.

ගුරුවරයකු වශයෙන් මට එක කාරණ යක් කියන්න පුළුවනි. මා ගම්බද දරුවන් විශාල ගණනකට උගන්වා තිබෙනව. ඒ අයගෙන් සමහරෙකුට සිවිල් නිලධාරීන් වෙන්න පුළුවන් වුණා; ඒජන්තවරුන් වෙන්න පුළුවන් වුණා. තවත් සමහරෙකුට විශ්ව විද්‍යාලයේ විද්‍යා අංශයෙන් සිය යට 97 ක සාමාන්‍ය ලකුණු ලබා ගෙන තත්ත්වයක් ඇති කර ගන්න පුළුවන් වුණා. මේ විධියට සාමාන්‍ය දක්ෂකමක් තිබුණත් උඩරට ගම්බද ජනතාවගෙ ළමයි අද දුක් විඳිනව. උඩරට ගැමි කොමිෂන් සභා වාර්තාවේ යෝජනා නිසියාකාර ක්‍රියාවෙ යොදවා ඒ අයට අධ්‍යාපන පහසුකම්, ගමනා ගමන පහසුකම් ආදිය සලස්වා දෙන්න ඕනෑ. අධ්‍යාපන පහසුකම් නිසි විධියට සලස්වනව නම් ඒ දරුවන්ට නගරවල විද්‍යායතනවලට ඇතුළු වී අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ශිෂ්‍යත්ව දෙන්න ඕනෑ. එසේ ඇවිත් ඉගෙන ගන්න මුදල් අතින් උදව් දෙන්නත් ඕනෑ. ඉංජිනේරු අංශයෙ, කාර්මික අංශයෙ සහ තවත් නොයෙකුත් කර්මාන්ත අංශවල ඉගෙනීම් පහසුකම් ලබා ගැනීම සඳහා ශිෂ්‍යයන්ට ආධාර දෙන්න ඕනෑ.

ලංකාවෙ කෝටියක ජනතාවක් සිටිනව. ඒ පිරිසෙන් ලක්ෂ 35 ක් පමණ අයින් කර දමා ක්‍රියා කරනව නම්, රටක් දියුණු කරන්න පුළුවන් වේය කියා මා සිතන්නෙ නැහැ. මේ ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා අධ්‍යාපනයට විශාල සේවයක් කළ කෙනෙක්. එම නිසා උඩරට ගැමි කොමිෂන් සභා වාර්තාව ක්‍රියාවෙ යෙදවී මෙන් මේ ගැමි දරුවන්ගෙ අභිවෘද්ධිය සඳහා කටයුතු කරන හැටියට මා එතුම ගෙන් ඉල්ලා සිටිනව. උඩරට දරුවන්ගෙ අධ්‍යාපනය ගැන මට හුඟක් කරුණු ඉදිරි පත් කරන්න පුළුවනි. තමුන්නාන්සෙගෙ අංශයට අයිති හරිය නිසියාකාර කෙරෙන්න ඕනෑ බවයි මා කියන්නෙ. මහනුවර කොට් ඨාශයට යාබද කොට්ඨාශයෙ සිටින ලෙඩෙක් කටුගස්තොට ආරෝග්‍ය ශාලාවට ගෙනෙ න්ට වුවමනා වුණොත් බූරු ඇඳක තියා ගෙන හතර පස් දෙනෙක් එකතු වෙලා ඔසවගෙන ආ යුතු තත්ත්වයකුයි තියෙ න්නෙ. පාරවල් නැතිකම නිසයි එසේ වී තිබෙන්නෙ.

එම නිසා මා ප්‍රශ්න කරනව, කොයි අතින්ද උඩරට අපට සංවර්ධනයක් ලැබී තිබෙන්නෙ කියා. මා කෑ ගහන්නෙ අපේ ජනතාව වෙනුවෙනුයි. ඒ ජනතාව අද දුක් විඳින නිසා මට කෑ ගහන්න සිදු වී තිබෙනව. දැන් මෙතනදී ගරු මන්ත්‍රීවර යෙක් පාරවල් ගැන කථා කළා. පාරවලින් පමණක් රටක් දියුණු කරන්න බැහැ. ග්‍රාම සංවර්ධන සමිතිවලින් සෑහෙන තර මක වැඩ කෙරී තිබෙනව. විශෙෂයෙන් ගම් බද ගැහැණු දරුවන්ගෙ රැකී රක්ෂා ප්‍රශ් නය විසඳන්න ඒ මගින් උදව්වක් ලැබී තිබෙනව. නමුත් දැන් ඒ වැඩ පිළිවෙළ වල් නිසියාකාර ක්‍රියාවෙ යෙදවෙන්නෙ නැහැ. 1948 දිසි ග්‍රාම සංවර්ධන සමිති පටන් ගත්තෙ. ඒවයෙ කටයුතු ක්‍රියාත් මක වෙනව මදි බව කියන්ට ඕනෑ. මේවා ක්‍රියාත්මක වනව නම් දෙපාර්ත මේන්තුවල අවහිරකම් බොහෝ දුරට මග හැරෙනව. ප්‍රජා මණ්ඩල තිබෙනව, සමුප කාර සමිති තිබෙනව, විවිධ සේවා සමුප කාර සංගම් තිබෙනව; ඔන්න ඔය විධියෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරකෝන් මයා.]

නොයෙක් නොයෙක් සමිති සමාගම් තිබෙනව. ඕව සියල්ලක්ම එක සංවිධානයක් යටතේ ඒකාබද්ධ කරනවා නම් එයින් වඩාත් ප්‍රයෝජනයක් සලසන්න පුළුවනි. There must be perfect co-ordination of all your departments, Mr. Minister, otherwise, you cannot achieve any success. මම තමුන්නාන්සේගෙ අධ්‍යක්ෂවරයගෙ, මේ වර වාර්තාව කියව බැලුව. ඒක ඉතා වැදගත් වාර්තාවක්. තමුන්නාන්සෙ මේ වාර්තාව කියවා බැලුවොත් තමුන්නාන්සෙට පෙනී යාවි, ග්‍රාම සංවර්ධන වැඩවලින් බලාපොරොත්තු වුණු තරම් ප්‍රතිඵල ලැබී නැති බව. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරය ප්‍රකාශ කළා අපේ රටට වඩා වැඩි ජනගහනයක් ඇති, අපට වඩා ප්‍රශ්න උග්‍රව ඇති ඉන්දියාවෙ, ගම්බද ජනතාවට ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයෙන් විශාල සෙතක් සැලසී තිබෙන බව; නමුත් ඒ සංවර්ධනය අපේ රටේ ඇති වී නැහැ. මෙයට හේතුව එම වාර්තාවෙන් ඉතාමත්ම පැහැදිලි වෙනව. ඒ වාර්තාවෙ ඇති කරුණු මේ අවස්ථාවෙදි විස්තර කරන්න යන්නෙ නැහැ. නමුත් බොහෝ කාරණා ගැන සඳහන් කර තිබෙනව.

මේ සමගම සඳහන් කළ යුතු වැදගත් කරුණක් තිබෙනව. විශේෂයෙන්ම ආදායම් පාලක කන්තෝරුවල, ඩී. ආර්. ඕ. කන්තෝරුවල, වැඩ කටයුතු මෙයට වඩා ඉක්මනින් කිරීමේ ක්‍රමයක් සකස් කර දෙන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම උඩරට ප්‍රදේශවල සිටින ආදායම් පාලක නිලධාරිවරුන් ඉතාමත්ම උනන්දුවෙන්, ජාතික හැඟීමක් ඇතුව කටයුතු කරන බව සන්තෝෂයෙන් මතක් කරන්න කැමතියි. නමුත් ඒ අන්දමට, අනිකුත් නිලධාරීන්, ලොකු ලියන මහත්තැන්—චීප් ක්ලාර්ක්ලා—වැඩ කරන්නෙ නැහැ; වැඩ කිරීමට උනන්දුවක් දක්වන්නෙ නැහැ. එම නිසා මේ ඩී. ආර්. ඕ. ක්‍රමය නැති කළොත් උඩරට පදිංචි දහස් ගණනක ජනතාව නැති කර දැමීමක් හා සමාන බව කියන්න පුළුවනි. මගේ දැනීමේ හැටියට, මට පෙනී ගොස් ඇති හැටියට, ඒ අය තමයි, නියම අවබෝධයක් ඇතුව උඩරට ජනතාවට, ජාතික හැඟීමක් ඇතුව, මහජන සේවයක් හැටියට සේවය කරන්නෙ.

නමුත් අද මොකද සිදු වී තිබෙන්නෙ? නගරවල උගත් තරුණයන් තරුණ-තරුණියන් "සිවිල් සර්විස්" පාස් කරල, නැත්නම් සී. ඒ. එස්. කියන විභාගය පාස් කරල ඒ ප්‍රදේශවලට ගියාම ඒ අයගෙන් නියම සේවයක් ඒ ගම්බද ජනතාවට ඉටු වෙන්නෙ නැහැ. මෙවැනි විභාග සමත් වී ඒ පළාත්වලට පත්ව යන අය, ඒජන්තවරුන්, යම්කිසි කාරණයක් සම්බන්ධයෙන් සම්භවෙන්න ඒ තරම් පහසු නැහැ. එපමණක් නොවෙයි, වෙනත් පළාතක තමන්ගෙ දරුමල්ලන් සිටිද්දි, ඒ අයගෙ කටයුතු කිරීමට තිබෙද්දි, ඒ ප්‍රදේශයේ මහජනතාව පිළිබඳ සෑහෙන අවබෝධයකින්, නියම හැඟීමකින් කටයුතු කරන්නට බැරි බව මතක් කර දෙන්න කැමතියි. ඒ අය මහජන සේවකයින් හැටියට නොවෙයි පත් වෙන්නෙ, මහජන සේවකයන් වශයෙන් නොවෙයි ඒ අය සේවය කරන්නෙ.

නමුත් ඩී.ආර්.ඕ. මහත්වරුන් ඒ විධියට නොවෙයි සේවය කරන්නෙ. ගමෙන් ගමට ගිහිල්ල, ඇලවල් මැදින්, කුඹුරු මැදින් ගිහින් නියම හැඟීමක් ඇතුව දුප්පත් ජනතාවට සේවය කරනව. එසේ කටයුතු කරන්නෙ ඒ ජනතාව සමගම ජීවත්ව, ජනතාවගේ දුක් කරදර හොඳින් දැනගෙන සිටීම නිසයි. ඒ ගම්බද ජනතාවට එදිනෙදා මුහුණ පාන්නට වන දුෂ්කරතාවන් ගැන හොඳ අවබෝධයක් මේ නිලධාරීන්ට තිබෙනව. එම නිසා ප්‍රදේශ අනුව ඩී. ආර්. ඕ වරුන් තෝරා ගන්නා ලෙසයි තමුන්නාන්සේගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්නෙ.

**සභාපතිතුමා**
(அக்கிராசனர்)
(The Chairman)

The Sitting is suspended till 2 P.M.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, අ. භා. 2ට නැවත පවත්වන ලදී.*

*அமர்வு பி. ப. 2 வரை இடை நிறுத்தப்பட்டு மீளத் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 2 P.M. and then resumed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බී. වයි. තුඩාවේ මයා. (මාතර)**
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡා කෙරෙන මේ අවස්ථාවේ වචන ස්වල්පයක් හෝ කථා කිරීමට——

**වීරකෝන් මයා.**
*(திரு. வீரக்கோன்)*
(Mr. Weerakoon)

I was given ten minutes more.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

Hon. Members were allotted ten minutes and you finished your ten minutes.

**වීරකෝන් මයා.**
*(திரு. வீரக்கோன்)*
(Mr. Weerakoon)

I thought another ten minutes would be given. That is how I understood it.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

You had ten minutes and every hon. Member was given ten minutes.

**වීරකෝන් මයා.**
*(திரு. வீரக்கோன்)*
(Mr. Weerakoon)

But within ten minutes we cannot say what we want. I shall be thankful if I can have another five minutes.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

I quite understand and appreciate the difficulties of hon. Members. I am going to appoint a Committee for the purpose of amending Standing Orders. Hon. Members could then make representations and have the Standing Orders amended so that Parliament can sit every day. But I have to follow the schedule that has been handed over to me so that I can permit as many hon. Members as possible to speak within the time available. I told the hon. Members that they must finish their speeches in ten minutes and within that time to bring out only the important points. I have also said, even in the course of general debate, that instead of going into details about wanting certain things done in the electorates, hon. Members should write to the Hon. Ministers concerned or see them personally and bring those matters to their notice. I quite understand and appreciate the difficulties of hon. Members. I am sorry, I cannot help but ask hon. Members to restrict their speeches. We have to amend our Standing Orders in order to have longer Sittings of Parliament.

The hon. Member for Matara may go on.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු සභාපතිතුමනි, මගේ කාලයෙන් විනාඩි තුනක් පමණ දැනටමත් ගත වී තිබෙනවා. කෙසේ වෙතත්, ස්වදේශ කට යුතු භාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡා කරන මේ අවස්ථාවේ මට නියමිත කාලය තුළදී වචන ස්වල්පයක්වත් කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා. 1939 දී ආරම්භ කර, යළි 1948 දී ප්‍රතිසංවිධානය කරන ලද මේ රටේ තවමත් තිබෙන ඉතාමත් වැදගත් ව්‍යාපාරයක් වන ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය සම්බන්ධයෙන් මා පළමුවෙන්ම වචන දෙක තුනක් කථා කරන්න කැමතියි.

සංඛ්‍යා ලේඛන අනුව බලන විට මේ රටේ දැනට ග්‍රාම සංවර්ධන සමිති 5,000ක් පමණ තිබෙන බව පෙනෙනවා. එහෙත් ඇත්ත වශයෙන්ම, අප හරියාකාර කල් පනා කර බැලුවොත්, නිසි පිළිදි ක්‍රියාත්මක වන ග්‍රාම සංවර්ධන සමිති 500ක් වත් ගම්බද ප්‍රදේශවල තිබෙනවය කියන්න පුළුවන්කමක් නොමැති බව පෙනී යනු නිරනුමානයි. මා එසේ කියන්නෙ, [illegible]මයක් ග්‍රාම සංවර්ධන සමිති, දැන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

නාම පුවරුවට පමණක් සීමා වී තිබෙනු දකින්නට ලැබී ඇති නිසයි. මෙවැනි තත්වයක් ඇති වීමට බොහෝ හේතු තිබෙන්න පුළුවන්. නමුත් ප්‍රධාන හේතුව වශයෙන් කල්පනා කළ හැකිව තිබෙන්නෙ ග්‍රාම සංවර්ධන සමිති, රජයේ යම් යම් දෙපාර්තමේන්තු සමග වැඩ කිරීමේදී එම දෙපාර්තමේන්තුවල නිලධාරීන් ග්‍රාම සංවර්ධන සමිති සම්පූර්ණයෙන්ම වාගේ අමතක කර දමා මහජනයා සමග සම්බන්ධකම් පැවැත්වීම බව මා දන්න තරමින් කියන්න පුළුවනි. ඇතැම් දෙපාර්තමේන්තු නිලධාරීන් ග්‍රාම සංවර්ධන සමිති මාර්ගයෙන් ගැමි ජනතාව සමග සම්බන්ධකම් ඇති කර ගැනීම වෙනුවට පෞද්ගලික වශයෙන් ගමේ සිටින ලොකු ලොකු උදවිය සමග සම්බන්ධකම් පැවැත්වීමට කටයුතු යෙදීම නිසා පරිහාවයට මෙන්ම වැදගැම්මකට නැති තත්ත්වයකට පත් වූ ග්‍රාම සංවර්ධන සමිති තිබෙන බවත්, හැම සමිතියක්ම පාහේ ඒ හේතු කොටගෙන බොහෝ දුරට ප්‍රපාතය කරා ගොස් තිබෙන බවත් කියන්නට පුළුවනි. ඒ නිසා ග්‍රාම සංවර්ධන සමිති නැවත පණ ගන්වා වැඩ කරන්නට පුළුවන් තත්ත්වයට නගා ලීමට නම්, රජයේ දෙපාර්තමේන්තු විසින් මෙතෙක් නොසැලකිල්ලට භාජන කර තුබූ ඒ සමිතිවලට නැවතත් සැලකිල්ල දක්වා, ගම්බද ප්‍රදේශවල වැඩ කටයුතු කිරීමේදී ඒ සමිති සමග කෙලින්ම සම්බන්ධව ක්‍රියා කිරීම විශේෂයෙන්ම අවශ්‍ය බව සඳහන් කරන්න කැමතියි. ඒ වගේම ගරු මන්ත්‍රීවරුන් කීප පොළකගේම කථාවලින් ප්‍රකාශ කරන ලද අන්දමට ගම්වල තිබෙන ජාතික සේවාවක් වන ශ්‍රමදාන ව්‍යාපාරයත්, වෘද්ධ අධ්‍යාපනය සහ ප්‍රජා මණ්ඩල වැනි සංවිධානත් යන මේ සියල්ලම එකමුතු කොට එකම දෙපාර්තමේන්තුවක් යටතේ ග්‍රාම සංවර්ධන සමිති මුල් කර ගෙන කටයුතු කරන්න යනව නම්, එයින් අද පවතින තත්ත්වය යටතේ ලැබෙන ප්‍රයෝජනයට වඩා අතිශයින් විශාල ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන් වේය කියා මා විශ්වාස කරනව. අද දේශපාලන මත භේද නිසාත්, වෙනත් නොයෙක් මාදිලියේ හේතු නිසාත් භේද භින්නව සිටින ගම්බද ජනතාව ඒ කනගාටුදායක තත්ත්වයෙන් මුදා ගෙන භේදාදියෙන් තොරව සමගි කරවන්න පුළුවන් ආයතන අතර ග්‍රාම සංවර්ධන සමිති ඉතා වැදගත් සථානයක් ගන්න බව මගේ පිළිගැනීම බැවින් ඒවා ප්‍රාණවත් කර, මනා ලෙස සංවිධානය කර, මහජනතාවගේ සංවිධාන හැටියට පරිවර්තනය කිරීමට ගරු ඇමතිතුමා විශේෂ මහන්සියක් ගනු ඇතැයි මා විශ්වාස කරනව. ඒවාගේම ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව හා සම්බන්ධ නිලධාරීන්ටත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් ඒ ඒ ග්‍රාම සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් වැඩි වැඩියෙන් පුහුණුවක් ලබාදිය යුතුයි. ප්‍රාදේශීය වශයෙන් පමණක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙනුත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පුහුණුවක් ලබාදීමට වැඩ පිළිවෙළක් සලස්වාදීම ඉතාමත් වැදගත් කාරණයක් බව මා මේ අවසථාවේදී සඳහන් කරන්න ඕනෑ.

ඊළඟට සුරාබදු දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වචන කීපයක් කියන්නට ඕනෑ. 1912 දී ආරම්භ කළ මේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය අදත් පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බව ගරු ඇමතිතුමා දන්නවා ඇති. සුරාබදු දෙපාර්තමේන්තුව ඉදිරියට ප්‍රයෝජනවත් දෙපාර්තමේන්තුවක් හැටියට සලකන්න පුළුවන්. ඒවාගේම විශාල ජාතික ආදායමක් ඒ දෙපාර්තමේන්තුවෙන් ලැබෙනවා. ඒ නිසා මේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සථිර රජයේ ගොඩනැගිල්ලක පවත්වාගෙන යෑම පිළිබඳව ගරු ඇමතිතුමා පියවරක් ගනීවිය කියා මා විශ්වාස කරනවා. ප්‍රධාන කාර්යාලයට පමණක් නොවෙයි, මේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවලටත් ගොඩනැගිලි පහසුව නැති බව අපට දැනගන්නට ලැබී තිබෙනවා. ඒ නිසා ප්‍රාදේශීය කාර්යාලවලටත් ගොඩනැගිලි පහසුකම් සැලැස්වීමට ඇමතිතුමා පියවරක් ගනීවිය කියා මා විශ්වාස කරනවා.

සුරාබදු දෙපාර්තමේන්තුවේ රස පරීක්ෂකවරුන් නැතිකම නිසා දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන නඩු බොහෝ සෙයින් ප්‍රමාද වන තත්ත්වයක් තිබෙනවා. ඒවාගේම, ගමන් බිමන් සම්බන්ධයෙනුත් මේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විශාල කරදරවලට මුහුණ පාන්නට සිද්ධ වී තිබෙනවා. සුරාබදු දෙපාර්තමේන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුවට රස පරීක්ෂකවරුන් වැඩියෙන් බඳවා ගත යුතුයි. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ටත් ඒ සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දීමට කටයුතු කිරීම ඉතාමත් වැදගත් කාරණයක් බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ.

ඊළඟට සුරාබදු දෙපාර්තමේන්තුවේ ගාඩ් වරුන් ගැනත් වචනයක් කිවයුතුව තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ ගාඩ්වරුන්ට ලැබෙන වේතනය කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. ඔවුන්ට මසකට රුපියල් 50 ක මූලික වැටුපකුයි ලැබෙන්නෙ. එපමණක් නොවෙයි, අවුරුදු 5 ක් ගතවන තුරු ඔවුන්ට රුපියලක වැටුප් වැඩිවීමකුයි ලැබෙන්නෙ. අවුරුදු 5 ක් ගතවුණාට පසුව ඔවුන්ට ලැබෙන්නෙ රුපියල් 1.50 ක වැටුප් වැඩිවීමකුයි. ඒ නිසා සුරාබදු දෙපාර්තමේන්තුවේ ගාඩ්වරුන්ට මීට වඩා හොඳ වැටුප් ක්‍රමයක් පිළියෙළ කර දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට මා මාතර ජනතාව වෙනුවෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නට සතුටුයි. මාතර, පොල්හේන, පරමුල්ල වල්ගම, පඹුරන ආදී ප්‍රදේශවල කොහු කර්මාන්තය සඳහා ස්වාභාවික පහසුකම් තිබෙනවා. කොහු කර්මාන්තය සඳහා අමු ද්‍රව්‍ය ඒ ප්‍රදේශවල බහුල වශයෙන් ලැබෙනවා. නමුත් මාතර කොහු කර්මාන්ත ශාලාව තිබෙන්නේ ස්වාභාවික පහසුකම් තිබෙන ඒ ප්‍රදේශයේ නොවන බව මා කනගාටුවෙන් ප්‍රකාශ කරනවා. වෙනත් ප්‍රදේශයකයි ඒ කොහු කර්මාන්ත ශාලාව තිබෙන්නෙ. නමුත් ඊට මගේ විරුද්ධත්වයක් නැහැ. මා ඉල්ලා සිටින්නේ, ස්වාභාවික වශයෙන් පහසුකම් තිබෙන, ලෙලි පල් කිරීමට පහසුකම් තිබෙන, අමු ද්‍රව්‍ය බහුල වශයෙන් තිබෙන, ඒවගේම උගත් තරුණ තරුණියන් සිටින මඩිහ, පඹුරන, පොල්හේන ප්‍රදේශයේත් කොහු කර්මාන්ත ශාලාවක් පිහිටුවන ලෙසයි. ඒ ප්‍රදේශයේ මහජනතාවගේ ආර්ථික තත්ත්වය දියුණු කිරීමට පිළියමක් වශයෙනුත් කොහු කර්මාන්තය සඳහා ස්වාභාවික වශයෙන් පහසුකම් තිබෙන මේ ප්‍රදේශයේ කොහු කර්මාන්ත ශාලාවක් පිහිටුවිය යුතුමයි.

ගරු සභාපතිතුමනි, මැටි බඳුන් කර්මාන්තය මේ රටේ වැදගත් කර්මාන්තයක්. නමුත් මාතර ප්‍රදේශයේ මැටි බඳුන් තනන්නන්ට ඒ කර්මාන්තය සඳහා අවශ්‍ය මැටි ලබාගැනීමට කුඹුරු නැතිකමේ ප්‍රශ්න යට අද මුහුණ පාන්නට සිද්ධ වී තිබෙනව. විශේෂයෙන්ම වල්ගම ප්‍රදේශයේ මැටි බඳුන් තනන්නන්ට අද මැටි ලබා ගැනීම සඳහා කුඹුරු නැතිකමේ ප්‍රශ්නයට මුහුණ පාන්නට වී තිබෙනවා. මැටි ලබා ගැනීමට පුළුවන් කුඹුරු ලබා දෙනවා නම් දුරබැහැර ප්‍රදේශවලට වුවත් ගොස් මැටි බඳුන් කර්මාන්තය වැඩි දියුණු කිරීමට මේ ප්‍රදේශයේ ජනතාව කැමැත්තෙන් සිටින බව මා ඇමතිතුමාට මතක් කරනවා. ඒ නිසා ඇමතිතුමාගේ අවධානය මේ සම්බන්ධයෙන් යොමු වෙනවා ඇත කියා මා විශ්වාස කරනවා.

කොහු කර්මාන්ත ශාලාවක් පිළිබඳව මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළා. ඒ සම්බන්ධයෙන් කිවයුතු තවත් කාරණයක් තිබෙනවා. මාතර ප්‍රදේශයේ සමහර කොහු කර්මාන්ත ශාලාවල සේවය කරන තරුණ තරුණියන්ට සුළු තුවාලයක් පවා සිදු වූ අවස්ථාවලදී ප්‍රතිකාර ලබාගැනීමට ආරෝග්‍යශාලාව කරා යන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේ කර්මාන්ත ශාලාවල ප්‍රථමාධාර පෙට්ටි තිබෙනවා නම් සුළු තුවාල යක් වුණාම ආරෝග්‍යශාලාවට නොගිහින් බෙහෙත් දමා ගන්න පුළුවනි. ඒ සම්බන්ධවත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා.

ඊළඟට මාතර ප්‍රදේශයට ආදායම් පාලක නිලධාරියකු නැතිව දැන් මාස දෙකක් ගත වී තිබෙන බව මා මතක් කරනවා. ආදායම් පාලක නිලධාරීන්ගේ රාජකාරි සම්බන්ධව—සමාජ සේවා කටයුතු, සහල් කූපන් පත්වල වැඩ කටයුතු ආදී රාජකාරි රාශියක් සම්බන්ධව—දැන් ගරු මන්ත්‍රීවරු කථා කළා. විශේෂයෙන්ම මාස කීපයක් තිස්සේ ආදායම් පාලක නිලධාරියකු නැතිකම නිසා ප්‍රධාන නගරයක්වූ මාතර ප්‍රදේශයේ ඒ කටයුතු සම්බන්ධයෙන් අද ඉතාමත් අමාරු තත්ත්වයක් ඇති වී තිබෙනවා. දැනට මාතර ආදායම් පාලක නිලධාරී වශයෙන් කටයුතු කරන්නෙත් කඹුරුපිටියේ ආදායම් පාලක නිලධාරීතුමාමයි. එම නිසා මාතරට ස්ථිර ආදායම් පාලක නිලධාරියකු පත් කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
නියමිත වෙලාව ගතවෙලා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

මට නියමිත වේලාව අවසාන වී තිබෙන නිසා, අවසාන වශයෙන් මේ සියලුම ඉල්ලීම් කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධාන ය යොමු කරවමින්, ඒවා ඉෂ්ට කර දෙන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසාන කරනවා.

ශ්‍රීමත් රසික් ෆරීඩ් (පත්කරන ලද මන්ත්‍රී)

*(ஸ்ரீமான் ரசிக் பரீத்—நியமன அங்கத்தவர்)*

(Sir Razik Fareed—Appointed Member)

I shall not take much time, but I do want to say that for the Department of Mosques and Muslim Charitable Trusts the Hon. Minister has only allocated Rs. 71,000-odd. This is the one great thing that the Government is doing to the Moors and Malays who are Muslims. I do want the Hon. Minister to see that larger amounts are spent on this great cause.

In regard to the appointment of Kathis, you know even in your own area there has been a great deal of agitation about the appointment of Kathis and also that poor children and mothers have suffered because of some flaw in the law with the result that Kathi Courts could not function. Now that the appointment of Kathis is to come within the purview of the Hon. Minister, I do hope that he will have honest and trustworthy men appointed to these places of honour to carry out this great service to the community.

Then with regard to small industries, I know that in every part of Lanka small industries have cropped up and it is the duty of the Hon. Minister to see that the poor man is helped to carry on with his small industry. He has allocated no less than Rs. 20 million for this great cause and I do hope that he will not stand in the way of progress, especially of the poorer people. When it came to the question of starting industries in Colombo Central, when I was the First Member for Colombo Central in the last Government, I do not think the then Hon. Minister allowed, particularly, the poor people to start any new industries but when it came to the rich they had their say and also their way.

The third matter I want to touch upon is this. I saw in the papers that the Government is very anxious to take over the race-course. I do not want it said that I am standing in the way of the Government, but I do want to bring to the notice of the Government that if the race-course is taken over, there will be a number of people who will be unemployed. At the present juncture there are no less than a thousand people who earn their livelihood from this source. I should say that in the Colombo area alone those who eke out an existence will count over 50,000 people. These little boys, little urchins, sell tickets and take a rupee or two home to feed their poor parents. If it is thought by the Government that the race-course must be taken over because of gambling going on in that place and that it is harmful from a religious point of view, then, we ought to stop toddy tapping and also the sale of arrack. If you are thinking of doing that on religious grounds then you must also stop the catching of fish because millions and millions of fish are being murdered every day—they are also lives lost. You cannot, therefore, get away by saying that you are taking over the race-course on religious grounds because of the gambling that is going on. I do hope that the Hon. Minister, if he has set his mind to take over the race-course, will give another 100 acres in the Katukurunda area so that these people may start breeding ponies for they already have about fifty ponies racing in Colombo.

අ. භා. 2.15

During the last Government I remember the then Minister of Finance, the hon. double Doctor,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

was anxious to see that horse-racing was continued because he found on calculation that it would be possible to get Rs. 52 million by way of taxation from this source. I hope the Hon. Minister will bear this in mind. If horse-racing is allowed in Colombo or even in Katukurunda, as I said, the C. T. C. will be able to give the Minister almost Rs. 50 million.

The Ceylon Turf Club, after all, is not a gambling club. It has been established for the purpose of providing recreation to its members and also to hold gymkhana meets and so on; this must be allowed to continue. There is hardly any recreation in Ceylon; when foreign tourists visit our country there is hardly any place to go and witness something that is interesting.

I remember when I went to Russia I saw millions of people in the racecourse in that country who had come to witness a gymkhana meet. They had even horse-racing and other forms of sport. I see His Excellency once upon a time, the hon. Member for Katugampola (Mr. Subasinghe) shaking his head——

ටී. බී. සුබසිංහ මයා. (කටුගම්පොළ)
*(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொள)*
(Mr. T. B. Subasinghe—Katugampola)

I am only disputing the number—millions.

ශ්‍රීමත් රැසික් ෆරීඩ්
*(ஸ்ரீமான் ரஸிக் பரீத்)*
(Sir Razik Fareed)

I suppose we say millions. Anyway, there were at least 100,000 people, because the racing was interesting. I am sure the hon. Member for Katugampola will agree with me that racing is very interesting. I had the good fortune to win a few hundred roubles, as they call it.

සභාපතිතුමා,
*(அக்கிராசனர்)*
(The Chairman)

The hon. Member is racing against time.

ශ්‍රීමත් රැසික් ෆරීඩ්
*(ஸ்ரீமான் ரஸிக் பரீத்)*
(Sir Razik Fareed)

I shall stop now.

ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)
*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)*
(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

He has been racing all his life.

ශ්‍රීමත් රැසික් ෆරීඩ්
*(ஸ்ரீமான் ரஸிக் பரீத்)*
(Sir Razik Fareed)

There are about 50 young boys who have taken to riding ponies. I do hope the Hon. Minister will see that these boys develop into good jockeys. Today, the persons who ride ponies are Ceylonese and this should be encouraged. My endeavour is to make the Hon. Minister feel that horse-racing must be allowed. But if he is bent on taking the Colombo race-course, I do hope he will allow that space to be used for the purpose of establishing a Muslim University.

බී. එච්. බණ්ඩාර මයා. (බදුල්ල)
*(திரு. பி. எச். பண்டார—பதுளை)*
(Mr. B. H. Bandara—Badulla)

ගරු සභාපතිතුමනි, මීට කලින් ද ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකු විසිනුත් සඳහන් කරන ලද නමුත් උඩ රට ගැමි කොමිෂන් සභාව ගැන මාද වචන දෙක තුනක් සඳහන් කරන්න ඕනෑ. මීට අවුරුදු ගණනාවකට උඩදී උඩ රට ගැමි කොමිෂන් සභාවේ වාර්තාව සකස් කොට ඒ අනුව කටයුතු කරගෙන ගිය නමුත් එම කොමිෂන් සභාව මගින් උඩ රට ප්‍රදේශයට බලාපොරොත්තු වුණු සේවය ඉෂ්ට නොවුණු බව සඳහන් කරන්නේ කණගාටුවෙනුයි. උඩ රට ප්‍රදේශ දියුණු කිරීම සඳහා මෙම කොමිසමට වෙන් වුණු මුදල ඉතා සුළු මුදලක් වීම ඊට හේතුව බව අපට පැහැදිලිව පේනවා. උඩ රට ගැමි කොමිෂන් සභාවේ වාර්තාව නිසා අද අපගේ ප්‍රදේශවල කිසිම වැඩක් කර ගන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

ප්‍රදේශයේ පාරක් සෑදීම හෝ වෙනයම් අවශ්‍ය වැඩක් කර ගැනීම හෝ පිළිබඳව සාකච්ඡා කරන්නට ඒ කටයුතු භාර නිලධාරීන් ළඟට ගිය විට අපට අසන්නට ලැබෙන්නේ "උඩ රට ගැමි කොමිෂන් සභාවට වෙන් කර තිබෙන මුදලින් මේ සඳහා මුදල් ලබා ගත යුතුය" යන ප්‍රකාශයයි. මේ නිසා අපගේ ප්‍රදේශවල කිසියම් කට යුත්තක් කර ගැනීමට ගැමි කොමිෂන් සභාවෙන් මුදල් ලැබෙන්නෙත් නෑ. වෙනත් දෙපාර්තමේන්තුවකින් මුදල් ලැබෙන්නෙත් නෑ. අවශ්‍ය වැඩකටයුතු කෙරෙන්නෙත් නෑ. මේ අනුව අපට පෙනී යන්නේ, උඩ රට ගැමි කොමිෂන් සභාවේ වාර්තාව නිසා උඩ රට දියුණු කරන්නට බැරි තත්වයක් ඇති වී තිබෙන බවයි. එම නිසා ගැමි කොමිෂන් සභාවේ නිර්දේශ අනුව සෑහෙන පමණ මුදල් ලබාගෙන හෝ වෙනත් දෙපාර්තමේන්තුවකින් මුදල් ලබාගෙන හෝ උඩ රට ප්‍රදේශ දියුණු කිරීමට වැඩ පිළිවෙලක් යොදන ලෙස මම ගරු ඇමතිතුමාට විශෙෂයෙන් මතක් කර නවා.

මට මතක් කරන්නට තිබෙන අනෙක් කාරණය නම්, උඩ රට ගැමි කොමිෂන් සභාවේ වාර්තාව නමැති මේ පොතේ සඳහන් නොවන කිසිම දෙයක් උඩරට ප්‍රදේශයෙහි කරන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබීමයි. මෙය උඩ රට ජනතාවට අද විශාල කරදරයක් වී තිබෙන නිසා මෙම පොත පුළුස්සා දමා කාලයට ගැළපෙන පරිදි අවශ්‍යතාවන් ගැන ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. අවුරුදු ගණනාවකට උඩදී සකස් කරන ලද මෙම වාර්තාවෙහි සඳහන් තත්වයට වඩා වෙනස් තත්ත්වයක් අද උඩ රට ප්‍රදේශයෙහි පවතින්නෙ. ගැමි කොමිෂන් සභා වාර්තාවෙහි සඳහන් කිසිම දෙයක් මගේ කොට්ඨාශය වන බදුලු කොට්ඨාශයෙහි නැති බව් මම දන්නවා. පාසල් ගොඩනැගිලි, පාරවල්, වෙනත් සමහර අවශ්‍යතා මෙම වාර්තාවට ඇතුලත් වී නැහැ. පොතේ සඳහන් නොවන එවැනි අවශ්‍යතා ලබා ගන්නට බැරි තත්ත්වයක් අද පවතිනවා. පසුගියදා පැවැත්වුණු බදුලු දිස්ත්‍රික් සම්බන්ධතා රැස්වීමේදීත් අප මේ ගැන සාකච්ඡා කළා. ගැමි කොමිෂන් සභා වාර්තාව වෙනස් කර හෝ කාලයේ හැටියට ඇති වී තිබෙන අවශ්‍යතාවන්—පාසල්, පාරවල්, වෙනත් නොයෙකුත් අවශ්‍යතා, පොතේ සඳහන් නූනත්—ඉටු කරලන්නට සුදුසු අන්දමේ වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ගැන සඳහන් කළ යුතුයි. උප්පැන්න සහතික පිටපත් ලබා ගැනීම් ආදී කටයුතුවලදී අද මහජනයාට විශාල කරදරයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. පරීක්ෂණවලට පෙනී සිටීම සඳහා තම උප්පැන්න සහතිකය ඉක්මනින් ලබා ගන්නට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වුවමනා වූ අවස්ථාවලදී, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් එය මාස කීපයක් ප්‍රමාද වීම නිසා එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඒ පරීක්ෂණවලට පෙනී සිටීමට නොහැකිවන අවස්ථා තිබෙනවා. රැකියාවන් සඳහා දවස් කීපයකින් උප්පැන්න සහතිකය ලබා ගන්නට වුවමනා වන අයට එය මාස කීපයකින්වත් ලබාගන්නට බැරි අවස්ථා ඇති වෙනවා. මෙසේ උප්පැන්න සහතික ප්‍රමාද වීම නිසා සමහර ශිෂ්‍යයන්ට විභාගවලට පවා පෙනී සිටීමට බැරි වූ අවස්ථා අනන්ත අප්‍රමාණ වශයෙන් අපට දැන ගන්න ලැබී තිබෙනව. ඒ වාගේම රක්ෂාවල් ලබා ගැනීමට බැරි වී තිබෙනව්. ඔය විධියේ නොයෙකුත් පාඩු විඳින්නට සිදු වී තිබෙන බව මම ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. එම නිසා උප්පැන්න සහතික ප්‍රමාද වීම වැළැක්වීම සඳහා සුදුසු කටයුතු කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනව.

ඒ වාගේම උප්පැන්න සහතික ලියාපදිංචි කිරීමේදී ඇති වන අක්‍රමිකතා ගැනද සඳහන් කළ යුතුව තිබෙනව. සමහර නම් වැරදියට ලියා පදිංචි කිරීම නිසා විශාල කරදරවලට මුහුණ පාන්නට සිදු වෙනව. බදුල්ලේ ආරෝග්‍යශාලාවේ උප්පැන්න ලියා පදිංචි කරන නිලධාරියා දෙමළ කෙනෙක්. ඔහු සිංහල නම් ලියා පදිංචි කර ඇති පිළිවෙල කොහොමද කීවොත් ඒවා මේ ගරු සභාවේදී සඳහන් කරන්නත් බැරි තරම් කුණු හරුප. රත්නායක මුදියන්සේලාගේ මුතු මැණිකා කියන තැනැත්තියගේ උප්පැන්න සහතිකය මට දකින්න ලැබුණා. එහි මුතු මැණිකා කියන තැනේ "මූ" යන්න නොවෙයි තිබුණෙ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙන අකුරක්. මේ ගරු සභාවෙ කියන්නත් බැහැ. මෙය විශාල වරදක්. උප්පැන්න සහතිකය වැරදි අන්දමින් ලියා තිබීම නිසා නැවත එය හරි ගස්සන්නට ගිය විට එක් අතකින් විශාල වියදමක් දරන්නට සිදුවන අතර අනික් අතින් අතුරක් නැති කරදර හිරිහැරවලටත් මුහුණ පාන්නට සිදු වෙනව. ඒ නිසා ඒ ගැනත් ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන්න ඕනැ.

අනික් කාරණය ඒ ආරෝග්‍යශාලාවේ සිටින දෙමළ නිලධාරියා උප්පැන්න ලියාපදිංචි කිරීමේදී ඕනැකමින්ම කරන වරදක් තිබෙනව. එනම් වතුකරයේ ඉන්දියානුවන්ගේ උපත් ලියා පදිංචි කිරීමේදී ඒ දරුවන් ප්‍රසූත කරන මව්වරුන්ගේ නම් සඳහන් කරන්නේ ඉන්දියානු දෙමළ වශයෙන් නොව, ලාංකික දෙමළ වශයෙනුයි. මේ ගැන බොහෝ දුරට සොයා බැලූ විට දකින්න ලැබුණේ සෑම උප්පැන්නයක්ම පිළිබඳව එසේ කර තිබෙන බවයි.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
මේ ගැන තමුන්නාන්සේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට දන්වා තිබෙනවද?

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
මම දන්නුව. ඒ නිලධාරියා මාරු කළා. නැවතත් ඇවිත් ඉන්නෙ ඒ ජාතියෙම එක්කෙනෙක්. ඒ නිසා මෙය විශෙෂ සැලකිල්ල යොමු කළ යුතු කාරණයක්. ලාංකික දෙමළය කියා උප්පැන්න සහතිකයේ සඳහන් වුණාම පරම්පරා තුනක් යන විට ඉබේටම පුරවැසියන් වෙනව. මේ විධියේ භයානක දේවල් සම්බන්ධයෙනුත් ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන්නය කියා මම මතක් කරනව.

ග්‍රාම සංවර්ධන සමිති ගැන ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම කථා කළා. ඒ ගැන මා දීර්ඝ වශයෙන් කරුණු කියන්න යන්නෙ නැහැ. එහෙත්, මෙහිදී සඳහන් නොකරම බැරි කරුණු කීපයක් තිබෙනව. දැනට ගම්වල වැඩ කටයුතු කෙරෙන්නේ වැඩි වශයෙන්ම ගම් කාර්ය සභා සහ ග්‍රාම සංවර්ධන සමිති මාර්ගයෙනුයි. මේ දෙකෙන් පමණයි වැඩ කෙරෙන්නෙ. අපි දන්නවා ගම් කාර්ය සභා කොට්ඨාශයක වැඩ කිරීම සඳහා ගම් කාර්ය සභාවලට ලැබෙන්නේ අවුරුද්දකට රුපියල් දෙතුන් සීයක් පමණ වූ සුළු මුදලක් බව. ගමේ ළිඳක් පඩි පෙළක් බඳින්නවත් එය ප්‍රමාණවත් නැහැ. අපේ ගරු ඇමතිතුමා ඉතාම දක්ෂ ඇමතිවරයෙක් නිසා මේ විධියේ කටයුතු ග්‍රාම සංවර්ධන සමිති වලින් කෙරීම පිණිස ග්‍රාම සංවර්ධන සමිති සඳහා වැඩිපුර ආධාර මුදලක් ලබා ගනීවිය කියා මම අදහස් කරනව.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
සල්ලි මවන්න බැහැ.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
මවා ගැනීමට වුණත් ඇමතිතුමාට දක්ෂකමක් තිබෙනව. එම නිසා කෙසේ හෝ මුදල් ටිකක් ලබාගෙන ගම්බද දියුණුව සඳහා අවශ්‍ය පාරවල් ළිං පඩි පෙළවල් ආදිය තැනීමට ගම්කාර්ය සභාවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට ආධාර කරන ලෙස මම ඇමතිතුමාගෙන් ඉල්ලනව.

අපට දැන ගන්න ලැබී තිබෙනවා, පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන දාහක් පිහිටුවීම සඳහා කැබිනට් මණ්ඩලයෙන් මුදල් ඉල්ලා තිබෙනවාය කියා. මම හිතනවා ඇමතිතුමාට ඒ සඳහා මුදල් ලැබේවිය කියා. පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන පිහිටුවීමෙන් ගම්වල රැකීරක්ෂා නැති විශාල පිරිසකට මහත් යහපතක් සැලසෙන නිසා පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන හැකි තරම් වැඩි වැඩියෙන් පිහිටුවීමට හැකි පමණ ඉක්මනින්ම ක්‍රියා කරන ලෙස ගරු ඇමතිතුමාට මතක් කරනව.

ගරු සභාපතිතුමනි, ඒ ළඟට සුරා ප්‍රශ්නය ගැන මතක් කරන්නට කැමතියි. මේ රටේ කිතුල් රා නිපදවන්නය කියා හෝ පොල් රා නිපදවන්නය කියා හෝ තැබෑරුම් වැඩි කරන්නය කියා හෝ මම කියන්නෙ නැහැ. මේ රට ලෝකයේ විශේෂ කීර්තියක් දිනාගෙන තිබෙන්නේ මේ රටේ තිබෙන බෞද්ධ ආගම නිසා බව මම විශේෂයෙන් මතක් කරන්නට ඕනැ. මේ රටේ දූෂණ, මැරවරකම්, තක්කඩිකම්, මිනීමැරුම් ආදී නොයෙක් අපරාධ ඇති


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

වීමට ප්‍රධාන හේතුව සුරාවයි. ඒ නිසා මේ රට අමද්‍යප රටක් කර මේ රටේ අපරාධ නැති කිරීමට ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනව. මේ රට අමද්‍යප රටක් කිරීම නිසා මේ රටේ ආදායම අඩු වෙනව නම් ඒ සඳහා වෙනත් ප්‍රතිකර්ම යොදා ගන්න පුළුවන්. මම පසුගිය කාලයේ ලෝකයේ රටවල් කීපයකටම ගියා. ඒ රටවල අය අපේ රටේ නිපදවන අරක්කු ලබා ගැනීමට බොහොම සතුටින් ඉන්නව. ඒ නිසා මේ රට අමද්‍යප රටක් කිරීමෙන් පාඩුවක් වෙනව නම් මේ රටේ නිපදවන අරක්කු ආදිය පිටරට අලෙවි කිරීම නිසා ඒ අඩු වන ආදායම පියවා ගන්නට පුළුවන්. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

ගරු සභාපතිතුමනි, සහල් සලාක පොතක් ලබා ගැනීම, උප්පැන්න සහතිකයක් ලබා ගැනීම වැනි සුළු දේවල් සඳහා පවා සමහර විට මන්ත්‍රීවරයාට ඒ දේ අවශ්‍ය පුද්ගලයා සමග ඩී. ආර්. ඕ. කන්තෝරුවට හෝ කච්චේරියට යන්න සිදු වෙනව. එසේ සිදු වී තිබෙන්නෙ මේ පාලන ක්‍රමයේ වරද නිසයි. ඒ නිසා මේ පාලන ක්‍රමය වෙනස් කර මේ තරම් කරදරයක් නැතිව මහජනයාට ඔවුන්ගේ වැඩ කටයුතු පහසුවෙන් කර ගැනීමට පුළුවන් වන විධියේ පාලන ක්‍රමයක් ඇති කරන්නට ඕනෑ. යල් පැනපු කච්චේරි ක්‍රමය වෙනස් කර මහජනයාට ප්‍රයෝජනවත් වන විධියේ අළුත් පාලන ක්‍රමයක් ඇති කිරීම ගැන ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන ලෙස ඉල්ලමින් මගේ වචන සවල්පය අවසාන කරනව.

අ. භා. 2.30

**ජෝර්ජ් අබයගුණසේකර මයා.** (හඟුරන්කෙත)

(*திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர—ஹங்குராங்கெத்த*)

(Mr. George Abeyagoonasekera—Hanguranketa)

ගරු සභාපතිතුමනි, වේලාව සීමාසහිත නිසා මම වැඩි වේලාවක් කථා කිරීමට බලාපොරොත්තු වන්නෙ නැහැ. ප්‍රාදේශීය පාලන අංශයේ සේවය කළ කෙනකු වශයෙන් ගරු ඇමතිතුමාට කරුණු කීපයක් මතක් කරන්නට ඕනෑ. ප්‍රාදේශීය ආදායම් නිලධාරිවරුන් පත් කිරීම එක්තරා කොමිසමක නිර්දේශ අනුව කෙරුණු නමුත් පරිපාලන සේවය ඇති වීමෙන් පසු අද ඒ ක්‍රමය අහෝසි වී තිබෙන බව අපි කව්රුත් දන්නව. එදා උඩරට ප්‍රදේශ, ද්‍රවිඩ ප්‍රදේශ සහ මුහුදු බඩ ප්‍රදේශ යනුවෙන් ප්‍රදේශ තුනක් අනුව ආධුනිකයන් තෝරා පත් කර ගන්නට යෙදුනේ විශේෂ කරුණු උඩයි. විශේෂයෙන්ම උඩරට ප්‍රදේශවල අධ්‍යාපනය අතින් තිබුණු අමාරුකම් නිසාත්, ඒ ප්‍රදේශවල ප්‍රගතිය අඩු වීම නිසාත් ඒ සම්බන්ධව විශේෂ සැලකිල්ලක් පෙන්වා ඒ ක්‍රමය ඇති කළා. ඒ නිසා අනාගතයේදී මේ නිලධාරීන් පත් කිරීම සම්බන්ධව කටයුතු කිරීමේදී මේ කාරණාව මතක් කර ගැනීම සුදුසු බව මා කියන්නට සතුටුයි.

ගරු සභාපතිතුමනි, පසුව ග්‍රාම සේවක ක්‍රමය ඇති කිරීම නිසා අහෝසි වුණු ගම්මුලාදෑනි ක්‍රමය සම්බන්ධවත් යමක් කිව යුතුව තිබෙනව. එදා සේවය කළ ගම්මුලාදෑනීන්, ඔවුන්ගේ කිසිම වැරැද්දක් නැතිව ඔවුන්ගේ රක්ෂාව නැති වීම නිසා, අද එක්තරා විධියක අනාථ භාවයකට පත් වී සිටිනව. ඒ නිසා ඒ නිලධාරීන් වෙනුවෙන් රජය අනුකම්පා කර ඒ තනතුරු අහෝසි වීමෙන් ඔවුන්ට සිදු වූ පාඩුව සලකා ඔවුන්ට යම්කිසි දීමනාවක් ගෙවීම ඉතාම සුදුසු බව මම කල්පනා කරනව. සුරා බදු දෙපාර්තමේන්තුව ගැන නොයෙක් දේ කියවුනා. දැනට අවුරුදු කීපයකට ප්‍රථම සුරා බදු අපරාධ මර්දනය කිරීම පිණිස සුරා බදු ප්‍රහාරක හමුදාවය කියා විශේෂ අංශයක් මේ දෙපාර්තමේන්තුවෙන් පටන් ගත්තා. මේ අංශයෙන් මේ රටට ඒ තරම් සේවයක් සැලසුනාය කියා අපට පිළිගන්නට පුළුවන් කමක් නැහැ. වැඩි විස්තර නොකීවාට එය අපි කව්රුත් පිළිගන්න කරුණක්. එම නිසා සුරා බදු ප්‍රහාරක හමුදාවේ යම් කිසි ප්‍රතිසංවිධානයක් ඇති කර මීට වඩා හොඳ සේවයක් සැලසීමට පිළිවෙලක් ඇති කිරීම හෝ එසේ නැත්නම් ප්‍රධාන දෙපාර්තමේන්තුවත්, ප්‍රහාරක හමුදාවේ සේවයත් යන දෙකම සම්බන්ධ කර මුළු දෙපාර්තමේන්තුවේම ප්‍රතිසංවිධානයක් ඇති කිරීම හෝ ඉතාමත් සුදුසු බව මම යෝජනා කරන්නට සතුටුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට ගරු සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කියා මගේ කථාව නවත්වන්ටයි, මා අදහස් කරන්නෙ. අපි දන්නව, විශේෂයෙන් ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ස්වෝත්සාහය පදනම් කරගෙන මහජන උපයෝගී වැඩ රාශියක් නිර්මාණය කරමින් පසුගිය කාලයේදී මේ රටට විශාල සේවයක් සිදු කළ බව. අභාග්‍යයකට වගේ ග්‍රාම සංවර්ධන සමිති දේශපාලනඥයන්ගේ වේදිකා බවට පරිවර්තනය වීමෙන් පසුව මේ සමිතිවලින් අපි බලාපොරොත්තු වූ සේවය ලැබුණේ නැහැ. අද දවසේ ග්‍රාම සංවර්ධන සමිති මගින් කෙරෙන්නෙ බොහෝ විට මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්, නැතහොත් වෙනත් දේශපාලනඥයින් සන්තෝෂ කිරීමට එහෙරෙදි වියන කර්මාන්ත ශාලාවක්, තව කොහෙවත් වඩු කර්මාන්ත ශාලාවක්, තවත් තැනක කුඹල් කර්මාන්ත ශාලාවක්, වෙනත් ස්ථානයක ලනු ඇඹරීමේ කර්මාන්ත ශාලාවක්, ආදී වශයෙන් තැන් තැන්වල පිහිටුවීමයි. යම් යම් පුද්ගලයින් සන්තෝෂ කරන්ට ක්‍රියා කරනවා මිස ග්‍රාම සංවර්ධන සේවයෙන් බලාපොරොත්තු වන විධියේ සැලැස්මක් අනුව යම්කිසි සංවර්ධනයක් ඇති වෙන්නෙ නැහැ.

විශේෂයෙන් වඩු කර්මාන්තය ගැන කල්පනා කර බලමු. වඩු කර්මාන්ත මධ්‍යස්ථානවලට ආධුනිකයින් බඳවා ගෙන ඔවුන්ට පුහුණුවක් ලබා දෙනව. සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය පමණක් නොව සමාජ සේවා දෙපාර්තමේන්තුව, කර්මාන්ත දෙපාර්තමේන්තුව, ආදී වෙනත් ආයතනවලිනුත් ඒ විධියේ පුහුණුවක් ලබා දෙනව. එහෙත් ඔවුන් යමක් ඉගෙන විශාල සහතිකයකුත් ඇතිව ඒ ආයතනවලින් පිටවී ගියාට පසු පෞද්ගලික අංශයෙන් පමණක් නොව රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ සුදුසු රැකියාවක් ලබා ගන්ට පුළුවන් කමක් නැහැ. මන්ද ? ඒ සහතිකයට සැලකිල්ලක් නොදක්වන නිසයි. එම නිසා ග්‍රාමසංවර්ධන ව්‍යාපාරයෙන්, ග්‍රාම සංවර්ධනය පිළිබඳව, කර්මාන්ත දියුණුව පිළිබඳව, නව සංවර්ධන කටයුතු අංශයෙන් යම්කිසි ප්‍රජා සංවර්ධනයක් ඇති වුණාදැයි පරීක්ෂා කර බලන්ට දැන් කාලය පැමිණ තිබෙනව. ඒ විධියේ පරීක්ෂණයක් ඇති කළොත්, ඒ මගින් අනාවරණය වන තොරතුරු අනුව මෙම දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කර අනාගතයේදී මීට වඩා හොඳ සේවයක් ලබා ගන්ට පුළුවන් වෙනවා ඇති.

ගරු සභාපතිතුමනි, දැන් නූල් ඇඹරීමේ කර්මාන්තශාලා නොයෙක් ප්‍රදේශවල පිහිටුවා තිබෙනව. මා නියෝජනය කරන කොට්ඨාශයේ හණ ගස් බහුල ලෙස වැවෙන නිසා කොහු කර්මාන්තය පටන් ගැනීමට පෙර පටන් ලනු කර්මාන්තය පැරණි කර්මාන්තයක් හැටියට උඩරට පළාත්වල පැවතුණා. මා දෙපාර්තමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කළා, විශේෂඥයන් ගෙන්වා පරීක්ෂණයක් පවත්වා එහි ලනු ඇඹරීමේ කර්මාන්තශාලාවක් ඇති කරන්ට කියා. එසේ නැතිව, දන්න විධියට කර්මාන්තශාලා ඇති කළාම ඒවයේ නිකම් දිරච්ච ලනුවල ස්වභාව ඇති වෙනව. එම නිසා ආර්ථික කටයුතු පිළිබඳව දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් රජයටත් අවවාද කරන්ට පුළුවන් ආර්ථික විශේෂඥයින් දෙපාර්තමේන්තුවල සිටිය යුතුයි. ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාත්, ඒ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමාත්, ඒ වගේම ඒ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමාත් ඒ කටයුතු ඉතා දක්ෂ ලෙස ප්‍රයෝජනවත් ලෙස කරගෙන යන බව මා දන්නව. නමුත් අපට රට රවට රවටා ඉන්ට දැන් කාලයක් නැති නිසා සත්‍ය කරුණුවලට මුහුණ පා මේ දෙපාර්තමේන්තුවෙන් අපි බලාපොරොත්තු වූ සේවය ඉටු වී තිබෙනවාද නැද්ද යන්න ගැන විශේෂයෙන් පරීක්ෂා කළ යුතුව තිබෙනව. මේ වචන ස්වල්පය කථා කිරීමට අවකාශ සලසා දුන් සභාපතිතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

ගරු සභාපතිතුමනි, මා ඉතා සුළුවෙන් කරුණක් දෙකක් ගරු ඇමතිතුමා ඉදිරිපිට තබන්නටයි, බලාපොරොත්තු වෙන්නෙ. මේ කාරක සභා සාකච්ඡාව කෙරීගෙන යන විට අපට පෙනී ගියා—මන්ත්‍රීවරුන් කුමන පක්ෂයකට අයත් වුණත්—සෑම පැත්තේම මන්ත්‍රීවරුන් තමන්ගේ ජීවිතයේදී ලද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

අත්දැකීම් අනුව කථා කළ බව. අද මන්ත්‍රීවරුන් බොහෝ දෙනකුට මුහුණ පාන්නට සිදු වී තිබෙන්නේ පාලන යන්ත්‍රයේ ඇති දුර්වලතාව නිසා මතු වන අවහිරකම් උඩ පැන නඟින ප්‍රශ්නවලට බව ගම්බද ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මට කියන්නට පුළුවනි. සමහර විට හාල් පොතක් අර ගැනීමට ගම්බද දුප්පත් පුද්ගලයකුට මන්ත්‍රීවරයා සමඟ ඩී. ආර්. ඕ. කාර්යාලයට නැත්නම් කච්චේරියට යන්නට සිදු වන බවත්, එසේම පාසල් ගොඩනැගිල්ලේ වහලේ උළු කැඩී තිබෙනවා නම් ඒ උළු ටික තබවා ගැනීමටත් මන්ත්‍රීවරයාට අධ්‍යාපන නිලධාරියාගේ කාර්යාලයට යන්නට සිදු වන බවත් මේ ගරු සභාවේ සිටින ගම්බද ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරුන් හොඳින් දන්නවා ඇති.

ගරු සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන සමිති ගැන කථා කරන්නට යෙදුනා. ග්‍රාම සංවර්ධන සමිතිවල පරමාර්ථය ඉතාමත්ම යහපත් බව ඇත්තයි. 1947 දී පමණ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කළ අවස්ථාවේදී හැම ගම්කම වගේ හතු පිපෙන්නාක් මෙන් ග්‍රාම සංවර්ධන සමිති මතු වන්නට පටන් ගත්තා. මහජනයා එකතු වී එක් රැස් වීමෙන් මහජනයාගේ අඩුපාඩු සපුරා ගන්නට පුළුවන් වේයයි ඔවුන් කල්පනා කළ නිසා ඒ විධියට සමිති පටන් ගත්තා. නමුත් මොකද වුණේ? මහජනයා එකතු වුණා. සංවිධානය වුණා. රැස්වීම් පැවැත්තුවා. නිලධාරීන් පත් කළා. යෝජනා සම්මත කර ගත්තා. කච්චේරියට ගියා. හැම තැනම ගියා. වැඩක් වුණේ නැහැ. හය මාසයක් බලා ගෙන සිටියා. අවුරුද්දක් බලාගෙන සිටියා. අවුරුදු දෙකක් බලාගෙන සිටියා. වැඩක් වුණේ නැහැ. සමිතිය කඩා වැටුණා, ග්‍රාම සංවර්ධන සමිතියෙන් ඇති වැඩේ මොකක්ද යන අදහසක් මහජනයා තුළ ඇති වුණා. ඊට හේතුව මේකයි. අපේ ග්‍රාමීය ප්‍රදේශවල පාලන යන්ත්‍රයේ තිබෙන දුර්වලකම නිසා මහජනයා කලකිරීමට පත් වුණා. අපේ ග්‍රාමීය පාලන යන්ත්‍රය දුර්වලයි. අපේ ගරු ඇමතිතුමා තරම් දෙපාර්තමේන්තු ගානේ කන්තෝරු ගානේ රස්තියාදු වූ කෙනකු නැති තරම්ය කියා කියන්නට පුළුවනි. ඒ නිසා ඒතුමාය පිළිබඳ නියම තත්ත්වය දන්නා බවට සැකයක් නැහැ. විශේෂයෙන්ම මේ රටේ ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා හැටියට ගරු ඇමතිතුමා නියම තත්ත්වය දැන ගත යුතුයි. ප්‍රාදේශීය පාලනය භාර ඇමතිවරයාටම පළාත් පාලනයත් පැවරුණා නම් මා බොහොම සතුටුයි. ග්‍රාමීය ප්‍රදේශවල පාලන කටයුතු පළාත් සභා වලටත් අයිතියි. ඒ වගේම ප්‍රාදේශීය පාලනයටත් අයිතියි. එහෙත් ආණ්ඩුවේ අවශ්‍යතා නිසා ඒ අංශ දෙක වෙනස් වී තිබෙනවා. නමුත් අපේ වර්තමාන ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා ප්‍රාදේශීය පාලන යන්ත්‍රය ප්‍රතිසංවිධානය කිරීමට වැඩි සැළකිල්ලක් දක්වා ක්‍රියා කළහොත් හොඳය කියා මා හිතනවා. අද කච්චේරිය මුල් කරගෙන ප්‍රදේශ පාලනය කරන්නට යැම අලිම මෝඩ වැඩක්. ආණ්ඩුව විසින් කොපමණ හොඳ දේ කල්පනා කර කොපමණ විශේෂඥයන්ගේ උපදෙස් ඇතිව සැලැස්මවල් සකස් කළත් ඒවා ක්‍රියාත්මක කරන්නට යැමේදී කච්චේරිය ඒවා කඩා දමනවා. අද සෑම ඇමතිවරයකුටම වාගේ ග්‍රාමීය ජීවිතයට බලපාන යම් යම් දේවල් ගැන වගකීමක් තිබෙනවා. ඒ ඇමතිවරුන් සියලුම දෙනා එකතු වී සාකච්ඡා කොට ගමේ සාමාන්‍ය මහජනයාට පාලන යන්ත්‍රයත් සමග එකට අත්වැල් බැඳගෙන වැඩ කරන්නට ක්‍රමයක් සකස් කරන්න ඕනෑ. මේ පිළිබඳව මගේ අදහස මා ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන්නට කැමතියි.

කච්චේරි ඒකාබද්ධ කිරීම ඒ තරම් සාර්ථක වේයයි මා නම් හිතන්නේ නැහැ. මා කියන්නේ අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රසිද්ධ වැඩ, ඉඩම්, වාරිමාර්ග, සමුපකාර ආදී සෑම අංශයක්ම ඒකාබද්ධ කිරීම ග්‍රාමීය මට්ටමට ගෙනෙන්නට ඕනෑ බවයි. ඒවා ඒකාබද්ධ කර මහජනයා සමඟ එකතු වී සැලැස්මවල් සාදගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට මාර්ග යොදා ගන්න ඕනෑ බවත්, වුවමනා කරන මුදල් වෙන් කරගෙන ඒවා හරි හැටියට කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරන්න මාර්ගයක් නම් ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයත් ගම්කාර්ය සභා කොට්ඨාශයත් යන දෙක එකට කිට්ටු කිරීම බවත් මගේ කල්පනාවයි. සෑම ගම්කාර්ය සභා ප්‍රදේශයකටම එක ආදායම් නිලධාරියකු බැගින් පත් කළ යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ මට්ටමේදී ගමකට බලපාන සෑම දේම ඒකාබද්ධ කර ආදායම් නිලධාරියකුගේ භාරයට පත් කරනවා. එවිට ඩී. ආර්. ඕ. වරුන්ට වැඩත් හිටිනව. කොට්ඨාශය කුඩා වුනත් වැඩ වැඩි වන නිසා ඩී. ආර්. ඕ. වරුන්ට වැඩ හිටිනව. ඩී. ආර්. ඕ. යටතේ ඒ ඒ පළාත්වල තිබෙන නොයෙක් දෙපාර්තමේන්තුවල නිලධාරීන් එක් වී ග්‍රාම සංවර්ධන සමිති, සමුපකාර සමිති හා ගම් කාර්ය සභා සමග ඒ ඒ ප්‍රශ්න සාකච්ඡා කර, ඩී. ආර්. ඕ. ප්‍රධාන සංවර්ධන නිලධාරියා හැටියටත්, පාලන නිලධාරියා හැටියටත්, සැලැස්ම සම්පාදන නිලධාරියා හැටියටත් සලකා කටයුතු කලොත් ගම්බද අයට ගමේ ප්‍රශ්න ගමේදීම විසඳා ගන්න පුළුවන් වේවි. එවිට ගැමියන්ට කච්චේරිවලත් අනික් කාර්යාලවලත් රස්තියාදු වෙන්න ඕනෑ නැහැ. මන්ත්‍රීවරුන්ටත් හාල් පොතක් අරන් දෙන්න හෝ පාසැලේ උළු ටිකක් තියන්න යනවට වඩා ප්‍රිය වැදගත් කටයුතුවලට කාලය කැප කරන්න පුළුවන් වේවි. ඒ නිසා මා ඇමතිතුමාගෙන් මේ කාරණය ඉල්ලනව. තමා මේ බලය ලබා සිටින කාලය තුළ මේ ක්‍රමය සංවිධානය කර, පාලන යන්ත්‍රය මහජනයාට කිට්ටු කර, මහජනයාට තිබෙන කරදර නැති කරන්නට කටයුතු කරන්නය කියා ඉල්ලනව.

අ. භා. 2.45

ගරු සභාපතිතුමනි, සුළු කර්මාන්ත සම්බන්ධවත් මතක් කරන්න ඕනෑ. අද අපේ ආසනවල වටපිට බැලුවොත් බොහොම අමාරු තත්ත්වයකුයි පෙනෙන්නෙ. මොනවා කරන්නද කියා තේරෙන්නෙ නැහැ. ගොවිතැන අතින් දියුණු කරන්න ඉඩම් නැහැ. සියල්ලම සංවර්ධනය වෙලා. ඒ අතින් දැන් කරන්න දෙයක් නැහැ. හැම තැනම කුඹුරු නැත්නම් පොල්වතු. එහෙත් ගම්වල රැකීරක්ෂා ප්‍රශ්නය උග්‍ර වෙනව. මන්ත්‍රීවරයෙක් ගෙදර සිටින දවසට තත්ත්වය පෙනෙනව. මට ආරංචියි කථානායකතුමා ළඟට දිනකට සියයක් පමණ රක්ෂා සොයා ගෙන යනවාය කියල. ඒ තරම් නැතත් මා ළඟටත් සැළකිය යුතු පිරිසක් එනව. ඒ නිසා අද කරන්නට තිබෙන්නේ පුළුවන් තරම් ඉක්මණින් කාර්මික අංශයෙන් දියුණුවක් ඇති කිරීමයි. ගොවි කර්මාන්තයෙන් පමණක් මෙය විසඳන්නට බැහැ. අපි හැමදාම "පේස කර්මාන්තය" කිය කියා සිටියාට එයින් පමණකුත් බැහැ. ඒකත් අවශ්‍යයි. ඒ ඒ ප්‍රදේශයේ තිබෙන අමු ද්‍රව්‍ය මොනවාද කියා බලා එය අත්තිවාරම කරගෙන සුළු කර්මාන්ත ආරම්භ කරන්න ඕනෑ. ඒ පිළිබඳව අපි කොයි තරම් කටයුතු කර තිබෙනවාද කියා සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් වහාම පරීක්ෂණයක් පවත්වා බලා ගෙන—සුළු කර්මාන්ත පමණක් නොවෙයි, ගරු කර්මාන්ත ඇමතිතුමාගේ සහයෝගය ඇතිව ලොකු කර්මාන්තත් ආරම්භ කළ යුතුව තිබෙනව—කල්පනාකාරීව ක්‍රියා කරන්නය කියා මා ඉල්ලා සිටිනව.

**කා. පො. ඉරත්තිනම් මයා.** (කිලිනොච්චි)
(திரு. கா. பொ. இரத்தினம்—கிளிநொச்சி)
(Mr. K. P. Ratnam—Kilinochchi)

தலைவர் அவர்களே, எனக்கு முன் பேசிய கௌரவ உறுப்பினர் [திரு. ரீ. பி. சுபசிங்ஹ அவர்கள் கிராம ஆட்சி அமைப்பை மாற்றியமைக்கவேண்டுமென்று கூறியதை நானும் வரவேற்று அவ்விதம் செய்ய வேண்டுமென்று வற்புறுத்த விரும்புகின்றேன். இப்பொழுதுள்ள அமைச்சர் அவர்கள் துணிவும் ஊக்கமும் வாய்ந்தவர். இன்று நடைமுறையில் இருக்கின்ற உள்நாட்டு அலுவல் அமைப்பு முறையை மாற்றியமைத்தாலன்றிக் கிராம மக்கள் எவ்விதமான துன்பமும் இன்றி வாழும் நிலைமை உண்டாகாது. கிராமங்கள், குடியேற்றப் பகுதிகளின் பிரதிநிதியென்ற முறையிலே இன்று நடக்கின்ற ஆட்சியமைப்பிலே—இன்று இருக்கின்ற கச்சேரி முறையிலே கிராம மக்கள் எந்தவிதமான நன்மையையும் பெற இயலாதவர்களாக இருக்கின்றனர் என்பதைக் கூற விரும்புகிறேன். எனவே, கிராம மக்கள் தாங்கள் இருக்கின்ற இடத்தில் இருந்து கொண்டு வேண்டியவற்றையெல்லாம் பெறத்தக்க முறையில் இந்த உண்ணாட்டு அலுவல் அமைப்பு முறையைத் தீவிரமாக மாற்றி, அதனை நல்ல ஆட்சிமுறையாக அமைப்பது இந்தத் தேசிய அரசாங்கத்தின் முதற் கடமையென்று கூற விரும்புகின்றேன்.

அனுமதிச்சீட்டொன்று பெறவேண்டுமானால், அரிசிப் பங்கீட்டுப் புத்தகமொன்றைப் பெறவேண்டுமானால் காரியாதிகாரி அலுவலகத்துக்கும் கட்சேரிக்கும் செல்லவேண்டும். என்னுடைய தொகுதியைப் பொறுத்தவரையிலே சிலபகுதி மக்கள் 72 மைல் தூரம் சென்றால்



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தான் கச்சேரியை அடைய முடியும். ஒருநாள் பயணம் செய்து, தங்கள் பணத்தைச் செலவழித்த பின்பும் காரியம் கைகூடாத நிலையில் தங்கள் இல்லங்களுக்குத் திரும்பும் கிராம மக்களின் உள்ளம் எவ்வளவு துன்பமடையும் என்பதை நான் கூறவேண்டியதில்லை.

எனவே, கிராமப்புற மக்கள் தங்களுக்கு வேண்டியவற்றையெல்லாம் அரசாங்கத்தினிடமிருந்து தாங்கள் வதிகின்ற இடங்களிலிருந்தே பெறத்தக்கதாக இந்த மாகாண நிருவாக முறையை மாற்றியமைக்கவேண்டியது அரசாங்கத்தினது கடமை. இந்த மாகாண ஆட்சி அமைப்பு முறையை எப்படி மாற்றியமைக்க வேண்டும் என்பதை நான் அமைச்சர் அவர்களுக்கு எடுத்துக்கூறவேண்டிய அவசியமில்லை. அவர் இவ்விடயத்தில் அனுபவம் வாய்ந்தவர். எனவே, அமைச்சர் அவர்கள் இந்த நிருவாக முறையை மாற்றியமைப்பாராயின் அது அவர் கிராம மக்களுக்குச் செய்கின்ற ஒரு பெரிய உதவியும் இணையற்ற தொண்டுமாகும் எனக் கூற விரும்புகின்றேன். எனவே, ஆட்சியமைப்பின் மையத்துக்குக் கிராம மக்கள் செல்லாமல் அம்மையம் கிராம மக்களைப் போய்ச்சேரத் தக்கதாக ஆட்சி அமைப்பு முறையை மாற்றியமைக்க வேண்டுமென்று நான் அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, மாவட்ட இணைப்புக் குழுக்களைப்பற்றிக் கூறவேண்டியிருக்கின்றது. இன்று ஒரு மாவட்டத்திலுள்ள பல திணைக்களங்களினதும் அலுவல்களை ஒருமுகப்படுத்தக் கூடிய முறையில் இந்த மாவட்ட இணைப்புக் குழுக்கள் அமைக்கப்பட்டிருக்கின்றன. ஆனால் சென்ற நான்கு, ஐந்து மாதங்களாக இதில் பங்குபற்றியவன் என்ற முறையிலே இந்த மாவட்ட இணைப்புக் குழுக்களின் கூட்டங்களினாலே எதுவித பயனுமில்லை என்று நினைக்க வேண்டியிருக்கின்றது. ஏனென்றால், அந்தக் கூட்டங்களிலே பல தீர்மானங்களை நிறைவேற்றுகின்றோம். ஆனால், அவை மேலதிகாரிகளிடம் வந்தவுடன்—அமைச்சர் காரியாலயத்துக்கு வந்தவுடன்—கவனிக்கப்படுவதில்லை. உதாரணமாக. சங்குபிட்டி-கேரதீவு பாலத்தை மிக விரைவில் முடிக்க வேண்டும்; அதற்கு முதலிடம் கொடுக்க வேண்டுமென்று மாவட்டக்குழு சென்ற ஆண்டுகளிலே தீர்மானித்தது. இந்த ஆண்டிலும் அவ்விதமே தீர்மானித்தது. ஆனால், ஒன்றும் நடைபெறவில்லை.

இரத்மலானையில் இருக்கின்றது போல் ஆரம்ப தொழில் நுட்பப்பாடசாலையொன்று யாழ்ப்பாணத்தில் தொடக்கிவைக்கப்பட வேண்டுமென்றும் அங்கு தமிழ் மூலம் கற்பிக்க ஒழுங்கு செய்யப்பட வேண்டுமென்றும் தீர்மானிக்கப்பட்டது. ஆனால், இதுவரை எதுவித நடவடிக்கையும் எடுக்கப்படவில்லை. எனவே, தலைவர் அவர்களே, தீர்மானங்களை நிறைவேற்றியபின் அவைகள் நடைமுறைக்கு வராமலிருந்தால் அந்தத் தீர்மானங்களினாலே என்ன பயன் என்று நாம் சந்தேகப்படுகிறோம்; பொதுமக்களும் சந்தேகப்படுகின்றார்கள். எனவே, மாவட்ட இணைப்புக் குழுவுக்கு ஓரளவு அதிகாரத்தைக் கொடுத்து அது நிறைவேற்றும் தீர்மானங்களுக்கு முன்னீடு—top priority—கொடுக்க வேண்டும்; அந்தக் குழுவின் தீர்மானங்களுக்கு மதிப்புக் கொடுக்க வேண்டும் என்று நான் அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்ததாக, கிராம சேவையாளர் முறை இந்த நாட்டிலே புதிதாகத் தொடக்கிவைக்கப்பட்ட ஒன்றாகும். தமிழ்ப் பகுதியைப் பொறுத்த வரையிலே இந்தக் கிராம சேவகர்களைத் தெரிவு செய்யும்போது தகுதியானவர்கள் தெரிவு செய்யப்படவில்லையே என்ற சந்தேகம் மக்கள் மனத்திலே நிலவியது. நேர்முகத் தேர்விலே சிலரை உயர்த்திச் சிலரை வீழ்த்திவிட்டமையால் இது நிகழ்ந்ததெனப் பலர் எண்ணினர். இது உயர்ந்த இடத்திலே நடந்த திருவிளையாடலின் விளைவென இப்பொழுது அறிகிறோம். இவ்விதம் தகுதியற்ற முறையில் ஆட்களைத் தேர்ந்தெடுக்கும் முறை இந்நாட்டிலே இனிமேலும் நிலவாமல் பார்த்துக்கொள்வதாக அமைச்சர் அவர்கள் கூறியதை நாம் வரவேற்கிறோம். இவர்கள் சாதாரண மக்களோடு தொடர்பு கொள்ளும் உத்தியோகத்தர்கள். எனவே, சேவை மனப்பான்மை உள்ளவர்களைத்தான் இந்தச் சேவையிற் சேர்க்க வேண்டும். அதிகார மனப்பான்மையுள்ளவர்களை எடுத்தால் ஒருபோதுமே நன்மையடைய முடியாது. இக்கிராம சேவையாளர்கள் கிராம மக்களுக்குத் துணை செய்யும் பதவியை வகிப்பவர்கள். இக் கிராம சேவையாளர் சேவை புதிதாகத் தொடங்கப்பட்ட ஒரு சேவையாதலால் இதில் திருத்தங்

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

கள் பல செய்யப்பட வேண்டியிருக்கின்றது. தங்களுடைய சேவையில் மனத்திருப்தி யடையக்கூடிய வாய்ப்புக்களை அவர்களுக்குக் கொடுத்தால் தான் அவர்களால் கிராம மக்களுக்கு நன்மை செய்ய முடியும். ஆகவே, இவர்களுக்கு வேண்டிய நலன்களைச் செய்து கொடுக்க வேண்டியது கௌரவ அமைச்சரவர்களுடைய கடமையாகும்.

என்னுடைய தொகுதியில் கிராம சேவையாளர்கள் தங்களுடைய கடமைகளைச் செய்வதற்கு 10, 15 மைல் தூரம்வரை செல்ல வேண்டியுள்ளது. இதற்காக அவர்களுக்குப் பிரயாணச் செலவு வழங்கப்படுவதில்லை. அவர்களின் அலுவலகங்களுக்கு வாடகை கொடுக்கப்படுவதில்லை. அவர்கள் நாடோறும் இருபத்துநாலு மணிநேரமும் உழைக்கவேண்டியிருக்கின்றது. காரியாதிகாரி அலுவலகத்துக்கு, கிழமையில் இரண்டு மூன்று முறைகள் செல்ல வேண்டியிருக்கின்றது. இதற்கும் பயணப்படி இல்லை. இப்படியாக இவர்களுக்குத் தக்க ஊதியமும், படிகளும் கொடுக்காமல் குறைந்த சம்பளத்தைக் கொடுப்பதுடன், தங்களுடைய வீட்டிலிருந்து வேலை செய்ய விடாமல் வேறு இடத்திலிருந்து வேலை செய்ய இவர்கள் நிர்ப்பந்திக்கப்படுவதனால் இவர்கள் உண்மையாகத் தங்களுடைய கடமையைச் செய்யாமல் மக்களைச் சிரமத்துக்குள்ளாக்கினால் அதில் வியப்பேற்படுவதற்கு இடமில்லை. அவர்கள் தங்களுடைய கடமைகளை உண்மையாகவும், உற்சாகமாகவும் செய்வதற்கேற்ற வாய்ப்புக்களைக் கௌரவ அமைச்சரவர்கள் கொடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன்.

அடுத்ததாக, இன்னொரு விஷயத்தைக் கௌரவ அமைச்சரவர்களுடைய கவனத்துக்குக் கொண்டு வர விரும்புகின்றேன். நான் சபையில் இருக்கும் போது எனக்குத் தொலைபேசிச் செய்தியொன்று கிடைத்தது. ஒருவர் தம்முடைய திருமண அறிவித்தலை இங்கே கொடுத்து அதன் பிரதியை யாழ்ப்பாணத்துக்கு எடுத்துச்செல்ல விரும்பினார். அவர் தம் பத்திரங்களை ஆங்கிலத்திலேயே சமர்ப்பித்திருந்தார். ஆனால் அவர் எழுதிக் கொடுத்த மொழியிலே, அவரது திருமண அறிவித்தல் பத்திரம் வழங்கப்படவில்லை. சிங்களத்தில் வழங்கப்பட்ட அப் பத்திரத்தை யாழ்ப்பாணத்துக்கு எடுத்துச் சென்றால், அங்கே ஏற்க மாட்டார்களாகையால் தமது இடர்ப்பாட்டை நீக்குமாறு கேட்டார். இப்படியான அலுவல்கள் இனிமேலும் அரசாங்க திணைக்களங்களில் நடக்காமல், நல்ல முறையில் அலுவல்கள் நடைபெறுவதற்கான ஒழுங்குகளைச் செய்ய வேண்டுமென்று கௌரவ அமைச்சரவர்களைக் கேட்டுக் கொள்ளுகின்றேன்.

அடுத்ததாக, சிறு கைத்தொழில்கள் பற்றிச் சில கருத்துக்கள் கூற விரும்புகின்றேன். கிராம முன்னேற்றச் சங்கங்கள் பல தம் பகுதிகளில் நெசவு நிலையங்கள் அமைத்துத் தர வேண்டுமென அரசாங்கத்தைக் கேட்டுக் கொள்ளுகின்றன. அவற்றின் தீர்மானத்தை மாவட்ட இணைப்புக்குழுவும் ஏற்றுக் கொள்ளுகின்றது. ஆனால், மாவட்ட இணைப்புக்குழுவின் தீர்மானத்தை ஏற்று நடைமுறைக்குக் கொண்டு வர அரசாங்கத்தினால் முடியாமல் போகின்றது. இதனால் மக்கள் நம்பிக்கை இழக்கிறார்கள். எனவே, இப்படியான நிலை உருவாக இடமளியாமல் குடிசைக் கைத்தொழிற் பகுதியைச் சீர்திருத்தியமைக்க வேண்டும்.

கடந்த கால அரசாங்கத்தின் உண்ணாட்டு அமைச்சராக இருந்தவர் வடக்கு, கிழக்கு மாகாணங்களுக்கு மின்விசைத் தறிகளை அதிகமாக அனுப்பவில்லை. தேசிய அரசாங்கத்தின் அமைச்சரவர்கள் இக்குறை இனியும் நிகழாமல் பார்த்துக் கொள்வதோடு, முன்னர் நிகழ்ந்த இக்குறையை நீக்க வேண்டும் என்றும் கேட்டுக்கொள்கின்றேன். மின்விசைத் தறிகளைப் பரப்புவதிலும் பார்க்க கைத் தறிகளைப் பரப்பினால் தான் நாட்டின் வேலையில்லாத் திண்டாட்டத்தை நீக்க முடியும். என்னுடைய தொகுதியில் 25, 30 இடங்களில் கைத் தறிகளை வைத்து வேலைசெய்ய மக்கள் ஆவலோடு இருக்கிறார்கள். ஆனால், அவர்களுக்குத் தேவையான உபகரணங்களை அரசாங்கம் கொடுக்கவில்லை. இக்குறையை கௌரவ அமைச்சரவர்கள் உடனே நீக்க வேண்டும் என்று கேட்டுக் கொள்ளுகிறேன்.

எனது பேச்சை முடிப்பதற்கிடையில், கிராம முன்னேற்றச் சங்கங்களைப்பற்றியும் ஒரு சில கருத்துக்களைத் தெரிவிக்க விரும்புகின்றேன். இச் சங்கங்களுடன் ஈடுபட்டிருக்கும் அரசாங்க உத்தியோகத்தர்கள் எத்தகைய உருப்படியான பணிகளையும் செய்வதில்லை. பல சங்கங்களை நிறுவுகிறார்கள். அவை பல நாட்களுக்கு வாழ்வதில்லை. சில நாட்களுக்

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉරත්තිනම් මයා.]

இடையில் இறந்து விடுகின்றன. கிராம அபி விருத்தி உத்தியோகத்தர்களுக்கு நல்ல முறையில் பயிற்சியளித்து, அவர்கள் மக்களுக்குத் தொண்டு செய்யக்கூடிய நிலையைக் கௌரவ அமைச்சரவர்கள் உண்டாக்க வேண்டும் எனக் கூறி, எனது உரையை முடித்துக் கொள்ளுகின்றேன்.

**සභාපතිතුමා**

*(அக்கிராசனர்)*

(The Chairman)

Order please! The hon. Appointed Member, Sir Razik Fareed, will now take the chair.

**අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, පත්කරන ලද මන්ත්‍රී නැන්පත් ශ්‍රීමත් රාසික් fපරීඩ් මහතා මූලාසනාරූඪ විය.**

அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, நியமன அங்கத்தவர் [ஸ்ரீமான் ருஸிக் பரீத் ஓ.பி.ஈ.], அக்கிராசனத், மர்ந்தார்.

*Whereupon* MR. SPEAKER *left the Chair, and* SIR RAZIK FAREED, O.B.E. [APPOINTED MEMBER] *took the Chair.*

**සෝමරත්න සෙනරත් මයා. (අම්පාරෙයි)**

*(திரு. சோமரத்ன செனரத்—அம்பாறை)*

(Mr. Somaratne Senerath—Amparai)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මා සඳහන් කරන්න යන්නේ කරුණු තුනක් පමණයි. අද තිබෙන තත්ත්වය අනුව මේ කච්චේරි ක්‍රමය මේ රටට හොඳ පාලන යන්ත්‍රයක්ය කියා අපට පිළිගන්න බැහැ. නිදහස ලැබෙන්නට පෙර මේ රටේ පැවති යල් පැනපු පාලන ක්‍රමයක් තමයි, මේ කච්චේරි ක්‍රමය. නිදහස ලැබී අවුරුදු ගණනාවක් ගියාට පසුවවත් මේ කච්චේරි ක්‍රමයේ වෙනසක් අපි බලාපොරොත්තු වුණා. අද නිදහස් ජාතියක් වශයෙන් රටේ හුඟක් වෙනස්වීම් ඇතිවී තිබෙනව. නමුත් මේ පැරණි ක්‍රමයේ වෙනසක් අද වනතුරුත් ඇති වී නැහැ. තවමත් අපේ ගැමියන්ට ඒජන්ත හාමුදුරුවෝ කිය කියා බඩගා ගෙන යන්නයි සිදු වී තිබෙන්නේ. මේ ක්‍රමයෙන් නම් මහජනතාවගේ අවශ්‍යතාවන් විසඳෙන්නේ නැහැ. ඒ නිසා දැනට කච්චේරිවලට තිබෙන බලතල පළාත් පාලන ආයතනවලට දීමෙන් හෝ කච්චේරිත් පළාත් පාලන ආයතන යන දෙක සම්බන්ධ කර යම්කිසි ක්‍රියා මාර්ගයක් ඇති කිරීමෙන් හෝ මේ ප්‍රාදේශීය පාලන යන්ත්‍රය දැනට වඩා හොඳින් කර ගෙන යෑමට පහසුවක් ඇති වේය යනු මගේ විශ්වාසයයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ඒ කච්චේරි ක්‍රමය ගැන තවත් කාරණා එකක් දෙකක් මම ඉදිරි පත් කිරීමට අදහස් කරනවා. අම්පාරේ ප්‍රදේශයට අළුතින් පිහිටුවූ කච්චේරියක් තිබෙනවා. මේ අළුත් කච්චේරිය යටතේ තිබෙනවා, ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයක්. දැනට කටයුතු කෙරෙන අන්දමට දෙලක්ෂයක පමණ ජනගහණයක් ඇති මේ ප්‍රදේශයට එක් ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයක් පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. අම්පාරේ ආසනයේ කොටසක් සමන්තුරේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයට අයිතියි. අනික් කොටස පොල්ගම්පත්තු ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයට අයිතියි. සමන්තුරේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය කල්මුනේ ආසනයටයි, අයත්. දත් මාසයකට පමණ පෙර—නින්තවූර්හි මන්ත්‍රීතුමා (එම්. එම්. මුස්තපා මයා.) දන්නවා මා කියන්නට යන කාරණය ගැන—අපේ දිස්ත්‍රික්ක සම්බන්ධතා කොමිටි රැස්වීමේදී අම්පාරේ දිස්ත්‍රික්කයට ආදායම් පාලක නිලධාරි කොට්ඨාශ දෙකක් තිබිය යුතුයයි යෝජනාවක් ගෙනාවා. සමන්තුරේ ආදායම් පාලක කොට්ඨාශය අම්පාරේ දිස්ත්‍රික්කයටම ගෙන එහි කොට්ඨාශ දෙකක් ඇති කරන්න කියායි, යෝජනාව ගෙනාවේ. ඒ අවස්ථාවේදී මා මිත්‍ර නින්තවූර් මන්ත්‍රීතුමා කියා සිටියා, උන්නැහේගේ ආසනයටත් ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයක් වුවමනාය කියා. මේ යෝජනා දෙකම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට එදා අපි තීරණය කළා. නින්තවූර් මන්ත්‍රීතුමාගේ ඉල්ලීම දෙන්න. ඒ සමඟම මගේ කොට්ඨාශයේ අවශ්‍යතාවය පිළිබඳවත් ඇමතිතුමාගේ සැලකිල්ල දක්වන්න. එයයි, මගේ ඉල්ලීම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මගේ කොට්ඨාශය බින්තැන්න ප්‍රදේශයේ මහඔය පදියතලාව දක්වා දික්වී යනවා. මහඔය පදියතලාව ප්‍රදේශය මොනරාගල දිසාපතිතුමා යටතේයි, පාලනය වන්නේ. අම්පාරේ සිට මොනරාගල දක්වා හැතැප්ම සීයක් පමණ තිබෙනවා. ඒ නිසා මහඔය දිස්ත්‍රික්කයේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය අම්පාරේ දිසාපතිතුමාගේ පාලනයට ගන්නා ලෙස මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම මොනරාගල කච්චේරියට යාමට බොහෝ දුර ඇති නිසා. අම්පාරේ මහඔය පාර දැන් කපා අවසානයි. එම නිසා, දිස්ත්‍රික් ආදායම් පාලක නිලධාරිතුමාගෙ කොට්ඨාශය මොනරාගලින් මුදවා අම්පාරේ දිසාපතිතුමාට පවරනව නම්, වැඩ කටයුතු කිරීමට විශාල පහසුවක් සැලසෙනවට කිසිම සැකයක් නැහැ.

අ. භා. 3

අම්පාරේ කච්චේරියෙ නිලධාරි හිඟයක් පවතිනව. ඒ ප්‍රදේශය දුෂ්කර ප්‍රදේශයක්ය කියා බොහෝ දෙනා එහි යන්න කැමති නැහැ. දේශපාලන කටයුතුවල නිරතවුණාය කියා ගුරුවරුන් මාරු කළා වාගෙ, දේශපාලනය කළ අය කීප දෙනෙක් වත් එහාට දැම්මොත් සමහරවිට එම නිලධාරි හිඟය මැඩ පැවැත්වෙන්ට පුළුවනි. එහෙ පදිංචියට ගෙවල් නැත කියාත්, යන්න අකමැති නිලධාරීන් සිටිනව. ආණ්ඩුව තීරණය කර තිබෙන බවත් පෙනෙනව, ගල්ඔය සංවර්ධන මණ්ඩලය වසා දමන්න. ඒ විධියට ගල්ඔය සංවර්ධන මණ්ඩලය වසා දැම්මොත්, ගල්ඔය සංවර්ධන මණ්ඩලය සතු ගෙවල් සහ කාර්යාල ගොඩනැගිලි හිස් බවට පත් වන බව තමුන්නාන්සෙ දන්නව ඇති. එතකොට දැනට උහන තිබෙන දිසාපති කාර්යාලය අම්පාරෙට ගෙන ගොස් අර අන්දමට හිස් වන ගොඩනැගිලි එම නිලධාරීන්ගෙ ප්‍රයෝජනය සඳහා පාවිච්චි කරන්න පුළුවන්කම ලැබෙන බව ගරු ඇමතිතුමාට මතක් කරන්න ඕනැ. අපි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කොමිටියෙදි යෝජනාවක් ස්ථිර කරගෙන එය අමාත්‍යාංශයටත් ඉදිරිපත් කර තිබෙනව. උහන දිසාපති කාර්යාලය අම්පාරෙට ගේන්න කියලයි, අපි ඉල්ලා සිටියෙ. දැන්ම බැරි වුණත්, පසු වෙන කොට එය කරන්න අවස්ථාව සැලසෙනවි ඇති. ගල්ඔය සංවර්ධන මණ්ඩලයට අයිති නිවාස සහ කාර්යාල ගොඩනැගිලි හිස් වුණාම, ඉබේටම වාගෙ මෙම කටයුත්ත ඉටු වේවිය කියා මා කල්පනා කරනව. එම නිසා දැන්ම ඒ ගැන මහන්සි නොගත්තත්, දැනට පවත්නා නිලධාරි හිඟය මැඩ පැවැත්වීම සඳහා කටයුතු කළොත් හොඳයි කියා මා ගරු ඇමතිතුමාට මතක් කරනව. අම්පාරෙ ප්‍රදේශයට සිංහල දන්න නිලධාරීන් හුඟක් අවශ්‍යයි. ඒ විධියෙ නිලධාරීන් කීප දෙනෙක් එහි යැව්වොත් කාර්යාලවල කට යුතු මීට වඩා හොඳින් කරගෙන යාමට අවස්ථාව සැලසෙනව ඇති.

**එම්. අබ්දුල් බකීර් මාකර් මයා.** (බේරුවල)

*(ஜனாப் எம். அப்துல் பாக்கீர் மாக்கார்—வேருவளை)*

(Mr. M. Abdul Bakeer Markar—Beruwala)

Mr. Chairman, I think there is unity in the expressions of hon. Members this afternoon. They have all praise for the Minister of Home Affairs. We know that if there is any Minister who is accessible, who gives every Member of Parliament the right of audience and listens to their grievances realizing the fact that the Member approaches the Minister with a sense of responsibility, it is the Minister of Home Affairs. When we go to the Minister with a problem we invariably find that he studies the question. He does not send us from one head of department to another; or from one table to another. After studying the question he first contacts the officer concerned, finds out from him the position and then gives the order immediately. This action of the Minister saves so much of time and trouble to the Members of Parliament and all of us are grateful to him. I am not saying that other Ministers do not attend to our problems, but if they also could dispose of matters in that fashion, much of the problems could be solved.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබ්දුල් බකීර් මාකාර් මයා.]

There are certain matters that I would like to bring to the notice of the Hon. Minister. Much was said about kachcheri administration. One difficulty I find is that officers who are appointed as Government Agents are not acquainted with kachcheri administration and we have found some of them to be square pegs in round holes. Some who are sent to the district kachcheris are men who have not had their training in provincial administration and, therefore, when we approach them with certain problems they find themselves in difficulties and have to consult others before they come to a decision.

I know, in the Kalutara Kachcheri we had a Government Agent who had everything at his finger tips. Whenever we approached him on any matter, it was disposed of in double quick time. What has happened now? That officer has been transferred to Colombo, to some Ministry or commission, and we have another officer sent in his place. He had a very good training in Colombo, but not in provincial administration. Again he has become either a square peg in a round hole or a round peg in a square hole! Therefore, it is very desirable to see that kachcheris are entrusted to officers who have had training in kachcheri admininstration.

In regard to rural development societies and rural administration, I would like to point out that in these rural areas there are societies and societies; their activities overlap one another and they work at a tangent. There is no co-ordination. It is necessary to bring about co-ordination at every level. A suggestion has been made—I think the Hon. Minister is aware of it and is attempting to carry it out—that we should form electoral co-ordinating committees. I would like to commend that idea. That is one way in which the Member of Parliament can have sufficient control of the administrative activities in his own electorate. There are rural development societies and young farmers' clubs: one society comes and makes a demand, then a similar demand is made of us by another society, and so on. We are placed in a peculiar position. We do not know whom to please. Difficulties of that sort are present always. If a co-ordinating committee is organized at electoral level, all those matters could be discussed at a district meeting and the Member of Parliament will be in the happy position of getting the amenities distributed in a systematic and satisfactory manner. Therefore, I would commend to the Hon. Minister the idea of a co-ordinating committee at an electoral level. It is very desirable and the suggestion must be implemented without any delay. It is the only means by which a Member of Parliament could have control in a systematic way over the facilities that are provided.

I wish now to refer to the Muslim Marriage and Divorce Act. We have drawn the attention of the Hon. Minister to this matter now and again. Where this matter is concerned, Muslims are in the happy position of having a Minister in charge of it in whom they have quite a deal of confidence. When we were left in the lurch and when we had no divorce courts one of the first Bills that the Hon. Minister presented was the Muslim Marriage and Divorce (Amendment) Bill and the appointment of Kathis is now a matter for the Judicial Service Commission.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

He re-introduced a Bill of the previous Government.

ගරු ආචාර්ය දහනායක

(கௌரவ கலாநிதி தகநாயக்க)

(The Hon. Dr. Dahanayake)

The previous Government had thrown it into the dustbin and I had to take it out.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

That is not correct; it was presented in this House.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

Order, please! The hon. Member has been allowed only a short time to speak.

අබ්දුල් බකීර් මාකර් මයා.
*(ஜனாப் அப்துல் பாக்கிர் மாக்கார்)*
(Mr. Abdul Bakeer Markar)

It was only a question of presenting the Bill, withdrawing it and asking the entire Muslim community to get the support of the U. N. P. to get a two-thirds majority. They were not in the least prepared to accommodate the Muslim community in that way. They only wanted to show them that they——

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

You have only a little time left.

අබ්දුල් බකීර් මාකර් මයා.
*(ஜனாப் அப்துல் பாக்கிர் மாக்கார்)*
(Mr. Abdul Bakeer Markar)

I only hope that the Hon. Minister will see that the re-validating Bill is introduced quickly in order to enable the decision of the Kathi courts to be put into effect.

Next I would like to refer to the Wakfs Commissioner. I would like the Hon. Minister to pay some attention to the salary paid to the Wakfs Commissioner. You are calling him a Commissioner—and he is the head of department—but you give him a salary lower than that of a D. R. O. It is an insult to the position he holds. A D. R. O. has a higher maximum salary than the Wakfs Commissioner. I would urge the Hon. Minister to see that immediate action is taken to give this departmental head a salary in keeping with his position. It is a department having administrative functions spread throughout the Island.

ඒ වාගේම, දැනට ග්‍රාම සේවක නිලධාරීන් පත් කිරීමේදී තමන්ගේ ගම් ප්‍රදේශවලට නොවෙයි පත් කරන්නෙ; පිට පළාත්වල වයි. මේ උදවියගේ රාජකාරියේ ප්‍රධාන තැනක් ගන්නේ ගම්වල අපරාධ මර්ධන යයි. නමුත් ඒ ගම්වල උදවිය දන්නෙ අඳුනන්නෙ නැතිව, ඔවුන්ගෙන් කිසිම සහයෝගයක් නැතිව, ඥාති මිත්‍රාදීන් නැතිව, අමුතුම ප්‍රදේශයකට ගිහින් අපරාධ මර්ධනය කරන්නෙ කොහොමද? ඒ තැනැත්තාට සහයෝගය දෙන කෙනෙක් නැහැ. දන්නා අඳුනන කෙනෙක් නැහැ. එවැනි ප්‍රදේශයකට ගිහින් හැලි අරක්කු කාරයොත්, හරක් හොරුත්, මිනී මරුවොත් එක්ක තනියම සටන් කරන්න පුළුවන් වේවිද? කවදාවත් පුළුවන්කමක් නැහැ. එම නිසා තමන් දන්න අඳුනන උදවිය සිටින, තමන්ට සහයෝගය ලැබෙන පිරිසක් සිටින, දන්න කියන පළාතකට පත් කිරීම ඉතාමත් සාධාරණයි, යුක්තිසහගතයි. නොදන්න ප්‍රදේශයකට පත් කළාම ඒ තැනැත්තාගෙන් කිසිම සේවයක් ඉටු වෙන්නෙ නැහැ.

අනික් කරුණ අද ඔවුන් පැරණි ගම් මුලාදෑනින්ගෙ අතකොළු බවට පත් වී සිටිනව. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක්ම දැන් වැඩි වශයෙන් නැවතී සිටින්නෙ පරණ ගම්මුලාදෑනීන්ගෙ ගෙදරවලයි. ඒ පරණ ගම්මුලාදෑනින්ගෙ බලය ඇති හැටියටයි ගමේ කටයුතු සිදු වන්නෙ. පරණ මුලාදෑනියා එක්ක හැප්පුණොත් ඔවුන්ට ඇප උපකාර කරන කෙනෙක්වත් සහය දෙන කෙනෙක්වත් ගමේ නැහැ. ඒ නිසා පරණ මුලාදෑනීන් කියන විධියටම ඔවුන් කටයුතු කරනව. ඒ අනුව අපට පෙනී යන්නේ පත් කළ මුලාදෑනීන්ගෙන් ගමට සේවයක් වෙන්නෙත් නැහැ; පරණ මුලාදෑනීන්ගේ සේවය ලැබෙන්නෙත් නැහැ. ඔය කරුණු අනුව කල්පනා කර ග්‍රාම සේවකයන් පත් කිරීමේ දී ඔවුන් දන්න අඳුනන ප්‍රදේශවලට පත් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනව. එවිට ඔවුන්ගෙන් ලොකු සේවයක් දෙවී.

ඊ ළඟට, රෙදි විවීමේ කර්මාන්තය ගැන කරුණක් දෙකක් සඳහන් කරන්න ඕනෑ. පේෂ කර්මාන්තය දැන් බොහෝම දියුණු වේගෙන යනව. දැන් කොළඹ හතේ හුඟක් දෙනෙකුට ලංකාවෙ නිෂ්පදනය කරන රෙදි ජනප්‍රිය වී තිබෙනව. ඉන්දියාවෙන් ගෙන්වන සාරිවලට වඩා දක්ෂ ලෙස නිම වුණ ඉතාම ලක්ෂණ ලංකා සාරි අද තිබෙනව. දැන් මේ අළුත් ආණ්ඩුව කපු මිල බස්සවා සාරි අඩු මිලට ඉන්දියාවෙන් ගෙන්වීමට අවස්ථාව සලසා තිබෙන නිසා——

ගරු ආචාර්ය දහනායක
(*கௌரவ கலாநிதி தகநாயக்க*)
(The Hon. Dr. Daharayake)
එහෙම අවසර දීල නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(*திரு. ஆர். ஜீ. சேனாநாயக்க*)
(Mr. R. G. Senanayake)
එහෙනම් තමුන්නාන්සෙ අද වොලරම්ස් සාප්පුවට ගිහින් බලන්න සිදු වී තිබෙන්නෙ කුමක්ද කියා. මීට කලින් ලංකාවේ නිපදවන සාරිවලින් අඩුම මිලට සාරියක් ගන්නට පුළුවන් වුනේ රුපියල් පහළොවත්, විස්සත් අතර ගණනකටයි. නමුත් මේ අයවැය ලේඛනය ඉදිරිපත් කළාට පසු දැන් රුපියල් 14 ට ඉන්දියන් සාරි විකුණන්න තියෙනවය කියා ඒ සාප්පුවෙ දැන්වීමක් පළ කර තිබෙනව. එයින් පෙනෙන්නෙ ඉන්දියාවෙන් අළුත් සාරි තොගයක් මෙහි ගෙන්වන්න පටන් ගෙන තිබෙන බවයි. එයින් අපේ කර්මාන්තයට විශාල පහරක් වදින බව මම මතක් කරන්න කැමතියි. මේ රටේ වැඩිපුර රක්ෂා ලැබෙන මාර්ගයක් සැළසුනා නම් ඒ සැළසුනේ. පේශ කර්මාන්තය මගින්. ඒ නිසා ඒ කර්මාන්තයට පහර නොවදින විධියට වැඩ කිරීම අපේ බරපතළ යුතුකමක්.

ගරු සභාපතිතුමනි, අපේ රෙදි කර්මාන්තයට පාවිච්චි කරන යන්ත්‍ර තවමත් තියෙන්නේ අර පරණ තත්ත්වයේමයි. ඒවායේ අබ මල් රේණුවක තරම්වත් වෙනසක්—දියුණුවක්—ඇති වෙලා නැහැ. පටන් ගත්ත කාලයේ තිබුණු යන්ත්‍රයමයි, තවමත් තියාගෙන කරකවන්නෙ. කිසිම අලුත් හැඩගැසීමක් නැහැ. නමුත් ජපන් රටේ රෙදි කර්මාන්තය තුන් හතර ගුණයකින් වැඩි දියුණු කිරීමට අළුත් යන්ත්‍ර නිපදවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනව. ඒ අනුව අපේ යන්ත්‍ර අළුත් වැඩියා කර ගැනීමට අද අපේ රටේ කිසිම වැඩ පිළිවෙළක් යොදා නැහැ; කිසිම මධ්‍ය ස්ථානයක් ඇති කර නැහැ. ජපන් රටින් උපදෙස් අරගෙන අපේ නිෂ්පාදනය තුන් හතර ගුණයෙන් වැඩි කරන්නට පුළුවන් යන්ත්‍ර නිපදවන්නට පුළුවන්. ඒ නිසා අපේ පේෂ කර්මාන්තය දියුණු කර ගැනීම සඳහා ජපන් රටේ උපදෙස් ඇතිව අපේ යන්ත්‍ර දියුණු කර ගැනීම සඳහා විශේෂ මධ්‍යස්ථානයක් ඇති කර ගැනීම ඉතා මත්ම ප්‍රයෝජනවත් බව මතක් කරන්න කැමතියි.

ඊළඟට අමද්‍යප ව්‍යාපාරය ගැන මතක් කරන්න ඕනෑ. ඩී. එස්. සේනානායක, එෆ්. ආර්. සේනානායක, දෙස්තර හේවා විතාරණ, අනගාරික ධර්මපාල යන උතුමන්ගේ නම් මෑත ඉතිහාසයේ අමද්‍යප වීරයන්ගේ නම් වශයෙන් අපි සිහි කරනව. සෑම ගම්වලම අමද්‍යප වීරයන් හැටියට ඒ අය සිහි කරනව. නමුත් අද අමද්‍යප වීර යන් හැටියට කැපී පෙනෙන අය තමයි, ඩඩ්ලි සේනානායක, ඩබ්ලිව්. දහනායක, ඊරියගොල්ල, ප්‍රේමදාස ආදි මහත්වරුන්.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
ආර්. ජී. සේනානායක.

**අ. භා. 4.15**

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

මමත් ඒ රැස්වීම් මාලාවට සහභාගි වුන බව ඇත්තයි. මේ රටේ මත්පැන් විකිණීම නවත්වනවය කියා මේ අය තදින්ම ව්‍යාපාරයක් ගෙන ගියා. නමුත් අමද්‍යප වීර යන් වශයෙන් කැපී පෙනෙන නම් ඇති අයට ඇමතිකම් ලැබුනට පසු ඒ අය එදා දරූ අදහසට කුමක් වෙනවද, එදා ගෙන ගිය ව්‍යාපාරයට කුමක් වෙනවද, කියා අපි බලාගෙන ඉන්නව. ප්‍රේමදාස මහත්මයා, ඊරියගොල්ල මහත්මයා වැනි අය අමද්‍යප වීරයන් වශයෙන් කැපී පෙනෙන අය හැටියට ඉන්නව. ඩඩ්ලි සේනානායක අගමැති තුමා මේ සම්බන්ධයෙන් විශේෂ කොමිෂන් සභාවක් පවත්වා කටයුතු කළා. දුන් බලය ලැබුණු පසු ඒ කොමිෂන් සභා වාර්තාව අනුව යම් කිසි ක්‍රියා මාර්ගයක් ගෙන යන්නට ඕනෑ නේද? නමුත් ඒ කොමිෂන් සභාවේ යෝජනා ක්‍රියාත්මක කරන ලකුණක් පෙනෙන්නට නැති බව බොහොම කනගාටුවෙන් කියන්නට සිදු වී තිබෙනව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ජාතික වීරයන් සිහිකිරීම පිළිබඳව උත්සව පවත් වන්නේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන්. වැඩි කලක් යන්න පෙර අනගාරික ධර්මපාල දිනය පවත්වන්න යන බව දැන ගන්න ලැබී තිබෙනව. මේ අය වෙනුවෙන් උත්සව තිය තියා මේ අයගේ ජීවිත ඉතාමත් අනර්ඝ ආදර්ශයන් වශයෙන් රටට පෙන් වන විට මේ උදවිය එසේ කැපී පෙනෙන් නේ මොන හේතුවක් නිසාද කියා අප කල් පනා කරන්නට ඕනෑ නේද? මේ සියළු දෙනාම කැපී පෙනෙන්නේ සිංහල ජාතිය අවදි කරවූ පිරිසක් හැටියට නොවේද? සිංහල ජාතික හඬ නැගූ පිරිසක් හැටියට නොවේද? මේ විධියට ආණ්ඩුව, සිංහල ජාතික හඬ නැගූ අය වෙනුවෙන් උත්සව තිය තියා, අප ඒ වීරයන් අනුගමනය කරන විට අප ජාති වාදීන් හැටියට හංවඩු ගසන්නේ කෙසේද? සිංහල ජාති වාදය මේ රටේ පිළිකුල් කළ යුතු දෙයක් නම් මේ උදවිය සිහි කිරීමට මේ රටේ උත්සව පවත් වන්නේ කුමක් නිසාද? ඒ උදවිය ජාතික වීරයන් වශයෙන් සිහි කර උත්සව පවත් වනවා නම් අප ඒ උදවිය අනුගමනය කිරීමේ ඇති වැරද්ද කුමක්ද? සංකර ජාති යක් බිහි කරන්න—අච්චාරු ජාතියක් බිහි කරන්න—උත්සාහ කරන ආණ්ඩුව ප්‍රතිපත්ති විරෝධි නොවෙයිද? වලිසිංහ හරිශ්චන්ද්‍ර, අනගාරික ධර්මපාල ආදි උතු මන් සිහි කිරීමට උත්සව පැවැත්වීම අද මේ ආණ්ඩුවේ ඇති පරමාර්ථයට ප්‍රතිවිරුඬ දෙයක් නොවෙයිද කියා මම අහන්නට කැමතියි.

**වී. අන්නමලෙයි මයා.** (පත්කරන ලද මන්ත්‍රී)
*(திரு. வீ. அண்ணாமலை—நியமன அங்கத்தவர்)*
(Mr. V. Annamalay—Appointed Member)

I should like to bring to the notice of the Hon. Minister the difficulties that parents face in obtaining the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අන්නාමලෙයි මයා.]

birth certificates of children. As hon. Members are aware, in the absence of birth certificates it is difficult to obtain admission to schools, difficult to find employment, impossible to apply for permission to travel abroad. I know of a case where an application was made for a birth certificate two years ago, and numerous reminders under registered cover have failed to bring about any result. I think the kachcheri system is a complete failure. It may be that the heads of departments are all right, but something is wrong with the subordinate staff. They fail to acknowledge the receipt of letters and no notice is taken of them. This is one of the important matters I wanted to bring to the notice of the Hon. Minister. I endorse the view of hon. Members that there should be a reform of the kachcheri system.

Another matter I want to mention is that plantation workers are being deprived of their guns for no reason. Although workers have possessed guns for 30, 40, even 50 years on licences issued, of late the tendency has been to confiscate the guns. Recently, it was as a result of timely intervention that the auction of guns was abandoned for the time being. Workers are themselves sports-minded, like the Hon. Minister, and they also deserve the opportunity to hunt in their leisure time. Many workers own vegetable plots which they are unable to protect without guns. One man brought it to my notice that his house had been burgled twice when he had no gun but that when he owned a gun, there had been no trouble. That his gun was recently taken away and his house has been burgled again. That is the state of affairs.

I see no justification for the confiscation of guns belonging to these poor workers. What is worse, no compensation is paid on confiscation. Even in the case of those who have passed away, no compensation has been paid. It is a case of confiscation and auction. I heard recently that all these confiscated guns are piled up and a steam-roller is sent over them to destroy them. Guns are useful, particularly for the protection of food crops. It is criminal to confiscate and destroy them.

I should also like to mention that when we tried to speak during the Debate on the Throne Speech we were told that we would have an opportunity to speak in the Budget Debate. When the Budget Debate was on, we were told that we would be able to speak during the Committee stage. Now that the Committee stage has arrived, we are asked to speak for two or three minutes and resume our seats.

මුලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

I should like to explain the position. Both sides have got together and they have given me a time table. The Chair has to keep to this time table.

අන්නාමලෙයි මයා.
(திரு. அண்ணாமலை)
(Mr. Annamalay)

I appreciate that, but, nevertheless, hon. Members face these difficulties.

I should also like to refer to the Kandyan peasantry. Year after year we have had report after report, but precious little has been done. When we meet at meetings of the co-ordinating committee, the government agents tell us there is no money. I find in the Estimates that only a sum of Rs. 4.2 million has been provided. It is in the Kandyan areas, particularly the plantation areas, that so much as Rs. 62 million is contributed by employers by way of E.P.F. payments. Cannot a fair portion of that be loaned to the Kandyan peasantry? They say it is Rs. 4.2 million whereas the annual E.P.F. contribution made by all employees in the Island, and more from the Kandyan plantation area, runs to as much as Rs. 62 million. I think hon. Members from the Kandyan areas

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

should not beg the question. We must demand it, I say. We all know in what plight the Kandyan villagers are living. We all come from that area; we know their difficulties and it is no pleasure to listen to speeches here—[*Interruption*]. It is really heartburning for the peasantry.—[*Interruption*]. I love them and I know them, and they love me, and that is why I am speaking. I know more about them than you know about them.

I think this is a matter where they will have to allow this money. I think the Kandyan Peasantry Commission this year is asking for a mere Rs. 10 million. Rs. 10 million out of Rs 62 million is only a fraction. I hope the Government will please allow that.

ගරු මන්ත්‍රීවරයෙක්
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

Ask the Government.

අන්නාමලෙයි මයා.
*(திரு. அண்ணாமலை)*
(Mr. Annamalay)

We are the Government and we are going to give. I am only reminding the Government.

I wish to congratulate the Hon. Minister of Home Affairs for two things; firstly, because he has taken away liquor from the restaurant cars in trains; and secondly, because he is very prompt, nice and so active although he is old. Prompt action is taken by him. He is one Hon. Minister from whom we can expect prompt action. I hope he will live long and have more energy to deliver the goods.

එච්. එම්. නවරත්න මයා. (මිනිපෙ)
*(திரு. எச். எம். நவரத்ன—மினிப்பே)*
(Mr. H. M. Nawaratna—Minipe)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, උඩරට ගැමි පුනරුත්ථාපනය ගැන හැම උඩරට මන්ත්‍රීවරයෙකුම වගේ කරුණු කිව්ව නිසා මා ඒ ගැන වැඩිදුර කථා කරන්ට අදහස් කරන්නෙ නැහැ. උඩරට ගැමි පුණරුත්ථාපනයට රුපියල් ලක්ෂ 100 ක් පමණ ලැබෙයි කියා මාත් බලාපොරොත්තු වෙනව. ගරු ඇමතිතුමාට මා ප්‍රකාශ කරන්ට සතුටුයි, ඒ සඳහා අතිරේක වැය ශීර්ෂයක් මේ ගරු සභාවට ඉදිරිපත් කළොත් මිණිපේ ජනතාව වෙනුවෙන් මා ඊට සම්පූර්ණ සහයෝගය දෙන බව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මට ලැබී තිබෙන්නෙ මිනිත්තු 2ක් පමණක් නිසා මට වැඩි දුර කථා කරන්ට බැහැ. මගේ කොට්ඨාශයේ තිබෙන අඩුපාඩු කීපයක් ගැන පමණක් සඳහන් කරනව. උඩරට ගැමි කොමිෂන් සභාව මගින් මගේ කොට්ඨාශයේ පාරක් කපාගෙන යනව. මාඩුගොඩ සිට උඩත්තව දක්වා කපන්ට අදහස් කරන එම පාර දැන් කළුගල දක්වා කපාගෙන ගොස් තිබෙනව. 1956 දී මා නියෝජනය කරණ මිණිපේ ආසනයට පත්ව සිටිය මැදිවක නමැති මහත්මයෙක්. ඒ පළාතේ එයාගේ ඉඩම් තිබෙනව. මෙම පාර ඒ මහත්මයාගෙන් ඉඩම් මැදින් ගෙන යාමටයි, අදහස් කරන්නෙ. එහෙත් කළුගල සිට උඩත්තව දක්වා යන විට ගම් 3ක් හම්බ වෙනව. උඩගල දෙබොක්ක, පල්ලෙගල දෙබොක්ක, ගල මුදුන නමැති ඒ ගම් වල පාඨශාලා 3 ක් තිබෙනව්. මේවායේ විශාල ජනතාවක් සිටිනව. ඒ ගම් මැදින් පාර ගෙන යන්නෙ නැතුව කැලයක් මැදින්, මනුෂ්‍ය වාසයක් නැති පළාතකින් ගෙන යන්ටයි, වැඩ පිළිවෙළ යොදා තිබෙන්නෙ. මා මේ කාරණය පාර්ලිමේන්තු ලේකම්තුමියටත් දැනුම් දුන්න. පාර්ලිමේන්තු ලේකම්තුමියගේත් සම්පූර්ණ සහයෝගය ඊට ලැබෙයි කියා මා අදහස් කරනව. ඒ පාර මනුෂ්‍යයන් පදිංචිව සිටින ගම් 3 මැදින් උඩත්තව දක්වා ගෙන යන්ට ඇමතිතුමා කටයුතු සලසනවා ඇතැයි මා විශ්වාස කරනව.

ඒ අතරම ඇමතිතුමාගෙන් තවත් ඉල්ලීමක් කරන්ට තිබෙනව. මිණිපේ ප්‍රදේශය සම්පූර්ණයෙන්ම ගොවි ජනතාව පදිංචි ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ ගොවීන්ට වල් සතුන්ගෙන් විශාල හානි පැමිණෙනව. එහෙත් මහනුවර කච්චේරියෙන් වැඩිපුර තවක්කු ලයිසන් නිකුත් කරන්නෙ, ක්‍රීඩකයින් ආදින්ටයි. තමන්ගේ ඉඩම් වල් සතුන්ගෙන් ආරක්ෂා කර ගන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කවිරත්න මයා.]

ගොවි ජනතාවටත් තුවක්කු ලයිසන් ලබා දෙන්ට කටයුතු කරන ලෙස ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව.

උඩදුම්බර ආදායම් පාලක නිලධාරි මහත්මයා පළාතේ මන්ත්‍රීවරයා වන මට වත් නොදන්වා ඒකාධිපතියකු වගේ ශ්‍රමදාන ව්‍යාපාර පටන් ගන්නව. ඒවාට මහ ජනයාගේ සහයෝගය ලබා දෙන්ට මට වත් දැනුම් දෙන්නෙ නැහැ. ඔහු ඒකාධිපතියකු ලෙස දුප්පත් ගැමි ජනතාව තලා පෙලා වැඩ කරවනව. ඒ ආදායම් පාලක නිලධාරියාගේ විධිය පාර්ලිමේන්තු ලේකම්වරයකු වන මහියංගනයේ ගරු මන්ත්‍රීතුමාත් දන්නව. ඒ නිසා ඒ ගැනත් සොයා බලන මෙන් ඇමතිතුමාගෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க)
(The Hon. Dr. W. Dahanayake)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ස්වදේශ කටයුතු ඇමති අංශය ගැන ගරු මන්ත්‍රීවරුන් 27 දෙනෙකු කථා කර තිබෙනව. ඒ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම කථා කළ දේවල් මා ලකුණු කරගෙන තිබෙනව. ඒ වගේම එයින් වැදගත් ඒවා හැටියට මාතෘකා 15 ක් මා සටහන් කරගෙන තිබෙනව, පිළිතුරු දීමට. මා කල්පනා කරන්නෙ කොහොමද විනාඩි 45 ක් තුළ මෙවැනි රාජකාරියක් මා ඉෂ්ට කරන්නෙ කියායි. මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මා පුළුවන් තරම් පැහැදිලි ලෙස උත්තර සපයන්ට උත්සාහ කරන්නම්.

මා කල්පනා කරනවා මේ සාකච්ඡාව ඉතා වටිනා සාකච්ඡාවක් කියා. ගරු පක්ෂ නායකයින් මේ ඇමති අංශය ගැන සාකච්ඡා කරන්ට පැය 4 වෙනුවට පැය 10 ක් වත් දුන්න නම් මා සන්තෝෂ වෙනව. මා කල්පනා කරනව, දුන්න කාලය මදි කියා. මේ කාරක සභා අවස්ථාවේදී අපට දොස් පවරණව් නම්, අපව විවේචනය කරනව නම්, අපේ වැරදි පෙන්වා දෙනව නම්, ඒවා ඉතා සන්තෝෂයෙන් පිළිගෙන ඒවා හරි ගස්සන්ට උත්සාහ ගන්නව. මේ කාරකසභා සාකච්ඡාව අපේ වැඩවලට කැඩපතක් හැටියට අපි සලකනව, ඉදිරියට තිබෙන මාස 12 දී, පසුගිය කාලයට වඩා හොඳින් [illegible] මා විශේෂයෙන්ම ගරු මන්ත්‍රීවරුන් 27 දෙනාටම ස්තුතවන්ත වෙනව. කිසිම මන්ත්‍රීවරයෙකුගේ කථාවක වරදක් තිබුණෙ නැත කියා මට කියන්ට පුළුවන්. ඒ මන්ත්‍රීවරුන් සියලු දෙනාම ඉතා පිරිසිදු අදහසින් ඒ කරුණු ප්‍රකාශ කළා යයි මා විශ්වාස කරනව. සමහර විට සමහර දෙවල් ගැන එකඟ වන්නට බැරි වුණත් මා ඒ මන්ත්‍රීවරුන් 27 දෙනාට ස්තුතිවන්ත වෙනවා. මගේ අමාත්‍යාංශය යටතෙ සිටින නිලධාරීන් 7 දෙනකුද ඒ ගරු මන්ත්‍රීවරුන්ගේ කථා ඇසුවා. අප සියලු දෙනාම එකතු වී ජනතාවගේ වැඩ කට යුතු වැඩි වැඩියෙන් කර දීමට ඒ කථා නිසා ධෛර්ය ලැබුණු බව මතක් කරන්නට කැමතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මා පිළිතුරු දෙන විට ඒ ඒ ප්‍රශ්න අසන ලද ගරු මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් නොකිරීම ගැන මට සමාවන්නට ඕනෑ. මාතෘකා අනුව පිළිතුරු දෙනවා නම් පහසුය කියා මා හිතනවා. ග්‍රාම සේවකයන් ගැන බොහෝ ගරු මන්ත්‍රීවරුන් විසින් සඳහන් කරන්නට යෙදුණා. දැනට මේ රටේ ග්‍රාම සේවකයන් 3,600 ක් සිටිනවා. ඔවුන් නියම විධියට වැඩ කරනවා නම් ආණ්ඩුවේ රාජකාරි ඉතාමත් හොඳට කරගෙන යන්නට පුළුවන් වේනවා. ග්‍රාම සේවකයන්ගේ අඩු පාඩු තිබෙන බව මා පිළිගන්නවා. නොයෙකුත් ගරු මන්ත්‍රීවරුන් ඒ අඩු පාඩු පෙන්වා දුන්නා. ග්‍රාම සේවකයන්ගේ පඩිනඩිවල හා අතිරේක දීමනාවල අඩුපාඩු තිබෙන බව එක් ගරු මන්ත්‍රීවරයෙක් පෙන්වා දුන්නා. ග්‍රාම සේවකයන්ට දුෂ්කරතා රාශියකට මූහුණ පාන්නට තිබෙන බව අප පිළිගන්නවා. ග්‍රාම සේවකයන්ගේ නියෝජිතයන් කැඳවා පසුගිය මැයි මාසයේදී සාකච්ඡාවක් පැවැත්තුවා. ඔවුන්ගේ දුක්ගැනවිලි අනුව අඩුපාඩු සියල්ලම හරි ගැස්සීමට දැන් පියවර ගෙන තිබෙනවා. ග්‍රාම සේවකයන්ට හොඳින් වැඩ කරගෙන යෑමට නම් ඔවුන් සඳහා ආණ්ඩුවේ කාර්යාල සහ නිවාස තිබිය යුතුයයි මා පිළිගන්නවා. නිවාසයක් නැත්නම් ග්‍රාම සේවකයන් කොතැනකද පදිංචි වන්නෙ? සමහර විට ගමක සිටින ලොකුම ඉඩම් අයිතිකාරයාගේ නැත්නම් ඉඩම් හිමියාගේ ගෙදරක විය හැකියි. මේ නිසා ඔහු ඒ ඉඩම් හිමියාගේ නැත්නම් ගෙවල් අයිතිකාරයාගේ බලපෑමට යට වෙනවා. එම නිසා මූලික ප්‍රශ්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යක් හැටියට ග්‍රාම සේවකයන්ට නිවාස සහ කාර්යාල දිය යුතුය කියා මා කල්පනා කරනවා. එසේ දීම ප්‍රමාද වෙනවා නම් ඒ වෙනුවෙන් ග්‍රාම සේවකයන්ට විශේෂ ආධාරයක් දිය යුතු බවට මා රෙකමදාරු කර තිබෙනවා. ග්‍රාම සේවකයන්ගේ නියෝජිත පිරිස සමග කරන ලද සාකච්ඡා වේදී බැස ගන්නා ලද තීරණයන් පිළිබඳව සම්පූර්ණයෙන්ම විස්තර කිරීමට කාලයක් නැහැ. ග්‍රාම සේවකයන්ගේ සියලුම දුක් ගැනවිලි ඉතාමත්ම හොඳින් විසඳීමටයි, අප අදහස් කරන්නෙ. ඊළඟට මේ ප්‍රශ්නය අනුව පසුගිය කාලයේ සිටි ගම්මුලාදෑනීන් සම්බන්ධව තවත් ප්‍රශ්න මතු වුණා. ඒ ගම්මුලාදෑනීන්ගේ නියෝජිතයන් සමග කරන ලද සාකච්ඡාවේදී මට පෙනී ගිය කාරණයක් නම් ඔවුන් අතුරෙන් එක්තරා පිරිසකට කිසිම විශ්‍රාම වැටුපක් නොලැබුණු බවයි. අවුරුදු 10 න් පහළ සේවයක් ඇති පැරණි ගම්මුලාදෑනීන්ට කිසිම පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම වැටුපක් ලැබී නැහැ. එවැනි අයට පාරිතෝෂික මුදලක් හෝ විශ්‍රාම වැටුපක් හෝ දිය යුතුය කියා යෝජනා කර තිබෙනවා. පසුගිය කාලයේ සිටි ගම්මුලාදෑනීන්ට ඊට වඩා වාසියක් කරන්නට පුළුවන්කමක් නැහැ.

අ. භා. 4.30

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

Order please! Mr. Speaker will now take the Chair.

අනතුරුව ශ්‍රීමත් රසික් ෆරීඩ් මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.

ஸ்ரீமான் ராசிக் பரீத் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, சபாநாயகர் அவர்கள் தலைமை தாங்கினார்கள்.

[*Whereupon* SIR RAZIK FAREED *left the Chair, and* MR. SPEAKER *took the Chair.*]

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

ගරු සභාපතිතුමනි, ස්ථිර සේවාවක් හැටියට ග්‍රාම සේවක සේවාවේ තිබෙන සියලුම අඩුපාඩුකම් හරි ගැස්සිය යුතු බව අප පිළිගන්නවා. විශ්‍රාම වැටුප් නොලැබෙන පසුගිය කාලයේ සිටි ගම්මුලාදෑනීන්ට ඒවා ලබා දීමත් අපේ අදහසයි. යම්කිසි අයුක්තියක් සිදු වී තිබෙනවා නම් ඒ පිළිබඳව නිදසුන් ගෙනහැර දක්වමින් කරුණු ඉදිරිපත් කරතොත් ඒ ගැන සෝදිසි කර බලා සුදුසු විධියට ක්‍රියා කරනු විනා වෙන විධියේ වෙනසක් කරන්නට බැරි බව දන්වන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, ග්‍රාම සේවක ඇබෑර්තු වහාම පුරවන්නය කියා ඉල්ලීමක් ගරු මන්ත්‍රීවරු කළා. මෙය මාර්තු මාසයේ මා ඇමති ධුරයේ වැඩ බාරගත් හැටියේම මගෙත් හිතේ බලපෑ කරුණක්.

තාවකාලික මුලාදෑනීන් පත් කර සිටීම නරකයි කියන එක මාත් හිතුවා. ඒ නිසා මා වැඩ බාරගත් දින සිටම ග්‍රාම සේවක විභාගයේ ප්‍රතිඵල සපයන්නය කියා මා වරින් වර විභාග දෙපාර්තමේන්තුවට බල කළා. ගිය සතියේ ඒ ප්‍රතිඵල ලබාගෙන තියෙනව. එහෙත්, අපි ඒ ප්‍රතිඵල ගෙන්වා ගත්තේ නැහැ. මේ සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වන්නය කියා දැනට මාසයකට පමණ පෙර මා දිසාපතිවරුන්ට අණ කළා. එය පවත්වන්නට විධිවිධාන දැන් සලස්වා ගෙන යනවා. ඒ සම්මුඛ පරීක්ෂණ යෙන් ලබන ලකුණුත් අර විභාග දෙපාතීමේන්තුවෙන් එවන ලකුණුවලට එකතු කරනවා. විභාග දෙපාතීමේන්තුවෙන් එවන ලකුණු මුලින් දක්වන්නේ නැහැ. සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලැබුණු විට ඒවාත් එකතු කර, ඒ ලකුණු සියල්ලම ප්‍රසිද්ධ පුවත්පත් මාර්ගයෙන් ප්‍රසිඛ කරන බව මා තමුන්නාන්සේට දන්වන්නට කැමතියි. යම් කෙනෙකුට අයුතු විධියට වාසියක් කළාය කියා මේ රජයට හෝ ඇමති අංශවලට චෝදනාවක් කරන්ට ඕනෑ නැහැ. ඒ නිසා පුරප්පාඩු පුරවන්නට අපි බලාපොරොත්තු වෙන්නේ ඒ විධියටයි. දැනට තිබෙන සියළුම පුරප්පාඩු ඒ විධියට පිරවීමට නොමැතිවීම ගැන කන ගාටුයි. දෙසැම්බර් මාසයේ පුරප්පාඩු සඳහා දැන්වීම් ප්‍රසිද්ධ කළ අවස්ථාවේදී ඒ කාලයේ පුරප්පාඩු තිබුණු ඩී. ආර්. ඕ. කොට්ඨාශ සඳහා පමණයි, ඉල්ලුම් පත්‍ර කැඳෙව්වේ. සමහර ඩී. ආර්. ඕ. ප්‍රදේශ සඳහා ඉල්ලුම් පත්‍ර කැඳෙව්වේ නැහැ. ඒ නිසා සමහර ඩී. ආර්. ඕ. කොට්ඨාශවල පුරප්පාඩු පිරවීමට මේ අවස්ථාවේදී බැරි වේවි. ළඟදී තවත් ග්‍රාම සේවක විභාගයක් පවත්වා අනික් පුරප්පාඩු පිරවීමට මා බලාපොරොත්තු වෙනව. ඒ අවස්ථාවේදීත් ලකුණු ක්‍රමය අනුව මිස වෙනත් ක්‍රමයකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය දහනායක]

ඒ පත්වීම් කරන්නේ නැති බවට මා තමුන්නාන්සේලාට පොරොන්දුවක් දෙන්න කැමතියි. ඒ ලකුණුත් තමුන්නාන්සේලාගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කරනවා.

යම්කිසි ග්‍රාම සේවකයකුට විරුද්ධව චෝදනාවක් තිබෙනවා නම්, ඒ ගැන අමාත්‍යාංශයෙන් බලපෑමක් කරන්නේ නැහැ. දිසාපතිවරුන්ට ඒවා ඉදිරිපත් කළ අවස්ථාවලදී නිසි අන්දමින්, පොදු සේවා කොමිෂන් සභාවේ ව්‍යවස්ථාවලට අනුව, කටයුතු කරනවා ඇති. එක්තරා ග්‍රාම සේවකයෙක් ගැන දෙම්පෙ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) සඳහන් කළා, ඡන්ද ගණන් කරන අවස්ථාවේදී ඡන්ද ඒජන්ත කෙනෙකු හැටියට කටයුතු කළාය කියා. මට ඒ ගැන අහන්නට ලැබුණේ අද මේ සාකච්ඡාවේදී පමණයි. මෙයට පෙර දෙම්පෙ ගරු මන්ත්‍රීතුමා විසින් ලිපියකින් හෝ වෙනත් විධියකින්—වචනයකින්වත්—ඒ ගැන මට දැන්නුවේ නැහැ. මා එසේ කියන්නේ ඒ ගරු මන්ත්‍රීතුමාට චෝදනාවක් වශයෙන් නොවෙයි. ඒ ග්‍රාම සේවකයාගේ සේවය තහනම් කර තිබුණු බව මා දැන ගත්තේ දැන් ඒ මන්ත්‍රීතුමා කීවාට පසුවයි. ඒ පිළිබඳව යම් තීන්දුවක් දුන්නා නම් එය කර තිබෙන්නේ. පොදු සේවා කොමිෂන් සභාවේ නියෝගයක් අනුවයි. ඊළඟට, විභාගයක් පැවැත්වූවා යයි කීවා. එයත් ඒ කොමිසමේ ව්‍යවස්ථාවලට අනුවයි. ඊට පසුව නිවැරදිකාරයා හෝ වැරදිකාරයා හෝ චෝදනාවලින් කොටසකට වැරදිකාරයා හෝ නිවැරදිකාරයා හෝ කියා ඔප්පු වුණා නම් හෝ නැවත ඔහුට රක්ෂාව ලැබුණා නම් හෝ එසේ සිදු වී ඇත්තේ ඇමතිවරයාගේ බලයක් අනුව නොව පොදු සේවා කොමිසන් සභාවේ ව්‍යවස්ථාවලට අනුව බව ගරු දෙම්පේ මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි. එහි අයුක්තියක් සිදු වී තිබෙනවා යයි දෙම්පෙ මන්ත්‍රීතුමාට හැඟෙනවා නම්, ඒ මන්ත්‍රීවරයා මට ඒ ගැන විස්තර දෙනොත්, තවදුරටත් පරීක්ෂා කරන්න මා කැමතියි.

සභාපතිතුමනි, අපි කාටවත් වැරද්දක් කිරීමට කැමති නැහැ. අපේ හතුරකුට වුවත් වැරද්දක් කිරීමට සතුටු නැහැ. බලපිටියේ ගරු මන්ත්‍රීතුමා (එල්. සී. ද සිල්වා මයා.) මඩකුඹුරේ ග්‍රාම සේවකයා 12 වාරයක් මාරු කළායයි කිව්වා. මේ ගරු මන්ත්‍රීවරුන් කියන දේ පත්‍රවල ලොකු අකුරින් වැටෙනවා. විශේෂයෙන්ම "ඇත්ත" පත්‍රයේ විශාල අකුරුවලින් වැටෙනවා. ඒ නිසයි, මම ඒවාට පිළිතුරු දීම සඳහා වෙලාව ඉල්ලා සිටියේ; අපි දෙන පිළිතුරුත් පත්‍රවල දැමීම සඳහායි. මේ පිළිබඳව සොයා බැලූ මට දැනගන්න ලැබී තිබෙනවා, ඔහු 12 සැරයක් මාරු කර නැති බව. තුන් සැරයක් පමණයි, මාරු කර තිබෙන්නේ. ඉන් දෙසැරයක් මාරු කර තිබෙන්නේ කඩදාසිවල පමණයි. තුන්වන සැරයේ තමයි, ඔහු නියම විධියට මාරු කර තිබෙන්නේ. ඒ ග්‍රාම සේවකයාට විරුද්ධව චෝදනාවක් තිබුණා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීධුරාපෙක්ෂකයාට වැඩ කළාය කියා. ඒ පිළිබඳව පැවැත්වූ විභාගයෙන් ඔහු නිවැරදිකාරයකු වුණා. නමුත් දිසාපතිතුමා ස්ථිර ලේකම්තුමාට නිර්දේශ කර තිබෙනවා, ඒ ග්‍රාම සේවකයා ඒ ගමෙන් පිට පළාතකට මාරු කිරීම සුදුසුය කියා. ඒ නිසා මාරු කිරීමට යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ තැනැත්තා පළමුවෙන්ම යැවීමට නියම වූ ගමේ මිනිසුන්ට මේ බව ආරංචි වී ඔවුන් ටෙලිග්‍රෑම් මගින් හා වෙනත් මාර්ගවලින් ඊට විරුද්ධව කරුණු ඉදිරිපත් කළා. ඒ නිසා ඒ මාරුව අවලංගු කරන්න සිද්ධ වුණා. ඊට පසු ඒ ග්‍රාම සේවකයා නවත් තැනකට මාරු කිරීමට නියම කළා. ඒ පළාතේ ගම්වැසියනුත් ඊට විරුද්ධත්වය පළ කළ නිසා එයද අවලංගු කරන්න සිද්ධ වුණා. මේ මාරු දෙකම ඒ ග්‍රාම සේවකයාට දැන්වූයේ නැහැ. තුන්වන වතාවේදී ඔහු වෙනත් ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයකට මාරු කිරීමට නියම කළා. ඒ වාරයේ තමයි, ඔහු නියම විදියට මාරු කළේ.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டீ. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillakeratne)

මගේ කොට්ඨාශයටයි, මාරු කර තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

මම රත්ගම ගරු මන්ත්‍රීතුමාට ස්තුති වන්ත වෙනවා, ඒ ගැන විරුද්ධ නොවීම ගැන. අපි දන්නේ නැහැ, එවැනි ග්‍රාම සේවකයෙක් කොහි යවන්නටද කියා. කෙසේ වුවත් ඒ මාරුවෙන් ඒ ග්‍රාම සේවකයාට වරදක් නොවෙයි, කළේ. ඒ ග්‍රාම සේවකයාගේ ශුභසිද්ධිය නකා ඔහුට විරුද්ධව චෝදනා නැඟූ ගම් වැසියන් අතර වැඩ කරන්නට නොදී ඔහු මාරු කළා.

මම පිළිගන්නවා, ග්‍රාම සේවකයින් ඉතාම වැදගත් සේවයක් කරන නිලධාරි කොටසක් හැටියට. ඒ නිසා ග්‍රාම සේවක යින්ට විරුද්ධව පැමිණිලි තිබෙනවා නම් වහාම ඒවා පළාතේ දිසාපතිවරුන්ට ඉදිරි පත් කරන මෙන් මම ගරු මන්ත්‍රීවරුන් ගෙන් ඉල්ලා සිටිනවා. මම මේ ගරු සභා වේදීම දිසාපතිවරුන්ගෙන් හා ප්‍රාදේශීය නිලධාරීන්ගෙන් ඉල්ලන්න කැමතියි, ග්‍රාම සේවකයින්ට විරුද්ධව කරන සියලුම පැමිණිලි කල් නොදමා ඉක්මනින්ම විභාග කර අවසන් කරන්නය කියා. පමා වී කරන විභාග, බොහෝ අවස්ථාවලදී, තුච්ඡවක වැදගම්මක් නැති විභාග වෙනවා. එසේ වූ විට නැවතත් ගරු මන්ත්‍රීවරු පැමිණිලි කරන්න පටන් ගන්නවා. ඒ නිසා ඉක්ම නින් කරන විභාග ඉතාම හොඳ විභාග හැටියට මම පිළිගන්නවා. තීන්දුව ඉක් මනින් දීම ඉතාම හොඳයි. ඒ නිසා මම සියලු දෙනාගෙන්ම ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා, ග්‍රාම සේවකයින්ට විරුඩව එන චෝදනා ඉක්මනින් විභාග කොට නියම තීන්දුව දීම සඳහා පුළුවන් උදව් දෙන ලෙස. මේ රටේ සිටින ග්‍රාම සේවක යින් හොඳින් වැඩ කරනවා නම් අනික් සියලුම දේ හරිගස්සා ගැනීමට අපහසුවක් වන්නේ නැතැයි මම කල්පනා කරනවා. නමුත් මුල් තැන නරක් වූ විට අනික් සියලු දේම නරක් වෙනවා. ගම්වල සිටින එකම ආණ්ඩුවෙ නිලධාරිය, ග්‍රාම සේවක යයි. ග්‍රාම සේවකය ගමට බලපානව. ග්‍රාම සේවකය නරක නම් සම්පූර්ණයෙන්ම ඒ ගමට ආණ්ඩුවක් නැතෙයි කියන්න පුළු වනි. එම නිසා ග්‍රාම සේවක ප්‍රශ්නය ඉතාම වැදගත් ප්‍රශ්නයක් හැටියට මාත් පිළි ගන්නව. ග්‍රාම සේවක සේවාව ඉතා හොඳ, ඉතා දක්ෂ ලෙස කර ගෙන යන සේවා වක් බවට පත් කරන්න අපට උදව් දෙන්නය කියා මේ ගරු මන්ත්‍රීවරුන් ගෙන් මා ඉල්ලා සිටිනව.

අ. භා. 4.45

සුරා ප්‍රශ්නය පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. සුරා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් 1955 දී එවකට තිබුණු ආණ්ඩුව මගින් කොමිෂන් සභාවක් පත් කළ එක ඇත්තයි. එහි වාර්තාව ප්‍රසිද්ධ වුණා 1957 දී. ඊට අදාල සැසි වාර්තාවේ අංකය 19 යි. 1957 සිට 1965 වන තුරු මේ කොමිෂන් සභා වාර්තාව තිබුණේ කොහේද ? මම මේ ජාතික රජයෙ ස්වදේශ කටයුතු භාර ඇමති වරය වශයෙන් පත්වී කන්තෝරුවට ගිය හැටියෙ හුඹස් කඟවී දමා තිබුණු එම කොමි ෂන් වාර්තාව එළියට අරගෙන ඒ සම් බන්ධයෙන් මට කරන්න පුළුවන් වැද ගත් දෙය කළා. එනම්, ඒ කොමිෂන් සභා වාර්තාව ඉතා පිරිසිදුව කියවා බලා, කොමිටි වලින් ඉදිරිපත් කර තිබුණු අදහස් පරීක්‍ෂා කර බලා කැබිනට් මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කිරීමයි. මා එය ප්‍රමාද කළේ නැහැ. නමුන්නාන්සෙල අවුරුදු 8 ක් එතැනම එල්ලී නිකම් හිටිය වාගෙ ඉන්නෙ නැතුව අපි ඉදිරියට යන්න ඕනැ කියන එකයි, මගෙ අදහස. "එක්කො මේක කරන්න ඕනැ ; නැතිනම් අරක කරන්න ඕනැ" කියල මම කැබිනට් මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කර තිබෙනව. ඒ සංදේශයෙ සම්පූර්ණ විස්තර කියන්න දැන් විධියක් නැහැ. නමුත් ප්‍රතිපත්තියක් වශයෙන් මේ රටේ අමද්‍යප ව්‍යාපාරයක් තියෙන්නෙ ඕනැ කියා මා පිළිගන්නව. "ප්‍රතිපත්තියක් වශයෙන් සුරාව නැති කිරීම පිළිගන්න ඕනැ" කියන එක මා පිළිගන්නව. එය ක්‍රියාවෙ යොදවන ආකාරය, කැබිනට් මණ්ඩලය විසින් තීන්දු කරනු ලබනව ඇති.

මේ අවස්ථාවෙදි මත්පැන් සම්බන්ධ යෙන් මට තව කරුණක් මතක් කරන්න තියෙනව. අද දවසෙ පිටරටින් ගෙන්වන මත්පැන් සහ මෙරට මත්පැන් අතර බේදයක් තියෙනව. එම බේදය නැති කර දැමීමට අපි අදහස් කරනව. මේ මත්පැන් දෙකොටස අතර වෙළඳාමෙ බේදයක් තියෙ නව ; බෙදා හැරීමේ බේදයක් තියෙනව ; නොයෙකුත් විධියේ තවතවත් බේද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය දහනායක]

තියෙනව. ඒ සියළු බේද නැති කර දමා එකම ප්‍රතිපත්තියක් අනුව වැඩ කටයුතු කරන්න අදහස් කරනව.

මගෙ මිත්‍ර යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කිතුල් ගස් සම්බන්ධයෙන් කරුණක් මතක් කළා. මම සන්තෝෂ වෙනව——

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

මීරා, මීරා.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. W. Dahanayake)

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කීව එතුමගෙ අදහසක් මා පිළිගත්තය කියා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගෙ එක අදහසක් නොවෙයි අදහස් රාශියක් මම පිළිගෙන තිබෙනව. ඉදිරියෙදිත් යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගෙ අදහස් පුළුවන් නම් පිළිගන්න මම බොහොම සන්තෝෂයෙන් සිටිනව. තවත් එක මන්ත්‍රීවරයෙක් කිතුල් රා පිළිබඳ ප්‍රශ්නය ඉදිරිපත් කළා. 1956 ට පෙර කිසිම බලපත්‍රයක් නැතිව කිතුල් ගස් මැදීමට අවසර ලැබී තිබුණා. නමුත් 1957 දී නිලධාරීන්ගෙ වුවමනාවට—මම මේව කියන්නෙ, පයිල් කියවා බලායි; මා කියන්නෙ ඇත්තයි—ආණ්ඩුව අළුත් නීතියක් ඉදිරිපත් කළා මේ විධියට: "පැණි ලබා ගැනීමට හෝ වේවා, හකුරු සෑදීමට හෝ වේවා කිතුල් ගසක් මදින්ට වුවමනා නම් 1957 සිට ඩී. ආර්. ඕ. ගෙන් බලපත්‍රයක් ලබා ගන්න ඕනැ". බලපත්‍ර ලබාගත යුතුයි කියන මේ නීතිය 1957 දියි ඇති කළේ. හැබැයි, කිසිම මුදලක් නොගෙවා මේ සඳහා බලපත්‍ර ලබාගන්න ඕනැය කියලයි ඒ නීතිය ඇති කළේ. බලපත්‍ර ලබාගත යුතුය කියන නීතිය අනුව කිතුල් හකුරු සහ කිතුල් පැණි නිපදවීම සම්පූර්ණයෙන්ම මෙරටින් නැති වී ගියාය කියල කියන්න පුළුවනි. මන්ද? ග්‍රාම සේවකයන් ළඟට ගිහින්, ඉන් පසුව ප්‍රාදේශීය නිලධාරීතුමාගෙන් බලපත්‍රයක් ලබාගැනීම ඉතාමත්ම අමාරු කරුණක් වුණා, ගැමියන්ට. එම නිසා ගැමියන්, රාජකාරි කරන නිලධාරියාට බයේ. එහෙම නැත්නම් ආණ්ඩුවට බයේ කිතුල් මල් මැදීම සම්පූර්ණයෙන්ම අත්හැර ඇරීම. පසුගිය ආණ්ඩු කාලයෙදි, නොයෙක් අවස්ථාවලදි ඔය පැත්තෙ ගරු මන්ත්‍රීවරුන් පවා කෑ ගැහැව්ව, ඒ බලපත්‍ර ක්‍රමය නැති කරන්නට ය කියා. නමුත් බිරි අලියට වීණා ගායනා කරන්නා වාගේ ඒ කිසිවක් ඇහුණේ නැහැ. නමුත් මේ ජාතික ආණ්ඩුව තුන් මාසයක් යන්ට පෙර 1957 ට පසුව ඇති කළ ඒ නීතිය ඉවත් කළා. බලපත්‍රයක් නැතුව හකුරු සහ පැණි නිපදවා ගැනීම සඳහා කිතුල් ගස් මැද ගන්න පුළුවන්ය කියා නීතියක් පැනෙව්ව.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

1957 තිබුණු ආණ්ඩුවෙ තමුන්නාන් සෙත් හිටියෙ.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

ඔව්, මමත් හිටිය. මම උත්සාහ ගත්ත ඒ නීතිය වෙනස් කරන්න. [බාධාකිරීමක්] ඔව්, මගේ ළඟ සිටින මේ ඇමතිතුමාත් හිටිය. තිබුණු දෙයක් නැතැයි කියන්න තමුන්නාන්සෙලගෙ "ඇත්ත" පත්‍රය වගෙ මම සූදනම් නැහැ. "ඇත්ත" පත්‍රයට නම් නැත්තත් ඇත්ත කරන්න පුළුවනි. තමුන්නාන්සෙල හිතනවද අපිත් එහෙමය කියල?

ගරු සභාපතිතුමනි, මේ විධියට අවසර දෙන කොට අපි කියා තිබෙනව, රා මැදීමට නොවෙයි මේ අවසරය දෙන්නෙ. මීරාවලින් පැණි හකුරු සෑදීමටය කියල. තර්කය එ තැනයි. යම් විධියකින් ගරු යටියන්තොට මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කියනවා නම් මේ නිසා එතුමාගෙ ගෝලයකු වුණාය කියා, මම ඒ ගැන සන්තෝෂ වෙනව. ඒ ගැන වාද විවාද කරන්න මම යන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි, කිතුල් මලක වටිනාකම රුපියල් දෙසීයකට තක්සේරු කර තිබෙනව; කිතුල් මලක් රුපියල් දෙසීයක් වටිනව. ඒ කිතුල් මලේ වටිනාකම සම්පූර්ණයෙන් අපේ ගැමියන්ට ලබාදීමට දැන් අප වැඩ කටයුතු සලස්වා ගෙන යනව. ග්‍රාම සංවර්ධන සමිති හා මහිලා සමිතිවලින් අප ඉල්ලා තිබෙනව, ගම්වල ඒ කිතුල් මල් මැදීම ගැන පරීක්ෂා කර බලන්නය කියා; වැරදි කරන්න ඉඩ දෙන්න එපාය කියා;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ වගේම නියම විධියට කිතුල් හකුරු සහ පැණි නිපදවන්නට උදව් දෙන්නටය කියා. මේ ග්‍රාම සංවර්ධන සමිති හා මහිලා සමිති ඒ කාරණය ගැන උනන්දුවක් දක්වනවා නම්, ඒ වාගේම නොයෙකුත් වෙළඳ ශාලා වල පිරිසිදු කිතුල් හකුරු හා කිතුල් පැණි නිපදවා විකුණනවා නම්, මම හිතනව තමුන්නාන්සෙලා වුණත් ඒ ගැන සතුටු වේවි. අද වැනි දවසෙ, පිරිසිදු කිතුල් හකුරු මිලදී ගන්න ඇත්තෙ නැහැ. එම නිසා අප සන්තෝෂ වෙනවා ගැමියන්ට විශාල වර මක් දෙන්න අපට ඉඩ ලැබීම ගැන. මම හිතනව, මේ රටේ ලක්ෂයකට වඩා ගැමියන් සිටිනව, කිතුල් මල් මැදලා ජීවිකාව ගෙන යන්න පුළුවන්. ඒ ලක්ෂය එම වෘත්ති යෙහි යොදවා, රටට යහපතක් වන පිළි වෙළට මේ වරම පාවිච්චි කරන්නය කියා මේ අවස්ථාවේදී සියලුම ගරු මන්ත්‍රීවරුන් ගෙන් මම ඉල්ලනව.

තුවක්කු බලපත්‍ර සම්බන්ධයෙන් තවත් වැදගත් ප්‍රශ්නයක් මතු කළා. කියන්න කනගාටුයි, මට බොහොම මන්ත්‍රීවරුන් ගෙන් පැමිණිලි ලැබුණා. විශේෂයෙන්ම වී. අන්නාමලෙයි පත් කරන ලද ගරු මන්ත්‍රීතුමාත්, රක්වානෙ ගරු මන්ත්‍රී තුමාත් (එච්. කුලරත්න මයා.) මේ ගැන පැමිණිලි කළා. පසුගිය ආණ්ඩුවෙ අන්තිම අවුරුද්දෙදි, හදිසි තත්ත්වයක් තිබෙන වාය කියා ගැමියන්ගෙ තුවක්කු හුඟක් රාජසන්තක කෙරුව. ගැමියන්ගෙ තුවක්කු රාජසන්තක කළෝ කවුරුදැයි මා දන්නෙ නැහැ. තුවක්කු රාජසන්තක කිරීම සම් බන්ධයෙන් පරීක්ෂා කර බලන විට හදිසි නීතිය යටතේ එය කර තිබෙන බවයි මට පෙනී ගියෙ. හදිසි තත්ත්වයක් රටේ තිබෙනවාය කියා තුවක්කු රාජසන්තක කළ නමුත් දැන් එවැනි තත්ත්වයක් ලංකාවේ නැති නිසා තව දුරටත් එසේ කිරීම අනවශ්‍ය බව අපේ ආණ්ඩුව පිළි ගන්නවය කියා, තුවක්කු සඳහා බල පත්‍ර නිකුත් කිරීමේදී පසුගිය ආණ්ඩුව තිබුණු කාලයේ ක්‍රියා කළ තරම් තදින් ක්‍රියා නො කර ටිකක් ලිහිල් කරන ලෙස දිසාපති වරුන්ට අණ දෙන හැටියට මා සන්දේශ යක් පිළියෙළ කළා.

දෙවැනි කාරණය, රාජසන්තක කරන ලද තුවක්කු ගැන තවත් පරීක්ෂණයක් පවත්වා පුළුවන් නම්, යුක්තිසහගත නම්, ඒවා ගැමියන්ට දෙන ලෙසත් මා නියම කළා.

පී. බී. විජයසුන්දර මයා. (කිරිඇල්ල)
(திரு. பீ. பி. விஜேசுந்தர—கிரியல்ல)
(Mr. P. B. Wijesundara—Kiriella)

කිසිම කරුණක් නැතිව රාජසන්තක කරන ලද තුවක්කු ආපසු දීමට කැමතිද?

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

ගරු මන්ත්‍රීතුමා සමග මාත් එකඟ වෙනව. එහෙත් ඒ සම්බන්ධයෙනුත් නීති යක් තිබෙනව. නීතියට අනුව මාත් ක්‍රියා කරන්න ඕනෑ. රාජසන්තක කරනු ලැබී මෙන් පසු කාලයක් ගත වී තිබෙනවා නම් ටිකක් අමාරුයි, ආපසු දෙන්න. ඒ නිසා මා කැබිනට් සන්දේශයක් ලැස්ති කරනව ආහාර වගා කිරීමේ යෙදී සිටින ගැමියන්ට අයිති තුවක්කු ආපසු දීමට එයින් බලා පොරොත්තු වෙනව. අපේ ආණ්ඩුව පිළි ගන්නෙ නැහැ, රතිඤ්ඤා පත්තු කිරීමෙන් අලින් එලවන්න පුළුවන්ය කියා.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

එහෙම නම් කොහොමද එලවන්නෙ?

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

ගැමියන්ට තුවක්කු වුවමනා කරනව.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

අපට අලියා එලවා ගන්න බැරි වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence and External Affairs)

රතිඤ්ඤ පත්තු කරල පුළුවන්කමක් නැහැ, අලි එලවන්න.

ගරු 'ආචාර්ය දහනායක

*(கௌரவ கலாநிதி தகநாயக்க)*

(The Hon. Dr. Dahanayake)

මැතිවරණ රැස්වීම්වලදිත් ඔය කාරණය මතු වුණා. රැස්වීම්වලදි මිනිස්සු අපෙන් ඇහුවා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගෙ ආණ්ඩුව කියන හැටියට තමුන්නාන්සෙලත් අපට වල් සතුන් එලවන්න කියනවද රතිඤ්ඤ පත්තු කරල? අපි එදා කිව්වෙ මොකක්ද? අපි ඒක පිළිගන්නෙ නැහැ, කිව්වා. අපේ අද හස සුදුසු ඉල්ලුම් කරුවන්ට සියලු දෙනාටම—ගැමියන්ට—ආහාර වගා කිරීමේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා තුවක්කු ලබා දීමටයි.

අනිල් මූණසිංහ මයා. (අගලවත්ත)

*(திரு. அனில் முனசிங்க—அகலவத்தை)*

(Mr. Anil Moonesinghe—Agalawatta)

ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ගරු පාර්ලිමේන්තු ලේකම්වරිය මොනවද ඒ ගැන කියන්නෙ?

ස්ටැන්ලි තිලකරත්න මයා. (කෝට්ටේ)

*(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)*

(Mr. Stanley Tillekeratne—Kotte)

ඒ ප්‍රශ්නයට උත්තරයක් බලාපොරොත්තු වෙනව.

ගරු 'ආචාර්ය දහනායක

*(கௌரவ கலாநிதி தகநாயக்க)*

(The Hon. Dr. Dahanayake)

කොහු කර්මාන්තය ගැනත් ප්‍රශ්නයක් මතු කර තිබෙනව. කොහු කර්මාන්තය මීගමුවෙ සිට මාතර දෙවුන්දර දක්වා ප්‍රදේශයේ පැතිර පවතිනවා. අද කොහු කර්මාන්තය ඉතාමත් දුර්වල තත්ත්වයකට වැටී තිබෙනව. එය නගා සිටුවීම පිණිස සාකච්ඡා සභාවක් පවත්වා නිසි විධිවිධාන යෙදීමට ක්‍රියා කරගෙන යනව. එම සාකච්ඡා සභාවේ තීරණ සියල්ලම මා ළඟ තිබෙන නමුත් ඒ සියල්ලක්ම කියවන්න දැන් වෙලාවක් නැහැ. කොහු කර්මාන්තය නගා සිටුවීමට තිබෙන ලොකුම අමාරුකම නම් කොහු කර්මාන්තයෙන් නිපදවන භාණ්ඩ පිටරට යවන්නට විධියක් නැතිකමයි.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.

*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*

(Mr. F. R. Dias Bandaranaike)

ඇයි ?

ගරු ආචාර්ය දහනායක

*(கௌரவ கலாநிதி தகநாயக்க)*

(The Hon. Dr. Dahanayake)

මන්ද, අපට තිබුණු පිට රට වෙළඳ පොළ සම්පූර්ණයෙන්ම පාහේ දැන් වැරැවන් කෝරය අල්ලාගෙන තිබෙනව. අපේ නිෂ්පාදන සඳහා ගෙවන්න වන මුදලට ඒ භාණ්ඩ විකුණන්න අපට විධියක් නැහැ. ඒ නිසා දැන් අපට සිද්ධ වී තිබෙන්නෙ "හෝම් මාර්කට්" හෙවත් අපේ රටේම වෙළඳ සැල් ඇති කර ගැනීමටයි. ඒ සඳහා අවශ්‍ය සියලුම විධිවිධාන යෙදීමට ඒ ඒ අංශවලට නිලධාරීන් පත් කිරීමෙන් වැඩ පිළිවෙළ සලස්සන බව දන්වන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, රෙජිස්ට්‍රාර්වරුන් ගැනත් ප්‍රශ්න මතු කළා. රෙජිස්ට්‍රාර්වරුන් ඉතාමත් වැදගත් සේවයක් කරන උදවිය කියා අප පිළිගන්නවා. අවුරුදු දහයක් තිස්සේ රෙජිස්ට්‍රාර්වරුන් නොයෙකුත් ඉල්ලීම් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් කණගාටුව මීට පෙර තිබුණු ආණ්ඩු රෙජිස්ට්‍රාර්වරුන්ගේ යක්තිසහගත ඉල්ලීම්වත් නොදීමයි. නමුත් මා දැන් කැබිනට් මණ්ඩලයට නිර්දේශ කර තිබෙනවා, රෙජිස්ට්‍රාර්වරුන්ගේ ඒ ඉල්ලීම් රාශියකටම ඉඩ දෙන්නය කියා. එයින් එක වැදගත් ඉල්ලීමක්, පසුගිය ආණ්ඩුව ප්‍රතික්ෂේප කළ ඉල්ලීමක් නමයි, රෙජිස්ට්‍රාර්වරුන්ට සාමදාන විනිශ්චයකාර පදවි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැත්නම් 'ජේ. පී.' තනතුරු පිරිනමන ලෙස කර තිබෙන ඉල්ලීම. පසුගිය ආණ්ඩුව මේ ඉල්ලීමට ඉඩ දෙන්න බැරිය කියා තිබෙනවා. නමුත් මා දැන් කැබිනට් මණ්ඩලයට නිර්දේශ කර තිබෙනවා, සියළුම රෙජිස්ට්‍රාර්වරුන් සමාදාන විනිශ්චයකාරවරුන් හැටියට පත් කරන්නය කියා.

අ. භා. 5

ඊළඟට රෙජිස්ට්‍රාර්වරුන්ගේ සීමා ප්‍රදේශ, ග්‍රාම සේවකයින්ගේ ප්‍රදේශ හා ආදායම් පාලක නිලධාරි ප්‍රදේශ සමහර ඒවා වුවමනාවට වඩා විශාලය, වැඩ කර ගෙන යාමට ඒ නිසා දුෂ්කරතා ඇති වෙනවාය, ආදී වශයෙන් ගරු මන්ත්‍රීවරුන් ප්‍රශ්න මතු කළා. ග්‍රාම සේවක ප්‍රදේශ, ආදායම් පාලක නිලධාරී ප්‍රදේශ, රෙජිස්ට්‍රාර්වරුන්ගේ ප්‍රදේශ, යන මේ සියළුම ප්‍රදේශ සංශෝධනය කිරීමට කටයුතු කරන මෙන් මා දිසාපතිවරුන්ට නියෝග කර තිබෙනවා. මේ සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් උදහස් ඒ ඒ දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවලට ඉදිරිපත් කර ඒ කාරක සභාවේ නිර්දේශයන් සමග මගේ අමාත්‍යාංශයට ලැබෙන ලෙස කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා. ඇත්ත වශයෙන්ම සමහර ග්‍රාම සේවක කොට්ඨාශ වුවමනාවට වඩා විශාල බවත් සමහර රෙජිස්ට්‍රාර්වරුන්ගේ ප්‍රදේශ දැනට වෙන් කර තිබෙන අන්දම නිසා ප්‍රදේශ වාසීන්ට මහත් කරදරවලට මුහුණ පාන්ට සිදුවන බවත් මා පිළිගන්නවා. ඒ වාගේම මේවා සංශෝධනය කිරීමෙන් තවත් අළුතෙන් ග්‍රාම සේවකවරුන්, ආදායම් පාලක නිලධාරීවරුන් පත් කරන්නට ඉඩ තිබෙන බවත් මා පිළිගන්නවා. ඒ නිසා මේ කාරණය සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ සියළුම අදහස්, අසවල් ග්‍රාම සේවක කොට්ඨාශය මෙන්න මේ විධියට දෙකට කඩන්න වුවමනාය, අසවල් ග්‍රාම සේවක කොට්ඨාශ දෙක මෙන්න මේ විධියට ඒකාබද්ධ කරන්නට වුවමනාය, ආදී වශයෙන් තමුන්නාන්සේලාගේ අදහස් සියල්ලම හැකි තරම් ඉක්මණින්ම දිසාපතිවරුන්ට දන්වා යවනවා නම් මේ ප්‍රශ්නය ළඟදීම විසඳන්නට පුළුවන් වෙනවා.

ඊළඟට උඩරට ගැමි සංවර්ධන ක්‍රමය සම්බන්ධවත් ප්‍රශ්න රාශියක් මතු කරන්නට යෙදුණා. පසුගිය කාලය තුළදී උඩරට ගැමියන්ට ලැබුණු සහන ප්‍රමාණවත් නැත කියා අපේ රජය පිළිගන්නවා. ඒ වාගේම උඩරට ගැමි සංවර්ධනය සම්බන්ධයෙන් ඉදිරියට මීට වඩා පළල් අන්දමින් කටයුතු කරන්නට වුවමනාය කියාත් අපේ රජය පිළිගන්නවා. එම නිසා මේ අයවැය ලේඛනයෙන් උඩරට ගැමි සංවර්ධනය සඳහා වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය අඩු වුවත් දැනට වෙන් කර තිබෙන මුදල් හැකි තරම් ඉක්මනින් අවසන් කර, වැඩ ආරම්භ කර, ඒ මුදල් අවසන්වූ විගසම අතිරේක වැය ශීර්ෂයක් ඉදිරිපත් කර තවත් වුවමනා කරන මුදල් ප්‍රමාණය ලබා ගැනීමට කටයුතු කරනවාය කියා මා ගරු මන්ත්‍රීවරුන්ට පොරොන්දු වෙනවා. අපේ රජය උඩරට ගැමි සංවර්ධනයට මුදල් වැය කරන්න ලෝභ වෙන්නෙවත් මැලි වෙන්නෙවත් නැති බවත් වුවමනා මුදල් ප්‍රමාණය වෙන් කරන බවත් මා උඩරට ගරු මන්ත්‍රීවරුන්ට කියන්නට සතුටුයි. උඩරට ගැමි සංවර්ධන ක්‍රමයේ වැඩ කටයුතු තවත් දියුණු කිරීම සඳහා එම කාර්යාලය කොළඹ නොතබා මහනුවරට ගෙනයාමටද මම තීරණය කර තිබෙනවා. එම කාර්යාලය මහනුවරට ගෙනගොස් බලවත් ඕනෑකමකින් යුක්තව, ඉතාමත් ඉක්මණින් උඩරට ගැමි සංවර්ධන කටයුතු කරන්නට ද අද විධිවිධාන සලස්වා තිබෙනවා. අවුරුදු දෙතුන් සියයක් තිස්සේ දුක් විඳපු උඩරට ගැමි ජනතාවට ඉක්මණින්ම සහනයක් සලසා දීම අවශ්‍යව තිබෙනවා. ඒ සඳහා, පසුගිය කාලයේ කළාක් මෙන් බොහොම හෙමින් යන බරකරත්ත ගමනක් නොවෙයි අපට වුවමනා කරන්නෙ.

ගරු සභාපතිතුමනි, උඩ රට ගැමි කොමිෂන් සභාවේ කටයුතු අද, එම වාර්තාවෙහි සඳහන් යෝජනාවට පමණක් සීමා වී තිබෙන බවට ගරු මන්ත්‍රීවරයකු විසින් කරනලද චෝදනාව මම පිළිගන්නවා. එම චෝදනාව ඉදිරිපත් කළේ බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා වෙන්න ඇති. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත් දහ දොළොස් දෙනෙක්ම පැමිණ මට මේ කාරණය පෙන්වා දුන්නා. "දැනට උඩ රට ගැමි කොමිෂන් සභා වාර්තාවෙහි තිබෙන යෝජනා පමණයි ක්‍රියාත්මක වන්නෙ, අනෙක් අඩු පාඩුකම් තමුන්නාන්සේලාගේ ඇස්වලට නොපෙනෙන්නේ මන්ද"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය දහනායක]
කියා ඒ ගරු මන්ත්‍රී වරුන් අපට චෝදනා කළා. ඒ චෝදනා පිළිගත් මම කැබිනට් මණ්ඩලයට ගොස් සංශෝධනයක් ලබා ගෙන තිබෙනවා. ඒ සංශෝධනය අනුව, උඩ රට ගැමි ජනතාව වෙනුවෙන් කිසියම් යෝජනාවක් ඉදිරිපත් කිරීමට යම් මන්ත්‍රී වරයකුට තිබෙනවා නම්, කාරක සභාවේ අනුමැතිය ඇතිව එය ඉදිරිපත් කළ විට, උඩ රට ගැමි කොමිෂන් සභා වාර්තාවේ එය සඳහන් නුනත්, අප එය පිළිගන්නවා. ඒ විධියට අලුත් වැඩ පිළිවෙලක් දැන් යොදා තිබෙනවා. ගරු සභාපතිතුමනි, අවුරුදු දහ යක් තිස්සේ තිබුණු වරදක් එයින් හරි ගස්සා තිබෙන බව නමුන්නාන්සේට පෙනී යනවා ඇති. බදුල්ලේ ගරු මන්ත්‍රී තුමා බොහොම තදින් විවේචනය කළ මේ කරුණ දැන් හරිගස්සා තිබෙන බව මම ඉතාමත් සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා.

ගැමි කොමිෂන් සභාවේ වැඩ කටයුතු ඕනෑතරමක් දෙන්න කියා මම ඉල්ලා සිටිනවා. මා දන් නියම කර තිබෙන වැඩ පිළිවෙල අනුව ඌව ප්‍රදේශයේත් මැද ප්‍රදේශයේත් සියලුම මැතිවරණ කොට්ඨාශ වලට සමව වැඩ කිරීමට කටයුතු යොදා තියෙනව. උඩරට ගැමි සංවර්ධන ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවලට ලොකු හැන්දකින් බෙදූ අතර විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ඡන්ද දායක කොට්ඨාශ වලට කිසිම දෙයක් කළේ නැතැයි කියන චෝදනාවක් පසුගිය දවස් වල මට එල්ල කර තිබුණා. මා දන් පිළියෙල කර තිබෙන්නේ සියලුම මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවලට කිසිම වෙනසක් නොකර එකම හොඳ හැන්දකින් බෙදීමේ වැඩ පිළි වෙලක්.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
පොල්කටු හැන්දක්ද ?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
මොන හැන්දෙන් වුණත් බෙදනවා නම් පිරිසිදු චේතනාවෙන් බෙදන්න ඕනෑ. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුත් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුත්—අප සියලු දෙනාම—එකතු වී, අවුරුදු දෙතුන් සියයක් තිස්සේ දුක් විඳපු උඩ රට ගැමි ජනතාවට සහනයක් සැලසීමට අප බොහොම ආසා වෙන් ඉතාමත් ඕනෑකමින් ඉතාමත් උනන් දුවෙන් සිටින බව උඩ රට ගරු මන්ත්‍රී වරුන්ට මා විශෙෂයෙන් මතක් කරන්නට කැමතියි.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)
සබරගමුව උඩ රට ප්‍රදේශයට අයිති නැද්ද ?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
තවම අයිති නැහැ. ඒ ගැන ප්‍රශ්නයක් තියෙනවා. වාර්තාවේ හැටියට සබරගමුවත් වයඹ පළාතත් අයිති නෑ.

තවත් ප්‍රශ්න මතු වුණා සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන ක්‍රමය සම්බන්ධව. ග්‍රාම සංවර්ධන ක්‍රමය ගැන මතක් කරන විට මට මතක් වුණා ග්‍රාම සංවර්ධන කටයුතුවල යෙදී ප්‍රාදේශීය නිලධාරීන් හැටියට වැඩ කළ දෙ පළක් අද මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් හැටියට පත් වී සිටින බව. ඒ මන්ත්‍රීවරුන් දෙපොළ වන මොනරාගල ගරු මන්ත්‍රීතුමා වත් (රාජා වෙලේගම මයා.) රත්තොට ගරු මන්ත්‍රීතුමාටත් (ඇස්. බී. යාලෙගම මයා.) අප සියලු දෙනාගේම ප්‍රසංශාව පුද කරන්න කැමතියි.

අද වෙනි දවසෙ ග්‍රාම සංවර්ධන නිලධාරීන් ගෙන් ඉතාමත් ලොකු සේවයක් ඉටු වෙනව. ඉදිරියටත් ඒ සේවය වැඩි දියුණු කර ගැනීම පිණිස නියම විධියේ ක්‍රම අපි පෙන්වා දෙන්න ඕනෑ. අපට ඉදිරියටත් වඩා හොඳ සේවයක් ලැබෙන පිදිදි ඔවුන්ට අපි නියමෙ උපදෙස් දෙන්න ඕනෑ. අපි දන් ඒ විධියට උපදෙස් දෙන බව මම නමුන් නාන්සේලාට මතක් කරන්න කැමතියි. ඒ අතරම ඒ නිලධාරීන්ගේ දුක්ගැනවිලි රාශියකුත් ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරි පත් කරන්න යෙදුණා. ඒ දුක්ගැනවිලි සත්‍ය දුක්ගැනවිලි හැටියට මම පිළි ගන්නව. දැනට ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ ශ්‍රේණි දෙකක් තිබෙනව. ඒ ශ්‍රේණි දෙක ඇති වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන්නේ වෙන මොනම සේවයක්වත් නැති රෙගුලාසි අනුවයි. ඉහළ ශ්‍රේණියේ එක් කෙනෙක් ඉන්නවා නම් පහළ ශ්‍රේණියේ පස් දෙනෙක් ඉන්නව. එතකොට පහළ ශ්‍රේණියේ සිටින කෙනෙකුට අවුරුදු 25 කින් වත් ඉහළ ශ්‍රේණියට යන්න බැහැ. පහළ ශ්‍රේණියේ සිටින නිලධාරීන් බොහෝම ඕනෑකමින් බලා ඉන්නව ඉහළ ශ්‍රේණියේ කී දෙනෙක් මැරෙනවාද, කී දෙනෙක් කවදා විශ්‍රාම යනවාද කියා. මෙය ලොකු වැරැද්දක්. මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර මම භාණ්ඩාගාරයට ලියුමක් ලියා තිබෙනවා, වහාම මේ වැරැද්ද හරි ගස්සන්නය කියා.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
ඒ ලියුම්වලින් වැඩක් නැහැ. අපිත් හුඟක් ලියුම් ලියා තිබෙනව. නමුත් වැඩක් නැහැ.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
කලක් මුදල් ඇමතිවරයකුව සිටි අපේ දොම්පෙ ගරු මන්ත්‍රීතුමා කියනවා, භාණ්ඩාගාරයට ලියන ලියුම්වලින් වැඩක් නැත කියා. එතුමා මුදල් ඇමති වශයෙන් සිටියදී එදා අපි ලියූ සෑම ලිපියක්ම එතුමා පතුලක් නැති කුණු කූඩයකට දැම්ම බව නම් මට කියන්න පුළුවනි. නමුත් අද ඉන්නෙ අවංකව වැඩ කරන වන්නිනායක මුදල් ඇමතිතුමා බව මම දොම්පෙ ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
ඔට්ටුවක් අල්ලන්න ලැහැස්තිද ?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
ඔව්, ඔට්ටුවක් අල්ලන්න ලැහැස්තියි.

**එස්. කේ. කේ. සූරියආරච්චි මයා. (මහර)**
*(திரு. எஸ். கே. கே. சூரியாரச்சி—மஹர)*
(Mr. S. K. K. Suriarachchi—Mahara)
කුණු කූඩෙට අඩියක් තිබුණ.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
ඒ එකයි පහේ ක්‍රමය නැති කර අපි ඉල්ලා තිබෙනව එකයි තුනේ ක්‍රමයක් ඇති කරන්නය කියා. පහළ ශ්‍රේණියේ පස් දෙනෙක් සිටිනවා නම් ඉහළ ශ්‍රේණියේ තුන් දෙනෙක් සිටීමේ ක්‍රමයක් හෝ එවැනි වෙන සාධාරණ ක්‍රමයක් හෝ ඇති කරන්නය කියා අපි ඉල්ලා තිබෙනව. ඒ වාගේම ඒ නිලධාරීන්ගේ දුක්ගැනවිලි ගැන ඉතා මත් ඕනෑකමින් කල්පනා කර බලන බවත් මේ ගරු සභාවට මතක් කරන්න කැමතියි.

ඊ ළඟට බලපිටියේ ගරු මන්ත්‍රීතුමා (එල්. සී. ද සිල්වා මයා.) සඳහන් කළා අම්බලන්ගොඩ සුරා සැලක් ගැන. මන්ත්‍රීතුමා ඒ කාරණය සඳහන් කළ වේලාවේ සිටම මම උත්සාහ කළා ඒ ගැන විස්තර ලබා ගන්න. කඩදාසි තුනක ලියා එවා ඇති විස්තරයක් මා ළඟ තිබෙනව. ඒ විස්තරය අනුව ඒ සුරා සැල කොතැනද යන්න සොයා ගන්න බැහැ. නමුත් බලපිටියේ මන්ත්‍රීතුමාටත්, අම්බලන්ගොඩ මන්ත්‍රීතුමාටත් මම පොරොන්දුවක් දෙනව, ඒ ගැන ඉදිරියට පරීක්ෂා කර බලා එහි මොකක් හෝ සුළු වැරැද්දක්වත් තිබෙනවා නම්, ඒ සුරා සැලෙන් පළාතට අයහපතක් සිදු වෙනවා නම්, එය වහාම වසා දැමීමට නියම කරන බවට.

දුම්රිය ආපණ මැදිරිවල සුරා විකිණීම නතර කර දැමීමේ ප්‍රශ්නය ගැන මේ ගරු සභාවේදී මතක් කළා. දුම්රිය ආපණ මැදිරිවල සුරා විකිණීම ලබන ඔක්තෝබර් මස 1 වැනිදා සිට නැවැත්වීමට නියම කර තිබෙනව. එය වසා දැමීමක් නොවෙයි කරන්නෙ. දුම්රිය ආපණ මැදිරිවල මත් පැන් විකිණීමට අවුරුද්දකට වතාවක් බලපත්‍රයක් ලබා ගන්න ඕනෑ. සැප්තැම්බර් මාසය අවසානයේදී මේ අවුරුද්ද අවසානයි. ඉදිරි වර්ෂය සඳහා නවත් බලපත්‍ර නිකුත් කරන්න එපාය කියා මම නියම කර තිබෙනව. මෙවැනි නියමයක් කළේ කුමක් නිසාද කියා මම මේ ගරු සභාවට පැහැදිලි කරන්න කැමතියි. උතුරු ප්‍රදේශයේ ගරු මන්ත්‍රීවරු සියළු දෙනාම ඒකච්ඡන්දයෙන් මගෙන් ඉල්ලීමක් කළා; දුම්රිය ආපණ මැදිරිවල සුරා විකිණීම නතර කර දමන්න ඕනෑය කියා. ඒවා තිබීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය දහනායක]
නිසා දුම්රියේ ගමන් කරන අයට විශාල පාඩු, අලාභ හානි සහ අපරාධ සිදු වෙන වාය කියායි, ඒ මන්ත්‍රීවරු ඒ ඉල්ලීම කළේ. ඒ මහජන මන්ත්‍රීවරුන්ගෙ මහ ජන හඬට එකඟ වී, කීකරු වී, එය නතර කිරීමට මට සිදු වුනා. මම ඒවා වසා දැමීමක් කළේ නැහැ. සැප්තැම්බර් මස 31 වැනිදාට පසු ඒවා තවදුරටත් පවත්වා ගෙන යාමට ඔවුන්ට අවසර නොදෙන බව තුන් මාසයකට කලින් දන්වා තිබෙනව.

අ. භා. 5.15

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරු තවත් කරුණු රාශියක් ඉදිරිපත් කර තිබෙනව. ඒ කරුණු ඉදිරිපත් කළ සියළුම ගරු මන්ත්‍රීවරුන්ට ස්තුති කරන අතර මම ප්‍රකාශ කරන්න සතුටුයි, ගරු මන්ත්‍රීවරුන් මේ ගරු සභාව තුළදී ඉදිරිපත් කරන විවේචන සියල්ලක්ම ලකුණු කර ගෙන ඒවා සම්බන්ධයෙන් අළුත් ෆයිල් එක බැගින් තබාගෙන ඒවා ගැන ක්‍රියා කරන්නේ මොන විධියටද යන්න මට පෙන්වන්නය කියා මම මගේ නිලධාරීන්ට නියම කර තිබෙන බව. තමුන්නාන්සේලා ඉදිරිපත් කරන තොරතුරු ඉතාමත්ම වටිනා ඒවා හැටියට අපි පිළිගන්නව. තමුන්නාන්සේලාගේ විවේචනවලට, ඉල්ලීම්වලට, දුක්ගැනවිලිවලට සෑම විටම අපේ අමාත්‍යාංශයේ දොරවල් ඇරිල තියෙනව. තමුන්නාන්සේලා ඇවිත් මේ සෑම වැඩ කටයුත්තක්ම ඉතා හොඳින් කර ගැනීමට අප සමග එකතු වන්නය කියා මම තමුන්නාන්සේලා සියළු දෙනාගෙන්ම ඉල්ලා සිටිනව. නැවතත් තමුන්නාන්සේලාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)
හතර පෝය නිවාඩු කිරීමේ යෝජනාව කොයි කාලයේ ක්‍රියාත්මක කරනවද කියා මම දැනගන්න කැමතියි.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්නය මතු කිරීම ගැන කෝට්ටේ මන්ත්‍රීතුමාට මම ස්තුති කරනව. අහපු නැති ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නට මට වුවමනාවක් තිබුනෙ නැහැ. නමුත් කව්රු හරි මේ ප්‍රශ්නය අසාවිය කියා මගේ ලොකු ආශාවක් තිබුන. නමුත් මට ලැබී තිබෙන අවසථාවෙන් අයුතු වාසියක් ගන්න මම අදහස් කළේ නැහැ. මම ගරු මන්ත්‍රීවරයකු ළඟට ගිහින් කණට කරල හෙමින් කිව්වෙ නැහැ, මේ ප්‍රශ්නය මතු කරන්නය කියා. දැන් කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහල තියෙන නිසා මම ඒ ගැන වචනයක් කියන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, නිවාඩු සම්බන්ධව අපේ අමාත්‍යාංශයේ තිබෙන සෑම ලිපි ගොනුවක්ම පිටුවක් පිටුවක් පාසා මම විස්තර වශයෙන් කියවා බැලුවා. එසේ බැලුවාම මට පෙනුන, යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමති වශයෙන් ඉන්න කාලයේදී වැන්ලැන්ගන්බර්ග් කොමිටිය පත් කර තිබෙන බව; නමුත් පෝය නිවාඩුව ගැන සඳහන් කරල ඒ වැන්ලැන් ගන්බර්ග් කමිටුව පත් කරල තිබුනෙ නැහැ. ඒ ලිපි ගොනුවල පෝය නිවාඩුව ගැන කිසිම සඳහනක් කරල තිබුනෙ නැහැ. මා දන්නා තරමට සතර පෝය නිවාඩුව ගැන මුලින්ම සඳහන් වී තිබෙන්නෙ එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රකාශයේ බව මම කියන්නට කැමතියි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
රාජපතිරණ කොමිසමේ තිබෙනව.

**ගරු අචායර් දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
රාජපතිරණ කොමිසමේ? [බාධා කිරීමක්] අපේ මුදල් ඇමතිතුමා පත් කළ කොමිටියට කිව්වේ නැහැ, ඔය පොහොය දින ගැන වාර්තා කරන්ට කියා.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)
තමුන්නාන්සෙ කොහොමද දෙනවයි කියන්නෙ? පොහොය දවසටත්, කලින් දවසෙ වරුවත් දෙනවද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ආචාර්ය දහනායක**
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

විස්තර කරන්ටවත් දෙන්නෙ නැහැනෙ. 1960 සිට 1965 දක්වා රාජාසන කථා කොපමණ තිබුණාද? හයක් තිබුණා. සතර පොහොය දින නිවාඩුව පිළිබඳව ඇලපිල්ලක්වත් ඒ සිරිමා බණ්ඩාරනායක රජයේ එකම රාජාසන කථාවකවත් සඳහන් වුණේ නැහැ. [බාධා කිරීමක්] සතර පොහොය නිවාඩුව ගැන මුලින්ම සඳහන් කළේ, මේ ජාතික ආණ්ඩුවේ රාජාසන කථාවෙන් බව මතක් කරන්ට කැමතියි. වැඩි කල් යන්ට පෙර පොහොය නිවාඩුව පිළිබඳව——

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

එතකොට පෝය පහුවෙයි.

**ගරු ආචාර්ය දහනායක**
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

—ස්ථිර තීරණයක් අරගන්නට අදහස් කරනවා. ඒ පිළිබඳව කෙටුම්පත් පනතක්, "ඩ්‍රාෆ්ට් බිල්" එකක් සකස් කර අද එය කැබිනට් මණ්ඩලයේ කාරක සභාවක් විසින් සලකා බලාගෙන යනවා. එය සංශෝධනය කරන්ට වුවමනා නම් සංශෝධනය කර තව තුන් මාසයකට පෙර මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

එතකොට පොහොය 12ක් පහුවෙලා.

**ගරු ආචාර්ය දහනායක**
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

ගරු සභාපතිතුමනි, මා තුන් මාසයක් යයි කිව්වෙ, අයවැය සාකච්ඡාව ඉවර වුණු හැටියෙම කෝට්ටෙ මන්ත්‍රීතුමාට විවේක කාලයක් වුවමනා වෙයි කියා හිතාගෙනයි.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

සිල් ගන්ට ඕනෑ.

**ගරු ආචාර්ය දහනායක**
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

සභාග ආණ්ඩුව කාලෙ තවත් වැඩ පිළිවෙළවල් පටන් ගෙන තිබුණා. වරාය කම්කරුවන්ට කෑම කන්න ශාලාවක් සෑදීමට, මධ්‍යම මුළුතැන්ගෙයක් සෑදීමට, වැසිකිළි, නානකාමර සහ ඇඳුම් දමන්න "ලොකර්" යනාදිය සෑදීමට ඒ කාලෙ මුදල් කොටසක් වෙන් කර තිබුණා. ඒවා ඒ විධියටම ගෙන යනවද කියා මා දැනගන්න කැමතියි. තවත් අදහසක් තිබුණා, ලංකාවෙ තිබෙන වරායවල් කීපයක්ම ඒකාබද්ධ කර පාලනය කිරීම සඳහා සංවිධානයක් ඇති කිරීමට. ඒ පිළිබඳව පණත් කෙටුම්පතක් සකස් කර එවන්න නීතිඥ මහතුන්ට යවා ඇති බව දැනගන්න ලැබුණා. එහෙමනම් ඉදිරිකාලය තුළදී, වරායවල් පිළිබඳව ඒකාබද්ධ සැලැස්මක් අනුව වැඩ කිරීමට තමුන්නාන්සෙ බලාපොරොත්තු වනවාද කියා දැනගන්න කැමතියි. ඒ වාගේම, ත්‍රිකුණාමලය වරායත් කන්කසන්තුරේ වරායත් ගාල්ලේ වරායත් මේ සැලැස්මට ඇතුළත් කරන්න යනවාද කියාත් මම දැනගන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, කොළඹ වරායේ වැඩ මෙයටත් වඩා සීඝ්‍රාකාරයෙන් කර ගෙන යන්න නම්, මගේ කල්පනාවේ හැටියට, ගබඩා කීපයක් අප ඇති කරන්න ඕනෑ. අප යෝජනා කර තිබුණා, බේරෙ වැව අයිනේ තට්ටු දෙක-තුනකින් යුත් ගබඩා කීපයක් පිහිටුවන්න ඕනෑය කියා. බඩු කෙළින්ම බත්තල්වලට බාන්න පුළුවන් නම්, බත්තල්වලින් ගබඩාවලට කෙළින්ම ගෙන එන්න පුළුවන් නම්, බේරෙ වැව අද්දර ගබඩා කීපයක් ඇති කිරීමෙන් වැඩ කටයුතු සීඝ්‍රාකාරයෙන් කරන්න පුළුවන් බවයි, විශේෂඥ මහතුන් කල්පනා කරන්නෙ. එසේ කරන්න නම් දැනට කොළඹ වරායෙන් බේරෙ වැවට එන "ලොක් ගේට්" එක ප්‍රමාණවත් මදි. මෙයට වඩා විශාල "ලොක් ගේට්" එකක් යොදන්ට ඕනෑ.

තවත් කාරණයක් නම්: පසුගිය කාලයේදී, විශේෂයෙන්ම සභාග ආණ්ඩුව තිබුණු කාලයෙදී, මේ රටට බඩු හරියට ගෙනෙන්නෙ නැහැ, වරායෙ වැඩ හරියට කෙරෙන්නෙ නැහැ, යනාදි ප්‍රවෘත්ති නිතර නිතර පත්‍රවල පළ කළ බව තමුන්නාන්සේට මතක ඇති. ඇත්ත වශයෙන්ම අපේ කොළඹ වරාය මේ වැඩ කටයුතු සඳහා ප්‍රමාණවත්ද කියන එක මේ කාරණයෙහිදී කල්පනා කර බලන්න ඕනෑ. අපේ රටට අවුරුද්දෙන් අවුරුද්ද බඩු ගෙන්වන ප්‍රමාණය වැඩි වෙනවා මෙන්ම මෙරටින් පිට රටවලට යවන ද්‍රව්‍ය ප්‍රමාණයත් වැඩි වෙනව. එම නිසා මෙම පරණ ක්‍රමයම දිගටම අනුගමනය කිරීමෙන් වරායෙ තදබදයක් ඇති වීම වළක්වන්න අමාරුයි. එබැවින් මේ පරණ ක්‍රමය, නැව් වරාය මැද තබාගෙන බඩු බෑමේ පරණ ක්‍රමය, දිගින් දිගටම ගෙන යාම ආර්ථික අතින් සුදුසුද කියා කල්පනා කර බලන ලෙස මේ අවසථාවේදී මතක් කරන අතරම මේ තත්ත්වය මග හැරීමට, වෙනස් කිරීමට, වැඩ පිළිවෙළක් යොදනවාද නැද්ද කියන කාරණයත් අප දැනගන්න කැමතියි.

මේ අවස්ථාවේදි වචනයක් සඳහන් කරන්න කැමතියි, මා ඇමතිවරයා වශයෙන් සිටින කාලයේදී වරාය ඇතුළෙ කම්කරු නායකයන් විසින් කම්කරුවන් අමතා කථා කිරීම නැවැත්වීම සඳහා නීතියක් පනවා තිබෙනවාය කියා පත්‍රවල පළ වී තිබුණු ප්‍රවෘත්තිය ගැන. ඇත්ත වශයෙන්ම, ඒ අවස්ථාවේදිත් මෙය ප්‍රතිපත්තියක් වශයෙන් අප පිළිගත්තෙ නැහැ. මේ ගැන ප්‍රශ්නයක් මතු වුණෙත් නැහැ. නොයෙකුත් හේතුන් උඩ එවැනි ප්‍රතිපත්තියක් අප ක්‍රියාත්මක කරන්න ඉඩ දුන්නෙ නැහැ. එම නිසා එය අවලංගු කළේ නැහැ. එහෙමම තිබුණා. එම නිසා මම කනගාටු වෙනවා, එම හේතුව උඩ වරායෙ කම්කරු නායකයකු අස් කිරීම ගැන. තමුන්නාන්සේලාට එවැනි දේ කිරීමට දැනට ශක්තියක් තිබුණත්, ඉදිරි කාලයේදී නම් එය එතරම් හොඳ ක්‍රියාවක් නොවන බව, එය තමුන්නාන්සේලාට ආධාර නොවන ක්‍රියාවක් බව මතක් කර දෙන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනිල් මුණසිංහ මයා.]

ගරු සභාපතිතුමනි, කොළඹ වරාය ගැන තවදුරටත් කල්පනා කරන කොට අපට පෙනී යනව, වරාය කොමිෂන් සභාවට අයිති කොටසත් වරාය සංයුක්ත මණ්ඩලයට අයිති කොටසත් ඒකාබද්ධ කර කට යුතු කළ යුතුය කියා. මා හිතනව අලුත් රජය ඒ ප්‍රතිපත්තිය පිළිගන්නවා ඇත කියා. මම මේ අවස්ථාවේදී දැනගන්න කැමතියි, මේ කොටස් දෙක ඒකාබද්ධ කර, එහි කටයුතු ගෙන යන්නට ඇමතිතුමා බලාපොරොත්තු වෙනවාද කියා. ඒ සමගම මේ අවස්ථාවෙදි මගේ සන්තෝෂය ප්‍රකාශ කරන්න කැමතියි—ඒ පිළිබඳව ගරු ඇමතිතුමාටත් මම ප්‍රශංසා කරනව—වරායෙ ටෙලි ක්ලාර්ක්වරුන්ගේ සහ වරායෙ වොච්මන්වරුන්ගේ සේවය ජනසතු කිරීමට තීරණය කිරීම ගැන. ඇත්ත වශයෙන්ම, මේ ගැන එක්තරා කාරණයකුත් කියන්න මට ඕනෑ කරනව. මේ යෝජනාව ඇමතිවරයා වශයෙන් සිටිද්දි මමත් ඉදිරිපත් කළා. නමුත් එවකට තිබුණු විදේශීය නැව් කොම්පැනිකාරයන් ඇවිත් අපට කීවා මේ ප්‍රතිපත්තිය වැරදිය කියා.

අ. භා. 6

මෙය කළොත් සමහර විට කොළඹ වරායට නැව් නොගෙන වෙනත් වරායවලට යන්නත් සිද්ධ වේය කියන තර්ජනයකුත් අපට එල්ල කළා. කොළඹ වරායෙහි වැලි ක්ලාක්වරුන්ගේ සහ වොච්මන්වරුන්ගේත් සේවය එක් කොම්පැනියකට භාර දිය යුතුයයි තීරණය කිරීමට අපට සිදු වූයේ අන්න ඒ හේතුව උඩයි. කොන්ත්‍රාත් ක්‍රමයක් තිබුණා; ඒ ක්‍රමය යටතේ වැලි ක්ලාක් මහත්වරුන්ට තමන්ගේ සේවයේ නියම ස්ථිරතාවක් තිබුණේ නැහැ. කිසිම හේතුවක් නැතිව වැලි ක්ලාක් මහත්වරුන් අස්කර දැමීම සිදු වුණා. කොන්ත්‍රාත්කාර මහත්වරුන් යටතේ වැලි ක්ලාක් මහත්වරුන්ට තම සේවය කරගෙන යාමට සිදු වුණේ නොයෙක් හිරිහැර විඳිමිනුයි. ඔය කොම්පැනි සියල්ලක්ම එකතු කර එක් කොම්පැනියකට භාර දීමට අප සූදානම් වූයේ ඒ නරක තත්ත්වය නැති කිරීමටයි. එයින් ඒ සේවකයන්ට නියම වැටුප් ක්‍රමයක් සහ සේවයේ ස්ථිර තත්ත්වයකුත් ලැබේය කියා අප බලාපොරොත්තු වුණා. එහෙත් ඊට ඉඩක් නුදුන් බව තමුන්නාන්සෙ දන්නව. ඒ අංශයේම බොහොම තද බල ලෙස බලපෑම් තිබුණා. ඇයි, මේ විධියට කොන්ත්‍රාත්කාර මහත්වරුන්ට පහර ගහන්න යන්නෙ, කියා ඇහුවා. මේ උදවිය මෙපමණ කාලයක් වරායේ වැඩ කරමින් සිටියා; දැන් ඒ අයට පාඩුවක් වෙනව නේද? කියාත් ඇහුවා. මේ කරන්න යන්නෙ අසාධාරණ වැඩක්ය කියාත් කිව්වා. සමහර උදවියට එයින් අමාරුවක් වුණු බව මාත් පිළිගන්නව. වැඩි දෙනාට සේවයක් වෙනවද කියා අප සොයා බැලිය යුතුයි. ඒ අනුවයි අප කල්පනා කළේ, වැලි ක්ලාක් මහත්වරුන්ගේත් වොචර් මහත්වරුන්ගේත් ඒකාබද්ධ සේවයක් ඇති විය යුතුය කියා. දැන් තමුන්නාන්සෙට සිද්ධ වෙලා තියෙනව, ඒ සේවය ජනසතු කරන්න. නැව් කොම්පැනිකාර මහතුන්ගෙ ඒජන්ත මහත්වරුන් මේ ගැන අද කියන්නෙ මොනවාදැයි මා දැනගන්න කැමතියි. ඒ අය සතුට පළ කර තිබෙන වලු. එහෙම නම් ඒ උදවිය දැන් ජාතික ආණ්ඩුවට සහයෝගය දෙනව වෙන්න ඕනෑ. ඒ අය දැන් ජාතික ආණ්ඩුවේ සමාජවාදයට එකඟ වී සිටින බවයි එයින් පෙනෙන්නෙ. විදේශීය කොම්පැනි අපට නම් කිසිම සහයෝගයක් දුන්නෙ නැහැ; හැම දාම අපට කරදර කළා. ගාස්තුත් වැඩි කළා. මෙවැනි දේවල්, අප වැඩ කරද්දී, අපට කළ නමුත් තමුන්නාන්සෙලාට නම් බොහොම ඉහළින් සහයෝගය දෙනව. එංගලන්තයෙ නැව් කොම්පැනිවලින්, ලොකු ලොකු ධනපතියන්ගෙන් මේ ජාතික ආණ්ඩුවට නම් සහයෝගය ලැබෙනව. ඒ නිසා වෙන්න ඇති, ගිය මාස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යේදී තමුන්නාන්සේලා ලක්ෂ විස්සක් පමණ ලාභ කොටස් යවන්න ඉඩ දීමට තීරණය කළේ.

මේ අවස්ථාවේදී මා මෙපමණයි කථා කිරීමට බලාපොරොත්තු වන්නෙ. ජාතික ආණ්ඩුවට නම් දිගට හරහට අඩු කර දෙන බව පෙනෙනව. අපට තමයි ඔක්කොම බර පැටෙව්වෙ. ඔය විධියට සහයෝගය දෙන්නෙ යම්කිසි දෙයක් ඒ උදවිය තමුන්නාන්සේලාගෙන් බලාපොරොත්තු වන නිසා වෙන්න ඕනෑ. ඒක තමයි තමුන්නාන්සෙලා ඉදිරි කාලයේදී කරන්න යන්නෙ. ඒවාටත් අප ලෑස්තිවෙලයි ඉන්නෙ. මේ අවස්ථාවේ මේ වචන ස්වල්පය පමණයි කථා කරන්න යන්නෙ. පසුව කථා කරන්න බලපොරොත්තු වෙනව, මා ඉදිරිපත් කළ ප්‍රශ්නවලට උත්තර ලැබුණාම.

ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government)

ගරු සභාපතිතුමනි, අපේ අගලවත්තෙ ගරු මන්ත්‍රීතුමා කථා කළ හැටියෙම මට කථා කරන්න ලැබීම එක් අතකින් මගේ වාසනාවක්ය කියා මා කල්පනා කරනව. එතුමා හිටපු ඇමතිවරයෙක් ; අපේ හොඳ මිත්‍රයෙක්. පුද්ගලයෙකු හැටියට එතුමා කෙරෙහි මා තුළ ලොකු සැලකිල්ලක් තිබෙනව. එහෙත් මා එතුමාගෙන් අහන්න කැමතියි, එක්සත් ජාතික පක්ෂයේ රැස්වීමක් යම් දවසක යම් ස්ථානයක පැවැත්වුණා නම් එදාට ස්ථානය හා සම්බන්ධ මාර්ගයේ බස් රථ ධාවනය නතර කිරීම කොයි විධියට සිදු වුණාදැයි, හවුල් ආණ්ඩුවෙ ඇමතිවරයෙකු හැටියට සිටි කාලයේදී එතුමා සොයා බැලුවද කියා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව කාලයේදීත්, ඒ වාගේම පසුගිය හවුල් ආණ්ඩුව කාලයේදීත් නොයෙක් අවස්ථාවලදී විරුද්ධ පක්ෂය රැස්වීම් පවත්වන විට ඒ ප්‍රදේශයේ බස් රථ ගමනාගමනය තිබී හැටියේ අඩාල වෙනවා ; නැත්නම් සම්පූර්ණයෙන්ම නතර වෙනවා. ඒක අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාත් පිළිගන්නවා ඇති. අපට එය පැහැදිලි වශයෙන්ම පෙන්නුම් කරන්නට පුළුවන්. එසේ නම් ඒක සාධාරණද කියා මා එතුමාගෙන් ප්‍රශ්න කරනවා. ඒක එක්තරා දූෂණයක් නොවෙයිද කියා මා ප්‍රශ්න කරනවා. ආණ්ඩුවේ ඒකාධිකාරයක් ඇති කරගෙන, ආණ්ඩුව යටතට පවරා ගත් මහජන සේවාවක් මගින් විරුද්ධ පාක්ෂිකයන්ට කරදර තිබිහැර කිරීම ප්‍රජාතන්ත්‍රවාදයද කියා මා ප්‍රශ්න කරනවා.

අනිල් මුණසිංහ මයා.

(திரு. அனில் முனசிங்க)

(Mr. Anil Moonesinghe)

දැන් ලංකා ගමනාගමන මණ්ඩලය මගින් පත්‍ර ගෙන යන්න ඉඩ දෙන්නෙත් නැහැ.

ප්‍රේමදාස මයා.

(திரு. பிரேமதாச)

(Mr. Premadasa)

අද පත්‍රවලට නිදහස තිබෙනව. "ඇත්ත" පත්‍රයට, "ජනදින" පත්‍රයට ඕනෑ තරම් බොරු කියන්න නිදහස තිබෙනව. තමුන්නාන්සේ පිළිගන්නවා ඇති බස් රථ තිබෙන්නෙ මගීන්ට යන්න බව. තමුන්නාන්සේ මගීන්ට බස් රථවල යන්න ඉඩ දුන්නෙත් නැහැ. දුර කතර ගෙවා අපේ රැස්වීම්වලට එන මගීන්ටත් තමුන්නාන්සේ බස් රථවල යන්න ඉඩ දුන්නෙ නැහැ. එදා යම් ප්‍රදේශයක අපේ රැස්වීමක් තිබුණා නම්, ඒ ප්‍රදේශයේ බස් රථ සේවාව සම්පූර්ණයෙන්ම අඩාල වෙනවා ; නැත්නම් සම්පූර්ණයෙන්ම නතර වෙනවා. ඒ නිසා අපි තමුන්නාන්සේලාට චෝදනා කරනවා.

ඊළඟට තමුන්නාන්සේලා මොකක්ද කළේ ? තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ රැස්වීමක් පවත්වන විට විශේෂ බස් රථ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

යෙදුවා. එසේ කළේ නැත කියා තමුන් නාන්සේලාට කියන්න බැහැ. අගලවත්ත ප්‍රදේශයේ ප්‍රචාරය කළ එක් මැතිවරණ දැන්වීමක් මා ළඟ තිබෙනවා. විරුද්ධ පක්ෂයේ නායිකාව යම්කිසි රැස්වීමකට පැමිණෙනවාය, ඒ රැස්වීමට ලංකා ගමනා ගමන මණ්ඩලය මගින් විශේෂ බස් රථ සේවයක් යොදනවාය කියා ඒ මැතිවරණ දැන්වීමේ සඳහන් කර ප්‍රචාරය කළා; ඒක මුද්‍රණය කර ප්‍රචාරය කළා. හරියට ලංකා ගමනාගමන මණ්ඩලය ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ පෞද්ගලික දේපලක් වගේ සලකා, ඒ රැස්වීමට විශේෂ බස් යොදනවාය කියා ප්‍රචාරය කළා.

**ඩී. බී. වෙලගෙදර මයා. (ජනසතු සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. பி. வெலகெதர—தேசிய மய சேவை அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*
(Mr. D. B. Welagedera—Parliamentary Secretary to the Minister of Nationalized Services)

නැන්දම්මගෙ බූදලය වගේ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

නැන්දම්මලගෙ මාමලගෙ බූදලය වගේ සලකල දැන්වීම් මුද්‍රණය කරල ප්‍රචාරය කළා. අගලවත්ත ප්‍රදේශයේ ප්‍රචාරය කළ ඒ දැන්වීමක් මා ළඟ තිබෙනවා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ මේ රැස්වීම් අමතනවාය කියා ඒකෙ මුද්‍රණය කර තිබෙනවා. පහළින් මුද්‍රණය කර තිබෙනවා, රැස්වීම අවසානයේදී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් විශේෂ බස් රථ සේවයක් යොදනු ලැබේය කියල.

**අනිල් මූණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

අගලවත්තෙ නොවෙයි, බුලත්සිංහල

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඒක දූෂණයක් නොවෙයිද? තමුත් මේ ජාතික රජය යටතේ නම් එවැනි වෙනස්කමක් සිදු නොවන බව මා සවිර විශයෙන්ම මේ අවසථාවේදී ප්‍රකාශ කර නවා.

**අනිල් මූණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

නැහැ, දැනුත් වෙනස්කම් කරනවා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

දැන් කඩාකප්පල්කාරී ව්‍යාපාරයක් ගෙන යනවා. සමහර විට අපේ රැස්වීම් තිබෙන විට නැවතත් බස් නැතිවෙනවා. ඒ නිසා මේ විධියේ අසාධාරණ චෝදනා අපට එල්ල කිරීම සම්පූර්ණයෙන්ම වැරදියි.

ගරු සභාපතිතුමනි, ඊළඟට මාර්තු මාස යේදී පැවතුණාට වඩා සැම අතින්ම දියුණු තත්ත්වයක අද ලංකා ගමනාගමන මණ්ඩලය තිබෙන බව අපට සියළුම වාර්තා වලින් ඔප්පු කරන්නට පුළුවන්.

**අනිල් මූණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

මහජනයාගෙන් අහන්න.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

එදා මහජනයාට බස්වල ගමන් කරන්න බැරිකමක් තිබුණා. ඔවුන්ට එදා හිරිහැර කළා; කරදර කළා. විශෙෂයෙන්ම ගරුතර මහා සංඝ රත්නය තමුන්නාන් සේලාගේ ප්‍රතිපත්තිය පිළිගත්තේ නැත කියා උන්වහන්සේලාට බස්රථවලින් ගමන් කරන විට කළ හිරිහැරවලට තමුන් නාන්සේලා මොකද කළේ කියා මා ප්‍රශ්න කරනවා. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති පිළිගත් අය අදත් ලංකා ගමනා ගමන මණ්ඩලයෙ ඉන්නවා. අදත් ඒ අය තමන් ගේ රාජකාරිය අපක්ෂපාත ලෙස කරන් නෙ නැහැ. ඒක පුදුමයක් නොවෙයි. බස් රථ පවරා ගත් දවසේ සිට පාලනය ගෙන ගියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩු වයි, තමුන්නාන්සේලාගේ හවුල් ආණ්ඩු වයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට ඇමතිතුමා පෞද්ගලික වශයෙන් අයුතු පත්වීම් දුන්නාද නැද්ද කියා තමුන්නාන්සේ ප්‍රශ්න කළා. මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටියා, කිසිම සැකයක් නැතුව අයුතු පත්වීම් පසුගිය කාලයේදී [බාධා කිරීම්]

**අනිල් මූණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)
නෑ. සභාග ආණ්ඩුව කාලයේ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
සභාග ආණ්ඩු කාලය කියා එක යුගයකුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු කාලය කියා තවත් යුගයකුත් තිබෙනවා යයි තමුන්නාන්සේලා අදහස් කරනවද ?

**අනිල් මූණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)
තමුන්නාන්සෙලාමනේ එහෙම කියන්නෙ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
අදත් ඒක එහෙමමද ? අපිනම් කල්පනා කළේ එකට එකතු වුණාය කියායි. පිං පව් දෙකම එකට එකතුවුණාය කියායි අප කල්පනා කළේ.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)
අප එකතු වුණේ කරුණු 14 කින් යුත් ප්‍රතිපත්තියක් අනුවයි.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
ගරු සභාපතිතුමනි, දෙගොල්ලක් අතර ඇති වන කරුණු 14 ක් උඩ ආණ්ඩුවක් ගෙනයන්නට රටක් පාලනය කරන්නට පුලුවන්ද ? එය මොන මෝඩ කථාවක්ද ?

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)
තමුන්නාන්සෙලා හත් හවුලක් හදා ගෙන තියෙන්නෙ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
අප කටයුතු කරන්නෙ කරුණු 20 කට 30 කට පමණක් අපගේ ප්‍රතිපත්ති සීමා කරගෙන නොවෙයි. පොදු ප්‍රතිපත්තියක පිහිටා මහජනතාවගේ සෑම අවශ්‍යතාවයක් ගැනම වගකීමේ වැඩ පිළිවෙළක් අනුව අප කටයුතු කරන බව මම ප්‍රකාශ කරනවා. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
Order, please! Please do not interrupt.

The hon. Member for Agalawatta, (Mr. Anil Moonesinghe) was not interrupted when he was speaking. Therefore, please do not interrupt. If you have anything to say against what the hon. Parliamentary Secretary is saying, I have always said, "Note it down" and I shall give you a chance of replying. I shall not allow any interruptions. I am going to send out any hon. Member who interrupts as there are too many interruptions. Let one side speak while the other side listens, and then the other side can reply. Please do not interrupt.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
ගරු සභාපතිතුමනි, රජ සතු කළ දින සිටම, ආණ්ඩුව සන්තක කළ දින සිටම, මෙම ව්‍යාපාරයෙහි දූෂණ ඇති වුණාද නැද්ද කියා වැඩි කල් යන්නට පෙර එළිදරව් කරන්නට පුදුවන්කම ලැබෙයි. පත්වීම් දීම් අතින්, උසස් කිරීම් අතින්, වෙනත් වාසි ලේසි සැලසීම් අතින් ලංගමය ගෙන ගිය ක්‍රියා කලාපය එළි කළ යුතුව තිබෙනවා. මේ රජය පිහිටෙව්වාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

පසු අපගේ විශේෂ උත්සාහය වුණේ පසු ගිය ආණ්ඩුව කාලයේදී තිබුණු අසාධාරණ ක්‍රමය වෙනුවට ඊට වඩා වෙනස් සාධාරණ තත්ත්වයක් ඇති කිරීමයි. එම නිසා සෑහෙන තරම් සතුටුදායක තත්ත්වයක් ලංගමයෙහි ඇති වී තිබෙන බව ප්‍රකාශ කරන්නට සතුටුයි. අප විසින් පත් කරන ලද අධ්‍යක්ෂවරුන්, විරුද්ධ පක්ෂය විසින් දේශපාලන හේතුන් උඩ විවේචනය කරනවා. නමුත්, අප විසින් පත් කළ අධ්‍යක්ෂවරුන් පත් වුණු දවසේ සිටම ඉතාමත් උත්සාහයෙන් ක්‍රියා කරන බව මා ප්‍රකාශ කරනවා. ලංගම අධ්‍යක්ෂවරුන් ගේ වැඩ කටයුතු සම්බන්ධයෙන් අද තිබෙන තත්ත්වය ගැන යම් විවේචනයක් කරනවා නම්, එය සාධාරණ ලෙස කරන හැටියට මම ඉල්ලා සිටිනවා.

අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (අනිල් මුණසිංහ මහතා) ලංගමය සම්බන්ධයෙන් කථා කරගෙන යන විට, පෙරේසිදා—සෙනසුරාදා—" ඩේලි නිව්ස් " පත්තරයෙහි පළ වී තිබුණු ප්‍රවෘත්තිය ගැන එතුමාගේ අවධානය යොමු කොට ඒ ගැන පිළිතුරක් දේයයි මම හිතුවා.

**අනිල් මුණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

ඒ ගැන උසාවියේ නඩුවක් තිබෙන නිසා මට ප්‍රකාශයක් කරන්නට බැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

උසාවියේ තිබෙන නඩුවක් ගැන නොවෙයි මම කියන්නෙ. පත්තරයේ පළ වුණු ප්‍රවෘත්තියක් ගැන. බොහොම වේග යෙන් කථා කළ ඒ ගරු මන්ත්‍රීතුමා එතුමා ගේ කාලයේදී—හවුල් ආණ්ඩුව කාලයේදී —ලංගමයෙහි දූෂණ ඇති වුණු බව ඔප්පු කරන ලෙස ගරු ඇමතිතුමාට අභියෝග කළා.

**අනිල් මුණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

මම එහෙම කිව්වෙ නෑ, පත්වීම් ගැනයි කිව්වෙ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

පත්වීම් කළ ඒවත් වෙනත් ඒවත් එකතු කොට ඒ සියල්ලටම "දූෂණය" කියන වචනය පාවිච්චි කරන්නට පුළුවනි. ගරු සභාපතිතුමනි, ලංගම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරන ලද පරීක්ෂණයක දී හෙළි වුණු කරුණු වගයක් පිළිබඳ ප්‍රවෘත්තියක් සැප්තැම්බර් මස 4 වැනි සෙනසුරාදා "ඩේලි නිව්ස්" පත්තරයෙන් මට කියවන්නට ලැබුණා. අගලවත්තෙ ගරු මන්ත්‍රීතුමා ඒ ගැන විවනයක් එතුමාගේ කථාවේදී ප්‍රකාශ කරයි කියා මම විශ්වාස කළා.

"Inquiry by two directors spotlights irregularities.

CTB VEHICLES USED FOR NON-CTB WORK.

Coalition Minister used seven cars, Land Rover, motor cycle."

**අනිල් මුණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

කවුද විභාගෙ පැවැත්තුවෙ? යූ එන් පී එකෙන් නොවෙයිද? තමුන්නාන්සේලා පත් කළ නීතිඥයන්.

අ. භා. 6.15

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මම මෙය සම්පූර්ණයෙන් කියවන්නම්. මම එතුමාට චෝදනා කරනවා නොවෙයි. මෙවැනි වැදගත් කාරණයක් සම්බන්ධ යෙන් මම එතුමාගෙන් ප්‍රකාශයක් බලාපොරොත්තු වෙනව.

"Investigations relating to the use of C. T. B. vehicles during the last General Election have disclosed that a Coalition Minister had used seven cars, a Land Rover and a motor cycle, for purposes unconnected with C. T. B. operations.

This investigation was carried out by two C. T. B. Directors—Major C. A. Dharmapala and Mr. Oscar de Livera. They have submitted their report for consideration of the Board.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Their investigations reveal that the release of these vehicles appears to have been made on orders purporting to come from the Ministry.

Request for vehicles was 'by demand' and the release was made under pressure thus removing any vestige of legal validity attached to the use of such vehicles, say the directors in their report. No log sheets were used on these vehicles although the organization's rules make this an absolute requirement.

New Vehicles: Nearly all the vehicles concerned are of recent registration. Repairs on twelve occasions were done to some of them within four months.

The total cost of private mileage performed by the ex-Minister or on his orders amounts to Rs. 6,855.30 out of which amount the ex-Minister has paid Rs. 700."

මම හිතනව, "හිටපු ඇමතිවරයාය" කියන්නෙ අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාය කියා.

"The Report pinpoints the use of the motor cycle belonging to the Matugama Depot for election work in a neighbouring electorate. This particular motor cycle was used, the report says, to escort the funeral procession of an election victim from Kalutara to Matugama.

The investigations have also disclosed that no less than four vehicles used, met with accidents at different times. Some of the expenses for repairs were met by the Ceylon Insurance Corporation. One car was taken into Matugama Police in connection with an alleged murder.

The investigations have also brought to light several instances (thirteen instances as reported by the Depot Manager, Kalutara) in the Kalutara region where buses have been used for special trips without the payment of fares. There has been no authority for the use of these buses on such trips nor have log sheets been properly maintained. Moreover, particular buses have been used, the report states, to transport supporters to election meetings."

ගරු සභාපතිතුමනි, හිටපු ඇමතිතුමා පිළිගන්නවා ඇති මෙය නොසලකා හැරිය හැකි පුවතක් නොවන බව. එක්කො මේකෙ ඇත්තක් තිබෙනවි නම් ඇත්තය කියන්න ඕනැ. නැත් නම් බොරුවක් නම් බොරුවක්ය කියන්න ඕනැ. එසේත් නැත් නම් බාගයක් ඇත්ත නම් බාගයක් ඇත්තය කියන්න ඕනැ. ඒ නිසා අපි ඒ ගැන යමක් දැනගන්න ඕනැ.

අනිල් මූණසිංහ මයා.
(திரு. அனில் முனசிங்க)
(Mr. Anil Moonesinghe)

එතකොට මැතිවරණ නඩුවට බොහොම ලෙහෙසියි.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

මම දන්නෙ නැහැ ඒක. තමුන්නාන්සෙ නීතිඥයෙක් නිසා දන්නවා ඇති. පාර්ලිමේන්තුව ඇතුළෙ කියන දේ ගැන තමුන්නාන්සේ බය වෙන්න ඕනැ නැහැ.

අනිල් මූණසිංහ මයා.
(திரு. அனில் முனசிங்க)
(Mr. Anil Moonesinghe)

ඇයි හැන්සාඩ් වාර්තාව.

පේ‍්‍රමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

හැන්සාඩ් වාර්තාවෙ පළ වුණාට මෙ කද? තමුන්නාන්සෙ කියන්න බයයි. එහාට ගිහින් වෙන කථාවක් කියන්න බලාපොරොත්තු වෙනවාද? [බාධා කිරීම්] කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා නීතිඥයෙක් හැටියට දන්නවා ඇති. මෙතැනදී එකක් කියා උසාවියේදී එකක් කියන්න බැහැ. ඇත්ත කියනවා නම් ඇයි බය වෙන්නෙ? මෙතැනදී එකක් කියා උසාවියේදී තවත් එකක් කියන්න බැහැ.

අනිල් මූණසිංහ මයා.
(திரு. அனில் முனசிங்க)
(Mr. Anil Moonesinghe)

This is one of the grounds of the election petition.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

I am not aware of the grounds of the election petition.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

But he cannot refer to these things.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අනිල් මූණසිංහ මයා.**
(திரு. அனில் முனசிங்க)
(Mr. Anil Moonesinghe)

නඩුවක් තිබෙනව.

**ප්‍රේමදාස මයා.**
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

ඒකට ඇති බාධාව මොකක්ද? ඇත්ත විශයෙන්ම මම එතුමාට චෝදනා කරනවා නොවෙයි. මෙය ඉතා වැදගත් පුවතක්. හිටපු විශකිය යුතු ඇමතිවරයෙක් කර ඇති ප්‍රකාශයක් හැටියට පළ වී ඇති නිසා එය වැදගත් පුවතක් හැටියට මා කල්පනා කරන නිසයි. [බාධා කිරීම්] මා දන්න කරුණු ගැන මහජන මන්ත්‍රීවරයෙක් හැටියට මට මෙම ගරු සභාවේදී කරුණු ඉදිරිපත් කිරීමට නිදහසක් තිබෙනව. ඇයි ඒ ගැන තමුන්නාන්සේ ඇත්ත කියන්න බය? ඇයි ඒ හිටපු ඇමතිතුමාට මෙතැනදී නැගිට ඒ ගැන පිළිතුරක් දෙන්න බැරි? මම කාර් පාවිච්චි කෙළේ නැහැ, ලෑන්ඩ් රෝවර් පාවිච්චි කෙළේ නැහැ, මෝටර් සයිකල් පාවිච්චි කෙළේ නැහැ කියා කියන්න ඇයි බැරි? හොඳයි මම එතුමාගෙන් අහනවා, රුපියල් 700ක් ගෙවූ එක නැතෙයි කියා කියනවාද කියා.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

ඒක පස්සෙ බලන්න පුළුවන්.

**ප්‍රේමදාස මයා.**
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

පස්සෙ බලන්න දෙයක් නැහැ. මේ ගරු සභාව තමයි මහජන ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතු මේ රටේ කේන්ද්‍රස්ථානය. ඒ හිටපු ඇමතිතුමා කියනවාද, එතුමා ලංගම රථවාහන මැතිවරණ කටයුතු වලට පාවිච්චි කෙළේ නැත කියා. මට අනික් එක ප්‍රශ්නයකටවත් උත්තරයක් වුවමනා නැහැ. ඒ ප්‍රශ්නයට පමණක් උත්තරයක් ඉල්ලනව. එතුමා චෙක් පතකින් රුපියල් හත් සියයක් ගෙවා තිබෙනව. මොකක්ද එතුමා ලංගම අධ්‍යක්ෂවරයාට ලියා තිබෙන්නෙ? මා කියන දේ වැරදි නම් එතුමාට හරිගස්සන්න පුළුවන්.

"මා ලංගම ආයතනය භාර ඇමතිවරයකු හැටියට සිටියදීම මගේ මැතිවරණ කටයුතු කරන අතර මට සිදු වුන, ඒ මැතිවරණ කටයුතු සඳහා ලංගම රථ පාවිච්චි කරන්න."

එහෙම කිව්වද, නැද්ද කියා මම අහන්න සතුටුයි. එතුමා උත්තර දෙන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි, මට ඔප්පු කරන්න පුළුවන් ප්‍රකාශයක්, මා මේ කරන්නෙ. එතුමා එහෙම ලියා තිබෙනව, එතුමාගේ ඇස්තමේන්තුව අනුවත්, එතුමාගේ තක්සේරුව අනුවත්, කිසිම සටහනක් එතුමා තියාගෙන නැහැ. එතුමාගේ රාජකාරි ගමන් යන අතරේත් මැතිවරණ කටයුතුවලට ගියාලු. ඒ නිසා එතුමා සිතනවලු, ඒ කාලයේ මැතිවරණ කටයුතු සඳහා ලංගමයේ වියදමින් රුපියල් හය සියයක පමණ ගමන් යන්නට ඇත කියා. ඒ වුනත් එතුමා රුපියල් හත් සියයක් ගෙවනව. මගේ කීම හරිද? එතුමාගේ ඇස්තමේන්තුව සහ තක්සේරුව රුපියල් හය සියයයි. තව රුපියල් සියයක් පිනට ගෙවනවා. මේකට උත්තර දෙන්න බැරි ඇයි කියායි, මම අහන්නෙ. එය එතුමා පිළිගන්නව ඇති.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

උසාවියෙදි උත්තර දෙයි.

**ප්‍රේමදාස මයා.**
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

උසාවිය හොඳයි, තමුන්නාන්සෙ වගේ යමක් හොයා ගන්න ඉන්න උදවියට. කෝච්චේ මන්ත්‍රීතුමා බය වෙනව ඇති, මේව මෙතන එළි කළොත් එතුමාගේ රාජකාරියට බාධාවක් ඇති වේය කියා. නැහැ. එතකොට එතුමාට තවත් වාසියි. මෙතන කට වරද්ද ගත්තම උසාවියෙදී එතුමාට තවත් දිග්ගස්සගන්න පුළුවන්. [බාධා කිරීමක්.]

**සභාපතිතුමා**
(அக்கிராசனர்)
(The Chairman)

Please do not interrupt.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்தன)*
(Mr. Stanley Tillekeratne)

This is a matter that is being canvassed before the Supreme Court.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

This is the supreme legislature. [*Interruption*]. For whom are you appearing and by whom have you been instructed ?

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

We were getting on very well before the hon. Member for Kotte arrived. I am afraid I shall have to deal with the hon. Member if he causes trouble.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்தன)*
(Mr. Stanley Tillekeratne)

Sir, I have always held your Order in respect in this House. What I am saying is that this is a matter that is being canvassed in a court of law. It is *sub judice*. Therefore, it is difficult to reply here to what is being said. We will reply to it in the courts and come and reply later here.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

If it is a point of Order, you know how to raise it. Then I would make my Order. You can raise a point of Order, but please do not interrupt. I do not like interruptions because they take up so much time. This is the Committee stage and the hon. Member for Agalawatta (Mr. Anil Moonesinghe) or any other hon. Member can speak again if there is anything he wishes to answer, provided we have the time. If there is an important point that has to be explained, I shall certainly allow time for that.

Will the hon. Parliamentary Secretary please carry on with his speech ?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ගරු සභාපතිතුමනි, අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා නිශ්ශබ්දව ඉන්නව. එයින් අපට තේරුම් ගන්න තියෙන්නෙ අප කියන දේ එතුමා පිළිගන්නවය කියායි.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

සමහර විට වෙලාව ආවම උත්තර දෙයි.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ගරු සභාපතිතුමනි, මගේ තර්කය තවම අවසාන නැහැ. මා එතුමාට විරුද්ධව පෞද්ගලික චෝදනාවක් කරන්නෙ නැහැ. එතුමා ලොකු අභියෝගයක් කළා. අපේ විවේචන, ලංගමයේ පත්වීම්වලට පමණක් සීමා කරන ලෙස එතුමා අපෙන් ඉල්ලුව. ගරු ඇමතිතුමා ඒ පත්වීම් ගැන මොන විධියේ පරීක්ෂණයක් කරල තියෙනවද කියා අපි දන්නෙ නැහැ. මම ඒ අමාත්‍යාංශයට සම්බන්ධ කෙනෙක් නොවෙයි. පිටින් දැන ගන්න ලැබී තිබෙන තොරතුරු ගැනයි, මා කථා කරන්නෙ. යම් යම් ආයතන තමන්ගේ පාලනය යටතට පත් කරගෙන ඒවා දේශපාලන ප්‍රයෝජනය සඳහා යොදා ගත්තම මේ විධියේ විවේචනවලට මුහුණ දෙන්න සිදු වෙනව. ප්‍රවෘත්ති පත්‍ර ආණ්ඩුවට ගත්තත් මේක මයි, සිද්ධ වෙන්නෙ. පසුගිය මැතිවරණය පැවැති දවසෙ සාධාරණ ලංගම සේවයක් තිබුණා යයි තමුන්නාන්සෙ පිළිගන්නවද? නැහැ. ඒ ගැන විශේෂයෙන් දුර බැහැර පළාත්වලින් පත් වී ආ මන්ත්‍රීවරුන් සාක්ෂි දෙනවි ඇති. එදා හවුල් ආණ්ඩුවට විරුද්ධ එක්සත් ජාතික පක්ෂයට පක්ෂ, එසේ නැත්නම් හවුල් ආණ්ඩුවට විරුද්ධ කණ්ඩායම්වලට පක්ෂ, යම් ප්‍රදේශ තිබුණ නම් ඒවාට බස් නැතුව ගියා. සමහර ගම්වල මිනිසුන්ට හැතැප්ම දහය, දොළහ, විස්ස, තිහ පයින් එන්ට සිද්ධ වුණා. ඔවුන්ට ඉඩ ලැබුණෙ නැහැ, ඔවුන්ගේ ඡන්ද පාවිච්චි කරන්ට. පසුගිය මැතිවරණ රෙගුලාසි යටතේ සැතපුම් ගණන් පයින් එන්ට සිද්ධ වුණා. ඒක සාධාරණද කියා මා අහනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

ගරු සභාපතිතුමනි, පිටකොටුවේ බස් නැවතුම්පොළ ගැන සඳහන් කළා. හිටපු ඇමතිතුමාට—අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාට—මා කියන්ට සතුටුයි, පසු දවසක ගිහින් ඒ බස් නැවතුම්පොළ බලන්ට කියා. ඒ අත්‍යවශ්‍ය දෙයක් ඉටුවී තිබෙන්නෙ. මා නැතැයි කියන්නෙ නැහැ. එහෙත් ඒ කටයුත්ත හරියට කර නැහැ. එක පැත්තක තිබෙන මඩගොහොරුව තමුන්නාන්සේට අද ගියත් බලන්ට පුළුවන්. නියම විධියට කටයුත්ත නොකිරීමේ ප්‍රතිඵලයක් ඒ. එතුමා කිව්ව, ඒ ගැන මට කරන්ට දෙයක් නැහැ, ඒක ඊට සම්බන්ධව කටයුතු කළ නිලධාරීන් කළ දෙයක් කියා. ඒ වගකීම එතුමාට භාර ගන්ට බැරිය කිව්ව. එහෙම නම් පසුගිය දවස් කීපය තුළ තමුන්නාන්සේලා අපේ ඇමතිවරුන්ට චෝදනා කළේ ඒ ඇමතිවරුන්ගේ පෞද්ගලික වැරදි නිසාද? නැහැ. ඒ ඇමතිවරුන්ට කියන්ට පුළුවන්, මම මොනව කරන්ටද, ඒව කර තිබෙන්නෙ මගේ නිලධාරීන්, කියා. ඇමතිවරයෙකුට ඒ වගකීමෙන් මිදෙන්ට පුළුවන්කමක් නැහැ. ඒ රජයේ වේවා, මේ රජයේ වේවා, ඇමතිවරයාට ඒ කටයුතු සම්බන්ධයෙන් වගකියන්ට සිද්ධ වෙනව. පිටකොටුවේ බස් නැවතුම්පොළ මීටත් වඩා නියම විධියට සකස් කර ගැනීමට පුළුවන්කම තිබුණ, මැතිවරණ කඩිමුඩිය උඩ ඒක විවෘත කරන්ට කල්පනා නොකළා නම්. මැද කොළඹ ගරු තුන් වෙනි මන්ත්‍රීතුමාට (පී. ජී. බී. කෙනමන් මයා.) දවසක් එහි ගිහින් සිටින්ට සිද්ධ වුණා, එදා විවෘත කරනවා යයි දන්වා තිබුණ නිසා. එහෙත් වැඩ අවසාන වී නොතිබුණු නිසා එදා විවෘත කිරීමක් සිදු වුණේ නැහැ. එතුමාට ආපසු යන්ට සිද්ධ වුණා. දෙවෙනි වරට තමයි, එතුමාට විවෘත කිරීමේ උත්සවයට යන්ට පුළුවන් වුණේ, මැතිවරණ අවස්ථාවේ. කඩිමුඩියේ, හදිසියේ මැතිවරණ අවස්ථාවේදී එය විවෘත කරන්ට කටයුතු යෙදුව. මා කියනව කෙලින්ම, පිටකොටුවේ බස් නැවතුම්පොළ විවෘත කිරීමත් දේශපාලන ප්‍රයෝජනයට පාවිච්චි කළා කියා.

ඊළඟට අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා ජනසතු සේවා ඇමතිතුමාට ප්‍රශංසා කළා, වරායේ වැලි ක්ලාක් සහ වොච්මන් මුරකරු සේවය ජනසතු කිරීම ගැන. එතුමා ප්‍රශංසා කරන අතරම කිව්ව, එතුමාත් මේ කටයුත්ත යෝජනා කළා කියා. යෝජනා කරන්ට ඇති. මා නැතැයි කියන්නෙ නැහැ. එහෙත් යම් යම් නැව් කොම්පැනිකාරයින් ඊට තර්ජනයක් වුණායයි කිව්ව. එහෙම නම් තමුන්නාන්සේ පිළිගන්නව ඇති, මේ ආණ්ඩුව ඒ තර්ජනය මර්දනය කළා කියා. ඒ නිසා අපට පුළුවන් වුණා, තමුන්නාන්සේට කරන්ට බැරි වුණු වැඩක් කරන්ට. එහෙම නම් ඇයි, තමුන්නාන්සේලා අපට කියන්නෙ, අපි නැව් කොම්පැණිකාරයින්ගේ පැත්ත ගන්න උදවියය කියා? එහෙම නම්, අපි කොම්පැණිකාරයින්ගේ පැත්ත ගෙන වැඩ කරන උදවියය කියා තමුන්නාන්සේලා අපට චෝදනා කරන්නෙ ඇයි? නැහැ සභාපතිතුමනි, අවශ්‍ය දෙයක්, කළයුතු දෙයක් ඉදිරිපත් වුණාම අනික් පැත්ත කොයි තරම් ප්‍රබලයෙකු වුණත්, මේ රජය නිර්භීතව, අභීතව ඒ කාර්‍ය්‍ය ඉටු කරන බවට එය සාධකයක් යයි අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්ට කැමතියි.

මේ හැර වරායේ අද බඩු බෑම සහ පැටවීම ඉතා හොඳින් සිදු වෙන බව තමුන්නාන්සේලා පිළිගන්නව ඇති. මේ රටේ ආර්ථික ප්‍රශ්නය පිළිබඳව අද වරාය වැදගත් ස්ථානයක් ගන්නව. වරායේ කාර්‍ය්‍යක්ෂමතාව උඩ අපේ රටේ ජීවන වියදම අඩු කිරීමේ ප්‍රශ්නයත් සැලකිය යුතු තරම් දුරට ගැබ් වී තිබෙනව. එම නිසා මේ රජය පිහිටුවූ දවසේ පටන් වරායේ කටයුතු කාර්‍ය්‍යක්ෂම අන්දමින් කරන්ට කටයුතු යොදා තිබෙනව. මා ඒ පිළිබඳව කථා කරන්ට අදහස් කරන්නෙ මෙපමණයි, ගරු සභාපතිතුමනි.

අ. භා. 6.30

**සභාපතිතුමා**

*(அக்கிராசனர்)*

(The Chairman)

The hon. Appointed Member (Sir Razik Fareed) will now take the Chair.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, ஸ்ரீமான் ருசிக் பரீத் தலைமை தாங்கினார்.

[*Whereupon* MR. SPEAKER *left the Chair, and* SIR RAZIK FAREED *took the Chair.*]

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ජනසතු සේවා අමාත්‍යාංශය යටතේ ඇති වැය ශීර්ෂය සාකච්ඡාවට භාජන කරමින් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා නිවිසැනසිල්ලෙන් හා විමසිල්ලෙන් යුතුව කථා කළායින් පසු හිටපු ජනසතු සේවා ඇමතිවරයකු වන අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා මෙම විවාදයට සම්බන්ධ වෙමින් එක්තරා ප්‍රකාශයක් කිරීම හේතුකොටගෙන, හිටපු ඇමතිවරයකු වශයෙන් චාරිත්‍රයක් හැටියට එක්තරා ප්‍රකාශයක් කිරීම හේතු කොටගෙන, අපේ පළාත් පාලන කට යුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා මේ සාකච්ඡාව දේශපාලන විවාදයක් බවට පරිවර්තනය වන අන්දමින් කථා කිරීම ගැන මා කනගාටු වෙනවා. අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා කථා කෙළේ හිටපු ඇමතිවරයකු වශයෙනුයි. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කථා කෙළේ ජනසතු සේවා අමාත්‍යාංශයේ ඇති අඩුපාඩු පෙන්වා දෙමිනුයි. නමුත් පළාත් පාලන කට යුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා මෙතැනට එක්තරා දිනපත්‍ර පත්‍රයක් ගෙනැවිත් ඉදිරිපත් කොට අපේ අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාට මඩ ගසන්නට උත්සාහ කළ නිසා අපටත් යම් යම් දේ ප්‍රකාශ කරන්නට සිදු වෙලා තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු ලේකම්වරයාගේ කථාව මා ඉතාමත්ම ඉවසිල්ලෙන් අහගෙන සිටියා. ඒ කථාවේදී සඳහන් වූ එක් වගන්තියකට මගේ හිත යොමු වුණා. මේකයි වගන්තිය: "පොදු සේවා ආයතන ආණ්ඩුව අතට පත් කළාම ඕකයි වන්නේ" මේ ප්‍රකාශය ඔහුගේ කථාවත් සමඟ හැන්සාඩ් වාර්තාවට ගොසින් ඇති.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මා ඒ ගැන පෞද්ගලික ප්‍රකාශයක් කරන්නට ඕනෑ. මා ඒ විධියට කිව්වේ නැහැ. මා කිව්වේ, "යම් යම් ආයතන රජය සන්තක කරගෙන අනික් අයට තිබෙන නිදහස නැති කර තිබෙන ආකාරය මෙයින් පේනවා" කියලයි. මා කී දේ නිවැරදිව හැන්සාඩ් වාර්තාවේ ඇති.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)

කට බොරු කිව්වත් දිව බොරු කියන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

You must accept it.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)

ඔබතුමා කියනවා නම් පිළිගන්නම්. හොඳයි, බස් සේවය ජනසතු කරන්නට පෙර තත්ත්වය ගැන අප හොඳින් දන්නවා. 1956 යේ කාලයේ සිටම පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙක්. මේ ආණ්ඩුවට සම්බන්ධ වී සිටින එවකට සිටි බස් මුදලාලිලාගෙන් විරුද්ධ පක්ෂයේ උදවියට කොතරම් කරදර තිබුණාද කියාත්, ඔවුන් බස් වලින් ගමන් කරන්නවත් අයිතිවාසිකම් නොතිබුණා නේද කියාත් මා එතුමාගෙන් ප්‍රශ්න කරනවා. ඒ කාලපරිච්ඡේදය නැති කරමින් 1956 දී බලයට පත් වූ ආණ්ඩුව ඉතාමත්ම ප්‍රගතිශීලී පියවරයක් වශයෙන් අත්‍යවශ්‍ය සේවයක් වූ බස් සේවය ජනසතු කළා. එදා ඊට සම්බන්ධ වූ සියලුම දෙනාට අපේ ගෞරවය හිමි වෙනවා. නමුත් අපේ අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා ජනසතු සේවා ඇමති වුණායින් පසු ලංගමය තුළ විශාල වෙනසක් ඇති වුණා. ප්‍රගතියක් ඇති වුණා. දියුණුවක් ඇති වුණා. විශාල දියුණුවක් ඇති වූ බව ලංකාවාසීන් හොඳින් දන්නවා. අලුත් ක්‍රමයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන්දර මයා.]
බස් රථ සේවා ඇති වුණා. ශීඝ්‍රගාමී බස් රථ සේවා ඇති වුණා. බස් පෝලිම්වල සංගීතය අසමින් සිටින්නට අවස්ථාව සැලසුවා. [බාධා කිරීමක්] සමහරුන්ට මේවා විහිළු. නමුත් පොදුවේ මහජනතාව මේ ගැන හොඳින් දන්නවා. මේවා කෙළේ කවුද කියා මහජනතාව දන්නවා. ඒ අන්දමට අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා එදා ජනසතු බස් සේවය දියුණු කරන්නට උත්සාහ කළා.

ගරු සභාපතිතුමනි, අපේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා අපේ ගරු ඇමතිතුමාට ලොකු සැලකිල්ලකින් යම් යම් කරුණු පෙන්වා දුන්නා. ඒ නිසා මේ විවාදය වෙන අතකට යොමු කරන්නේ නැතිව අපේ ඇමතිතුමාට යම් යම් කරුණු පෙන්වා දෙන්නට කැමතියි. මැතිවරණ කටයුතුවලදී අනිසි විධියට ලංගම බස් සේවාවෙන් ප්‍රයෝජන ගත්තාය කියා චෝදනාවක් කෙරුණා. ඒ චෝදනාවට පිළිතුරු දෙන්න මට පුළුවන්; මා එයට ලැහැස්තියි. කිරිඇල්ල ඡන්ද කොට්ඨාශයේ සහ දෙහිඕවිට ඡන්ද කොට්ඨාශයේ තිබුණ ඉතා විශාලම රැස්වීම විරුද්ධ පක්ෂයේ නායිකාව සහභාගී වූ රැස්වීමයි. එදා සාමාන්‍ය බස් සේවාවවත් තිබුණාද කියා රත්නපුරේ බටහිර ප්‍රදේශයේ රීජනල් මැනේජර් මහත්මයාගෙන්, ඩිපෝ මැනේජර්තුමාගෙන් හා ප්‍රාදේශීය කළමනාකරුගෙන් විමසන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එදා ඒ පළාතේ වෙනත් උත්සවයක් තිබුණා. ඊට පෙරදින අධිකාරීතුමා ටෙලිෆෝන් කර මගෙන් ඇසුව, හෙට අගමැතිනිය එනවා නේද කියා. එවිට මා කීවා, බස් තිබෙනවා නම්, හෙට පිංකමක් තිබෙන නිසා ඊට යොදවන්නය කියා. නමුත් රත්නපුර කොළඹ මාර්ගයේ වැඩ කළේ බස් දෙකයි. මා ඇමතිතුමාට කියනව ගිහින් විභාග කර බලන්නය කියල. යම්කිසි තැනක යම්කිසි දවසක යම්කිසි දෙයක් කෙරුණා කියා පොදු වශයෙන් මඩ ගැසීමේ ව්‍යාපාරයක් අරඹන්න එපාය කියා මා කියනව.

අද ලංගමයේ විශාල තරුණ පිරිසක් සිටිනව. ඇත්ත තමයි, ලංගමයේ වැඩ කරන තරුණ නිලධාරීන්, අලුත් කොන්දොස්තරවරුන් සහ රියැදුරන් සමාජවාදී අදහස් දරන උදවිය බව අපි පිළිගන්නවා. ඒ අය තුළ ඔවුන් දරන දේශපාලන අදහස්වලට වඩා ජාතිය ගැන කැක්කුමක් තිබෙනව. ඒ නිසා කඩාකප්පල්කාරී වැඩ කරනවාය කියන එක අමූලික අසත්‍යයක්. ඒ උදවියගේ සහයෝගය ලබා ගන්නය කියා මා ඇමතිතුමාට කියනව. අවංක තරුණයින් එහි සේවකයින් වශයෙන් සිටිනව. ඒ අයගේ සහයෝගය ලබා ගන්නය කියා මා ඇමතිතුමාට කියනව. අද සිදු වී තිබෙන්නේ මොකක්ද? ලංගමය ඇමතිතුමා මගින් පාලනය වන බවක් මහජනතාව දන්නේ නැහැ. අද පත්තරවල පළ වන්නෙත්, එතුමා ප්‍රසිද්ධ වී සිටින්නෙත්, ක්‍රීඩා ඇමති කියලයි. ලංගමය කාට බාර දීලද කියන්න දන්නෙ නැහැ. එවැනි තත්ත්වයකුයි අද තිබෙන්නෙ. ඒ නිසා එවැනි රටට ජාතියට ආදරයක් තිබෙන ඒ ලංගම සේවකයින් ගෙන් වැඩ ගන්නට එතුමාට ධෛර්යයක් තිබෙනවාය, එය ලබා ගන්නය, කියා මා කියනව.

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)
කඩාකප්පල්කාරී වැඩ නැතෙයි කියනවද?

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)
කඩාකප්පල්කාරීන්ය කියන්නේ අහවල් පක්ෂයේය කියන කොටසකට නොවෙයි. කඩාකප්පල් කාරීන්ය කියන්නේ කඩාකප්පල්කාරී වැඩ කරන උදවිය වයි. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
නම් ලැයිස්තුවක් දෙන්න.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)
විවාදය අවුල් කරන්න උත්සාහ ගන්න එපා. මෙය වැදගත් විවාදයක්. දන් ලංගමයේ කම්කරුවන් අතර විශාල නොසන්සුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කමක් ඇති වී තිබෙනව. ඒ මාරුවීම් උඩයි. ඒ නිසා කම්කරුවන්ගේ ප්‍රශ්න ගැන, රියැදුරන්ගේ ප්‍රශ්න ගැන ඩිපෝ අධිකාරීන්ගේ කාර්යාලවල සාකච්ඡා ඇති කරන්නය කියා මා කියනව. බස් මගීන් ගේ සංගම්වල නියෝජිතයනුත් සේවක යින්ගේ නියෝජිතයිනුත් කැඳවා නිලධාරීන් සමග සාකච්ඡ ඇති කර ඒ උදවියගේ ප්‍රශ්න විසඳන්නය කියා මා ඇමතිතුමාට කියනව. රියැදුරකු ගැන හෝ කම්කරුවකු ගැන පැමිණිල්ලක් ඇති වූ විට ලංගමට සම්බන්ධ නැති අයත් ඇතුළත් වූ මණ්ඩලයක් ඇති කර ඒ මගින් එය විභාග කරන්නය කියා මා කියන්න කැමතියි.

තවත් කරුණක් කියන්න කැමතියි. ප්‍රධාන විශයෙන් බස් සේවා කීපයක්ම මගේ ඡන්ද කොට්ඨාශයට සම්බන්ධ කර තිබුණා.

**සී. එන්. මැතිව් මයා.** (කොලොන්න)
*(திரு. சீ. என். மதியூ—கொலன்ன)*
(Mr. C. N. Mathew—Kolonna)
ඡන්ද කාලයෙද ?

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)
ඡන්ද කාලෙ සම්මත කළාට ඒවා දුවවන්න මා උපදෙස් දුන්නෙ නැහැ. ඒ විධියට අපි කටයුතු කළේ නැත කියා කොලොන්නෙ අලුත් මන්ත්‍රීතුමාට කියන්න මා කැමතියි.

අපේ කර්මාන්ත ඇමතිතුමාගේ කොට්ඨාශයට සම්බන්ධ වන පූවක්පිටිය-තුම්මෝදර බස් සේවයත්, මින්නාන-උඩුවන බස් සේවයත් සම්මත වී තිබුණා. ඒවායේ බස් දුවවීමට අපි උත්සාහ කළේ නැහැ. ඉලෙක්ෂන් ප්‍රදර්ශන බස් අපි යෙදෙව්වේ නැහැ. ඒ බව මට ආඩම්බරයෙන් කියන්න පුළුවනි. ඒ නිසා ඒ බස් සේවාවන් වහාම ආරම්භ කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

"ජනදින," "ඇත්ත" ආදී පත්‍ර ලංගම යෙන් ගෙන යන්න අවසර දෙන්නෙ නැහැ. ඒ පත්‍රත් ජනතාවගේ පත්‍ර හැටියට පිළිගෙන ඒවා බස් රථවල ගෙන යාමට ඉඩ සලස්වන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

ලංකාවේ බස් සේවය ගැන බලන විට ප්‍රධාන විශයෙන්ම ගල්කිස්සේ සිට කොළඹ තෙක් ඇති සේවයෙහි විශාල දුෂ්කරතාවයක් තිබෙන බව පෙනෙනවා. කොපමණ බස් යෙදුවත්, කොපමණ මගීන් බස්වල පැටෙව්වත් ලොකු ප්‍රමාද යක් තිබෙනවා. ඊට ප්‍රධාන හේතුව ඒ පාර ඉඩ මදිකමයි. කොයි තරම් බස් තිබු නත් පස්සෙන් එන හිස් බස් රථයකට ඉස්සරහින් යන බස් රථය පසු කර යාමට පුළුවන්කමක් නැහැ, පාර ඉඩ මදි නිසා. ඒ නිසා ඒ මගීන්ට පහසුකම් සැල සීම සඳහා රජයේ වැඩ අමාත්‍යාංශයත් මේ අමාත්‍යාංශයත් එකතු වී සුදුසු වැඩ පිළිවෙලක් යොදන මෙන් මම ගරු ඇමති තුමාගෙන් ඉල්ලා සිටිනවා.

ක්‍රීඩා පිළිබඳවත් කරුණක් දෙකක් ඉදිරිපත් කිරීමට මම අදහස් කරනවා. අද අපේ ගම්බද තරුණයින්ටත්, නගරබද තරුණයින්ටත් ක්‍රීඩා කිරීමට අවශ්‍ය පහසුකම් ඇත්තේ නැහැ. ඒ නිසා පළාත් පාලන ආයතන සම්බන්ධ කරගෙන, ගම් කාර්ය ප්‍රදේශයකට අඩු වශයෙන් පොදු ක්‍රීඩා භූමි දෙකක්ද සුළු නගර සභාවකට අඩු ගණනේ එක් පොදු ක්‍රීඩා භූමියක්ද නගර සභාවකට අඩු ගණනේ පොදු ක්‍රීඩා භූමි දෙකක්ද දෙන මෙන් මම ඉල්ලා සිටිනවා. ජනසතු සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡා වන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු කරුණු රාශියක් ඇතත් කාලය මදි බැවින් ඒවා පසුව ඉදිරි පත් කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ විවාදයේදී අනවශ්‍ය දේ ඇදගෙන කාලය ගත කිරීම ගැන කනගාටුව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**එස්. ද එස්. ජයසිංහ මයා.** (දෙහිවල ගල්කිස්ස)
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க—தெகிவள கல்கிசை)*
(Mr. S. de S. Jayasinghe—Dehiwala Mt. Lavinia)
ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කථා කළ පළාත් පාලන උප ඇමතිතුමාගේ කථාවෙන් පසු මගේ කථාව පහසුවෙන් හා කෙටියෙන් කිරීමට ඉඩ ප්‍රස්තා ලැබුණා. මට පෙර කථා ක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

ගරු මන්ත්‍රීතුමා 1956 ට පෙර තුබුණු බස් රථ ව්‍යාපාරය සම්බන්ධයෙන් සඳහන් කළා. ඒ ගැන පිළිතුරක් දීම මගේ යුතුකමක් හැටියට මම සලකනවා. මීට අවුරුදු 30 කට 35 කට පමණ පෙර පටන්ගත් මේ බස් රථ ව්‍යාපාරය සියයට සියයක්ම ලාංකිකයින් විසින් දියුණු කරන ලද බව තමුන්නාන්සේ දන්නවා ඇති. එදා මේ ව්‍යාපාරයේ මූලිකව කටයුතු කළ උදවිය ජීවිත පරිත්‍යාගයෙන්, ධන පරිත්‍යාගයෙන් කටයුතු කර සමහරුන් සම්පූර්ණයෙන් නැත්තටම නැති වූ අතර තවත් සමහරුන් එක්තරා තත්වයකට පැමිණ සිටි අවස්ථාවක් තිබුණා.

අ. භා. 6.45

ඒ අවස්ථාවේදී දේශපාලන පොරපිටියට කවුරුත් සම්බන්ධ වුණා. මේ රට පක්ෂවලට බෙදුණා. බස් රථ හිමියන් එක්සත් ජාතික පක්ෂය වටා රොක් වුණා. සියයට එකක් එදා සිටි විරුද්ධ පක්ෂයට නොහොත් ලංකා සමසමාජ පක්ෂයට ඉන්න ඇති. සියයට 99ක්ම එක්සත් ජාතික පක්ෂයට සිටියා. 1956 න් පසු පිහිටුවූ මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුව එදා පළිගැනීමේ චේතනාවෙන්, මේ අය හිස ඔසවා සිටියොත් නැවතත් එක්සත් ජාතික පක්ෂය බලයට පත් කරාවිය යන අදහස නිසා ඊර්ෂ්‍යාවෙන් බස් සේවය ජනසතු කළා. එසේ බස් ජනසතු කරන අවස්ථාවේදී ඔවුන් හුඟක් දේ බලාපොරොත්තු වුණා. නමුත් ඒ බලාපොරොත්තු ඉෂ්ට කිරීමට බොහොම පරක්කු වුණා. හැබැයි, කෝටි සංඛ්‍යාත ධනස්කන්ධයක් නාස්ති වුණා. ඒ වාගේ යම් යම් පුද්ගලයින් පොහොසත් වූ බවත් රහස් නොවෙයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

ස්විස් බැංකුවේ තැන්පත් කරන්න ඇති.

එස්. ද එස්. ජයසිංහ මයා.
(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)
(Mr. S. de S. Jayasinghe)

ස්විස් බැංකුවේද, වෙනත් බැංකුවලද කියා මම දන්නේ නැහැ.

මේ බස් රථ සේවාව ඒ ඒ අවධිවල ඒ ඒ ඇමතිවරුන් යටතෙ තිබුණා. එය බාරව තිබුණේ සිටි අය තමතමන්ගෙ හිතු මතයට අනුව බස් රථ යොදවාගෙන ගියා. අද අපේ රටේ බස් සේවාවට බස් රථ වර්ග කීපයක් එකතු වී තිබෙන බව තමුන්නාන්සෙ දන්නව. ඒවායින් සමහර බස් රථ ඒවා දුවවන පාරවලට විශාල වැඩියි. එම නිසා ලංගමය කල්පනා කරන්න ඕනෑ කුඩා පාරවලට කුඩා බස් රථ කීපයක් ගෙන්වා ඒ පාරවල තිබෙන තදබදය නැති කර දැමීමට.

පසුගිය ආණ්ඩුව, මේ බස් රථ ව්‍යාපාරයෙන් අප්‍රමාන ලෙස අයුතු ප්‍රයෝජන ලබා ගත්ත. මැතිවරණ කාලයෙදිත්, මැතිවරණයට ප්‍රථමත්, ඡන්ද කඩා ගැනීම සඳහා මෙන්ම ඡන්ද අල්ලා ගැනීම සඳහාත් ලංගමයට අයිති මහජන මුදල් ඉතාමත් නුසුදුසු විදියට යෙදෙව්ව. ඇතැම් විට, ලංගම් සේවකයන් අතර බෙදා දුන්නෙ, ලංගමයට අයිති මුදල් නොවෙයි; පෞද්ගලික බස් රථ හිමියන්ට ගෙවිය යුතුව තිබුණු වන්දි මුදලුයි. කිසි ඇහීමක් බැලීමක් නැතිව බොහෝ විට තම තමන්ගෙ හිතුමනාපෙ බෙදා දුන්න. මෙසේ කළේ මොන හේතුවක් උඩද? ඡන්ද කඩා ගැනීම සඳහායි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ආණ්ඩුව දිනවීම පිණිස එම පරිත්‍යාගය කළා. එදා බස් රථ හිමිව තිබුණු අයට ලැබෙන්න තිබුණු වන්දි මුදල් එම පරිත්‍යාග සඳහා ප්‍රයෝජනයට ගත්ත. බස් රථයක දෙකක හිමිකමක් තිබුණු, සුළු, කොටස් හිමිව සිටි ඇතැම් අය අද ඉතා දුකසේ තමන්ගෙ ගම්වල ජීවත් වන බව මා දන්නව. එදා පෞද්ගලික බස් රථ ව්‍යාපාර තිබුණු කාලෙ යම් යම් අයට ඒ ව්‍යාපාරවල නිලතල දී තිබුණ. ඒ අයට මාසික වේතනයක්ද ලැබුණ. එදා ඒ අය තමන්ගෙ ගෙදර පුටුවක කකුලක් කැඩුණාම වඩු මඩුවට ඒක ගෙනැවිත් හදා ගත්තෙත්, කුස්සියෙ හිරමණේ මුවත තියාගන්න, මන්නයක් හදාගන්න කම්මලට ගෙන ආවෙත්, තමන්ගෙ ළමයි නිදහසේ පාසැලට යැව්වෙත් බස් රථවල උපකාරයෙනුයි. අද ඒ සෑම වරප්‍රසාදයක්ම නැති වෙලා. අද ඒ අය ඉතා අමාරු තත්ත්වයකයි ඉන්නෙ.

විජයසුන්දර මයා.
(திரு. விஜேசுந்தர)
(Mr. Wijesundara)

තමුන්නාන්සෙටයි, ඇමතිකම දෙන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*

(Mr. S. de S. Jayasinghe)

මා ඇමතිකමක් ගන්න සුදුසු තමයි. නමුත් මොකද කරන්නෙ? [බාධා කිරීම්]

මම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙ දැනගැනීම පිණිස ප්‍රකාශ කරන්න කැමතියි, සුළු බස් රථ හිමියන්ව සිටි සියයට හැත්තෑ පහක් දෙනා අද ඉතා දුකසේ ජීවත් වන බව. ඒ අයට ලැබියයුතු පාරිතොෂික මුදල්වත් ලංගමයෙන් ලබා ගන්න බැරි වුණා. ඒකටත් නීතියක් මගින් හරස් කපා තිබුණා. කොටස් කාරයකු වශයෙන් වේවා, අධ්‍යක්ෂවරයකු වශයෙන් වේවා, කළමනාකාර අධ්‍යක්ෂවරයකු වශයෙන් වේවා, සේවකයකු වශයෙන් වේවා තමන්ගෙ රැකියාව නැති වන අවස්ථාවේදී ලැබිය යුතු වරප්‍රසාද යම් යම් අයට ලැබුණෙ නැහැ. කොටස් හිමි සේවකයන්ගෙ වරප්‍රසාද නැති කර දැම්ම. ඒ සම්බන්ධයෙන් මේ ගරු ඇමතිතුමාගෙ අවධානය යොමු කරවන්න මා කැමතියි. බස් රථ ව්‍යාපාරවල සේවය කළ එවැනි කොටස් හිමියන් අපේ ප්‍රදේශවල පමණක් නොවෙයි, ලංකාවෙ නොයෙකුත් ප්‍රදේශවල හිටින බව මා දන්නවා.

පසුගිය මැතිවරණ සමයෙදි, එක්සත් ජාතික පක්ෂයෙ රැස්වීම් පවත්වනු ලැබූ අවස්ථාවලදී ලංගම බස් සේවයෙ යෙදී සිටින ඇතැම් උදවිය ලවා නොහොබනා විධියෙ කටයුතු කෙරෙව්වා. එම රැස්වීම් පවත්වන තැන් අසලදි බස්වල එන්ජින් ඕනෑවට වැඩිය ශබ්ද කරවාගෙන පැදෙව්වා. බස්වල එන්ජින් ඕනෑවට වඩා "රේස්" කරගෙන දුම් ගස්සවාගෙන පැදෙව්වා. එපමණක් නෙවෙයි, යම් යම් ඩිපෝවල "හූ" පාටි සූදානම් කළා. එක්සත් ජාතික පක්ෂයෙ රැස්වීම් තබන තැන්වලට වෙන වෙනම "හූ" පාටි යැව්වා. [බාධා කිරීම්] ඔව්, නරි පාටි. තමුන්නාන්සෙලගෙ ඇමතිවරයා "හූ" පාටි ලෑස්ති කළා. මම දන්නව රැස්වීම් පැවැත්වෙන බොහොම තැන්වලට මේ "හූ පාටි" යැව් බව. හැබැයි මගේ රැස්වීම් පැවැත්වුණ තැනකට එන්නෙ නැති බව නම් මම දැනගෙන හිටියා. එහෙම ආවා නම් ඒ අයට වෙන දේ ගැනත් ඒ අය දන්නවා. මම දන්නව ලංගමේ ඩිපෝවලින්ම හූ පාටි සංවිධානය කර ගෙන තිබුණු බව. කෝට්ටෙහිදි එහෙම අවස්ථාවකට මුහුණ දෙන්න වුණා. මම කාර් එක හරවගෙන ඇවිත් හූ කියාපු අයට ගහන ලෙස අණ කළා. ඊට පස්සෙ නම් හූ තිබ්බෙ නැවතුණා. ඒ තරම් දරුණු විධියටයි ලංගම සේවකයින් පෙළෙඹෙව්වෙ. මේ ගැන එම මණ්ඩලයෙ නිලධාරීන් සම්පූර්ණයෙන් වග කියන්න ඕනැ. එවැනි දෙයක් ඒ අයගෙන් අප බලාපොරොත්තු වුණා. මන්ද? නැවතත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් මේ රටේ ඇති වුණා නම් පමණයි. ඒ නිලධාරීන්ට, එතෙක් කර ගෙන ආපු හුරා කෑම ඉදිරියටත් කර ගෙන යන්න ඉඩ ලැබෙන්නෙ. ගරු සභාපතිතුමනි, අද ලංගමයෙ සේවය කරන අය තෝරා බේරා ගත්තොත්, දස දහසක් ගත්තොත්, එයින් හත් දහසක් පමණ හරියට රක්ෂාව කරන්නෙ නැහැ. ඒ විධියට බලන කොට දහ දහසකින් තුන් දහසක් පමණ නිකම් ඉඳ පඩි ගන්නවා. මේ දස දහසින් අට දහසක් පමණ සිටියි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙ නෑදැයො; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැති ඇමතිවරුන්ගෙ පන්දන් කාරයො; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ආධාර කාරයො; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ හිතවත්තු.

එපමණක් නොවෙයි, පසුගිය මැතිවරණ කාලයේදී ඇමතිවරයාගේ වුවමනාකම් උඩ ලංගමයට අයත් බස් රථ, මෝටර් රථ. ඒ වාගේම මෝටර් සයිකල් පාවිච්චි කළා. අලුත්ගම ඩිපෝවෙ "වේ බිල්" අර ගෙන බලන්න, මම කියන දේ බොරුද කියල. "ඇමතිවරයාගේ වුවමනාව උඩ නොමිලයෙ දුවවන ලදී" කියා සටහන් කර තිබෙනවා. මම කියන මේ ප්‍රකාශය වැරදි නම් ඕනෑම දඬුවමකට මම යටත් වෙනවා. ඇමතිතුමාගේ වුවමනාව උඩ, ඇමතිතුමාගේ ප්‍රයෝජනය සඳහා ලංගම බස් පාවිච්චි කළ බව, ලංගමයට අයත් මෝටර් රථ සහ වෙනත් වාහන පාවිච්චි කළ බව ඒ හිටපු ඇමතිවරයාම පිළිගන්නව ඇති. මේව නැතැයි කියන්න බැහැ. මට ඒ පිළිබඳ සෑහෙන තොරතුරු සොයා ගන්න ලැබුණා. මම දන්න, මට හිතවත් මගේ ළඟ හිටපු සේවකයින් ලංගමයෙ ඉන්නවා. [බාධා කිරීමක්] ඒ හිටපු ඇමතිවරයා ඇත් සභාවෙ ඇතත් නැතත් මේවා මතක් කර දෙන්න ඕනැ. මේ විධියෙ කරපු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

නොයෙකුත් දූෂණ නැතැයි කියා කාටවත් කියන්න බැහැ. ලංගමයේ බස් රථවලින් ගොස් බෝම්බ ගසා පොලිසියෙන් අල්ලා ගත්තෙ නැහැයි කියා ඒ අයට කියන්න පුළුවන්ද? මේ කාරණා සාක්ෂි ඇතුව ඔප්පු කරන්න පුළුවනි.

බස් ස්ටෑන්ඩ් එක සම්බන්ධයෙන් වචනයක් කියන්න ඕනෑ. ඒ අවස්ථාවේදී අගලවත්තේ මන්ත්‍රීතුමා ඇමතිවරයා විශයෙන් සිටිද්දී, නියෝග කළා මොන විධියකින් හරි බස් ස්ටෑන්ඩ් එක හදන්නය කියල. එහෙම නැත්නම් මාස හත අටක් මේ කටයුත්තට ගත වෙනව. ප්‍රසිද්ධිය ලබා ගැනීම සඳහා කොහොම හරි කරල ඉතා ඉක්මනින් විවෘත කළා. මේ විධියෙන් ප්‍රසිද්ධිය ලබා ගන්න කළ වැඩ බොහොමයක් තිබෙනව. කළුතර සමහර පාරවල් වලට තාර දමා සකස්කර තිබෙන්නෙ, ගල් නොදමා පස්වලටම උඩින්. විහාර ලේන් පාරෙ වැඩත් ඔය විධියයි. මහජන ප්‍රසාදය ලබාගන්න කඩි මුඩියේ ඔය විධියෙ වැඩ රාශියක්ම කළා. නමුත් ඇති වුණු තත්ත්වය ගැන දන්නව නෙ? මේ විධියෙන් අනන්ත අප්‍රමාණ දූෂණ ලංගමයෙන් කෙරුණා.

ගරු සභාපතිතුමනි රුපියල් විසි දහ, තිස් දහ, හතලිස් දහ, පනස් දහ. ඔය ආදී විශයෙන් වටිනා බස් රථ හය සියයක් හත් සියයක් පමණ, වේරහැර ලංගම ඩිපෝවෙ එළි මහනෙ දමා තිබෙනවා, දිරාපත් වෙන්න; විනාශ වෙන්න. හිටපු ඇමතිතුමා ඔය තරම් කාර්යක්ෂම නම් ඇමතිතුමාගෙ සේවකයින් ඔය තරම් කාර්යක්ෂම නම්, මේ තරම් වටිනා බස් රථ සංඛ්‍යාවක් දිරාපත් වෙන්න ඊට උඩින් ගස් පැලවෙන්න ඉඩ හැරියෙ ඇයි? එපමණක් නොවෙයි ටයර් නොග ගණන් දිරාපත් වෙනව. බස් රථවලට වුවමනා කරන අමතර කොටස් නොග ගණන් නාස්ති වී යනව. ඉඩම් සහ වාරි මාර්ග ඇමතිතුමාගෙ වැය ශීර්ෂය යටතෙ කථා කරන විට එක් මන්ත්‍රීවරයකු සඳහන් කළා අවුරුදු සියයකට වඩා කාලයකට අවශ්‍ය අමතර කොටස් ගෙන්වා තිබෙනවාය කියා. නමුත් මම කියන්න කැමතියි ලංගමයෙ වේරහැර ඩිපෝව පරීක්ෂා කළොත් සමහර විට රුපියල් කෝටි ගණනක් වටිනා අමතර කොටස් අද ධාවනය කරන බස් රථවලට පාවිච්චි කරන්න බැරි අමතර කොටස්, සොයා ගන්න පුළුවන් වන බව. ඔයින් සමහරක් පංචිකාවත්ත පැත්තටත් යනව. අද ධාවනය කරන්නෙ බොහොමයක්ම බෙන්ස් වර්ගයෙ, ලේලන්ඩ් වර්ගයෙ බස් රථ. නමුත් ලංගම ඩිපෝවෙ බොහොමයක් තිබෙන්නෙ, මේ රථවලට වුවමනා කරන්නෙ නැති බස් රථ අමතර කොටස්. [බාධා කිරීම්] බස් රථ දහයකට අමතර කොටස් වුවමනා කරනවා නම් ඕඩර් කරනවා බස් රථ දාහකට පමණ අවශ්‍ය අමතර කොටස්. එපමණක් නොවෙයි, මේ බස් රථවලට වුවමනා කරන අමතර කොටස් ඕඩර් කිරීම සඳහා නිලධාරීන් පොකුරු පිටින් පිට රටවලට ගියේ. ඇයි ඒ රටවල සිටින අපේ තානාපතිවරුන්ගෙ මාර්ගයෙන් මෙරට සිටින ඒ කොම්පැනි වල නියෝජිතයන්ගෙ මාර්ගයෙන්, ඒ අමතර කොටස් ලබාගත්තෙ නැත්තෙ? [බාධා කිරීමක්] ඔව් ඒ කාරණය මතක් කළ හින්ද කියන්නම්. කොමිස් ලබා ගැනීමේ අදහසින් තමයි ලක්ෂ ගණනක් වටිනා අමතර කොටස්—කිසිම අවශ්‍යතාවයක් නැති අමතර කොටස්—ලංගමයට ගෙන්නා ගත්තෙ. කොමිස් ගැහුවෙ නැත්නම් ඔය තරම් වුවමනා නැති අමතර කොටස් රුපියල් කෝටි ගණනක විය දමින් ගෙන්වන්න තිබුණු වෙන වුවමනාවක් ගැන හිතා ගන්න පුළුවන්කමක් නැහැ. ලංකා ගමනාගමන මණ්ඩලයේ වේරහැර දහස් ගණනක් දෙනා අද වැඩ කරනවා. පරීක්ෂා කර බැලුවොත් පෙනී යාවි, වැඩ ටිකයි; පඩි වැඩියි, කියන කතාව සත්‍යයක් බව. ජනසතු සේවා සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අපේ ගරු ඇමතිතුමා ඉතාමත් දක්ෂ ක්‍රීඩකයෙකු බව කවුරුත් පිළිගන්නව. එතුමා ක්‍රීඩාවලටත් දක්ෂයි. වැඩටත් දක්ෂයි. හොඳ ක්‍රීඩාශීලී ඇමතිවරයෙකු වන එතුමා ක්‍රීඩාවන්හිදී ජයග්‍රහණය කරන්නාක් මෙන් අති දක්ෂ ලෙස ජයග්‍රහණය කර මේ රටේ ජනතාවට ඉතා හොඳ සේවයක් ලබා දෙනු ඇතැයි මා අපේක්ෂා කරනව.

පසගිය ආණ්ඩුව පෙට්‍රල් සංයුක්ත මණ්ඩලයක් ඇති කළා. එයින් ලොකු සේවයක් වුණා. එහෙත් එහි කඩාකප්පල්කාරීන් ඉන්න බව ගරු ඇමතිතුමාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා මතක් කර දෙන්න කැමතියි. ඉස්සර නම් ඕඩරයක් දුන්නොත් පැය විසි හතර කින් හෝ ඊට ඉක්මනින් හෝ වැඩක් කරවා ගන්න පුළුවන්කමක් තිබුණා. අද ඕඩර යක් දුන්නොත්, දවස් හතරකින් පහ කින්වත් නොලැබෙන අවස්ථා තිබෙනවා. එයින් මහජනතාව කලකිරෙනවා. උසස් නිලධාරීන් අතින් කෙරෙනවද, වෙන අය අතින් කෙරෙනවද කියන්න දන්නෙ නැහැ. "ඇත්ත" පත්‍රය අරන් බැලුවොත් කියවන්න ලැබෙනවා, ඔන්න පෙට්‍රල් නැහැ ; බූමිතෙල් නැහැ ; මේක තමයි ජාතික ආණ්ඩුවෙ හැටි ; කාපල්ලා ඉතින් මසල වඩේ ; කාපල්ලා තෝසෙ, ආදි වශයෙන්. සමහර කඩාකප්පල්කාරී ව්‍යාපාර ජනසතු සේවා අංශවල කෙරෙන බව පෙනෙන්න තියෙනවා. පෙට්‍රල් සංයුක්ත මණ්ඩලයෙ වගේම බස් රථ සේවා අංශයෙත් එවැනි දේ කෙරෙනවා. ජනසතු කරන්න ඉස්සර කාලයේ යම් පෙට්‍රල් ගබඩාවකට ගියොත් හොඳට සලකා සේවකයින් ක්‍රියා කළ නිසා තමන් කර ගැනීමට ආ කාර්යයත් සතුටු දායක ලෙස කරවාගෙන වුවමනා නම් වාහනයට හුළං ගහගෙන ඉක්මනින් යන්න පුළුවන් තත්ත්වයක් තිබුණු බව ගරු ඇමතිතුමා දන්නවා. අද හුළංවත් නැහැ. ගබඩා දහයකට ගියොත් ඉන් එක කයි හුළංවත් තියෙන්නෙ. අනෙක් නවයෙ ම හුළං නැහැ. එපමණක් නොවෙයි, ගබඩා වට ඇතුළු වන පාරත් හදලා නැහැ. ඉතා මත් අසතුටුදායක තත්ත්වයකයි තියෙන් නෙ. ඒ නිසා ගරු ඇමතිතුමා මේ සම්බන් ධයෙනුත් සුදුසු පියවරක් ගන්නවා ඇතැයි බලාපොරොත්තු වෙනවා. මේ තරම් අසතුටුදායක තත්ත්වයක් තියෙන්නෙ කොමිස් නැතිව වැඩ කරන්න බැරිකම නිසාද දන්නෙ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඔහේට පුළුවනි නේද ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasinghe)
මට පුළුවනි. මගේ දහඩිය මහන්සියෙ නුයි මා මුදල් හම්බ කළේ. මා ඔය විදියට කොමිස් ගහලා නොවෙයි හම්බ කර ගත් තෙ. මම පගාව ගහල සල්ලි හෙව්වෙත් නැහැ. මම සවාරි ගැහැව්වෙත් නැහැ ඔය විදියට. වෙන එකක් තබා මට ස්විට්සර් ලන්තයේ බැංකුවල සල්ලිත් නැහැ. රුපියල් පන්සියයෙනුයි මා වැඩ කරන්න පටන් ගත්තෙ. මා තුන් විතාවක්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට පත් වුණා. අදත් මා ජීවත් වන්නෙ එයින්මයි, තමුන්නාන්සෙලාගෙ ආණ්ඩුව කොයි තරම් ජනසතු කළත්.

අ. භා. 7

වෘත්තීය සමිති සම්බන්ධයෙනුත් වචන යක් දෙකක් කියන්න ඕනෑ. පසුගිය ආණ්ඩුව පැවති කාලයේ එක්සත් ජාතික පක්ෂයේ ජාතික සේවා වෘත්තීය සමිතිය කීප වරක්ම එවකට හිටපු ඇමතිතුමා ප්‍රතික්ෂේප කළා. එදා එක්සත් ජාතික පක්ෂයේ වෘත්තීය සමිතියකට ලංගමයේ ඉඩක් තිබුණේ නැහැ. ඒ නිසා එදා රහසේ හැංගිලා දේශපාලන කටයුත්තක් තිබුණා නම් අප්‍රසිද්ධියේ තමයි කරගෙන ගියේත්. අද එක්සත් ජාතික පක්ෂයේ වෘත්තීය සමිතියට නියමිත වරප්‍රසාද ලැබී තිබෙන අතර අනෙකුත් වෘත්තීය සමිතිවල වැඩත් කඩාකප්පල් නොකරන බව මතක් කරන්න කැමතියි.

පළාත් පාලන ආයතනයක නගරාධිපති වරයෙකු හැටියට මා එක් ඉල්ලීමක් කරන්න කැමතියි, අපේ ජනසතු සේවා සහ ක්‍රීඩා කටයුතු භාර ගරු ඇමතිතුමා ගෙන්. දෙහිවල-ගල්කිස්ස ප්‍රදේශයේ 1,25,000 ක ජනගහණයක් ඉන්නවා. එයින් අවම ගණනේ 50,000 ක් 60,000 ක් පාසැල් යනවා. අපට ක්‍රීඩා භූමි නැහැ.

**විජේතුංග මයා.**
*(திரு. விஜேதுங்க)*
(Mr. Wijetunga)
නුවරඑළියේ තියෙනවා.

**එස්. ද එස් ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasinghe)
ඔව්, නුවරඑළියේ ක්‍රිකට් ගහපු අයත් ඉන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රී තුමනි, අපේ ප්‍රදේශයේ ඉඩම් මිළ ඉතාමත්ම අධිකයි. අද දෙහිවල-ගල්කිස්ස ප්‍රදේශයේ පර්චස් එකක් රුපියල් 1,000ක් පමණ වෙනවා. මේ තත්ත්වය නිසා පළාත් පාලන ආයතනයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

අක්කර දෙක තුනක ඉඩමක් ගන්න මුදල් නැහැ. මේ විධියේ කාර්‍ය්‍යයකට ඉඩමක් ගන්න මහා ආණ්ඩුවෙන් පළාත් පාලන ආයතනවලට ණයට මුදල් දෙන්නෙ නැහැ ; මහා ආණ්ඩුවෙන් ණය දෙන්නෙ මුදල් උපයන කටයුතුවලට පමණයි. මේ තත්ත්වය නිසා අද අපේ ප්‍රදේශයේ ක්‍රීඩා පිටියක් පිහිටුවීමට පුළුවන් කමක් නැහැ. ඒ නිසා සුදුසු ස්ථානයක, මුළු ප්‍රදේශයේම මහ ජනතාව සඳහා, පාසැල් දරුවන්ට වාගේම මහජනතාවටත් සුදුසු වන විධියේ ක්‍රීඩා පිටියක් දෙහිවල-ගල්කිස්ස ප්‍රදේශයේ පිහිටුවන මෙන් මා ජනසතු සේවා ඇමතිතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ජනසතු සේවා ඇමතිතුමා මේ අමාත්‍යාංශය භාර ගත්තාට පසුව දැන් නැව් පෝලිම් නැතිව ඉතාමත් හොඳින් වරායේ කටයුතු කරගෙන යනවා. ඒ සම්බන්ධයෙන් අපේ පක්ෂය පමණක් නොවෙයි, මුළු ලාංකික ජනතාවම එතුමාට ස්තුති කරනවා. දැනටමත් ජනප්‍රියවී සිටින එතුමා වරාය ශුද්ධ කළා වාගේම ලංකා ගමනාගමන මණ්ඩලයත් පෙට්‍රල් සංයුක්ත මණ්ඩලයත් ශුද්ධ කර ජනප්‍රිය සේවාවක් මහජනතාවට සැලැස්වීමෙන් එතුමාට තවත් ජනප්‍රියවීමට අවස්ථාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසාන කරනවා.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
**(Mr. L. C. de Silva)**

ගරු කථානායකතුමනි, ජනසතු සේවා ඇමතිතුමාගේ වැය ශීර්ෂ සම්බන්ධ සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මටත් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම ගැන ඇත්ත වශයෙන්ම සන්තෝෂ වෙනවා. ජනසතු ව්‍යාපාර ආරම්භ කළ හැම අවස්ථාවකදීම ඒවාට විරුද්ධවූ කටවලින්ම අද ජනසතු ව්‍යාපාරවල වර්ධනය පිළිබඳව ප්‍රශංසා මුඛයෙන් කථා කරනවා අසන්නට ලැබීම අපට සන්තෝෂයට කාරණයක්.

මේ සාකච්ඡාවේදී අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාගේ (අනිල් මුණසිංහ මයා.) කථාවට පසුව කථා කළ පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ කථාවෙන් අප බලාපොරොත්තු වුණේ අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අභියෝගයට පිළිතුරක්. නමුත් පළාත් කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා ඒ අභියෝගයට පිළිතුරක් දෙන්න උත්සාහයක් නොදරා නිකම් මඩ ගැසීමට තැත් කළ බවයි අපට පෙනුණේ. එතුමා "ඩේලි නිව්ස්" පත්‍රයේ වාර්තාවක් මේ ගරු සභාවේ කියෙව්වා. ඒක එක්සත් ජාතික පාක්ෂික අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු විසින් කරන ලද පරීක්ෂණයක් ගැන පළ කර තිබෙන වාර්තාවක්. ඒ වාර්තාව මේ ගරු සභාවේ කියවීමට ප්‍රථමයෙන්, ගරු මන්ත්‍රීතුමාට ඒ ගැන ප්‍රකාශයක් කරන්නට අවස්ථාවක් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් දිය යුතුව තිබුණා. ඒ කෙසේ වෙතත් අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා කළ අභියෝගයට පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් වත් ඊට පසුව කථා කළ දෙහිවල-ගල්කිස්ස ගරු මන්ත්‍රීතුමාගෙන්වත් (එස්. ද එස්. ජයසිංහ මයා.) පිළිතුරක් ලැබුණේ නැහැ.

අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අභියෝගය මෙයයි: "නමුන්නාන්සේලාගේ රජය බලයට පත්වූවාට පසුව ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන්ගෙන් දේශපාලන පළිගැනීම් කර තිබෙනවා ; නමුන්නාන්සේලාගේ පක්ෂයේ සම්බන්ධකම් උඩ ලංකා ගමනාගමන මණ්ඩලයේ පත්වීම් දී තිබෙනවා : මෙසේ සඳහන් කර, අගලවත්තේ මන්ත්‍රීතුමා කියා සිටියා, එතුමා ඇමතිවරයා හැටියට ක්‍රියා කළ කාලයේදී එවැනි එකම පත්වීමක්වත් දුන්නේ නැත, එවැනි එක ස්ථාන මාරුවක්වත් එතුමා නොකළාය කියා, ඒකයි අභියෝගය. බේරුවල ගරු මන්ත්‍රීතුමාත් තම කථාව ආරම්භයේදී කිව්වා පිළිතුරක් දෙනවාය කියා. පිළිතුරක් දේවිය කියා අපිත් බලාගෙන සිටියා. නමුත් එතුමාවත්, දෙහිවල-ගල්කිස්ස ගරු මන්ත්‍රීතුමාවත් පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාවත් ඒකට පිළිතුරක් නොදී බේරෙන්නට ලෑස්ති වුණා. ගුරුවරුන් ළඟට මේ ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන් නමුන්නාන්සේලාගේ දඩයමට භාජන වන බව මා කල්පනා කරනවා. එයිනුත් අගලවත්ත කොට්ඨාශයේ ලංගම සේවකයන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොම්මර එකට දමා තිබෙනවා. ඊළඟට මගේ කොට්ඨාශයේ එනම් බලපිටිය කොට්ඨාශයේ ලංගම සේවකයන් නොම්මර දෙකට දමා තිබෙනවා. ඒකට හේතුව සමහර විට ලංකා ගමනාගමන මණ්ඩලයේ වර්තමාන සභාපතිතුමා—මීට කලිනුත් එතුමා සභාපති වශයෙන් පත් කර තිබෙනවා—මගේ කොට්ඨාශයේ කෙනෙකු නිසා වෙන්න ඇති. සමහර විට ගරු ඇමතිතුමා මේවා ගැන නොදන්නවා වෙන්න පුළුවනි. අපේ කොට්ඨාශවල ලංගම සේවකයන්, අවුරුදු 57ක් වයස්වූ පියදුරන්, අද යාපනේට මාරු කර යවා තිබෙනව. මේ වගේ පලිගැනීම් සාධාරණද කියා මම ගරු ඇමතිතුමාගෙන් අහනව. එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනය ගැන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් බොහොම උදන් ඇනුවා. සවදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා පෝය දින නිවාඩුව ගැන හේම උදන් ඇනුවා. පලි නොගන්න බව සඳහන් කළොත් ඔය මැතිවරණ ප්‍රකාශනයෙම තමයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
පලි ගත්තේ නෑ, මාරු කළා.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)
තමුන්නාන්සේලාගේ රජය බලයට පත් වුණාට පසු දිගට හරහට පලිගැනීම් කරන්නට පටන් ගත්තා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
යාපනය අපේ නොවෙයි නෙ.

**එල් සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)
තමුන්නාන්සේලාගේ තමයි. මෙම සේවකයා දෙමළ ප්‍රදේශයට යැව්වාය කියන එක නොවෙයි මම අදහස් කරන්නෙ. යාපනය තරම් දුර බැහැර ප්‍රදේශයකට යැවූ බවයි මම කියන්නෙ. මේ රජය බලයට පත් වුණාට පසු [බාධා කිරීම්]—

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)
Order, Please! Will the hon. Member please address the Chair? Then there will be less trouble from that side.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)
I think you should ask them not to disturb me.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)
They are not addressing me. You are addressing the Chair.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)
මේ රජය බලයට පත් වුණාට පසු ගත වුණු මාස 5 ඇතුළත, ඔවුන් මැතිවරණ කාලයේදී මහජනතාවට දුන් පොරොන්දු එකක්වත් ඉෂ්ට කරන්නට බැරි වුණු නිසා (බාධා කිරීම්) දැන් මේ වගේ පලිගැනීම් වලින් ඔවුන්ගේ සගයින් තෘප්තියට පමුණුවා ගන්නවා. ඒකයි දත් කෙටීගෙන යන්නෙ. ලංගමයෙන් ඉල්ලා අස්වුණු එක්සත් ජාතික පක්ෂයේ හිතවතකුට රක්ෂාව දුන් හැටි යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා මයා.) පෙන්වා දුන්නා. කිසිම කරුණක් නැතිව ලංගම සේවයෙන් අස් කර දැමූ මගේ කොට්ඨාශයේ කෙනකුට රක්ෂාව ඉල්ලලත් නොදීම ගැන මම කණගාටු වෙනවා. ගරු ඇමතිතුමාගේ දැනගැනීම සඳහා මම ඒ විස්තරය ඉදිරිපත් කරනව.

මේ සේවකයාගේ නම විජේසේකර. ගම කොස්ගොඩ. ඔහු ලංගමයේ කොන්දොස්තර කෙනකු වශයෙන් වැඩ කළා. මේ තැනැත්තාට සිදු වුණේ ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයකට මුහුණ පාන්නටයි. 1960 ජූලි මැතිවරණයේදී මොහු එක්සත් ජාතික පක්ෂයෙන් බලපිටිය ආසනය තරඟ කළ වී. පී. ද සොයිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. සී. ද සිල්වා මයා.]

මහත්මයාට සහයෝගය දුන්නා. ඒ මැතිවරණයෙන් බලපිටිය ආසනය ජය ගෙන මෙම ගරු සභාවට පැමිණි මන්ත්‍රීතුමා ලංගමයේ වර්තමාන සභාපතිතුමාගේද ආධාරය ඇතුව මෙම සේවකයා වැලිමඩට මාරු කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ආණ්ඩුව නොවෙයිනේ මාරු කරන්නෙ.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல் சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

ආණ්ඩුව නොවෙයි මාරු කරන්නෙ, ලංගමයේ සභාපති මහතා. මේ සේවකයා, මාරු කිරීම අනුව, වැලිමඩට ගිහින් එහි වැඩ බාරගෙන රක්ෂාව කරගෙන යන අතර අසනීප වී ගමට ගියා. ගමට ගොස් විසින් වර වෛද්‍ය සහතික ඉදිරිපත් කළා. නමුත්, නොයෙකුත් බලපෑම් උඩ ඩිපෝ කළමනාකරු ඒ වෛද්‍ය සහතික වලට නිවාඩු දීම නතර කර, ඒවා ලැබුණේ නැතැයි කියා, මෙම සේවකයා රක්ෂාවෙන් දොට්ට දැම්මා. මොහු එක්සත් ජාතික පක්ෂයේ තරුණ සමිතියක සාමාජිකයෙක්. එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයාට සහයෝගය දුන් නිසයි මොහුට මෙම අතවරයට මුහුණ පාන්නට සිදු වුණේ. මේ මනුෂ්‍යයාට නොයෙක් කරදර කළ ඒ හිටපු මන්ත්‍රීවරයාට පසුගිය මැතිවරණයේදී සහයෝගය දීමට ඔහු ඉදිරිපත් වුණේ නෑ, පක්ෂයෙන් නියෝග කළත්. අදත් මේ තැනැත්තාට රක්ෂාව ලැබී නැති බව මම ගරු ඇමතිතුමාට මතක් කරනවා. මොහුට රක්ෂාව දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇතත්, මේ දක්වා ඒ ගැන කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම ගැන මම කණගාටුව ප්‍රකාශ කරනවා. ගරු ඇමතිතුමා පෞද්ගලික වශයෙන් මේ ගැන තම අවධානය යොමු කොට මේ මනුෂ්‍යයාට රක්ෂාව දිය යුතුනේද කියා කල්පනා කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, බස් ධාවන මාර්ග ගැනද ප්‍රශ්නයක් තිබෙනවා. බස් සේවා ඇති කළ හැකි, ඇති කළ යුතු මාර්ග කීපයකම තවම එය ඇති කරන්නට බැරි වී තිබෙන බව ගරු ඇමතිතුමාද පිළිගන්නවා ඇති. සියලුම මාර්ගවල එක වරම බස් සේවා ඇති කළ නොහැකි බව අපිද පිළිගන්නවා. නමුත්, මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ කිසියම් මාර්ගයක බස් සේවාවන් ඇති කරන විට විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අදහස් විමසන ලෙසයි. ඒ මගින් අපට කියන්න පුළුවන් අපේ කොට්ඨාශවල කුමන සේවයකටද ප්‍රමුඛස්ථානය දිය යුතු කියා.

ලංගම බස් රථ පෞද්ගලික ගමනාගමනයට—private hire—සඳහා දීම සාමාන්‍ය වශයෙන් නතර කරගෙන යන බව පෙනෙනවා. තමුන්නාන්සෙලා දේශපාලන කටයුතු හා සම්බන්ධ ගමනාගමනයට දෙන්නෙ නැත කියනවා නම්, ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් සාමාන්‍ය මහජනයාගේ ගමන් බිමන්වලට බස් දිය යුතුය කියා අපි යෝජනා කරනව. මම දන්නවා පසු ගිය දවසේ දොඩම්පහළ කවිධජ ස්වාමීන් වහන්සේගේ ආදාහනය දවසේ අම්බලන්ගොඩ ජනතාවට බස්වලින් ගමන් කිරීමට බැරි වුණ බව.

**වෙලගෙදර මයා.**
*(திரு. வெலகெதர)*
(Mr. Welagedera)

එදා විශෙෂ බස් දැම්මා.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

ඔවුන්ට වුවමනා කෙළේ හැතැප්මක් පමණ නගරයට එන්නෙ නැතුව ඒ උදවියගෙ ගම්වලට බස් ගෙන ගොස් නැගයන්නයි. ඒ නිසා එවැනි වරප්‍රසාද කිසිම විධියකින් නැති කරන්න එපාය කියා මම ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊ ළඟට දෙහිවල-ගල්කිස්ස මන්ත්‍රීතුමා (එස්. ද එස්. ජයසිංහ මයා.) චෝදනාවක් නැඟුවා අමතර කොටස් ගැන. බස් රථ හිමියෙක් හැටියට එතුමා ක්‍රියා කළ කෙනෙක් නිසා මේ කරුණු ගැන එතුමා මට වඩා හොඳින් දන්නවා ඇති. බස් රථවල අමතර කොටස් ලංගමයට ගෙන්වන්න ඇත්තේ එහි නිලධාරීන්ගෙ නිර්දෙශ අනුවයි. ඇත්ත වශයෙන්ම අනවශ්‍ය අමතර කොටස් ලංගමයට ගෙන්වා ඇති බව අපත් පිළිගන්නව. එමෙන්ම අප කියන්නෙ වුවමනාවට වඩා අමතර කොටස් ගෙන්වීමට ක්‍රියා කළ නැනැත්තන්ටම නැවතත් පාලනය දීම වැරදි බවයි. ඒ හිටපු සභාපතිවරයාම—අනවශ්‍ය අමතර කොටස් ගෙන්වූ සභාපතිවරයාම—නැවතත් පත් කළ විට ඒකම නොවේද සිද්ධ වෙන්නෙ? මම හිතන්නෙ නැහැ ඇමතිතුමාටවත්, උප ඇමතිතුමාටවත් පුළුවන්ය කියා එතැනට ගිහින් අහවල් අමතර කොටස් ඕනැය කියා ලැයිස්තු හදන්න. ඒ නිසා මම අවවාද කරනවා ටිකක් ප්‍රවේසම් වෙන්නය කියා. මේ විරුද්ධ පාර්ශ්වයේ සිටින මන්ත්‍රීවරුන්ට ඔය පැත්තේ සිට මේ පැත්තට එන්න සිද්ධ වුණේත් ඔය විධියේ පාලන කටයුතු නිසයි. මේ විධියට දිගින් දිගට කළොත් තමුන්නාන්සේලාටත් ඒ ටිකම වේවි.

අ. භා. 7.15

ගාලු වරායේ වැඩ ගැනත් ගරු ඇමතිතුමාට කරුණු කීපයක් පෙන්වා දෙන්න තිබෙනව. ගාලු වරාය සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී ස්වදේශ කටයුතු ඇමතිවරයා හැටියට සිටින ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා ඒ වැඩ පිළිවෙළ නිසා ඇතිවන රැකියාවල් සියල්ලම සම්පූර්ණයෙන්ම ගාලු මැතිවරණ කොට්ඨාශයටම සීමා කර ගෙන තිබෙනව. මෙය සාධාරණය කියා ගරු ඇමතිතුමා පිළිගනීවියයි මම හිතන්නෙ නැහැ. මම රැකීරක්‍ෂා කාර්යාලයට යෝජනා කර තිබෙනව, ගාල්ල මැතිවරණ කොට්ඨාශයේ උදවිය පමණක් නොව, ගාලු දිස්ත්‍රික්කයේම උදවිය ඒ රක්ෂාවල් සඳහා ඉදිරිපත් කරන්නය කියා. මා පමණක් නොවෙයි, මම හිතනව, ගාලු දිස්ත්‍රික්කයේ සිටින සියලුම ගරු මන්ත්‍රීවරුන් මගේ ඒ යෝජනාව අනුමත කරනවා ඇත කියා. ඇත්ත වශයෙන් ගාලු වරායේ ඇති රක්ෂා මුළු ගාල්ල දිස්ත්‍රික්කයේම බෙදා හැරීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. සමහර විට ගාලු වරාය දියුණු කිරීමේ වැඩ පිළිවෙළ යටතේ තමන්ගේ සාමාන්‍ය රැකියාවල් අහිමි වී ගිය ගාලු නගරයේ උදවියට වෙනම සැලකිල්ලක් දැක්වීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් සියලුම රක්ෂා ගාල්ලට පමණක් සීමා කිරීම ගැන නම් අපි විරුද්ධ විය යුතුයි. ඒ ගැන ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු වේය කියා මම කල්පනා කරනව.

ඊ ළඟට කියන්නට තිබෙන්නෙ තමුන්නාන්සේගේ භාරයට පත්ව ඇති අළුත් අංශය ගැනයි. ක්‍රීඩා අංශය ගැනයි. මා පාසල් යන කාලයේ සිටම ක්‍රීඩාවට තමුන්නාන්සේ තුළ තිබෙන දක්ෂකම ගැන හොඳට දන්න කෙනෙක්. ක්‍රීඩාවන් ආරම්භ කළ යුත්තේ ගම්බද පළාත්වලින් බව—ගම්බද පාඨශාලාවලින් බව—යටියන්තොට ගරු මන්ත්‍රීතුමා පෙන්වා දුන්න. තමුන්නාන්සේලා අපි පාසල් යන අවධියේ ක්‍රීඩා තිබුනේ කොළඹ විද්‍යාලවල පමණයි. පසුගිය අවුරුදු කීපය තුළ ගම්බද පාසල්වලත් ක්‍රීඩා අංශයෙන් යම් තරමක දියුණුවක් ඇති වෙලා තියෙනව. අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලය පසුගිය අවුරුදු කීපය තුළ බැඩ්මින්ටන් ක්‍රීඩාවෙන් විශේෂ තැනක් ලබා ගත් බව ගරු ඇමතිතුමා දන්නව ඇති. ඇත්ත වශයෙන් අවුරුදු කීපයක්ම මුළු ලංකාවේ බැඩ්මින්ටන් ශූරතාව දිනා ගැනීමට ඒ විද්‍යාලයට පුළුවන් වුනා. නමුත් දැන් අවුරුදු දෙකක සිට එම විද්‍යාලයේ ඒ ක්‍රීඩාව සම්පූර්ණයෙන්ම නවත්වා තිබෙනව. පාසල් පාලනය තමුන්නාන්සේගේ අංශයට යටත් නැති වුනත් මේ කරුණ ගරු අධ්‍යාපන ඇමතිතුමාට පෙන්වා දීමට තමුන්නාන්සේට අයිතියක් තියෙනව.

ගරු සුගතදාස
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)

ඇයි එහෙම නවත්වා තිබෙන්නේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එල්. සී. ද සිල්වා මයා.
*(திரு. எல் சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

කිසිම හේතුවක් නැතිව ඒ විද්‍යාලයාධිපතිවරය ඒ ක්‍රීඩාව සම්පූර්ණයෙන් නවත්වා තිබෙනව. මේ වර්ෂයට ළමයින් ඇතුළත් කරලත් නැහැ. ඒ ගැන ලියන ලද විශාල ලිපියක් දවස් කීපයකට පෙර "ඩේලිනිවුස්" පත්‍රයෙත් පළ වී තිබුන. ඒ නිසා ඒ ගැනත් තමුන්නාන්සේගේ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනව. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේ ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න ඕනැ, පාසල්වල ක්‍රීඩා අංශය දියුණු කිරීමට පියවර ගත යුතු බවට විදුහල්පතිවරුන්ට විශේෂ නියෝගයක් කරන්නය කියා.

ගරු සභාපතිතුමනි. දෙහිවල-ගල්කිස්සේ ගරු මන්ත්‍රීතුමා නගරාධිපතිවරයකු හැටියට කළ ඉල්ලීම, පළාත් පාලන ආයතනයක සභාපතිවරයකු හැටියට මමත් අනුමත කරනව. පළාත් පාලන ආයතන මගින් පාලනය වන පළාත් බොහොමයකටම ක්‍රීඩා භූමි ඇත්තෙ නැහැ. අපට මුහුණ පාන්නට සිදු වී තිබෙන ප්‍රශ්නය නම් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා දෙන දීමනාව ඉතාමත්ම සුළු එකක් වීමයි. ඒ මුදලින් ක්‍රීඩා භූමිවලට අවශ්‍ය දේ සැපයීමට අපට පුළුවන්කමක් නැහැ. ඒ නිසා තමුන්නාන්සේගේ මේ වැය ශීර්ෂයට වෙන් කර තිබෙන මුදල මදි නම් අතිරේක වැය ශීර්ෂයක් මගින් මුදල් ලබගෙන හෝ ඒ මුදල ගම්බද පළාත්වලටත් බෙදී යන පිළිවෙළට යම් කිසි ක්‍රමයක් යොදවන මෙන් මම ඉල්ලා සිටිනව.

ලංගමයේ රක්ෂා දීම පිළිබඳවත් වචනයක් කිව යුතුව තිබෙනව. ඒ කාලයේදී සුදුස්සන්ට ඔවුන්ගේ සුදුසුකම් උඩ රක්ෂා දුන් බවත්, කුසපත් ඇදීමෙන් ඡන්ද කොට්ඨාශ අනුව කොන්දොස්තර තනතුරුවලට පත්වීම් දුන් බවත් අගල වත්තේ ගරු මන්ත්‍රීතුමා පෙන්වා දුන්න. ගරු ඇමතිතුමත් ඒ ක්‍රියා මාර්ගය එසේම අනගමනය කරනවද එසේ නැතිව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන නම් ලැයිස්තු අනුව පත්වීම් දෙනවද කියා ගරු ඇමතිතුමාගේ පිළිතුරු සභාවේදී ප්‍රකාශයක් කරන ලෙස අපි ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනව. ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ මන්ත්‍රීතුමාගේ ලියමන "ඇත්ත" පත්‍රයේත් පළ වුනා. පත්වීම් දෙන්නේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත්, ආණ්ඩු පක්ෂයේ පරාජිත අපේක්ෂකයිනුත් එවන නම් ලැයිස්තු අනුවද කියා ප්‍රකාශයක් කරන ලෙස අපි ඉල්ලා සිටිනව. එදා අම්බලන්ගොඩ මන්ත්‍රීතුමාගේ ලියමන "ඇත්ත" පත්‍රයේ පළ වුණු දවසෙම එක්තරා කාරණවක් ඉටු කරන්නය කියා ලංගම අධ්‍යක්ෂ ධම්පාල මහත්මයා ලංගම සභාපති ආර්. ටී. ද සිල්වා මහත්මයාට ලියපු තවත් ලියුමක් පළ වුනා. අම්බලන්ගොඩ මන්ත්‍රීතුමාගෙ හැඟීමක් තියෙනව, ඒ ලියමන පිට වුණේ අම්බලන්ගොඩ තැපැල් කාර්යාලයෙන්ය කියා. ඒ ලියමන අම්බලන්ගොඩ තැපැල් කාර්යාලයෙන් පිට වුනා නම්, ධම්පාල මහත්මයා. ආර්. ටී. ද සිල්වා මහත්මයට ලිවූ ලියමන පිට වන්නට හැටියක් නැහැ. ඒ නිසා ඒ වැරදි හැඟීම නැති කර ගන්නා ලෙස මම අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනව. මේ රජය ගෙන යන්නට බලාපොරොත්තු වන වැඩ පිළිවෙළට විරුද්ධ උදවිය සමහර විට හැම කාර්යාලවලම ඇති.

ඒ උදවියට ඒ ලියමන "ඇත්ත" පත්‍රයට දෙන්ට පුළුවන්කමක් ඇති. මා හිතන්නෙ නැහැ, තමුන්නාන්සේගේ ලියමන අම්බලන්ගොඩ තැපැල් කන්තෝරුවෙන් විවෘත කළා කියා. තමුන්නාන්සේගේ ලියමනේ මොනවා තිබෙනවාදැයි තැපැල් කන්තෝරුවේ උදවිය දන්නෙ නැහැ. මා එසේ කියන්නෙ තැපැල් කන්තෝරුවේ යම්කිසි නිලධාරියෙක් බේරන්නට සිතාගෙන නොවෙයි. [බාධා කිරීමක්] තමුන්නාන්සේ සැක කරන නිලධාරීන් එදා තැපැල් කාර්යාලයේ වැඩ කළේ නැහැ. මා මේ කරුණු කියන්නෙ තමුන්නාන්සේ තුළ තිබෙන වැරදි හැඟීම නැති කරන්ටයි. කෙසේ වෙතත් ඒ මන්ත්‍රීතුමාට හිතට අමාරු ඇති. එතුමා රහසේ යැවූ ලියමනක් එළිදරව්වීම ගැන. රක්ෂාවල් නැති තුන්-හාර දහක් සිටින ඡන්ද කොට්ඨාශයකින් දහ දෙනෙකුගේ නම් ඒ විධියට යැව්වාම ඒක මන්ත්‍රීතුමාට විසඳාගන්නට බැරි ප්‍රශ්නයක් වෙනව. අනික් මිනිස්සුත් ඊට පසුව එතුමාගෙන් ඉල්ලයි, මේ විධියට ඔවුන්ගේ නම් සඳහන් කර ලියුම් යවන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා. ගරු මන්ත්‍රීතුමාට ඒ ගැන කොයි තරම් හිතට අමාරු වුණත් මේක පිටවුණු තැන හරියාකාර හොයා ගන්ට ඕනෑ. එදා එකම පත්‍රයේම ලියුම් දෙකක් පළ වී තිබුණ. සමහරවිට පාර්ලිමේන්තු ලේකම් වරයා තමුන්නාන්සේට කියන්ට ඇති මේක අපේ කාර්යාලයෙන් නම් ගියේ නැත කියා.

වෛද්‍යාචාර්ය සද්ධාසේන
(வைத்திய கலாநிதி சத்தாசேன)
(Dr. Saddhasena)
අපට ඒක විනෝදයට කාරණයක්.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல் சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)
හොඳයි කමක් නැහැ; අපටත් විනෝද යක් ඒක. ලංගමය රක්ෂා දෙන්ට බලා පොරොත්තු වෙන්නෙ, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත්, ආණ්ඩු පක්ෂයෙන් මැති වරණයට ඉදිරිපත්ව පරාජය වුණු අපේක්ෂ කයනුත් එවන ලියුම් අනුවද, නැත්නම් සුදුසුකම් ඇති උදවියටද කියා, ගරු ඇමති තුමාගෙන් අපට දැනගන්ට වුවමනා කරනව. කොන්දොස්තර තනතුරු වැනි පත්වීම් සුදුස්සන්ට කුසපත් ඇදීමේ ක්‍රම යට දෙනවද කියන එක මා දැනගන්ට කැමතියි. [බාධා කිරීමක්] ඒ වගේ චෝදනා තමුන්නාන්සේලා වෙන ඕනෑ කෙනෙකුට කරන්ට; අපට කරන්ට පුළුවන්කමක් නැහැ. මම මේ සම්බන්ධයෙන් මීට වඩා කාලය ගන්ට බලාපොරොත්තු වෙන්නෙ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, තව එක කරු ණක් පමණක් සඳහන් කරන්ට ඕනෑ. දැන් අවුරුදු ගණනාවක සිට ඇල්පිටියේ සිට ඌරගස්මංහන්දිය හරහා කොළඹ දක්වා බස් සේවයක් ආරම්භ කරන්ට යයි ඉල්ලී මක් කරන නමුත් එය මෙතෙක් ඉටු වී නැහැ. ඒ ප්‍රදේශය දැන් ශීඝ්‍රයෙන් දියුණුවී ගෙන එන ප්‍රදේශයක්. අද ඒ උදවිය කොළඹ එනව නම්, අළුත්ගමට වෙනත් බස් රථයකින් ඇවිත් කොළඹ එන බස් රථයකට නගින්ට ඕනෑ. නැත්නම් අම්බලන්ගොඩට වෙනත් බස් රථයකින් ඇවිත් කොළඹ එන බස් එකකට නගින්ට ඕනෑ. අද ඒ පාර බස් ධාවනය කිරීමට සුදුසු තත්ත්වයක තිබෙනව. පසුගිය දිනවල මා මේ කාරණය ඉදිරිපත් කළ අවස්ථාවේදී කිව්ව, අළුත් බස් ආව හැටියෙ ඒ මාර්ගයට බස් රථයක් ලබා දෙනව කියා. පුළුවන්තරම් ඉක්මණින් උදේට ඇල්පිටියේ සිට ඌරගස්මංහන්දිය හරහා කොළඹ එන්ටත්, හවස ආපසු ඒ මාර්ගයේම ඇල් පිටිය දක්වා යන්නටත් බස් සේවයක් ආරම්භ කරන මෙන් ඉල්ලා සිටිමින් මගේ වචන සවල්පය අවසාන කරනවා.

එම්. එම්. මුස්තාෆා මයා. (සමාජ සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(ஜனாப் எம். எம். முஸ்தபா—சமூகசேவை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. M. M. Mustapha—Parliamentary Secretary to the Minister of Social Services)
I shall be very brief. If there is any part of the country which has suffered great inconvenience in the matter of transport services I should say it is the Batticaloa and Kalmunai Districts. What happened was——

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
They boycotted "Sri" buses.

මුස්තාෆා මයා.
(ஜனாப் முஸ்தபா)
(Mr. Mustapha)
In 1958 the Federal Party launched what was called the "Anti-Sri Campaign" which naturally provided the last regime with a glorious excuse not to send any new buses to the Eastern Province. The only buses which operated in the Eastern Province, particularly in the Batticaloa and Kalmunai Districts, were unserviceable buses which were of no use to other parts of the country. I find that the position has considerably eased now and even Jaffna is getting double-decker buses without a protest. I suppose these buses are running with "Sri" numbers. I do not grudge that because after a long time the Northern Province is entitled to get good buses, new buses and even double-deckers.

In the Kalmunai District you will find in the mornings, evenings and during busy hours of the working day, these old buses parked on

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the roadside like tortoises. It is a sight to see. Even school children have to suffer thereby because we do not have educational facilities as in other parts of the country. The children, both boys and girls, have to come from distances of 4 or 5 or 6 miles to the bigger schools. Sometimes they have to wait for three or four hours for a bus and go back home as there is no bus. So I would request the Hon. Minister of Nationalized Services to see that the chairman or some responsible officer visits Kalmunai and Akkaraipattu areas with a view to finding out the needs of those areas with regard to the bus services. I am very grateful to the Hon. Minister of Nationalized Services because he tells me that he himself will visit the area.

The other matter is somewhat of a more important nature. It is about the price of petroleum products. I think the prices of these articles were fixed at a time when the private sector enjoyed a monopoly of the import and distribution of petroleum products. I take as an illustration the price of petrol. In Colombo, a gallon of petrol—" Super-petrol "—is Rs. 3.30. But in Kalmunai, a gallon costs Rs. 3.61 ; that is, 31 cents more on every gallon of petrol.

Today, the Government enjoys a monopoly in the import and distribution of petrol. I can understand a private company importing petrol and charging various rates in different parts of the country. They have their headquarters in Colombo and they can afford to distribute the petrol to consumers in Colombo without adding any transport charges. But when Government is in charge of the import of petrol, it is in duty bound to distribute it to everybody at a uniform price, because, I believe, Government exists to the same degree in Colombo as in any other part of the country. Its existence is felt uniformly throughout the length and breadth of this country. It is not the fault of the person living in Kalmunai that he does not live in Colombo. Everybody cannot live in Colombo.

What happens now is that the corporation passes on the transport charges to the consumers. I have gone into this matter very carefully. I say it is immoral, it is wrong for the Government or the Petroleum Corporation to do this. Just imagine our cost of living being higher than that in Colombo. The price difference prevails not only with regard to petrol or kerosene. The position is the same with regard to several other items like maldive fish and, what is worse, even rice.

A measure of rice is supposed to be sold at 25 cents. If the Government dares to increase the price of rice by even two cents, there will be a terrible uproar in the country. But do you know that in Kalmunai we pay 29 cents for a measure of rice ? What is worse, that rice is grown in Batticaloa ; it is bought by Government in Batticaloa and sold to the consumers in Batticaloa at 4 cents more than the price at which it is sold to the consumer in Colombo. I will come to that aspect of the matter when I deal with the Votes of my Hon. Friend the Minister of Commerce and Trade.

ප. භා. 7.30

However, I would like to pin-point this problem to show the entire incompatibility of this whole system. There is a history to this. One can understand the Esso Company or the Shell Company doing this because they had their headquarters in Colombo. The distributors in Kalmunai bought the petrol in Colombo at prices prevalent in Colombo and they had to bear the transport charges. Now the import and distribution of petroleum products has been nationalized and the Petroleum Corporation enjoys a monopoly. Therefore, the corporation must distribute petrol, kerosene and diesel —whatever products they import—to everybody throughout the length and breadth of Ceylon at the same price.

In other words, petrol must be sold throughout the country at Rs. 3.45 a gallon—or whatever price is fixed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The Colombo man too should have to bear transport charges. It is wrong to split the c.i.f. price, the net price, or gross price or whatever it is among certain consumers. What matters is the price at which it is sold. We cannot make a difference between the Colombo consumer and the consumer in Hambantota. This may be a new idea but it is an idea to which the Hon. Minister should give serious consideration.

More than 80 or 90 per cent. of the people live in the provinces but there is a greater consumption of petrol and kerosene in Colombo so that, in the final analysis, I think, the corporation will not suffer though, of course, the people in Colombo will have to pay a little more than what they are paying now. But they will be paying the same price that everybody else pays and that is perfectly fair.

**තුඩාවෙ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ජනසතු සේවා අමාත්‍යාංශය යටතේ ඇති වැය ශීර්ෂ සාකච්ඡා කෙරෙන අවස්ථාවේදී විරුද්ධ පැත්තේ ගරු මන්ත්‍රීවරුන් විසින් මතු කරන ලද යම් යම් ප්‍රශ්න සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දුන් පිළිතුරු අනුව පෙනී යන්නේ මේ ආණ්ඩුවටත් ජනසතු සේවා ආරක්ෂා කර ගන්නට වුවමනාවක් ඇති බවයි. ඒ විධියේ අධිෂ්ඨානයක් ආණ්ඩු පැත්තේ ගරු මන්ත්‍රීවරුන්ට ඇති වී තිබෙන්නේ තමන්ගේ හද පත්ලෙන්ම පැන නැඟුණු හැඟීමක් නිසා නොව මේ රටේ මහජනයා තුළ ජනසතු සේවා ව්‍යාපාර කෙරෙහි ඇති ආශාව නිසයි. ඒවා හොඳට පවත්වාගෙන යෑමට ජනතාව තුළ ඇති අධිෂ්ඨානය නිසයි.

පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා කළ කථාවේදී, පසුගිය සභාග ආණ්ඩුව එක්සත් ජාතික පක්ෂයේ රැස්වීම්වලට මහජනයාට යන්නට හැකි වන අන්දමට බස් සේවය ඇති කෙළේ නැති බව, එක්සත් ජාතික පක්ෂයේ රැස්වීම් අසාර්ථක කිරීමට වෑයම් කළ බව, ප්‍රකාශ කළා. හොඳයි, දැන් ඒ තත්ත්වය වෙනස් වී තිබෙනවද? දැන් බලයේ සිටින අයත් එදා කළ ඒ වරදම දැනුත් කරන එකයි වරද. මේ පිළිබඳව නිදර්ශනයක් ඉදිරිපත් කරන්නට කැමතියි. ලංකා කොමියුනිස්ට් පක්ෂයේ 22 වන සම්මේලන වාරය පසුගියදා මාතර උයන්වත්තේදී පැවැත්වුණා. අති විශාල පිරිසක් ඒ රැස්වීමට පැමිණ සිටියා. ඒ රැස්වීම අවසන් වන විට ර. 10 විතර වුණා. අකුරැස්ස, පාලටුව, හක්මන, කිරින්ද, ආදී ප්‍රදේශවලින් මහජනයා එහි පැමිණ සිටියා. ඔවුන් බස් නැවතුම්පොළට ගොස් තම ගම්වලට යෑම සඳහා බස් රථ දෙන මෙන් ඉල්ලා සිටියා. එවිට බස් නැවතුම්පොළේ සිටි අය කීවේ මොකක්ද? "තමුසෙලා නිල් කමිස ඇඳගෙන ආවා නම් අපට තිබුණා ඒ ගැන සාකච්ඡා කර බස් ඩිපයක් සපයන්ට" කියලයි. එක්සත් ජාතික පක්ෂය, පසුගිය ආණ්ඩුව කළ වැරදිවලට දොස් කියන ගමන්, තමන් බලයේ සිටින මේ කාලයේ ඒ වැරදිම කරන බවට මා මේ සඳහන් කළ කාරණය හොඳම සාධකයක්.

ගරු සභාපතිතුමනි, හිටපු ඇමතිවරයාගේ දූෂණ ක්‍රියා විගයක් ගැන සී. ඒ. ධර්මපාල සහ ලිවේරා යන මහතුන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා "ඩේලි නිව්ස්" පත්‍රයෙන් කියෙව්වා. හදිසි බස් රථ පරීක්ෂක කණ්ඩායම්වලට අයිති වෑන් රථ පාවිච්චි කිරීමට නැත්නම් තබා ගැනීමට ලංගම අධ්‍යක්ෂ මහතුන්ට බලය තිබෙනවාද කියා මා අසන්නට කැමතියි. මාතර ප්‍රදේශයේ මෙම වෑන් රථයක් තිබෙනවා. පසුගිය දවස්වල—මා කොළඹ සිටි නිසා ඊයෙ පෙරේදා තත්ත්වය ගැන දන්නේ නැහැ—මේ වෑන් රථය ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු වූ සී. ඒ. ධම්පාල මහත්මයාගේ බංගලාවේ තිබුණා. හවසට මේ වෑන් රථ බංගලාවට ගෙන යනවා. උදේට ගෙන එනවා. මේ වෑන් රථයට වඩා වටිනා බස් රථ බස් ඩිපෝ එකේ නවත්වා තබන්නට පුළුවන් නම් මෙම වෑන් රථය අධ්‍යක්ෂවරයකුගේ බංගලාවක නවත්වන්නට ඇති හේතුව කුමක්ද කියා පරීක්ෂා කර බැලිය යුතුයි. මගේ මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවෙ මයා.]

ප්‍රකාශය ඇත්තද හෝ නැත්තද කියා දැන ගන්නට මාතර ලංගම ඩිපෝ අධිකාරි තැන ගෙන් ප්‍රශ්න කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මැතිවරණය අවසාන වී මාස කීපයක් ගත වූ සැටියේ අපට බස් කොන්දොස්තරවරුන් තෝරා ගැනීමේ ලැයිස්තු ආවා. මේ ලැයිස්තුවලින් ලොත රැයි ක්‍රමයට 24 දෙනෙක් තෝරා ගන්න වාය කියා ඒ අවස්ථාවේ පෙනී සිටින ලෙස මන්ත්‍රීවරයා හැටියට මටත් ලිපියක් එවා තිබුණා. මා මාතර කච්චේරියට ගොස් එය ක්‍රියාවට පරිවර්තනය කරන ආකාරය බලා හිටියා. එපමණක් නොවෙයි, ඒ අවස්ථාවේ 24 දෙනෙක් හෝ 25 දෙනෙක් තෝරා ගත්තා. එය සතුටුදායක අන්දමින් ක්‍රියා වේ යෙදුවාය කියා මමත් අත්සන් කළා. මට මතකයි බුලත්සිංහල මන්ත්‍රී මංගල මුණසිංහ මහතා දවසක් ගරු මන්ත්‍රීතුමා ගෙන් ඇසුවා මේ බස් කොන්දොස්තර වරුන් සේවයට ගන්නවාද නැද්ද කියා. මා නැවතත් ඒ ප්‍රශ්නය ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරනව. අපේ ඇස් හමුවේ ලොතරැයි ක්‍රමයට තෝරා ගත් ඒ බස් කොන්දොස්තරවරුන්ට රක්ෂාව දීමට තව මත් හරියාකාර ක්‍රියාමාර්ගයක් නොගත් තේ ඇයි කියා, මා ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරනව. ඒ ගැන කෙළින්ම පිළිතු රක් දෙනවා ඇත කියා මා බලාපො රොත්තු වෙනව. එපමණක් නොවෙයි. මෑත කාලයේදී බස් රියැදුරන් පත් කිරී මත් ඉතාම අසාධාරණ විධියට පක්ෂග්‍රාහී විධියට එක්සත් ජාතික පක්ෂයේ ලොකු අයගෙන් ලැබෙන රෙකමදාරුව අනුව වෙනවාය කියන දෝසාරෝපනයක් අපට ලැබී තිබෙනව.

මෙසේ බස් රියැදුරන් වශයෙන් බඳවා ගන්නා අයගේ දේශපාලන අදහස්— කවර දේශපාලන පක්ෂයකට හිතවත්ද ? මොන විධියේ දේශපාලන අදහස් දරන වාද, ආදී විස්තර—ඇතුළත් වාර්තාවක් අපරාධ පරීක්ෂණ අංශයෙන් ලබා ගැනීමට ඇමතිතුමා කටයුතු කරනවාය කියා අපට ආරංචියි. එය කොතරම් දුරට ඇත්තද නැත්තද කියා මා දන්නෙ නැහැ. මා වැරදි නම් හරිගස්සන හැටියට ගරු ඇමතිතුමාට මතක් කරනව. යම් කෙනෙක් බස් කොන්දොස්තර කෙනෙක් හැටියට බඳවා ගත්තාට පසුව ඔහුගේ චරිතය පිළිබඳව— ඒ කියන්නේ අපරාධකාරයෙක්ද උසාවි යකින් දඬුවම් ලබා තිබෙනවාද යන ආදී විස්තර නොවෙයි, මොන කඳවුරේද, මොන අන්දමේ දේශපාලන අදහස්ද දරන්නේ මොන පක්ෂයටද හිතවත් ආදී දේශපාලන චරිතය පිළිබඳව—රහස් වාර්තාවක් සී. අයි ඩී. එකෙන් ගෙන්වා ගන්නවාය කියා ආරං චියි. ඒක තමයි හත් හවුලේ ප්‍රජාතන්ත්‍ර වාදය. මේක තමයි ඒකාධිපතිවාදයට ගමන් කිරීමේ පිළිවෙළ. දක්ෂකම් උඩ, හැකියාව උඩ, අධ්‍යාපන සුදුසුකම් උඩ අදුස් සෙක් තෝරා ගත යුතුයි. එහෙම නැතිව දේශපාලන සම්බන්ධකම් පිළිබඳව යම්කිසි රජයක් කරුණු සොයනවා නම් එය ප්‍රජා තන්ත්‍රවාදී රජයක්ය කියා සලකන්නට අපට බැහැ. එය ඒකාධිපතිවාදයට ගමන් කරන රජයක්ය කියලයි අපට සලකන්නට පුළුවන්. ඒ සම්බන්ධයෙනුත් ගරු ඇමති තුමාගෙන් ප්‍රකාශයක් බලාපොරොත්තු වෙනව.

එමෙන්ම කොළඹ නගරයේ විරොලි බස් සේවයේ යෙදී සිටි විශාල පිරිසක් එයින් ඉවත් කර සිටිනවා. ඒ අයට අද රක්ෂා වක් නැතිව තමන්ගේ පවුල් නඩත්තු කර ගන්නට බැරිව ජීවත් වෙනව. මේ විරොලි බස් සේවකයින් විරොලි බස් එළවා පළපුරුදු අය නිසා බස් රියැදුරන් වශයෙන් ඔවුන් පුහුණු කිරීම ඉක්මණින් ම කරන්න පුළුවන්. එසේ කර ලංගමයට ඔවුන් බඳවා ගැනීමට කටයුතු කළොත් කොළඹ නගරයට සේවයක් කළ කම්කරු වන්ට කෘතගුණ සැලකීමක් ගරු ඇමති තුමාගෙන් ඉටු වුණාය කියා අපට පිළිගන් නට පුළුවන්. එයත් ඇමතිතුමාට මතක් කරන්න කැමතියි.

තවත් කරුණක් තිබෙනව. පසුගිය කාලයේ මාතර ලංගම ඩිපෝව මාගීයෙන් හක්මන පළාතේ බස් මාගීයක් ගැන කට යුතු සංවිධානය කළා. මේ අලුතින් දුවවන් නට බලපොරොත්තුවූ බස් රථය සැරසීමේ කටයුතු ඩිපෝවේ එක්තරා නිලධාරි පිරිස කට බාරවී තිබුණා. ඩිපෝ අධිකාරී මහතා විසින් දෙන ලද උපදෙස් අනුව ඒ මහත් වරු ඒ බස් රථය ඉතා අලංකාර විදියට සැරසුවා, මේ බස් සේවය ආරම්භ කිරීම සඳහා. ඒ මහත්වරු තමන්ගේ වැඩ කොටස කරන අවස්ථාවේදී මේ බස් සේව කයින් අතර සිටින එක් අවස්ථාවාදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුද්ගලයෙක් ඩිපෝ අධිකාරී මහත්මයාගේ මූහුණ ලොකු කරන්න, ලංගමයේ හා ආණ්ඩුවේ මුහුණ ලොකු කරන්න ඩඩ්ලි සේනානායක මහත්මයාගේ පින්තූරයක් ගෙනවුත් බස් රථයේ ඇලෙව්වා. ඒ අවස්ථාවේදී බස් රථය සැරසීම භාරගත් සේවක මහත්වරු කියා සිටියා, අපි මේ බස් එක සරසා එළියට දැම්මාට පසු ඕනෑ හැටියට පින්තූර අලවන්නය, ඊට අපෙන් වරදක් නැත කියා. ඔවුන් එසේ කිව්වේ බස් රථය සැරසීම ඔවුන්ට භාර දී තිබුණු නිසයි. ඔවුන් විසින් බස් රථය සරසා එළියට දැම්මාට පසු ඩඩ්ලි සේනානායක මහත්මයාගේ පින්තූරයක් ඇලෙව්වාට ඔවුන්ගේ අමනාපයක් නැතැයි කිව්වා. පසුව ඩඩ්ලි සේනානායක මහත්මයාගේ පින්තූරය අලවා බස් රථය දිව්වා. ඩිපෝ එක ඇතුළේදීම ඒ පින්තූරය ඇලවීමට විරුද්ධ වූ නිසා සේවක මහත්මයෙක් දුර බැහැර ප්‍රදේශයකට මාරු කළා. මෙන්න ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන මේ හවුල් ආණ්ඩුව කරන ක්‍රියාවල හැටි.

අ. භා. 7.45

ගමනාගමන පහසුකම් නැති ප්‍රදේශවලට වැඩි වැඩියෙන් බස් රථ යොදවා, මේ ජනසතු සේවාව මහජනයාට ප්‍රයෝජනවත් එකක් කරන අතර විශාල ආදායමක් ලබා ගැනීමට පුළුවන් විදියට සාර්ථක අන්දමින් කරගෙන යාමට උදව් දීමට අපි සැම අවස්ථාවේදීම සූදානම්. නමුත් ඒ ජනසතු සේවාවේ යෙදී සිටින සේවකයින් තෘප්තිමත් කරන්නේ නැතිව, ඒ සේවකයින් වහලුන් මෙන් තබගෙන වැඩ කරන්නට යනවා නම් ඒ සේවය දියුණු කරන්නට බැරි බව මම කියන්න කැමතියි. [බාධා කිරීමක්] ඉස්සර ආණ්ඩුව කළාය කියා මේ ආණ්ඩුවත් කරනවාද? ඉස්සර ආණ්ඩුව කළ දේ නරකය කියා නේද, මේ ආණ්ඩුව බලයට ආවේ? එහෙම නම් ඉස්සර කරපු නරක දේ තිබෙනවා නම් ඒවා දැන් නවත්වන්න.

බස් සේවකයන් බොහොම නරක අන්දමට දැන් මාරු කරනවා. මැතිවරණය අවසන් වූ හැටියේම බස් සේවකයින් රාශියක් මාරුකර තිබෙනවා. බලපිටියේ ගරු මන්ත්‍රීතුමා [එල්. සී. ද සිල්වා මයා.] කීවාක් මෙන් මේ ආණ්ඩුවේ පළිගැනීමේ ව්‍යාපාරයේ දෙවන තැන ගන්නේ ජනසතු සේවා ඇමතිතුමායි. පළමු තැන ගන්නේ අධ්‍යාපන ඇමතිතුමායි. මම ජනසතු සේවා ඇමතිතුමාගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මේ සේවකයින් එක් එක්කෙනාගේ දේශපාලන පරමාර්ථයන් මුදුන්පත් කිරීම සඳහා, එක එක්කෙනාගේ ලියවිලිවලට හිතුවක්කාර විදියට මාරු කරන්නේ නැතිව, මේ සේවය කඩාකප්පල් කිරීමට යම් සේවකයෙක් කටයුතු කරනවා නම් ඔහු මාරු කරනවා පමණක් නොවෙයි, ඊට වඩා දරුණු පියවරක් වුවත් ගන්නා ලෙස. ඒ ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. අපි මේ සේවය ආරක්ෂා කරන්නා වාගේම එම සේවයේ යෙදී සිටින සේවකයින්ද ආරක්ෂා කළ යුතුයි. එසේ වුවත් මේ ජනසතු සේවාව නිසි ලෙස ගෙනයාමට බාධා පමුණුවන සියලුම සේවකයින්ට, ඉහළම සේවකයකුට හෝ වේවා පහළම සේවකයකුට හෝ වේවා, ඉතා තද දඬුවම් දිය යුතුයි. නමුත් අහිංසක කම්කරුවින් මැතිවරණ කාලයේදී තමන්ගේ මැතිවරණ ව්‍යාපාරයට උදව් කළේ නැත කියා, තමන්ගේ දේශපාලන ප්‍රතිපත්ති අනුමත නොකරනවාය කියා තැන් තැන්වලට මාරු කරනවා නම් එය සාධාරණ නොවන බවත් අප මතක් කර දිය යුතුයි.

මගේ කථාව අවසන් කිරීමට පෙර ගරු ඇමතිතුමාට ක්‍රීඩා භූමි පිළිබඳවත් වචනයක් කියන්න අදහස් කරනවා. අද ලංකාවේ ක්‍රීඩා භූමි තියෙන්නෙ, නගරබදව පමණයි. ලොක්කන්ගෙ දරුවන්ටත්, නගරබද කම්කරුවන්ගෙ දරුවන්ටත් ඒ ක්‍රීඩා භූමි පාවිච්චි කර ශරීර සෞඛ්‍යය දියුණු කර ගැනීමට පුළුවනි. ඒ ගැන අපි සන්තොෂ වෙනව. ඒ වගේම ගම්බද ගොවීන්ගෙ දරුවන්ටත් ක්‍රීඩා මාර්ගයෙන් තම තමන්ගෙ ශරීර සෞඛ්‍ය දියුණු කර ගැනීමටත් ගති ගුණ දියුණු කර ගැනීමටත් අවස්ථාව ලබා දීම පිණිස ගම්බද ප්‍රදේශවලත් ප්‍රසිද්ධ ක්‍රීඩා භූමි සකස් කර දෙන හැටියට මා ඉල්ලා සිටිනව.

ගුරුවරයකු වශයෙන් කටයුතු කර පළපුරුද්දක් ඇති මට කියන්ට පුළුවනි බොහෝ කොට්ඨාශවල, විශේෂයෙන්ම මාතර දිස්ත්‍රික්කයෙ පාසැල් ළමුන්ට ක්‍රීඩා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවෙ මයා.]

කරන්න පිට්ටනි නැතිකමින් බොහෝ කරදර විඳින බව. හක්මන ඡන්දදායක කොට්ඨාශය තුළ, අකුරැස්ස ඡන්දදායක කොට්ඨාශය තුළ, බෙලිඅත්ත ඡන්දදායක කොට්ඨාශය තුළ පාඨශාලාවන්හි ඉගෙනීම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තමතමන්ගෙ ක්‍රීඩා උත්සව ආදිය පැවැත්වීම සඳහා සුදුසු ස්ථාන නොමැතිවීම විශාල පාඩුවක්. මේ ප්‍රදේශවල ළමයි ඉතාමත් බාධා සහිත ඉඩම්වල ඒ කියන්නෙ පොල් ඉඩම්වල එහෙම තමයි, ක්‍රීඩාවල යෙදෙන්නෙ. එම නිසා ඔවුන්ට ක්‍රීඩා අතින් ඇති දක්ෂකම්, හැකියාවන් දියුණු කර ගැනීමට අමාරු වී තිබෙනව. තමතමන්ගෙ ක්‍රීඩා උත්සව පවත්වන්න වුවමනා වූ විට වෑන් රථ වලට හෝ බස් රථවලට මුදල් වියදම් කරමින් සැතපුම් විස්ස තිහ මග ගෙවා ගෙන මාතර නගරය බලා එන්ට ඒ අයට සිදු වී තිබෙනව. මාතර පිට්ටනියෙ තමයි, ඒ අය සරඹ සන්දර්ශන වැනි ක්‍රීඩා උත්සව පවත්වන්නෙ. එම නිසා ක්‍රීඩා ලෝලයකු වූ ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, නගරබද ජනතාවගෙ දරුවන්ට ක්‍රීඩා පිට්ටනි අතින් ලබා දී ඇති පහසුකම් ගම්බද ගොවීන්ගෙ දරුවන්ටත් ලබා දීම සඳහා කටයුතු කරන ලෙස.

අන්තිම වශයෙන් මගේ ප්‍රදේශයෙ ප්‍රශ්නයක් ගැනත් එතුමගෙ අවධානය යොමු කරවන්න ඕනෑ. එනම් මාතර-දීයගහ බස් සේවාව ගැනයි. වේරඹුව-අපරැක්ක පාරෙන් දීයගහට ගමන් කරන බස් රථ සේවාව, ඒ පාරෙ තිබෙන යම් යම් දුර්වලතාවන් නිසා නියම ස්ථානයට, ඒ කියන්නෙ දීයගහ කඩපොළට, ගමන් කරවීම අපහසු වී තිබෙනව. කුඩා බස් රථවත් යොදවනව නම් ඒ පාරෙ ඉතිරි ටිකත් ගෙවා දීයගහ කඩපොළට පැමිණෙන්ට පුළුවනි. විශාල ලෙස මහජනය රැස්වන තැනක් තමයි, දීයගහ කඩපොළ. අවට නොයෙකුත් පළාත්වල සිට මෙහි මහජනය පැමිණෙනව, නානාවිධ වෙළඳ භාණ්ඩ විකුණා ගැනීමට සහ මිල දී ගැනීමට. දීයගහ කඩපොළ ඒ ප්‍රදේශයෙ තිබෙන විශාල වෙළඳ පොළක් වෙනව. එම නිසා දැනට තිබෙන පාර තරමක් දුර්වල වුණත් එම ස්ථානය දක්වා යාම පිණිස කුඩා බස් රථ කීපයක්වත් දුවවනව නම් එයින් ඒ ප්‍රදේශයෙ ජනයාට විශාල පහසුවක් සැලසෙනව ඇති. වේරඹුව-අපරැක්ක පාරෙ ගමන් කරන බස් රථ සේවය දීයගහ කඩපොළ දක්වා දීර්ඝ කර දෙන්නය කියන එක, ඒ ප්‍රදේශයෙ මහජනතාවගෙ වැදගත් ඉල්ලීමක් තමයි. මාතර ප්‍රදේශය වෙනුවෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලන මේ පළමුවන ඉල්ලීම ඉටුකර දෙන හැටියට කියා සිටිනව. ජනසතු සේවාව ආරක්ෂා කර ගනිමින් එතුමා ඉදිරියට ගෙනයන ව්‍යාපාරවලදී අපේ සම්පූර්ණ සහයෝගය එතුමාට දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

**ඒ. ලතීෆ් සින්නලෙබ්බෙ මයා.**
(මඩකලපුව දෙවන මන්ත්‍රී)

*(ஜனாப் ஏ. லதீப் சின்னலெப்பை—மட்டக்களப்பு இரண்டாம் அங்கத்தவர்)*

(Mr. A. Latiff Sinnalebbe—Second Batticaloa)

கௌரவ தலைவர் அவர்களே, இலங்கை தேசிய மய சேவைகளைப் பற்றியும் இலங்கை போக்குவரத்துச் சபை பற்றியும் இங்கு எதிர்க் கட்சிப் பிரதிநிதிகள் மிகவும் தாக்கிப் பேசிக்கொண்டிருக்கிறார்கள். இவை அனைத்தையும் நாம் எடுத்து ஆராயும் போது மிக முக்கியமாக ஒன்றே ஒன்றுதான் எனக்கு வெளிப்படையாகத் தென்படுகிறது. அதாவது அவர்கள் தாங்கள் முன்பு செய்தவற்றையெல்லாம் மறைப்பதற்காகத்தான் இன்று ஏதேதோவெல்லாம் எடுத்துக் கூறிக்கொண்டிருக்கிறார்கள். எதிர்க் கட்சியில் இருக்கக்கூடிய முன்னைநாள் அமைச்சரான கௌரவ அகலவத்தைப் பிரதிநிதி (திரு. அனில் முனசிங்க) அவர்கள் பேசுகையில் தாங்கள் எந்தவிதமான பாகுபாடுமின்றி இலங்கைப் போக்குவரத்துச் சபையை நடாத்தி வந்ததாகக் குறிப்பிட்டார். இச்சபையில் இருக்கக்கூடிய சகல அங்கத்தவர்களும் அவருடைய பேச்சை நன்கு ஆழ்ந்து சிந்தித்துப் பார்க்க வேண்டும். ஏனெனில் முன்னைய ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியின் கூட்டரசாங்கத்தினர் எவ்விதமாக இலங்கைப் போக்குவரத்துச் சபையை நடத்தினார்கள் என்பது எங்களுக்கு நன்கு தெரியும்.

நான் இங்கு ஒரு விடயத்தை மிக முக்கியமாக வற்புறுத்திக் கூற விரும்புகிறேன். அதாவது அன்றைய கூட்டரசாங்கத்தினர் இலங்கை முழுவதையும் ஒரேமாதிரியாகத்தான் கவனித்ததாகக் கூறுகிறார்கள். ஆனால் கிழக்கு மாகாணத்தைத் தவிர்ந்த ஒரு இலங்கையையே அவர்கள் முழு இலங்கை

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

யென்று நம்பினுர்கள். இப்படி கூறும்பொழுது சில விடயங்களை ஆதாரபூர்வத்துடனேயே குறிப்பிட விரும்புகிறேன். முன்னைய கூட்டரசாங்கத்தினர் கிழக்கிலங்கையைப் புறக்கணித்தார்கள். அவர்கள் எங்களுக்கு அனுப்பிய பஸ் வண்டிகள் எப்படிப்பட்டவையாக இருந்தன என்பதை இச்சபையிலேயுள்ள கௌரவ அங்கத்தவர்கள் நன்கு சிந்தித்துப் பார்க்க வேண்டுமென்று வேண்டிக் கொள்ளுகிறேன். தாங்கள் கடைப்பிடித்த புறக்கணிப்புக் கொள்கைக்கு தமிழரசுக் கட்சியினர் ஸ்ரீ எதிர்ப்புப் போராட்டத்தைக் கொண்டுவந்தார்கள் என்றதொரு சாக்கு அவர்களுக்கிருக்கிறது. அப்படி ஒரு சாக்கை வைத்துக் கொண்டு கிழக்கு மாகாணத்திற்குப் பழைய ஐ. ஸி. பஸ்களை அனுப்பினுர்கள். இதே பஸ்களைத்தான் வடக்கு மாகாணத்திற்கும் அனுப்பினுர்கள். இப்படி அனுப்பப்பட்ட பஸ்கள் தானும் எப்படி இருந்தன? இந்த இடத்தில் நான் மிக வற்புறுத்திக் கூற வேண்டியது என்னவென்ருல் இலங்கை போக்குவரத்துச் சபையின் மட்டக்களப்பு டிப்போவில் உள்ளவை 33 பஸ்கள். ஆனுல் போக்குவரத்துக்காக எங்களுக்குத் தேவையான பஸ்களின் தொகை 38 ஆகும். தற்போது இருக்கக் கூடிய 33 பஸ்களில் ஆக 14 பஸ்கள் தான் வீதியில் பாவிக்கக்கூடியவையாக இருக்கின்றன. மற்ற பஸ்களை அவர்கள் வைத்திருக்கின்ருர்கள். ஏதோ பஸ்சேவை நடக்கவேண்டுமென்பதற்காக அவை வீதியிலே நடமாட விட்டுக் கொண்டிருக்கிருர்கள்.

உண்மையிலே, நான் ஒரு அங்கத்தவன் என்றதற்காக அல்ல, இம்மாபெரும் சபையிலே நான் ஒரு அங்கத்தவனுவதற்கு முன் இந்தப் பஸ் சேவையிலே ஒரு பிரயாணியாகச் சென்றிருந்தேன். அந்தச் சூழ் நிலையிலே நடந்ததென்னவென்ருல், மட்டக்களப்புக்கும் கல்முனைக்குமிடையேயுள்ள தூரம் ஏறத்தாழ இருபத்தைந்து மைல். இந்தத் தூரத்திலே, ஒரேயொரு ஐ. சி. பஸ், ஒரு "லேலண்ட்" பஸ்—மூன்று இடங்களிலே "பிறேக் டவுன்" ஆகிவிட்டது. நான் ஏன் ஆங்கிலச் சொற்களையும் தமிழிற் பேசும்போது பாவிக்கின்றேனென்ருல் இங்கிருப்போருக்கு அது நன்ருக விளங்கக் கூடியதாக இருக்குமென்பதற்காகவே.

இப்படியாக எங்களைப் புறக்கணித்து, கிழக்கு மாகாணம் என்று ஒன்று இலங்கையிலே இல்லை யென்று இதற்கு முன்னிருந்த கூட்டு அரசாங்கத்தினர் நடாத்தி வந்தார்கள். அப்படியிருந்துங்கூட கௌரவ அகலவத்தை உறுப்பினர் "நாங்கள் எந்த விதமான விபரீதமும் காட்டியிருக்கின்ருேமா? அல்லது வேறு பிரிவினைகள் நாங்கள் காட்டியிருக்கின்ருேமா? சமூக வேறுபாடுகள் காட்டியிருக்கின்ருேமா?" என்று கேட்டார்கள். அவருக்கு நான் ஒன்றே யொன்று கூறிவைக்க விரும்புகின்றேன். எங்களுடைய இலங்கையிலே நாங்கள் எல்லோரும் ஒன்று என்று இன்று இந்தத் தேசிய அரசாங்கம் அமைக்கப்பட்டிருக்கின்றது; எல்லாச் சமூகத்தினரும் ஒன்று என்று. அப்படியிருந்துங்கூட அவர்கள் கிழக்கிலங்கையைப் பிரித்து வைத்தார்கள். பிரித்து வைத்துப் புறக்கணித்தார்கள்.

இன்று நான் எங்களுடைய கௌரவ பிரதம மந்திரி அவர்களை மிக மெச்சுகின்றேன். ஏனென்ருல் தேசிய சேவை அமைச்சராக எங்களுடைய கௌரவ கொழும்பு வடக்கு பிரதிநிதி அவர்களைத் தேர்ந்தெடுத்ததற்காக. ஏனெனில் அவர்கள் போக்குவரத்துச் சேவையில் மாத்திரமல்ல, விளையாட்டு வகையிலுங்கூட ஓர் மாபெரும் வீரர். இத்தகைய நல்ல ஒருவரைத் தெரிந்தெடுத்தார்கள். அவர்கள் "பாஸ்கட் போல் ரீம்"—அகில இலங்கை பாஸ்கட் போல் ரீமில் அவர்கள் கப்டனுக விளங்கினுர்கள். அவர்கள் கிழக்கு மாகாணத்துக்கு முக்கியமாக மட்டக்களப்பு நகருக்கு வருகை தந்தார்கள். இதற்கு முன்னிருந்த அமைச்சர்கள் எங்களுடைய பகுதிக்கு வருகை தருவதற்குக் கூச்சம் அடைந்தார்கள். வருகை தரப் பயந்தார்கள், வருவதற்கு மறுத்தார்கள். ஆனுல் எங்களுடைய அமைச்சர் வருகை தந்தார்கள். இலங்கைப் போக்குவரத்துச் சபையின் டிப்போவைப் பார்வையிட்டார்கள். பார்வையிட்டு உடனடியாக அவர்கள் எங்கள் மத்தியிலே, அங்கு இருக்கக்கூடிய பாராளுமன்ற உறுப்பினர் மத்தியிலே என்ன கூறினுர்கள் என்ருல், நீங்கள் எந்தச் சூழ்நிலையில் கவனிக்கப்படாதிருந்தீர்களோ அதை நாங்கள், இந்தத் தேசிய அரசாங்கம் எப்படியும் சீர்திருத்தமாக்கி நல்ல போக்குவரத்து வசதிகளை உங்களுக்குச் செய்து தருவதோடு இன்னும் பொது மக்களுக்காக என்ன என்ன செய்ய வேண்டுமோ அவை அனைத்தையும்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලතීෆ් සින්නලෙබ්බෙ මයා.]

செய்வதாக எங்களுக்கு கௌரவ அமைச்சர் அவர்கள் வாக்குறுதி தந்தார்கள். அப்படி அது இருந்தும் கூட, நான் மிகவும் கவலை யுடன் இந்தச் சபையிலே முக்கியமானதொரு விஷயத்தைக் கூற விரும்புகின்றேன். அது என்னவென்றால், எங்களுக்கு அந்தச் சமயத் திலே கதிர்காமச் சேவையில் இருந்து கூட 5, 6 பஸ்கள்—

**එකල්හි වේලාව අ. භා. 8 වූයෙන්, මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.**

**කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම, 1965 සැප්තැම්බර් 7 වැනි අඟහරුවාදා.**

நேரம் பி. ப. 8 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி சபைக்கு அறிவிக்கும் பொருட்டு தலைமை தாங்கிய அங்கத்தவர், அக்கிராசனத்திலிருந்து நீங்கினர்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது, 1965, செப்ரெம்பர் 7 ஆம் தேதி செவ்வாய்க் கிழமை.

*It being 8 P.M., the Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Tuesday, 7th September 1965.*

# කල්තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**මතු පළවන යෝජනාව සභාසම්මත විය.**

“ මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය ”.—[ගරු සී. පී. ද සිල්වා]

தீர்மானிக்கப்பட்டது :

“ சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக ” .—[கௌரவ சீ. பீ. டி சில்வா]

*Resolved :*

“ That the House do now adjourn ”.—[*Hon. C. P. de Silva*].

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.01 ට 1965 සැප්තැම්බර් 2 වන දින සභාසම්මතිය අනුව, 1965 සැප්තැම්බර් 7 වන අඟහරුවාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.**

அதன்படி சபை பி. ப. 8.1 மணிக்கு, அதனது 1965 செப்ரெம்பர் 2 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க, 1965, செப்ரெம்பர் 7 ஆம் தேதி செவ்வாய்க்கிழமை மு.ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

*Adjourned accordingly at 8.01 P.M. until 10 A.M. on Tuesday, 7th September 1965, pursuant to the Resolution of the House on 2nd September 1965.*

PUBLIC LIBRARY
JAFFNA.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30. தபால்மூலம் 45 சதம். முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500, Colombo 1.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org